322 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 322 - இல. 05
Volume 322 - No. 05

2025 නොවැම්බර් 12 වන බදාදා
2025 நவம்பர் 12, புதன்கிழமை
Wednesday, 12th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා කරන ලද ඉල්ලීම [තීරුව 801]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 801]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 803-818]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පිරිවෙන් අධ්‍යාපනය සඳහා ප්‍රතිසංස්කරණ [තීරුව 818]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [හතරවන වෙන් කළ දිනය]:**
දෙවන වර කියවීම - විවාදය කල් තබන ලදී [තීරු 829–984]

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
சிறப்புரிமைக் கேள்வியொன்றை எழுப்புவதற்காக விடுக்கப்பட்ட வேண்டுகோள் [ப: 801 ]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 801]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 803-818]

**தனி அறிவித்தல் மூல வினா:**
பிரிவெனாக் கல்விக்கான சீர்திருத்தங்கள் [ப: 818]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட நான்காம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் ஒத்திவைக்கப்பட்டது [ப: 829-984]

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENT:
Request to Raise a Question of Privilege [Col. 801]

AUDITOR-GENERAL'S REPORT [Col. 801]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 803-818]

QUESTION BY PRIVATE NOTICE:
Reforms to Piriven Education [Col. 818]

APPROPRIATION BILL, 2026 - [Fourth Allotted Day]:
Second Reading - Debate Adjourned [Cols. 829–984]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 12වන බදාදා***
*2025 நவம்பர் 12, புதன்கிழமை*
*Wednesday, 12th November, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කිරීම සඳහා කරන ලද ඉල්ලීම
### சிறப்புரிமைக் கேள்வியொன்றை எழுப்புவதற்காக விடுக்கப்பட்ட வேண்டுகோள்
### REQUEST TO RAISE A QUESTION OF PRIVILEGE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to make this Announcement with reference to a letter submitted to me by the Hon. (Dr.) Ramanathan Archchuna, Member of Parliament, seeking permission to raise a matter of Privilege in respect of an incident that had taken place on 08.11.2025 during the Adjournment Debate.

I wish to inform that having considered the proceedings at the referenced moment, I have already instructed the Secretary-General of Parliament to expunge the unparliamentary words from Hansard and the audio-video recordings of the proceedings. Therefore, a requirement does not arise to raise the matter again in Parliament.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXVII කොටස;
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ L හා LI කොටස්; සහ
- 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXV කොටස, තෙවැනි කාණ්ඩයේ XVIII සහ නවවැනි කාණ්ඩයේ XIII හා XIV කොටස් මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අමිල ප්‍රසාද් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මහරගම, දුම්රිය මාවත, අංක 218 ඒ යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. ස්වර්ණලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බොරලැස්ගමුව, කටුවාවල, කහටගහවත්ත, ශ්‍රී සද්ධානන්ද මාවත, අංක 109/1/5 යන ලිපිනයෙහි පදිංචි ඕ.ආර්. ජයන්ත චන්ද්‍රලාල් මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්: පැවරීම
## காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: கையளித்தல்
## LANDS BELONGING TO LAND REFORM COMMISSION: TRANSFER

1289/2025

**1. ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(ii) කොමිෂන් සභාවට අයත් ඉඩම් පුද්ගලයන්ට සහ රජයේ හා පෞද්ගලික ආයතන වෙත පැවරීමේදී බලපවත්වන නීති කවරේද;

(iii) කොමිෂන් සභාවේ ඉඩම් පැවරුම් සහතික වර්ගීකරණය කර තිබේද;

(iv) නිකුත් කර ඇති නියාදන පත්‍රයක් අවලංගු කිරීමට බලය ඇත්තේ කාටද;

(v) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් සම්බන්ධ නීති යාවත්කාලීන කිරීමට/සංශෝධනය කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்த மான மொத்தக் காணியின் அளவு, மாவட்ட வாரியாக வெவ்வேறாக எத்தனை ஏக்கர்கள் என்பதையும்;

(ii) மேற்படி ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளை தனிநபர்களுக்கு, அரச மற்றும் தனியார் நிறுவனங்களுக்குக் கையளிக்கும்போது செல்வாக்குச் செலுத்தும் சட்டங்கள் யாவை என்பதையும்;

(iii) ஆணைக்குழுவின் காணி கையளிப்புச் சான்றிதழ்கள் வகைப்படுத்தப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) வழங்கப்பட்டுள்ள கையுதிர்ப்புப் பத்திர மொன்றை இரத்துச் செய்யும் அதிகாரத்தைக் கொண்டவர் யார் என்பதையும்;

(v) காணிச் சீர்திருத்த ஆணைக்குழுவின் காணிகள் தொடர்பான சட்டங்களை இற்றைப்படுத்து வதற்கான/ திருத்துவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the total extent of land belonging to the Land Reform Commission in acres, in each of the districts, separately;

(ii) the laws that are applicable in transferring the lands belonging to the Commission to individuals, government entities and private institutions;

(iii) whether the land transfer certificates of the Commission are classified;

(iv) the person who is vested with power to cancel an instrument of disposition that has already been issued; and

(v) whether steps will be taken to update/ amend the laws relating to the lands of the Land Reform Commission?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය ඉතාම කාලෝචිත ප්‍රශ්නයක්. කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මඟින් ප්‍රකාශිත ඉඩම් ප්‍රමාණය අක්කර 1,418,391යි, රූඩ් 03යි, පර්චස් 37ක් හා 1975 අංක 39 දරන පනත මඟින් ප්‍රකාශිත ඉඩම් ප්‍රමාණය අක්කර 418,754යි, රූඩ් 02යි, පර්චස් 28ක් වේ.

උක්ත ප්‍රකාශිත ඉඩම් අතුරින් වරින් වර සංශෝධිත 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම්, දිස්ත්‍රික් මට්ටමින් පැවරී ඇති අතර පවරා ගැනීමේදී පැවරුණු සමස්ත ඉඩම් ප්‍රමාණය මැනුම් කර නොමැත. එම ඉඩම් ප්‍රමාණය ඇමුණුමෙහි දක්වා ඇත. එය දීර්ඝ ඇමුණුමක් බැවින් **සභාගත*** කරමි..

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

මේ වන විට පිළියෙළ කර ඇති ඉඩම් ලේඛනයට අනුව හඳුනාගනු ලැබූ ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී සිතියම්ගත කරමින් පවතී.

ගරු කථානායකතුමනි, මේ ඉඩම් 1972 ඉඩම් අත්පත් කර ගැනීමේ පනත හරහා අත්පත් කර ගත්තත්, එදා මෙදා තුර මේ ඉඩම් පවරා ගැනීමට සහ නිවැරදිව මැනුම් කර ලේඛනගත කරන්න සමත් වෙලා නැහැ කියන එක තමයි අපි දිගින් දිගටම හඳුනා ගනිමින් තිබෙන්නේ. ඒ කොහොම නමුත්, දැනට මේ සඳහා යම් මැදිහත්වීමක් කරමින්, නිවැරදි කරමින් යනවා.

(ii) වරින් වර සංශෝධිත 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන හා ඉඩම් බැහැර කිරීමේ පාලන චක්‍රලේඛ අංක 2024/03 චක්‍රලේඛයට අනුව තමයි මේ සඳහා ක්‍රියාමාර්ග ගනිමින් තිබෙන්නේ.

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් පැවරුම් සහතික නිකුත් කිරීමක් සිදු නොකරයි.

(iv) අදාළ නොවේ.

(v) 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත පහත පරිදි සංශෝධනය වී ඇත.

1. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධිත) පනත
2. 1981 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (සංශෝධිත) පනත
3. 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
4. 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනත
5. 1986 අංක 18 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන සංශෝධිත) පනත

(ආ) අදාළ නොවේ.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාට. ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා දුන් පිළිතුර අනුව පැහැදිලි වෙනවා. ඉඩම් ප්‍රමාණය අක්කරවලින් හඳුනාගෙන තිබුණත් මේ වනතෙක් නිවැරදිව විගණනයකට ලක් වෙලා නැහැ කියලා. නමුත්, ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරනවා කියන එකත් ප්‍රකාශ කළා. ගරු කථානායකතුමනි, මම නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් බොහොමයක අනවසරයෙන් පදිංචිවීම් දකින්නට ලැබෙනවා. විශේෂයෙන්ම දේශපාලන හිතවත්කම් මත පිරිසක් පදිංචි කරවා තිබෙනවා. තවත් පිරිසක් අනවසරයෙන් ඒ ස්ථානවල ස්ථිර පදිංචිකරුවන් වශයෙන් ඉන්නවා. මේ විගණනයේදී, එහෙම නැත්නම් ඉදිරියේදී අනුගමනය කරන ක්‍රියාමාර්ගයට අනුකූලව කටයුතු කිරීමේදී එම පදිංචිකරුවන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය පිළිබඳව යම් කිසි අදහසක් තිබෙනවාද කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, මේ ඉඩම් සම්බන්ධයෙන් රටේ දේශපාලන අධිකාරියට වාගේම මහ ජනතාවට තිබෙන්නේ ඉතාම අවිනිශ්චිත වූ අදහසක්. ඉඩම් පවරා දීම්, අත්පත් කර ගැනීම් නීත්‍යනුකූලව සිදු නොවුණා කියන එකට අදාළ තොරතුරු ආයතන පැත්තෙන් ගත්තත් දිගින් දිගටම වාර්තා වෙමින් තිබෙනවා. විගණන ක්‍රියාවලියක් සිදු නොවුණු අවස්ථා තමයි බහුල වශයෙන්ම දකින්නට ලැබෙන්නේ.

සමහර දේශපාලනඥයන් - ඇමතිවරු, ඇමතිවරියන් - යටතේ මෙම විෂය තිබෙද්දී තමන්ගේ පවුලේ ඥාතීන්ට බෙදා ගත් අවස්ථා වාර්තා වනවා. මැණික් ගැරීමේ ව්‍යාපාර පවත්වාගෙන යන්න ඉඩම් කොටස් කැබලි කර ගත්ත අවස්ථා වාර්තා වනවා. අපි අමාත්‍යාංශයක් විධියට එම අඩුපාඩු හඳුනාගෙන, එම අක්‍රමවත් ඉඩම් බැහැර කිරීම් හඳුනාගෙන, ඒවා ඉක්මනින් විගණනයට ලක් කරන්නත්, ඒ වාගේම එම ක්‍රියාවලිය විධිමත් කරලා, ඉතා විනිවිදභාවයෙන් යුක්ත ඉඩම් පරිහරණය කරන ආයතනයක් බවට එම ආයතනය පත් කිරීමටත් අපි සැලසුම් කර තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට අදාළව කිව්වොත්, අපි විගණන ක්‍රියාවලිය ශක්තිමත් කරනවා. එය නිවැරදි කර ගන්න තිබෙන හොඳම අවස්ථාව විගණනය කියලා අපි විශ්වාස කරනවා. විගණනය වාගේම එහි තිබෙන අඩුපාඩු මඟ හරවා ගන්නත් අපි අමාත්‍යාංශයක් විධියට කටයුතු කරමින් සිටිනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඊට ප්‍රථම මම මේ කාරණය කියන්න කැමැතියි. රජයේ ඉඩම්වල දැනට නීත්‍යනුකූලව පදිංචි වී සිටින පිරිස්වලට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් නිකුත් කරනවා, නියාදන සාධන පත්‍රයක්. ඒක ග්‍රාම නිලධාරිවරයා සහතික කරනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් නිකුත් කරන ඒ අයිතිවාසිකම, හිමිකම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලවත් ලේඛන, දත්ත නැහැ. නමුත්, පසුගිය කාලයේ අපට නිරීක්ෂණය වුණා, නියාදන සාධන පත්‍ර පුද්ගලයෙකුට නිකුත් කරලා එම පුද්ගලයා එම ඉඩමේ පදිංචි නොවී සිටින අවස්ථාවක තවත් අයෙකුට එම ඉඩමට නියාදන සාධන පත්‍රයක් නිකුත් කිරීම නිසා ඉඩමේ හිමිකම පාර්ශ්ව දෙකකට ඇවිල්ලා තිබෙන බව. පාර්ශ්ව දෙකේ යම් ගැටලුකාරී තත්ත්වයකුත් වාර්තා වුණා. එක සිද්ධියක් නොවෙයි. එවැනි සිද්ධි බොහෝ ප්‍රමාණයක් අපට වාර්තා වෙලා තිබෙනවා.

මම දන්නා තරමින් නියාදන පත්‍ර නිකුත් කළාට පස්සේ අවලංගු කිරීමේ ක්‍රමවේදයක් නැහැ. මම ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් අහන්න කැමැතියි, නියාදන පත්‍රයක් නිකුත් කළාට පස්සේ ඒක අවලංගු කරලා සුදුසුකම් තිබෙන අයෙකුට හිමිකම් පැවරීමේ ක්‍රමවේදයක් සූදානම් කරන්න, එවැනි පිළිවෙතක් අනුගමනය කරන්න හැකියාවක් තිබෙනවාද කියලා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියනවා වාගේ එකම ඉඩම් කැබැල්ලට දෙදෙනෙකුට බලපත්‍ර දීලා තිබෙනවා වාගේම සමහර අවස්ථාවල අවුරුදු 45, 48 වාගේ කාලයක්, අවුරුදු 50කට ආසන්න කාලයක් පදිංචි වුණු කෙනෙකුට හැර වෙනත් පළාතක ඉන්න කෙනෙකුට බලපත්‍ර දීපු අවස්ථාත් වාර්තා වෙනවා. එහෙම ගත්තාම, දේශපාලන හිතවතුන්ට අවිධිමත් බැහැර කිරීම් විධියට තමයි බොහෝ ඒවා තිබෙන්නේ. ඒ වාගේම ආයතන පැත්තෙනුත් ගැටලු ගණනාවක් තිබෙනවා. නිලධාරින්ගේ පැත්තෙන් මේ පිළිබඳව ස්ථාන පරීක්ෂණ නොකර පවරාදීම් කරලා තිබෙනවා. ඒ නිසා මේ වන විට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නීති අංශත් එක්ක කථා කරමින් සිටිනවා. මේ පිළිබඳව සොයා බලා විධිමත් බලපත්‍රයක් නිකුත් කරනවා වාගේම අසාධාරණයට ලක් වෙලා සිටින ජනතාව වෙනුවෙන් උපරිම සාධාරණයක් කරන්නත් අපි නීති අංශ එක්ක දැනටමත් සාකච්ඡා ආරම්භ කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේවා සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග 600කට ආසන්න ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ජනතාවගේ දේපොළක් වන ඉඩම් අයිතිය ජනතාවට ලබා නොදීමට සැලසුම්සහගතව ගත් ක්‍රියාමාර්ග විධියට සමහර කාරණා අපි හඳුනා ගනිමින් තිබෙනවා. ඒ අනුව ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට පිළිතුර වන්නේ, ජනතාවට උපරිම සාධාරණයක් කරමින් අදාළ බලපත්‍ර ලබා දෙන්න අපි නීති අංශ සමඟ සාකච්ඡා කරමින් සිටිනවා කියන එකයි.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -1312/2025- (1), ගරු සුදත් බලගල්ල මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -1323/2025- (1), ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මඩුවන්වෙල වලව්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීම: විස්තර
### மடுவன்வெல வலவ்வை தொல்பொருள் திணைக்களத்தால் கையகப்படுத்தல்: விபரம்
### TAKEOVER OF MADUWANWELA WALAWWA BY DEPARTMENT OF ARCHAEOLOGY: DETAILS

1347/2025

**4. ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඓතිහාසික මඩුවන්වෙල වලව්ව ඉදිකර ඇති කාල වකවානුව කවරේද;

(ii) එහි ඓතිහාසික වටිනාකම කවරේද;

(iii) මඩුවන්වෙල වලව්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට නීත්‍යානුකූලව පවරා ගන්නා ලද දිනය කවරේද;

(iv) පවරා ගන්නා අවස්ථාව වන විට එහි අයිතිකරු කවුරුන්ද;

(v) පවරා ගන්නා ලද භූමි ප්‍රමාණය කොපමණද;

(vi) ඒ සඳහා ගෙවන ලද තක්සේරු වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මඩුවන්වෙල වලව්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද මුල් ගැසට් පත්‍රයේ අංකය හා දිනය කවරේද;

(ii) එම ගැසට් පත්‍රය සංශෝධනය කරමින් දෙවන ගැසට් පත්‍රයක් නිකුත් කර තිබේද;

(iii) එසේ නම්, එම ගැසට් පත්‍රයේ අංකය හා දිනය කවරේද;

(iv) දෙවන ගැසට් පත්‍රය අනුව පවරා ගන්නා ලද භූමි ප්‍රමාණය කොපමණද;

(v) එම ගැසට් පත්‍රය අනුව ඉවත් කරන ලද භූමි ප්‍රමාණය කොපමණද;

(vi) මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புராதன மடுவன்வெல வலவ்வ நிர்மாணிக்கப் பட்ட காலப்பகுதி யாது என்பதையும்;

(ii) அதன் வரலாற்று முக்கியத்துவம் யாது என்பதையும்;

(iii) மடுவன்வெல வலவ்வ தொல்பொருள் திணைக் களத்தால் சட்டரீதியாகக் கையகப்படுத்தப்பட்ட திகதி யாது என்பதையும்;

(iv) கையகப்படுத்தும் சந்தர்ப்பத்தில் அதன் உரிமையாளர் யார் என்பதையும்;

(v) கையகப்படுத்திய காணியின் விஸ்தீரணம் யாது என்பதையும்;

(vi) அற்காகச் செலுத்தப்பட்ட மதிப்பீட்டுப் பெறுமதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தொல்பொருள் திணைக்களம் மடுவன்வெல வலவ்வவை கையகப்படுத்துதல் தொடர்பாக வெளியிடப்பட்ட முதல் வர்த்தமானப் பத்திரிகையின் இலக்கம் மற்றும் திகதி யாது என்பதையும்;

(ii) மேற்படி வர்த்தமானப் பத்திரிகையைத் திருத்தம் செய்து இரண்டாவது வர்த்தமானப் பத்திரிகையொன்று வெளியிடப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி வர்த்தமானப் பத்திரிகையின் இலக்கம் மற்றும் திகதி யாது என்பதையும்;

(iv) இரண்டாவது வர்த்தமானப் பத்திரிகைக்கு அமைவாக கையகப்படுத்திய காணியின் விஸ்தீரணம் யாது என்பதையும்;

(v) மேற்படி வர்த்தமானப் பத்திரிகைக்கு அமைவாக நீக்கப்பட்ட காணியின் விஸ்தீரணம் யாது என்பதையும்;

(vi) இது தொடர்பில் முறையான விசாரணையொன்று மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) the period during which the historic Maduwanwela Walawwa was constructed;

(ii) its historical value;

(iii) the date on which the Maduwanwela Walawwa was officially taken over by the Department of Archaeology;

(iv) the owner of it at the time of the said takeover;

(v) the extent of land that was taken over; and

(vi) the assessed value that was paid for it?

(b) Will he also inform this House -

(i) the date and the number of the first Gazette issued regarding the takeover of Maduwanwela Walawwa by the Department of Archaeology;

(ii) whether a second Gazette had been issued amending the aforementioned first Gazette;

(iii) if so, the number and date of the said Gazette;

(iv) the extent of land that had been taken over under the second Gazette;

(v) the extent of land that had been excluded under that particular Gazette; and

(vi) whether a proper investigation is being conducted regarding this?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වර්තමාන මඩුවන්වෙල වලව්ව එම පරපුරේ දීර්ඝ කාලීන ඉදිකිරීම් විකාශනයක ප්‍රතිඵලයකි. ක්‍රිස්තු වර්ෂ 1700ට පූර්වයේ කටු මැටි බිත්තියෙන් ඉදිකර තිබුණු මඩුවන්වෙල මුල්ම නිවහන ක්‍රිස්තු වර්ෂ 1700න් පසුව සුදු හුනු පිරියම් කර උළු සෙවිලි කරන ලද වලව්වක් බවට පත්වී ඇත. පසුව මෙම වලව්වේ වාසය කරන ලද මඩුවන්වෙල පරම්පරා කිහිපයක ප්‍රධානීන් වරින් වර මෙම වලව්ව සංවර්ධනය කර තිබෙනවා. එම ඉදිකිරීම් 1905.01.01 දින අවසන් කර ඇත.

(ii) මඩුවන්වෙල වලව්ව නිර්මාණය කරන ලද පරපුරට හා මෙම වලව්වට 16වන සියවසේ සිට 20වන සියවසේ මුල් භාගය දක්වා දිවෙන ඉතිහාසයක් තිබේ. මෙම වලව්ව වාස්තු විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක, මොසෙයික් කලාව යන කරුණු මත මෙරට ඉතිහාසය තුළ සුවිශේෂී තත්ත්වයක් නිරූපණය කරනවා. ඒ අනුව මෙහි සන්දර්භය ඓතිහාසික වශයෙන් වැදගත් වෙනවා.

(iii) 1978.10.18වන දින මඩුවන්වෙල වලව්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර දී තිබෙනවා.

(iv) එෆ්.පී. ඉලංගකෝන් මහතා සහ එල්.සී. සෙනෙවිරත්න මහතා යන අය තමයි අයිතිකරුවන් හැටියට ඉඳලා තිබෙන්නේ.

(v) 883 දරන ගම් සිතියම, 1699 දරන 1975.08.31 දරන මිනින්දෝරු සිතියමට අයත් අක්කර 13යි, රූඩ් 3යි, පර්චස් 13ක් වලව්ව සමඟ භාර දී තිබෙනවා.

(vi) රත්නපුර දිසාපති විසින් පුරාවිද්‍යා කොමසාරිස් අමතන ලද 1986.05.12වන දිනැති ලිපිය අනුව ඉඩමේ හිමිකරුවන්ට රු.85,500ක තක්සේරු මුදලක් ගෙවන ලද බව වාර්තා වනවා.

(ආ) (i) මෙම වලව්ව 1983.07.08 දින අංක 252/18 දරන අති විශේෂ ගැසට් පත්‍ර නිවේදනය මඟින් රජයට පවරාගෙන තිබෙනවා.

ඒ යටතේ අංක 883 දරන ගම් පිඹුරේ අංක 7 දරන උද්ධෘතයේ අංක 104 දරන බිම් කට්ටිය රජයට පවරාගෙන තිබෙනවා. 1999.12.31 දින අංක 1113 දරන ගැසට් පත්‍රය මඟින් මඩුවන්වෙල වලව්ව ගොඩනැඟිල්ලට යාර 400ක ආරක්ෂණ ප්‍රේරණ කලාපය ද වෙන්කර තිබෙනවා.

මඩුවන්වෙල වලව්ව සහ එම පරිශ්‍රය -ග.පි. 883 අතිරේක පත්‍ර අංක 4 දරන පිඹුරේ කැබලි අංක 104 පෙන්නුම් කොට ඇති කොටස- අක්කර 7යි, රූඩ් 0යි. පර්චස් 23ක විශාලත්වයෙන් යුතුව 2006.07.21 දින අංක 1455 දරන ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යා රක්ෂිතයක් විය යුතු බවට නිවේදනය කර තිබෙනවා.

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

(ii) රජයට පවරා ගැනීම සම්බන්ධයෙන් නිකුත් කර තිබෙන ගැසට් නිවේදනය හෝ පුරාවිද්‍යා රක්ෂිතයක් වශයෙන් ප්‍රකාශයට පත් කර තිබෙන ගැසට් නිවේදන නැවත සංශෝධනය කර නැහැ.

(iii) ගැසට් පත්‍රයේ අංකය හා දිනය මා කලින් සඳහන් කළා.

(iv) ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මෙතැනින් තමයි මේ ගැටලුව මුණ ගැහෙන්නේ.

මෙහිදී දෙවන ගැසට් පත්‍රයක් ලෙස අදහස් කරනුයේ, පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද 2006.07.21 දින අංක 1455 දරන ගැසට් පත්‍රය නම් එහිදී -ග.පි. 883 අතිරේක පත්‍ර අංක 4 දරන පිඹුරේ කැබලි අංක 104 පෙන්නුම් කොට ඇති කොටස- අක්කර 7යි, රූඩ් 0යි, පර්චස් 23ක විශාලත්වයෙන් යුතු වලව්ව සහිත ඉඩම තමයි මේ අදහස් කරන්නේ.

(v) 1978.10.18වන දින 883 දරන ගම් සිතියම, 1699 දරන 1975.08.31 දිනැති මිනින්දෝරු සිතියමට අයත් අක්කර 13යි, රූඩ් 3යි, පර්චස් 13ක වලව්ව සමඟ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර දීලා තිබෙනවා.

නමුදු 2006.07.21 දින අංක 1455 දරන ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත්තේ අක්කර 7යි, රූඩ් 0යි, පර්චස් 23ක භූමියකි. එය මා කලින් සඳහන් කළා, ඒ අනුව භාර දෙන ලද හා පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති භූමි ප්‍රමාණයේ වෙනස වන්නේ අක්කර 6යි, රූඩ් 2යි, පර්චස් 30කි.

(vi) මේ පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය -එවකට පැවති අමාත්‍යාංශය- අවස්ථා රාශියකදී ලිපි හුවමාරු කර ගැනීම්, ඒකාබද්ධ රැස්වීම් පැවැත්වීම් සිදු කර ඇත. නමුදු, අවසන් තීරණයක් කරා එළඹ නැහැ.

(ඇ) අදාළ නොවේ.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා මඩුවන්වෙල වලව්ව පිළිබඳව විස්තරාත්මක පිළිතුරක් ලබා දුන්නා. අපි දන්නවා, මේ වලව්වට අවුරුදු 300ක පමණ ඉතිහාසයක් වාගේම ඒ ගොඩනැඟිලිවලටත් අවුරුදු 100කට අධික පුරාවෘත්තයක් තිබෙන බව. ඒ ඓතිහාසික භූමියේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ඒ ගොඩනැඟිල්ල මැද මිදුල් 21ක් සහ කාමර 120ක් වාගේ ප්‍රමාණයකින් යුක්ත අතිදැවැන්ත නිර්මාණයක්. ඒක තමයි එහි විශේෂත්වය. ඒ කාලයත් එක්ක බලනකොට ඒක විශේෂිතයි. ඒ වාගේම අද දක්වා මෙය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආරක්ෂා කර ගනිමින් තිබෙනවා. ගරු කථානායකතුමනි, නමුත් තිබෙන ගැටලුව තමයි, 1978.10.18වන දින පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වන්දි ගෙවීම සහිතව අක්කර 13, රූඩ් 3, පර්චස් 13ක වාගේ ප්‍රමාණයක් පවරා ගෙන තිබීම. 2006.07.21වැනි දින නැවත වෙනත් ගැසට් පත්‍රයක් මඟින් අක්කර 7, පර්චස් 23ක් දක්වා ඒ ප්‍රමාණය අඩු කරගෙන තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් මේ වෙනකොට ඒ ප්‍රදේශයේ යම් යම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මොකද, වර්තමානයේ අර ගැසට් එකට අනුව යම් පිරිසක් එය අත්පත් කර ගැනීමක් කරමින් ඉන්නවා.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් පළමුවන අතුරු ප්‍රශ්නය හැටියට අහන්නේ, 1978 දහවන මාසයේ නිකුත් කළ මුල් ගැසට් එකත්, 2006දී නිකුත් කළ දෙවන ගැසට් එකත් අතර පරතරය ඇතුළත යම් භූමි ප්‍රමාණයක් මේ ඓතිහාසික භූමියෙන් ඉවත් වුණා කියන එක සම්බන්ධව අමාත්‍යාංශය වශයෙන් කරන ලද සමීක්ෂණවලින් සහ ඒ අදාළ දේවලින් තහවුරු වෙලා තිබෙනවාද, ඒ අනුව යම් ප්‍රමාණයක් මේ වෙනකොට අහිමි වෙලා තිබෙනවාද කියන එකයි.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය පැහැදිලියි. රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන ඓතිහාසික බවින් අනූන තැනක්, මේක. මෙය මෑත කාලයේදීත් කිහිප වතාවක් මගේ පෞද්ගලික නිරීක්ෂණයට ලක් වුණා. මේ පිළිබඳ පූර්ණ පරීක්ෂණයක් තවදුරටත් කළ යුතුව තිබෙනවා. මම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගෙන් මේ ගැන විමසා රත්නපුර සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ හරහා මේ සම්බන්ධව පූර්ණ වාර්තාවක් ගෙන්වාගෙන තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒකෙත් සඳහන් වෙනවා, ඔබතුමා කියන කාරණය. ඔය කාරණයට නතු වෙන්නේ දෙවැනි ගැසට් පත්‍රය මඟින් පෙන්වා දෙන මඩුවන්වෙල වලව්වට අහිමි වුණු භූමි ප්‍රමාණය. අක්කර 6යි, රූඩ් 1යි, පර්චස් 30ක ප්‍රමාණය සම්බන්ධව තමයි මේ ගැටලුව තිබෙන්නේ. මේ වලව්වට නුදුරුව -බොහොම සමීපව- තිබෙන ඉඩම් කොටසක් විකිණිලා එහි පෞද්ගලික ඉදිකිරීම් සිදු කරමින් තිබෙනවා. මම හිතන විධියට, ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා සහ ඒ පළාත්බද සියලුදෙනා උනන්දු වෙමින් සිටින්නේ මේ ඓතිහාසික ස්මාරකය සමීපයේ මේ වාගේ වෙළෙඳ -වාණිජ- ඉදිකිරීම් සිදු වෙන එක පිළිබඳවයි. මේ පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් මා වෙත සපයා තිබෙන වාර්තාවේ තිබෙනවා, නැවත භාරකාරයන් හරහා තවත් පිරිසකට මේ ඉඩම් විකිණීම සම්බන්ධ ගැටලුව අවසන් වෙලා නැති බව. එහි නොපැහැදිලි තැන් රාශියක් තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, මම මේ පිළිබඳ අධ්‍යයනය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම නතර කරලා නැහැ. පූර්ණ පරීක්ෂණය අවසන් කරලා ඔබතුමාට නිවැරදි, නිරවුල් තත්ත්වය මම වාර්තා කරනවා. ඒ වාගේම, මගේ අවධානය යොමු වෙනවා, මේ පුරාවිද්‍යා ස්මාරකය පත් වූ පරිදි භූමි දර්ශනයත් එක්කම රැක ගැනීම සම්බන්ධව.

**ගරු උපුල් කිත්සිරි මහතා**
(மாண்புமிகு உபுல் கித்சிறி)
(The Hon. Upul Kithsiri)

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමෙන් මැදිහත් වෙලා කඩිනමින් පරීක්ෂණයක් කරලා, මේ ඓතිහාසික භූමිය රැකගන්න අමාත්‍යාංශය හැටියට ක්‍රියාමාර්ගයක් ගන්නවාද, එය ගත හැකිද?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නවා. ඇත්තටම, අමුතුවෙන් ක්‍රියාමාර්ගයක් ගන්න නැහැ. මම දැනටමත් මැදිහත්වීම් කරලා තිබෙන්නේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සහ මම කලින් සඳහන් කරපු ආයතන කිහිපය -කොලොන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය- එක්තැන් කරගෙන විධිමත් පරීක්ෂණ ඉතා ඉක්මනින් නිම කරලා

තොරතුරු වාර්තා කරනවා. අපේ අපේක්ෂාව තමයි, මේ මහා ස්මාරකය පුරාවිද්‍යා විධි නියමයන්ට අනුව අවට භූමි දර්ශනය ආරක්ෂා කරගෙන පත් වූ පරිදි ජාතියට හිමි කර දීම.

බොහොම ස්තුතියි.

## පළාත් පාලන ආයතන විසින් වීදි ලාම්පු භාවිතය: අය කරන ගාස්තු

உள்ளூராட்சி மன்றங்களால் வீதிகளுக்கு ஒளியூட்டும் தெரு விளக்குகள் பயன்படுத்தப்படல்: அறவிடப்படும் கட்டணம்

USE OF STREET LIGHTING LAMPS BY LOCAL AUTHORITIES: CHARGES LEVIED

1477/202

**5. ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ සියලුම පළාත් පාලන ආයතන වීදි ආලෝකකරණ විදුලි පහන් භාවිත කරන බවත්;

(ii) ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය මේ දක්වා කිසිදු අය කිරීමක් සිදු නොකළ බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) වීදි ආලෝකකරණ විදුලි පහන් භාවිත කිරීම වෙනුවෙන් පළාත් පාලන ආයතනවලින් මුදල් අය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය තීරණය කර තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ අය කිරීම් ක්‍රමවේදය කවරේද;

(iii) ඉහත අය කිරීම හේතුවෙන් ආදායම් අඩු පළාත් පාලන ආයතන අපහසුතාවට පත් වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) இலங்கையின் சகல உள்ளூராட்சி மன்றங்களும் வீதிகளுக்கு ஒளியூட்டும் தெரு விளக்குகளைப் பயன்படுத்துகின்றன என்பதையும்;

(ii) இலங்கை மின்சார சபை இதுவரை அதற்கு எவ்விதக் கட்டணங்களையும் அறவிடவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ)(i) வீதிகளுக்கு ஒளியூட்டும் தெரு விளக்குகளைப் பயன்படுத்துவதற்காக உள்ளூராட்சி மன்றங் களிடம் கட்டணத்தை அறவிடுவதற்கு இலங்கை மின்சார சபை தீர்மானித்துள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அது தொடர்பான அறவிடல் வழிமுறை யாது என்பதையும்;

(iii) மேற்படி அறவிடலின் காரணமாக குறைந்த வருமானத்தைப் பெறும் உள்ளூராட்சி மன்றங்கள் சிரமத்துக்கு உள்ளாவதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அதற்குத் தீர்வு வழங்கப்படுமா என்பதையும்;

(v) ஆமெனில், அந்தத் தீர்வு யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Energy:

(a) Is he aware that -

(i) all local authorities in Sri Lanka use street lighting lamps; and

(ii) the Ceylon Electricity Board has not levied any charges on that so far?

(b) Will he inform this House -

(i) whether the Ceylon Electricity Board has decided to impose charges on local authorities for the use of street lighting lamps;

(ii) if so, the relevant billing mechanism used for that;

(iii) whether he agrees that the above charge will cause difficulties for low- income local authorities;

(iv) if so, whether a solution will be provided for that; and

(v) if so, such solution?

(c) If not, why?

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) විදුලිබල මණ්ඩලය මේ සඳහා මාසිකව විදුලි බිල්පත් නිකුත් කළද, අදාළ පළාත් පාලන ආයතන විදුලි බිල්පත් ගෙවීම් කිරීම සඳහා කටයුතු කර නොමැත.

(ආ) (i) ඔව්, ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර චක්‍රලේඛයකට අනුව සියලුම ස්ථාපිත වීදි ලාම්පු වෙනුවෙන් අදාළ පළාත් පාලන ආයතන සඳහා ගිණුම් ආරම්භ කිරීමට උපදෙස් ලබා දී ඇත.

(ii) වීදි ලාම්පු සඳහා වෙනම අය ක්‍රමයක් මහජන උපයෝගිතා කොමිෂන් සභාව මඟින් අනුමත කර ඇති අතර, ඉහත ගිණුම්වලට අනුව පාවිච්චි කරන ලද විදුලි ඒකක ප්‍රමාණය සඳහා අදාළ ගෙවීම් පළාත් පාලන ආයතන මඟින් සිදු කළ යුතු වේ.

(iii) විදුලිය සැපයීම සඳහා දරන පිරිවැය අදාළ පාරිභෝගිකයින්ගෙන් අය කර ගැනීම ප්‍රතිපත්තිය වන නිසා සපයනු ලබන විදුලිය වෙනුවෙන් මුදල් අය කර ගැනීම සිදු කළ යුතුව තිබේ.

(iv) මේ පිළිබඳව ආණ්ඩුව විධියට විසඳුමක් ලබාදීමට අවශ්‍ය සාකච්ඡා දැනටමත් සිදුවෙමින් පවතී.

(v) ඉහත සාකච්ඡාවල ප්‍රතිඵල අනුව සුදුසු විසඳුමක් ලබා දීමට බලාපොරොත්තු වේ.

(ඇ) අදාළ නැත.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ වනවිට සියලුම වීදි පහන් අලුතින් ස්ථාපිත කිරීම සම්බන්ධ කාරණය වාරණයකට ලක් වෙලා තිබෙනවා. මෙහි තිබෙන ඇත්ත ප්‍රශ්නය මේකයි. පසුගිය කාල සීමාව තුළ පළාත් පාලන ආයතනවල සිටි සමහර සභාපතිවරු, මන්ත්‍රීවරු තම තමන්ගේ හිතවතුන්ට අවශ්‍ය පරිදි වීදි පහන් ස්ථාපනය කරන්න අවස්ථාව ලබා දීලා තිබුණා. ඒ නිසා අදාළ ස්ථානවල නොව අනවශ්‍ය ස්ථානවල අවිධිමත් විධියට වීදි පහන් ස්ථාපනය කිරීම නිසා වීදි පහන් වැඩි ප්‍රමාණයක් පරිහරණය කරනවා කියන එක පේන්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නිසි නියාමනයක් කරලා වීදි පහන් ස්ථාපනය කිරීම අදාළ පළාත් පාලන ආයතනවල අධීක්ෂණය යටතේ සිදුකිරීමට මොන යම් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට අමාත්‍යාංශයක් විධියට ඔබතුමන්ලා සැදී පැහැදී ඉන්නවාද, ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් යොදා ගන්න කටයුතු කරනවාද කියලා මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, එතුමා ඇහුවේ බොහොම වැදගත් ප්‍රශ්නයක්. ලංකා විදුලිබල මණ්ඩලය විධියටත්, අපේ අමාත්‍යාංශය විධියටත් වීදි ලාම්පු සවි කිරීම පිළිබඳව මේ දක්වා බොහොම ගැටලු තිබෙනවා. නමුත්, ඒකේ වගකීම තිබෙන්නේ අදාළ පළාත් පාලන ආයතනවලට පමණයි. මොකද, අපි කරන්නේ ඒ සඳහා අවශ්‍ය විදුලි සැපයුම ඒකට සම්බන්ධ කිරීම පමණයි. වීදි ලාම්පු සවි කිරීම හා ඒවා නඩත්තු කිරීම අදාළ පළාත් පාලන ආයතනයේ වගකීමක් විධියට තමයි පවරලා තිබෙන්නේ. ඒ අනුව අත්‍යවශ්‍ය නොවන තැන්වලට සවි කරලා, අත්‍යවශ්‍ය තැන්වලට සවි නොකිරීම වාගේ ගැටලුත් තිබෙනවා. මොකද, ඒක favours අනුව තමයි මේ දක්වාම කෙරුණේ. මේ පිළිබඳව බලශක්ති අමාත්‍යාංශයට පළාත් පාලන ආයතනවලට එරෙහිව නීති පනවන්න බැහැ. ඒ නිසා අපි ආණ්ඩුව විධියට ඒ පිළිබඳව පුළුල්ව බලලා, සමාජ වගකීමක් විධියට, ඒ වාගේම ජනතාවට වෙන්න ඕනෑ සේවාවක් විධියට, මේවා සවි කිරීම සහ නඩත්තු කිරීම කරන්නේ කොහොමද, ඒ වාගේම ඊට විදුලිය ලබා දීමට අදාළ පිරිවැය අපි කොහොමද ලබා ගන්නේ කියලා සැලසුම් කරනවා. මොකද, ආදායම් ගොඩක් අඩු පළාත් පාලන ආයතන තිබෙනවා. අපි ඒ ගැනත් අවධානය යොමු කරනවා. ආදායම් වැඩියෙන් තිබෙන ඒවාත් ගෙවන්නේ නැහැ. කොළඹ මහ නගර සභාව පවා සත පහක්වත් ගෙවන්නේ නැහැ. එවැනි ආයතන එක්ක සාකච්ඡා කරලා, රටක් විධියට අපි යම් වැඩ පිළිවෙළකට යන්න සැලසුම් කරගෙන යනවා. මම හිතන විධියට, ලබන අවුරුද්දේ අපට ඒක නිමා කර ගන්න පුළුවන් වෙයි.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමාගෙනුත් කියැවුණා, පළාත් පාලන ආයතනවලින් මෙම මුදල් අය කර ගැනීමේදී විෂමතා තිබෙනවා කියන එක. මොකද, සමහර පළාත් පාලන ආයතන, ඒ ආයතනවල නඩත්තුව සඳහාවත් ආදායම් ලබන තත්ත්වයකට පත්වෙලා නැහැ. ඒ නිසා එම ආයතන නඩත්තු කිරීම ප්‍රශ්නයක් වෙලා තිබියදී, මෙවැනි විදුලි බිලක් ලබා දීම සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා සමහර පළාත් පාලන ආයතන මේ වෙනකොටත් තමන්ට අයත් වීදි පහන් ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ගරු ඇමතිතුමනි, රටක් අඳුරේ තියලා වැඩ කටයුතු කරන්න අපහසුයි. ඒ නිසා නව වැඩ පිළිවෙළ යටතේ, අලුත් ප්‍රතිසංස්කරණ යටතේ මේකට උත්තරයක් ලබා දීමට ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ තුළ යම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් සිටිනවා ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, මගේ කලින් පිළිතුරේත් ඒක සඳහන් වුණා. ඇත්තටම මේක හරි විධියට කරන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. අපි රජය විධියට මෙතැනදී බලන්නේ, පළාත් පාලන ආයතන ද, බලශක්ති අමාත්‍යාංශය ද කියන එක නොවෙයි. ඒක නිසා අපි මෙතැනදී නිවැරදිව අවශ්‍ය තැන්වලට විදුලි සැපයුම ලබා දීම වාගේම අවශ්‍ය විධියට ඒවා සවි කිරීමත්, නඩත්තු කිරීමත් කළ යුතු වුවත්, එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. මේවා on කිරීමේ, off කිරීමේ ඉඳන් ප්‍රශ්නයක් තිබෙනවා. බොහෝ අවස්ථාවලදී අපි පෞද්ගලිකවත් අත් දකිනවා, මේ වීදි පහන් on කරනවා විතරයි, off කරන්න ලංකාවේ කවුරුවත් නැහැ. එවැනි ප්‍රශ්න තිබෙනවා. මොකද, තමන්ගේ ගේ ළඟම තිබෙන වීදි පහනුත් සවස 4, 5 වෙනකොට on කරනවා. හැබැයි, off කරන්නේ නැහැ. අපි ඒවාටත් එක්ක විසඳුම් සොයන්න ඕනෑ. අපි විදුලිය පරිභෝජනය කාර්යක්ෂමව සහ අරපිරිමැස්මෙන් කරන්න ඕනෑ. මොකද, ඒ වෙනුවෙන් ලොකු මුදලක් යනවා. ඉදිරියේදී මේ වැය බර රජය හෝ ලංකා විදුලිබල මණ්ඩලයට අනුබද්ධ ආයතනවලින් දරන්න තීරණය කළොත්, වීදි පහනක් තමන්ගේ ගේ ඉස්සරහා නැති, වීදි පහනක් තමන්ගේ පාරේ නැති පාරිභෝගිකයාගේ විදුලි බිලෙනුත් අය වෙලා තමයි ඒක නඩත්තු වෙන්නේ. ඒ ගැන වගකීමෙන්, අපි සැලසුමකට අනුව බලන්නේ ඒකයි. හැම පැත්තක්ම බලලා ඉදිරියේදී ඒක ක්‍රියාත්මක කරනවා. ඒ වැඩ පිළිවෙළ අපි සාර්ථකව කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## 2015-2023 දක්වා වී සඳහා අවම ස්ථාවර මිල: විස්තර

2015-2023 வரை நெல்லுக்கான குறைந்தபட்ச நிர்ணய விலை: விபரம்

MINIMUM FIXED PRICE FOR PADDY FROM 2015-2023: DETAILS

1312/2025

**2. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු සුදත් බලගල්ල මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு சுதத் பலகல்ல சார்பாக )
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Sudath Balagalla)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2023 දක්වා රජය විසින් වී කිලෝ එකක් මිල දී ගැනීම සඳහා නියම කරන ලද අවම

මිල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට වී අලෙවි මණ්ඩලය සතු, වී ප්‍රවාහනය කළ හැකි ලොරි රථ සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට වී අලෙවි මණ්ඩලය සතු, වී මෝල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2023ஆம் ஆண்டு வரையான காலப்பகுதியில் ஒரு கிலோகிராம் நெல்லை கொள்வனவு செய்வதற்கு அரசாங் கத்தால் நிர்ணயிக்கப்பட்ட குறைந்தபட்ச விலை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) தற்போது நெல் சந்தைப்படுத்தல் சபையிடம் நெல்லை ஏற்றிச் செல்லக்கூடிய எத்தனை லொறிகள் உள்ளன என்பதையும்;

(iii) இன்றளவில் நெல் சந்தைப்படுத்தல் சபைக்குச் சொந்தமான அரிசி ஆலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House-

(i) the minimum price fixed by the Government for purchasing one kilogram of paddy in each year during the period from the year 2015 to 2023, separately;

(ii) the number of lorries currently owned by the Paddy Marketing Board, which are available for transporting paddy; and

(iii) the number of rice mills currently owned by the Paddy Marketing Board?

(b) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | කන්නය | රජයේ වී වල 1kg ක සහතික මිල රු. | | |
|---|---|---|---|---|
| | | කීරි සම්බා | සම්බා | නාඩු |
| 2015 | 2014/15 මහ | 50.00 | 50.00 | 45.00 |
| | 2015 යල | 50.00 | 50.00 | 45.00 |
| 2016 | 2015/16 මහ | 50.00 | 41.00 | 38.00 |
| | 2016 යල | 50.00 | 41.00 | 38.00 |
| 2017 | 2016/17 මහ | 41.00 | 41.00 | 38.00 |
| | 2017 යල | 41.00 | 41.00 | 38.00 |
| 2018 | 2017/18 මහ | 41.00 | 41.00 | 38.00 |
| | 2018 යල | 41.00 | 41.00 | 38.00 |
| 2019 | 2018/19 මහ | 41.00 | 41.00 | 38.00 |
| | 2019 යල | 41.00 | 41.00 | 38.00 |
| 2020 | 2019/20 මහ | 50.00 | 50.00 | 50.00 |
| | 2020 යල | 50.00 | 50.00 | 50.00 |
| 2021 | 2020/21 මහ | 52.00 | 52.00 | 50.00 |
| | | 54.00 | 54.00 | 52.00 |
| | | 56.50 | 56.50 | 56.50 |
| | 2021 යල | 55.00 | 52.00 | 50.00 |
| | | 55.00 | 52.00 | 55.00 |
| 2022 | 2021/22 මහ | 95.00 | 92.00 | 90.00 |
| | 2022 යල | 130.00 | 125.00 | 120.00 |
| 2023 | 2022/23 මහ | - | - | - |
| | 2023 යල | 110.00 | 100.00 | 95.00 |

(ii) ලොරි රථ 01යි.

(iii) වී මෝල් නොමැත.

(ආ) (අ) ප්‍රශ්නයේ (iii) වන කොටසට අදාළව වී අලෙවි මණ්ඩලය මඟින් වී තොග සහල් කිරීමේ අවශ්‍යතාවක් ඇති වූ අවස්ථාවල සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් මඟින් සිදු කරනු ලැබේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### පිරිවෙන් අධ්‍යාපනය සඳහා ප්‍රතිසංස්කරණ
### பிரிவெனாக் கல்விக்கான சீர்திருத்தங்கள்
### REFORMS TO PIRIVEN EDUCATION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදය මඟින් ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන බවත්, අනෙකුත් සියලු ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

අතරම, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීමක් විය යුතු බවත් අවධාරණය කර තිබේ. බුද්ධ ශාසනය මෙන්ම, බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස කටයුතු කරන සංඝයා වහන්සේලා ආරක්ෂා කිරීමත්, චිරාත් කාලයක් පැවැත ආ සහ පරපුරේ පිළිවෙත් හා ඊට ආවේණික සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමත් රජයේ මුඛ්‍ය පරමාර්ථය විය යුතු පසුබිමක වර්තමාන රජය එම සංස්කෘතික උරුමයන් නොසලකා හරිමින් කටයුතු කරන ආකාරය පෙනෙන්නට තිබෙන බැවින්, කරුණු පැහැදිලි කර ගැනීම සඳහා මම පහත සඳහන් ප්‍රශ්න රජය වෙත යොමු කරමි.

1. 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීම සඳහා රජය උත්සාහ ගනිමින් සිටින්නේද? එසේ නම්, එම යෝජිත සංශෝධන මොනවාද? මෙම පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීමට පසුබිම් වූ කරුණු කාරණා කවරේද?

2. පිරිවෙන් අධ්‍යාපන පනත සංශෝධනය කිරීම හරහා කෘත්‍යාධිකාරි හිමිවරුන් වෙත පනත මඟින් ලබා දී ඇති බලතල සහ වරප්‍රසාද අහෝසි කිරීම සඳහා රජය උත්සාහ ගනිමින් සිටින්නේද? පිරිවෙන්හි ඉගැන්වීම් කටයුතු සිදු කරන ගිහි ආචාර්යවරුන් වෙනුවෙන් පිරිවෙන් අධ්‍යාපන පනතට පටහැනි ආකාරයේ බලතල හෝ වරප්‍රසාද ලබා දීම සඳහා රජය උත්සාහ කරමින් සිටින්නේද? එසේ නම් ඊට පාදක වූ කරුණු මොනවාද?

   විශේෂයෙන්ම පිරිවෙන් අධ්‍යාපනය කියන්නේ සම්භාව්‍යවත් අධ්‍යාපනයක්. ඒක සම්ප්‍රදායානුකූල ඉගැන්වීමේ රටාවෙන් බැහැරව ක්‍රියාත්මක වන ක්‍රමවේදයක්. ඒ නිසා මේ ප්‍රශ්නයට පැහැදිලි පිළිතුරක් අපි රජයෙන් බලාපොරොත්තු වෙනවා.

3. පිරිවෙන් අධ්‍යාපනයේ විෂය නිර්දේශය සංශෝධනය කිරීම සඳහා යෝජිත රජයේ ඉදිරි වැඩ පිළිවෙළ කුමක්ද? මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ කුමන විෂයයන් අරබයාද? මේ සඳහා යෝජිත කාල රාමුව කුමක්ද?

4. බුද්ධ ශාසනය ආරක්ෂා කර ගැනීම සඳහා කැපවන ශාසන ළැදි භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කර ගැනීම සඳහා රජය සතු නිශ්චිත වැඩ පිළිවෙළක් පවතින්නේද? බුදු දහමට අගෞරව වන අරමුණෙන් හා ශාසන විරෝධී ආකාරයෙන් කටයුතු කරන භික්ෂූන් වහන්සේලා ශාසනයෙන් ඉවත් කිරීම සඳහා වන වැඩ පිළිවෙළක් රජය සතු වන්නේද? නොඑසේ නම් ඒ මන්ද? ඒ සඳහා පවතින නීති ශක්තිමත් කළ යුතු බව රජය පිළිගන්නේද? නොඑසේ නම් ඒ මන්ද?

   විශේෂයෙන්ම බුදු දහම විකෘති කරන විවිධ කණ්ඩායම් අද නිර්මාණය වෙලා තිබෙනවා. විවිධ ආකාරයේ පාර්ශ්වකරුවන්ගේ දේශීය හා විදේශීය අනුග්‍රහයන් ලබා ගෙනයි ඒ විකෘති කිරීම්වලට ඒ අය මුල පුරන්නේ. රජය මේ පිළිබඳව වහාම පියවරක් ගත යුතුයි. රජය ගන්නා පියවර මොකක්ද කියා මම අහන්න කැමැතියි.

5. 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 41 සහ 42 වගන්ති මඟින් සහ පරපුරේ ආරක්ෂාව වෙනුවෙන් ලබා දී ඇති නීත්‍යානුකූල ආරක්ෂාව ප්‍රමාණවත් බව රජය සිතන්නේද? නොඑසේ නම්, එම වගන්ති සංශෝධනය කිරීම සඳහා යෝජිත රජයේ ඉදිරි වැඩ පිළිවෙළ කුමක්ද?

   ඇත්ත වශයෙන්ම මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලාගේ ඉල්ලීමක් තමයි එකී ආඥා පනතේ 41 සහ 42 වගන්ති සංශෝධනය කරලා සහ පරපුරට ලබා දෙන ආරක්ෂාව තවදුරටත් ශක්තිමත් කරන්න කියන එක. ඒ වෙනුවෙන් රජය ගන්නා පියවර මොකක්ද කියලා අපි අහන්න කැමැතියි.

6. 2025 වසරේදී බුද්ධශාසන අමාත්‍යාංශයට වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද? එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය කෙබඳුද? 2026 වසරේදී බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ බුද්ධ ශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් රජය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් මොනවාද? එම වැඩසටහන් වෙනුවෙන් මෙවර අයවැයේ දී වෙන් කළ ප්‍රතිපාදන වෙන් වෙන්ව දක්වන්නේද?

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, සම්ප්‍රදායානුකූලව ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න යොමු වෙන්නේ, එක අමාත්‍යාංශයකට අදාළව නිශ්චිත ප්‍රශ්න. ගරු විපක්ෂ නායකතුමා ඇත්ත වශයෙන්ම මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ, අමාත්‍යාංශ දෙකකට අදාළ ප්‍රශ්න. නමුත් අපි ඒ ගැන නොසලකා ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ඉදිරිපත් කරලා තිබෙන මුල් ප්‍රශ්න තුනට මම පිළිතුරු ලබා දෙනවා. බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි ඇමතිතුමා ඉතිරි ප්‍රශ්න තුනට පිළිතුරු ලබා දෙයි.

නමුත් ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න යොමු කරනකොට නිශ්චිත අමාත්‍යාංශයකට අදාළව ප්‍රශ්නය යොමු කළ යුතුයි කියන උපදෙසත් ගරු විපක්ෂ නායකතුමාට ලබා දෙන්න කියලා.

1. (i) ඔව්.

   (ii) ගෞරවනීය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලා විසින් නම් කරන ලද නියෝජිත විද්වත් ස්වාමීන් වහන්සේලා ඇතුළත් සාමාජිකයන් හත්දෙනෙකුගෙන් සමන්විත විශේෂඥ කමිටුවක් විසින් වර්තමානයට ගැළපෙන අයුරින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහනට අනුකූලව සහ මුල් පනතෙහි සඳහන් විධිවිධාන හා නියෝගවලට හානියක් නොවන ආකාරයට පිරිවෙන් අධ්‍යාපන පනතට අවශ්‍ය සංශෝධන ඇතුළත් කෙටුම්පත සකස් කරගෙන යනු ලබයි.

   ගරු කථානායකතුමනි, අපේ ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලා එක්ක අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, පිරිවෙන් මණ්ඩලයේ උපදෙස් අනුව තමයි මේ කමිටුව පත් කරන්නේ. මොකද, අපි ඉතා හොඳින් දන්නවා, පිරිවෙන් අධ්‍යාපනය කියන්නේ ලංකාවේ සුවිශේෂ තැනක් ගන්නා දෙයක් බවත් ඒකට සුවිශේෂ කාර්යභාරයක් තිබෙන බවත්. ඒ කාර්යභාරයත්, ඒ සුවිශේෂීභාවයත් රැකගෙන,

වර්තමාන තත්ත්වයට මුහුණ දෙන විධියට ඒක ශක්තිමත් කළ යුතුයි කියන පදනමේ ඉඳගෙන තමයි අපි මේ ක්‍රියාවලිය ආරම්භ කරලා තිබෙන්නේ.

(iii) වර්තමාන පිරිවෙන් අධ්‍යාපන පනත වර්ෂ 45ක් පැරණි බැවින්, නූතන අධ්‍යාපන ක්‍රමවලට සහ කාලීන අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් එය වෙනස් කළ යුතු වේ. නිදසුනක් ලෙස, පරිවේණාචාර්යවරුන්හට රජයේ පාසල් ගුරුවරුන්ට හිමි වැටුප් පරිමාණ හා ශ්‍රේණි උසස්වීම් ආදී සියලු වරප්‍රසාද ලබා දී ඇති බැවින්, ඔවුන් බඳවා ගැනීම සඳහා සලකා බලනු ලබන අධ්‍යාපන සුදුසුකම් ආදී කරුණු සංශෝධනය කළ යුතු වේ.

තවද, පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලයේ සංයුතිය සහ විෂයමාලා ප්‍රතිසංස්කරණය වැනි කරුණු සංශෝධනය විය යුතු කරුණු වශයෙන් හඳුනාගෙන ඇත.

2. (i) නැත.

(ii) නැත.

(iii) අදාළ නොවේ.

3. (i) පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරලීම පිණිස පත් කරන ලද විශේෂඥ කමිටුව වෙත පිරිවෙන් අධ්‍යාපනයේ විෂය නිර්දේශ සංශෝධනය කිරීම පිළිබඳ පර්යේෂණ වාර්තාව සකස් කිරීමට අදාළ වගකීම පවරා ඇත. එම කමිටුව විසින් මේ වන විට පර්යේෂණ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, ජාතික අධ්‍යාපන ආයතනය සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව උක්ත නෛතික ක්‍රියාවලිය සිදු කරමින් පවතී. ජාතික පිරිවෙන් අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නෛතික රාමුව සකස් කිරීමෙන් අනතුරුව යෝජිත විෂය නිර්දේශ සංශෝධන වාර්තාවෙහි කෙටුම්පත පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය වෙත සහ ගෞරවනීය ත්‍රෛනිකායික මහානායක හිමිවරුන් වෙත ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

(ii) දැනට ක්‍රියාත්මක වන මූලික සහ මහ පිරිවෙන් හා විද්‍යායතන පිරිවෙන්වල විෂය නිර්දේශ සම්බන්ධ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

(iii) පර්යේෂණ වාර්තාව සකස් කිරීම - 2026.01.31
විෂයමාලා ප්‍රතිසංස්කරණ සකස් කිරීම - 2026
නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම - 2027
නව විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීම - 2028

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියට ස්තුතිවන්ත වෙනවා, ප්‍රශ්නයේ මුල් කොටසට පිළිතුරු දීම ගැන. අංක හතරේ සිට ඇති ප්‍රශ්නවලට මා පිළිතුරු ලබා දෙනවා.

4. (i) ඔව්.

(ii) ඔව්. බුද්ධශාසනය ආරක්ෂා කර ගැනීම සඳහා කැපවන ස්වාමීන් වහන්සේලාගේ ආරක්ෂාවට හා ශාසන විරෝධී කටයුතුවල නිරත ස්වාමීන් වහන්සේලා සම්බන්ධව රජය කටයුතු කරනුයේ අතිගෞරවනීය ත්‍රෛනිකායික මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා අනුවය. මහානායක ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා පරිදි පවතින නීති ශක්තිමත් කිරීමට රජය කටයුතු කරනු ලැබේ.

මේ වැඩ පිළිවෙළ තවදුරටත් ශක්තිමත් කරන්න ගෞරවනීය ශ්‍රීමත් මහානායක හිමිවරුන්ගේ උපදෙස් පරිදි අපි මුළු ත්‍රෛනිකායම නියෝජනය කෙරෙන විධියට පාර්ශ්ව 31ම කැඳවා බුද්ධශාසන සභාව පිහිටුවා ගත්තා. එතැනිනුත් හොඳ මහ පෙන්වීමක් අපට ලැබෙමින් තිබෙනවා මේ කාරණය ගැන.

(iii) අදාළ නොවේ.

(iv) ඔව්, තවදුරටත් ශක්තිමත් කළ යුතුයි.

(v) අදාළ නොවේ.

5. (i) ප්‍රමාණවත් නැත.

(ii) 1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥා පනතේ 41 හා 42 වගන්ති සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ගෙන අතිපූජ්‍ය ත්‍රෛනිකායික මහා නායක ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනා පරිදි කටයුතු කරමින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙතින් සංශෝධන සකස් කරගෙන නීතිපති නිරීක්ෂණ ලබා ගැනීම සඳහා දැන් යොමු කර තිබෙනවා. දීර්ඝ කාලීන ප්‍රයත්නයක් අනුව දැන් ඒක නීතිපතිගේ නිරීක්ෂණ සඳහා යොමු වෙලා තිබෙනවා. නීතිපති නිරීක්ෂණ අනුව ඉදිරි කටයුතු කරන්නයි අපේක්ෂා කරන්නේ. තව ඉතාම කුඩා පියවරක් විතරයි අපට එතැනදී ඉතුරු වෙලා තිබෙන්නේ.

6. (i) රුපියල් මිලියන 3,484ක් වෙන් වෙලා තිබෙනවා

(ii) 2025.09.30 දිනට වියදමේ ප්‍රගතිය රුපියල් මිලියන 968.8ක්.

මා සඳහන් කරන්නට ඕනෑ, මේ රුපියල් මිලියන තුන්දහස් ගණනින් රුපියල් මිලියන 968.8ක් මූල්‍ය ප්‍රගතියක් පෙන්වනකොට, භෞතික ප්‍රගතිය පෙන්වනකොට හැඟෙන්න පුළුවන් විශාල මුදලක් වියදම් වෙලා නැහැ කියලා. ඒ නිසා සඳහන් කරන්නට ඕනෑ, ඉන්දීය මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සූර්ය බලශක්ති ව්‍යාපෘතියට වෙන් වූ රුපියල් මිලියන 1,130ක් මේ ශීර්ෂයට ඇතුළත් වන බව. තව අපට ඉතුරු වෙලා තිබෙන්නේ රුපියල් මිලියන 853ක මුදලක් විතරයි. ඒ මුළු මුදල සඳහාම අපි මේ වන විටත් බැඳීම් ඇති කරගෙන කටයුතු කරමින් සිටිනවා. මෙම සියලු ව්‍යාපෘති දෙසැම්බර් මස 3වැනි සතිය වන විට අවසන් වනවා. ඒ අනුව මූල්‍ය හා භෞතික ප්‍රගතිය නිසැකවම සියයට 90 ඉක්මවනවා.

ඉන්දීය සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ගැනත් මම පොඩ්ඩක් කථා කරන්නම්. මේ සඳහා ඉඩම් 13ක් අපේ නිරීක්ෂණයට බඳුන් වුණා, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ඇතුළු ආනුෂංගික ආයතනත් එක්ක. මේ වන විට හම්බන්තොටින් අක්කර

[ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා]

25කට වැඩි ප්‍රමාණයක් තිබෙන ඉඩමක් අපි පවරාගෙන තිබෙනවා. ඒ නිසා ඒ මුදල වියදම් කිරීම ගැන ගැටලුවක් නැහැ. ඒ ව්‍යාපෘතිය හොඳින් ඉදිරියට යනවා. ඒ අනුව ඒ මූල්‍ය හා භෞතික ප්‍රගතිය අපට දෙසැම්බර් මස 3වැනි සතිය වනකොට ඉතා ඉහළ තැනකට පත් කර ගන්න පුළුවන්.

(iii) ප්‍රධාන ශීර්ෂ 3කින් අපේ ප්‍රතිපාදන වෙන් වනවා, ගරු කථානායකතුමනි.

එකක් තමයි, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් වැය වන ප්‍රතිපාදන. ඒ සම්බන්ධව ඇමුණුම 01හි දීර්ඝව වෙන වෙනම සඳහන් කරලා තිබෙනවා. මම ඉදිරියේදී ඒ ගැන කියන්නම්. ඊළඟට, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් අය වැය ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව ඇමුණුම 02 යටතේ සඳහන් කර තිබෙනවා. ඊළඟට, බුද්ධශාසන අරමුදල මඟින් අරමුදලේ ප්‍රතිපාදන යටතේ වෙන් වන ඒවා තිබෙනවා. ඒ සම්බන්ධව ඇමුණුම 03 යටතේ දීර්ඝව විස්තර කර තිබෙනවා.

ගරු විපක්ෂ නායකුමනි, එම වැඩසටහන් වෙනුවෙන් මෙවර අය වැයේදී වෙන් කළ ප්‍රතිපාදන වෙන් වෙන්ව දන්වන්න කියලා ඔබතුමා සඳහන් කර තිබෙනවා. අමාත්‍යාංශය මඟින් අය වැය ප්‍රතිපාදන යටතේ අපි රුපියල් මිලියන 1,620ක් වෙන් කරලා තිබෙනවා. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව පාර්ශ්වයෙන් රුපියල් මිලියන 463.50ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම බුද්ධශාසන අරමුදල මඟින් රුපියල් මිලියන 70.3ක් වෙන් කරලා තිබෙනවා. මුළු ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 2,154ක් වෙන් වනවා. මම කලින් සඳහන් කළා වාගේ, ඇමුණුමේ දීර්ඝව විස්තර සඳහන් කර තිබෙනවා. ඔබතුමාට බලා ගන්න ඇමුණුම් 02 සහ 03 මම **සභාගත*** කරනවා.

මා දැන් කියවන්නම්, ඇමුණුම 01හි සඳහන් කාරණා ටිකත්.

බුද්ධශාසනයේ අභිවෘද්ධිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත වැඩසටහන්වලට බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ මුදල් වෙන් කරලා තිබෙනවා.

01. ආගමික කටයුතු නංවාලීම සඳහා රුපියල් මිලියන 26යි.
02. පුණ්‍ය ග්‍රාම වැඩසටහන සඳහා රුපියල් මිලියන 11යි.
03. පූජා භූමි සංවර්ධනය සඳහා රුපියල් මිලියන 25යි.
04. ග්‍රාමීය විහාරස්ථාන සංවර්ධය සඳහා රුපියල් මිලියන 150යි.
05. ආගමික විහාරස්ථාන සඳහා සූර්ය බල පහසුකම්වලට රුපියල් මිලියන 1,408යි.

ගරු කථානායකතුමනි, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පැත්තෙන් බැලුවොත්, බුද්ධ ශාසනය ආනුෂංගිකව අතිවිශාල මුදල් ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා. කිසිදු ශීර්ෂයක් අඩු වෙලා නැහැ. රාජ්‍ය වෙසක් උත්සවය, අනුබුදු මිහිඳු නාහිමි අනුස්මරණය, උපසම්පදා උත්සවය, ත්‍රිපිටකයේ ප්‍රකාශනය, ශාසනාරක්ෂක මණ්ඩල සඳහා පහසුකම් සැපයීම, දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය, භික්ෂූන් වහන්සේලාගේ ආදාහන කටයුතු, බෞද්ධ විශ්වකෝෂ ප්‍රකාශන කටයුතු, දහම් පාසල් පෙළ පොත් මුද්‍රණය, දහම් පාසල් ශ්‍රේණි විභාග පැවැත්වීම, සමස්ත ලංකා සිසු නිපුණතා තරගාවලිය, දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම, සිල්මාතා ආරාම සංවර්ධනය, දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදී වශයෙන් වූ වැඩසටහන් සඳහා විශාල මුදලක් වෙන් වෙනවා. බුද්ධශාසන අරමුදල මඟින් ඉතුරු මුදල් වෙන් වනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මුළු ගණන කීයද, ගරු ඇමතිතුමා?

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
මම කලිනුත් මේ ගැන සඳහන් කළා, ගරු විපක්ෂ නායකතුමනි. අමාත්‍යාංශ පාර්ශ්වයෙන් රුපියල් මිලියන 1,620ක්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පැත්තෙන් රුපියල් මිලියන 463ක්, බුද්ධශාසන අරමුදල මඟින් රුපියල් මිලියන 70ක් වශයෙන් රුපියල් මිලියන 2,154ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, කෙටි පැහැදිලි කිරීමක් කර ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ගරු අමාත්‍යතුමාට පෙන්වා දෙන්න කැමැතියි, එතුමාගේ පිළිතුරෙන්ම ඉස්මතු වුණු කාරණයක්. 2025 වසරේ වෙන් වුණු මුදල රුපියල් මිලියන 3,484යි. 2026ට වෙන් වුණු මුදල මිලියන 2,154යි. ගණන් හදලා බැලුවාම මිලියන 1,330ක අඩුවීමක් එතැන තිබෙනවා. ගරු කථානායකතුමනි, එහෙම අඩු කිරීමක් සුදුසු නැහැ කියලා අපි යෝජනා කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බුද්ධ ශාසනයට සුවිශේෂී ස්ථාවරයක් ලබා දීලා තිබෙන මොහොතක වෙන් කළ මුදල 3,484 සිට 2,154ක් දක්වා අඩු කිරීම සුදුසු නැහැ.

ඊළඟට, ගරු අග්‍රාමාත්‍යතුමියට මම යෝජනාවක් කරන්න කැමැතියි. ධර්මාචාර්ය ගුරු සංගමය කියනවා, ධර්මාචාර්ය ගුරු පත්වීම් ලබා දීම කරලා නැහැ කියලා. ඒ වාගේම දහම් සරසවි උසස් ඩිප්ලෝමාධාරීන්ටත් ඒ පත්වීම් ටික ලබා දීලා නැහැ. එතැනත් 600ක් විතර ඉන්නවා. ඒ වාගේම ධර්මාචාර්ය විභාගය සමත් වුණු 14,000ක් සිටිනවා. කරුණාකරලා මේ කාරණා පිළිබඳව අවධානය යොමු කරලා ධර්මාචාර්ය ගුරු පත්වීම් ලබාදීමත්, දහම් සරසවි උසස් ඩිප්ලෝමාධාරීන්ට පාසල් ගුරු පත්වීම් ලබා දීමත් ඉක්මන් කරවන්න.

විශේෂයෙන්ම ප්‍රතිපාදන කප්පාදු කරන්න එපා කියලා බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. එම ප්‍රතිපාදන වැඩි කරන්න තවමත් කාලය තිබෙනවා. ඇත්ත වශයෙන් ඕනෑ තරම් මුදල් තිබෙනවා. අර කිව්වා වාගේ භාණ්ඩාගාරය පිරී ඉතිරී ගිහින් තිබෙනවා. මේ රටේ ජනතාවගේ කරපිට බදු බර පටවලා, IMF එක කියනවාටත් වඩා tax ගහලා බදු ආදායම ලබලා තිබෙනවා.

---
***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, කෙටියෙන් කියන්න. ප්‍රශ්නය පැහැදිලියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ බදු ආදායම උපයෝගී කරගෙන බුද්ධ ශාසන අමාත්‍යාංශයට වෙන් කළ මුදල් ටික වැඩි කරන්න කියලා අපි මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයට ඇමතිවරුන් දෙන්නෙකුට උත්තර දෙන්න සිදු වෙලා තිබෙනවා කියලා ගරු අගමැතිතුමිය කිව්වා. ඒ නිසා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා, කරුණු පැහැදිලි කිරීමේදී එක්කෝ අග්‍රාමාත්‍යතුමිය විතරක් උත්තර දෙන්න. මොකද, මේක වෙච්ච නැති දෙයක්. අපි මේවා accommodate කරන එක misuse කරන්න එපා. ඒ නිසා පැහැදිලි කර ගැනීම්වලදී මේ විධියට අමාත්‍යාංශ දෙක තුනකට යන්න වුණොත්, අපට මේක කරන්න වෙන්නේ නැහැ. මේ කාරණය ගැන Parliamentary Business Committee එකේදී කථා කරනවා කියලාත් ඊයේ පොරොන්දු වුණා. එතකම්වත් අඩුම තරමින් මේකට යම් සාධාරණයක් ඉටු කරන්න, මෙහෙම යන්න අමාරුයි. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එක පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්, ගරු ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi)
ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

වැකි දෙකක් විතරයි මට කියන්න ඕනෑ වෙන්නේ. නැත්නම් මේ සභාව නොමඟ යන්න ඉඩ තිබෙනවා. විපක්ෂ නායකතුමා මේ වසර සහ 2026 වසර සංසන්දනය කරලා අරමුදල්, ප්‍රතිපාදන කප්පාදුවක් ගැන පැහැදිලි කළා. මා පිළිතුර ඉදිරිපත් කරනකොටත් මේක කිව්වා. 2025ට රුපියල් මිලියන 3,484ක් විධියට සඳහන් වෙන්නේ, ඉන්දීය මූල්‍ය ප්‍රතිපාදන යටතේ අපට ලැබුණු මුදලත් - රුපියල් මිලියන 1,130ත් - එහි ආදායමක් හැටියට තිබෙන නිසායි. ඒ නිසා තමයි ඒ ගණන තිබෙන්නේ. ඒක අපේ භාණ්ඩාගාරයේ මුදලක් නොවෙයි. ඒ මුදලත් වියදම් කරන්න අපි දැන් කටයුතු කරලා තිබෙනවා. ඒ මිසක්, අපේ පැත්තෙන් අරමුදල් අඩුවීමක් කිසිදු ආකාරයකින් සිදු වෙලා නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු,-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට පැහැදිලි කිරීමට නැවත අවස්ථාව ලබා දෙන්න බැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Hon. Speaker, I raise this matter concerning the Committee on Public Finance under Standing Order No. 121(5)(i). The Committee is supposed to present a report on the assumptions of the Budget and we have completed it. It is a 70-page document and the Committee went through it yesterday.

Sir, many Hon. Members of our Committee got in touch with me this morning regarding a headline in today's "Daily Mirror", which states, I quote:

> "Rs. 200 allowance for estate workers
>
> PRESIDENT'S BUDGETARY PROPOSAL DEEMED UNLAWFUL - COPF"

Sir, I would just like to make a clarification on that. Yes, that was discussed and various issues came up during the discussion on the legality of this payment et cetera. But, the Committee has or did not take a decision that that was unlawful. The Committee's decision was that we should bring it to the notice of the Government, which we will do on Friday morning. So, I just want to make sure that that correction is made.

Thank you.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු. න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, -

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, Standing Orders යටතේ point of Order එකක් raise කරන්න මට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 91(ඌ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය;"

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, එම ස්ථාවර නියෝගය යටතේ ඔබතුමිය මොන කාරණාවද මතු කරන්නේ?

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මීට දවස් දෙකකට ඉස්සෙල්ලා - මට මතක විධියට සඳුදා දිනයේදී - ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා විසින් හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමියව එල්ල කරගනිමින් කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් තමයි මම මේ point එක raise කරන්නේ. ඒ වෙලාවේ මම පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. නමුත් මේක සමාජ මාධ්‍ය තුළ සංසරණය වෙනවා, video clip එකක් හැටියට. ඒක edit කරලා යන clip එකක් හැටියට තිබෙනවා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමියට කියා තිබෙනවා, - ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමියට නොවෙයි. ඇත්තටම වසන්ත සමරසිංහ ඇමතිතුමා එක්ක පැවැති සංවාදයකදී හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය වසන්ත සමරසිංහ ඇමතිතුමාට එහා පැත්තේ ඉඳගෙන ඉන්න එක point කරලා, point of Order එකක් අරගෙන තමයි කියා තිබෙන්නේ, "ඇමතිතුමා ළඟ ඉඳගෙන ඉන්න මන්ත්‍රීතුමියට කියන්න, රට අරගෙන යයිද කියලා දන්නේ නැහැ..." කියලා.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරියන් ඇවිල්ලා ඉන්නේ; කාන්තාවන් ඇවිල්ලා ඉන්නේ දේශපාලනය කිරීමටයි. අපේ රටේ දේශපාලනය තුළ කාන්තාවන්ට ලබා දී තිබුණු නියෝජනය මෙච්චර කල් තිබුණේ සියයට 5ක වාගේ මට්ටමක. ගිය අවුරුද්දේ අපිට ඒක double කරගන්න පුළුවන් වුණා, සියයට 10කට ආසන්න මට්ටමකට. කාන්තාවක් වශයෙන් හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමිය පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ දේශපාලනය කිරීමට. තමන්ගේ ජනතාව නියෝජනය කිරීමට තමයි එතුමිය පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ. එවැනි මන්ත්‍රීවරියක් අලලා තමයි ඒ ආකාරයට උසුළු විසුළු කිරීම හෝ එහෙම ස්ත්‍රී විරෝධී ප්‍රකාශයක් ඇත්තටම එම මන්ත්‍රීතුමා විසින් සිද්ධ කර තිබෙන්නේ.

පළමුවෙනි කාරණය, මන්ත්‍රීතුමා ඒ කියපු කාරණය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කළ යුතුයි. දෙවැනි කාරණය, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා ප්‍රසිද්ධියේ හිරුනි විජේසිංහ මන්ත්‍රීතුමියගෙන් සමාව ගන්න ඕනෑ, මන්ත්‍රීවරියක් එල්ල කරගෙන එවැනි ප්‍රකාශයක් පාර්ලිමේන්තුව තුළ සිද්ධ කිරීම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, මම බලාපොරොත්තු වෙනවා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කරයි කියලා. මොකද, පාර්ලිමේන්තුව ආදර්ශයක් වෙන්න ඕනෑ. ඊයේ සමාජ මාධ්‍ය තුළ මේ සිදුවීම විහිළුවක් වාගේ කප කපා දමනවා. මන්ත්‍රීවරියක් ගැනයි මේ කථා කරන්නේ. දේශපාලනයයි මේ කරන්නේ. තමන්ගේ ජනතාව නියෝජනය කරන්න මෙතැනට ඇවිල්ලා ඉන්න කාන්තාවක් ගැනයි මේ කථා කරන්නේ. ලංකාවේ කාන්තාවන්ට දේශපාලනය කරන්න බැරිවෙනවා, විපක්ෂය දිගින් දිගටම මේ ආකාරයේ ආදර්ශ ජනතාවට ලබා දෙමින් යනවා නම්. සමගි ජන බලවේගය නියෝජනය කරන මන්ත්‍රීවරියන් දෙදෙනෙකු මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. මට ඇත්තටම කනගාටුයි, මම දන්නේ නැහැ, ඒ පක්ෂය ඇතුළේ කාන්තාවන්ට තිබෙන තත්ත්වය මොකක්ද කියලා. හැබැයි, ඒ තත්ත්වය මොකක්ද කියලා ඒ ප්‍රකාශවලින් හොඳින් පෙනෙනවා. මම හිතනවා, පක්ෂයක් හැටියට සමගි ජන බලවේගයත් සුජීව සේනසිංහ මහත්මයා ගැන මීට වඩා බරපතළව කටයුතු කරයි කියලා. ගරු කථානායකතුමනි, වෙලාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරන ලෙස එම ගරු මන්ත්‍රීතුමියගෙනුත් මා ඉල්ලා සිටිනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, ස්ථාවර නියෝග 27(2)හි second paragraph states, I quote:

> "Provided that, any question relating to a matter of urgent public importance may be asked by the Leader of the Opposition or a leader of a recognized political party at the conclusion of questions ..."

I have already spoken to the Minister of Health and Mass Media. I will say that in Tamil. இன்று யாழ்ப்பாணத்திலே -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයක් නේද? පක්ෂ නායකයෙකු විධියට ඔබතුමාට ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට පුළුවන්, point of Order එකක් විධියට නොවෙයි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2)හි කොටස් දෙකක් තිබෙනවා. එහි දෙවැනි කොටසේ මෙසේ සඳහන් වෙනවා:

> "Provided that, any question relating to a matter of urgent public importance may be asked by the Leader of the Opposition or a leader of a recognized political party at the conclusion of questions after due notice has been given to the Minister concerned."

It states "to the Minister". Only one Minister, "...the Minister". ඒ නිසා Standing Order එක හරි clear. අපි බලාපොරොත්තු වෙනවා, ඔබතුමා මේ සම්බන්ධයෙන් Ruling එකක් කල්පනා කරයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත 2026, දෙවන වර කියවීමේ විවාදය. සිව්වන වෙන් කළ දිනය.

අද දින සභාව කල් තබන අවස්ථාවේ දී යෝජනාවක් ඉදිරිපත් වී නොමැති බැවින් 2025 සැප්තැම්බර් 11වන දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණය ප්‍රකාරව අපර භාග 6.00 සිට අපර භාග 6.30 දක්වා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විවාද කිරීමට වෙන් කර ඇති කාලය ද විසර්ජන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය සඳහා සභාවේ අවසරය ඇතිව යොදා ගන්නා බව දැනුම් දීමට කැමැත්තෙමි.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

***කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.***

***ඊට අදාළ ප්‍රශ්නය - [නොවැම්බර් 07]***

***"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය".- [ගරු අනුර කුමාර දිසානායක මහතා]***

***ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.***

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 07]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக".- [மாண்புமிகு அநுர குமார திஸாநாயக்க]*

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [07th November]*

*"That the Bill be now read a Second time".- [ The Hon. Anura Kumara Dissanayake]*

*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කිරීම, the Hon. (Prof.) Sena Nanayakkara. You have ten minutes.

[පූ.භා. 10.29]

**ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார)
(The Hon. (Prof.) Sena Nanayakkara)
ගරු කථානායකතුමනි, මම සන්තෝෂ වෙනවා, සුවිශාල පරිශ්‍රමයකින්, විශාල සටනකින් ජනතා විජයග්‍රහණයක් ලබා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් පිහිටුවා දෙවන අය වැය ඉදිරිපත් කරන වෙලාවේදී ඒ අය වැය -විසර්ජන පනත් කෙටුම්පත - පිළිබඳව අද දවසේ පැවැත්වෙන විවාදයේ ආරම්භක අදහස් දැක්වීම කරන්නට අවස්ථාව ලැබීම ගැන. ඇත්තවශයෙන්ම මේක ඉතාම විශිෂ්ට, වඩාත් වැදගත් අවස්ථාවක් කියලා මම විශ්වාස කරනවා. අය වැය කියන්නේ, රටේ ඉදිරි වර්ෂය සඳහා මූල්‍ය කළමනාකරණය සහ මූල්‍ය සැලසුම් පිළිබඳව කරන ගැඹුරු සාකච්ඡාවක්. ඒ වාගේම ඒ සාකච්ඡාව කෙරෙන්නේ මේ රටේ මූල්‍ය නීති සම්පාදනය කරන, රටේ නීති හදන, රටේ හෙට දවසට මඟ කියන මේ උත්තරීතර සභාවෙන්. ඒ කියන්නේ මේ පාර්ලිමේන්තුවෙන්.

ගරු කථානායකතුමනි, මම කලින් කියපු සතුට වාගේම මේ මොහොතේදී සියුම් දුකකුත් ඇති වෙනවා. මොකද, රට පිළිබඳව කියවෙන මෙබඳු විදග්ධ සාකච්ඡා සභාවක, එහෙම නැත්නම් උත්තරීතර සභාවක කියන්න, අදහස් පළ කරන්න අත්‍යවශ්‍ය කාරණා ද අපි ගැඹුරින් සාකච්ඡාවට ලක් කරන්නේ කියන කාරණය නිසා. ඒක සුවිශේෂීව සලකා බැලිය යුත්තක්. පසුගිය දවස් කිහිපය තුළ පැවැත් වූ මේ සංවාද, විසංවාද දිහා විමර්ශනාත්මකව බලාගෙන ඉන්නකොට අපට තේරෙනවා, මේ උත්තරීතර පාර්ලිමේන්තුව පාවිච්චි කෙරෙන්නේ ඒ ගැඹුරු සාකච්ඡාවට ද, එහෙම නැත්නම් උසුළු විසුළු -විසූක දස්සන- සඳහා ද කියලා. මේ රටේ ජනතාවට මඟ කියන ඒ දේශපාලන මූලස්ථානයෙන්, කේන්ද්‍රස්ථානයෙන් පරිපාලන මධ්‍යස්ථානයෙන් කියවිය යුතු දේද, මිනිස්සු බැලිය යුතු දේද, ඇසිය යුතු දේද මේ විවාදයේදී අහන්න ලැබෙන්නේ, දකින්න ලැබෙන්නේ කියන කාරණය නිසා තමයි මට දුකක් දැනෙනවා කියලා මම කිව්වේ. මොකද, පසුගිය දවස් ටිකේ මහත් පරිශ්‍රමයකින් සකස් කළ අය වැයක් පිළිබඳව සාකච්ඡා කරද්දී ඒ සාකච්ඡා ඉතාම බාල, බොළඳ, බොල් තර්ක විතර්ක මැද දියත් වෙච්ච ආකාරය අපි දැක්කා. මේ තුළ වැඩියෙන් දකින්නට ලැබෙන්නේ විසූක දස්සන, බොහෝ නර්මාලාප, වාගාලාප.

මම විශ්වාස කරනවා, අප වාගේ විදග්ධ, යම් ආකාරයක උගත්කමක් ඇති පක්ෂ, විපක්ෂ සියලුදෙනාම මීට වැඩිය බරසාර විධියට මේ කාරණය පිළිබඳව ගැඹුරින් හිතන්න අවශ්‍ය වෙනවා කියලා. ගරු කථානායකතුමනි, මම උදාහරණයක් කියන්නම්. එක්තරා මහත්මයෙක් මේ පාර්ලිමේන්තු සභා ගර්භය ඇතුළේ, පැය හතරහමාරකට ආසන්න කාලයක් තිස්සේ ප්‍රකාශයට පත් වෙච්ච ඒ අය වැය ප්‍රකාශය අතරතුර ගොර ඇද ඇද ඉතාම ගැඹුරු නින්දක හිටියා. මේක සමාජ මාධ්‍ය හරහා මේ රටේ ජනතාවට පැහැදිලිවම විකාශය වුණා. ඒක ජනතාව අතර ජනප්‍රිය වුණා. පහළ බොල් රසය සහිත ජනතාව මෙය තමන්ගේ ආහාරයක් විධියට වැලඳගත්තා. ඉතින් මේකට විපක්ෂයේ උත්තරය වුණේ, මෙය හිස් අය වැයක් නිසා බොහොම හොඳින් විවේක ගත්තා, නිදා ගත්තා කියන එකයි. මේ වාගේ විසූක -විසුළු- උත්තර තමයි විපක්ෂයෙන් අපට ලැබෙන්නේ. මා විශ්වාස කරනවා, අපි හැමෝම මීට වැඩිය වඩාත් ගැඹුරින් මේ වාගේ කාරණාවක් පිළිබඳව හිතුවා නම් හොඳයි කියලා. විපක්ෂයේ සිටින මා හිතවත් සියලු නෝනාවරුන්ට, මහත්වරුන්ට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මා ආරාධනා කරනවා, අපි එකමුතු වෙලා මීට වැඩිය බරසාර විධියට ශාස්ත්‍රීය මට්ටමකින් මේ පිළිබඳව හිතා බලමු කියලා.

**[ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා]**

ගරු කථානායකතුමනි, කෙසේ වෙතත්, අපි කවුරුත් දන්නවා මේ අය වැය, උපායමාර්ගික ප්‍රවේශයන් හයක් යටතේ, ඉලක්ක හයක් යටතේ අරමුණු කර ගත් අය වැයක් බව. මේ අරමුණු හය පිළිබඳව මම විස්තරාත්මකව කථා කරන්න සූදානම් වෙන්නේ නැහැ. නමුත් මෙහිදී මගේ කථාවට විෂය වෙනවා, රට පුරාම සිටින පොදු ජනතාවට මෙහි ප්‍රතිලාභ ලබා දෙන අය වැයක් විධියට මෙය සැලකීමත්, ඒ වාගේම රටේ නිෂ්පාදන ආර්ථිකය වර්ධනය කරවීමත්, ඒ වාගේම ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීමත් කියන කාරණා තුන. ඒ කාරණා තුන සම්පිණ්ඩනය කරලා ගත්තොත්, මේ අය වැය එය ඉලක්ක කර ගත් ඉතාම විශිෂ්ට අය වැයක් විධියටයි අපි දකින්නේ.

ගරු කථානායකතුමනි, මේ අය වැයේ ග්‍රාමීය දිළිඳුබව නැති කරනවා කියන කාරණයෙන්ම මම දකින්නේ, මේ සමාජය, මේ රට පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ගත කරන මිනිස්සු ඉන්න රටක් බවට පත් කරන කාරණාවේ මූලික පසුබිම, මුල් පස සකසනවා කියන එකයි. ගරු කථානායකතුමනි, 'ගම' කියන්නේ ඇත්තටම පරිපාලනයේ කුඩාම ඒකකයයි. විශේෂයෙන්ම ලංකාවේ වැඩි පිරිසක් ඉන්නේ ග්‍රාමීය ජනතාව. අපේ රට තුළ ගම් බිම් සෑහෙන ප්‍රමාණයක් තිබෙනවා. මේ විශාල ජන පර්ෂදය දියුණුවට පත් කරන්න නම්, ඇත්තවශයෙන්ම මේ ජනතාව ආමන්ත්‍රණය කරන වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ තිබෙන්න ඕනෑ. ඒක ඉතාම විශිෂ්ට අන්දමින් මේ අය වැය තුළ ප්‍රකාශයට පත් කෙරෙනවා කියන කාරණය තමයි මට කියන්න තිබෙන්නේ. අපි හොඳටම දන්නවා, මේ ගම්බිම් ගැන සලකා බලද්දි ඉතාම දුෂ්කර, අතිශය බේදනීය, බේදජනක තත්ත්වයන් තමයි අපට දකින්න ලැබෙන්නේ කියන එක.

උදාහරණයක් විධියට ගනිමු, මගේ ආසන බල ප්‍රදේශය වන අනුරාධපුර-බටහිර බල ප්‍රදේශය. ගරු කථානායකතුමනි, අනුරාධපුර-බටහිර ආසන බල ප්‍රදේශයේ විලච්චිය, තන්තිරිමලේ, නොච්චියාගම, ඇලයාපත්තුව ආදී ගම්බිම්වලින් ඈතට යන්න යන්න ඉතාම දුෂ්කරයි, අතිශය බේදජනකයි. පසුගිය අවුරුදු ගණනාවක් තිස්සේ - දශක ගණනාවක් තිස්සේ - දුකට, පීඩාවට පත් වෙච්ච; ව්‍යසනයෙන් දුකට පත් වෙච්ච ජනතාවට, ගම්බිම්වලට ඇත්තවශයෙන්ම සංවර්ධනය කැඳවුණේ පසුගිය අවුරුද්දේ ඉඳලාය කිව්වොත් ඒක වඩා නිවැරදියි. ඊට කලින් කිසිම දෙයක් වුණේ නැහැ කියන කාරණය නොවෙයි මම කියන්නේ. යම් යම් දේවල් වෙලා තිබෙනවා. නමුත් ආණ්ඩුවකින් විධිමත් ආකාරයකට ජනතාවාදී කටයුත්තක් වෙලා තිබෙන්නේ පසුගිය අය වැයත් එක්කයි. මේ අය වැය ඒ ජනතා ආමන්ත්‍රණය ඉතාම සාර්ථකව තහවුරු කරලා තිබෙනවා කියන හැඟීම තමයි මේක කියවද්දි අපිට දැනෙන්නේ. එතකොට පැහැදිලිවම අපි දන්නවා, ඒ ජනතාව ආණ්ඩු නොසලකා හැරිය ජනතාවක්, එහෙම නැත්නම් තට්ටු මාරු ක්‍රමයට ආණ්ඩු බිහි වෙලා අමතක කරපු ජනතාවක්, එහෙමත් නැත්නම් දේශපාලකයෝ අවුරුදු 5න්, 5ට ගමට ගිහිල්ලා ඡන්ද, කතිර කොල්ල කාලා පසු කාලයකදී අමතක කරපු ජනතාවක් කියලා. මේ ජනතාව නඟාසිටුවීම තමයි පැහැදිලිවම අපි මේ අය වැයෙනුත් තහවුරු කරලා තිබෙන්නේ. මේ අහිංසක මිනිස්සුන්ගේ ජීවිත ගොඩ ගන්න නම් ආණ්ඩුව ඒ මිනිස්සුන්ට හයියක් වෙන්න ඕනෑ. මම හිතන විධියට, ඒ හයිය පිළිබඳව මෙවර ජාතික ජන බලවේගයේ දෙවැනි අය වැය තුළ අපි ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ වෙනකොට අනුරාධපුර දිස්ත්‍රික්කයේ විතරක් වැව් 307ක් නම් කරලා තිබෙනවා, මේ අය වැය තුළින් ප්‍රතිසංස්කරණය කරන්න. ඒ වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2024, 2025 කියන අවුරුදු දෙකේම අය වැයෙන් වෙන් කරපු මුදල අතිවිශාලයි. උදාහරණයක් විධියට ගත්තොත්, රුපියල් මිලියන 91,700ක් වෙන් කරලා තිබෙන්නේ වාරි කර්මාන්ත දියුණු කිරීම සඳහායි. දේශීය කර්මාන්ත දියුණුව, දේශීය කෘෂි කර්මාන්තය පිළිබඳව වැඩිපුර අවධාරණය කිරීම, රැකියා උත්පාදනය, ඔවුන්ගේ ආදායම් මාර්ග වැඩි කිරීම අරමුණු කරගෙන තමයි මේ කටයුත්ත කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මේ වෙනකොට මගේ ආසන බල ප්‍රදේශයේ විතරක් කුඩා වැව් රාශියක් ප්‍රතිසංස්කරණය කරමින් තිබෙනවා. මේ වෙනකොට මම ම පෞද්ගලිකව සම්බන්ධ වෙනවා, වැව් 9කට. මේවා කලා වැව, තිසා වැව, නුවර වැව වාගේ සුවිශාල වැව් නොවෙයි, සාමාන්‍ය ගම්වල තිබෙන කුඩා වැව්. ගරු කථානායකතුමනි, මම තලාව, තිබ්බටුවාවැව මේ වෙනකොට සකස් කරමින් තිබෙනවා. රුපියල් මිලියන 71ක් වියදම් කරලා, අක්කර 600කට අධික අලුත් භූමි භාගයක් මේ තුළින් අස්වද්දන්න හැකියාව ලැබෙනවා. මේ වාගේ කටයුතු අපි දැන් ආරම්භ කරනවා. පහළ මල්වතු ඔය ව්‍යාපාරයේ කටයුතු නැවතිලා තිබුණා. ඒ කටයුතු සම්පූර්ණයෙන්ම අපි ආරම්භ කර තිබෙනවා. උතුරේ මන්නාරම ප්‍රදේශයේ තිබෙන පානීය ජල ගැටලුව, ගංවතුර ගැටලු ආදිය අනාගතයේදී සමනය කරන්නත් පහළ මල්වතු ඔය ව්‍යාපාරය සමත් වෙනවා. සේනානායක සමුද්‍රයේ සොරොව්ව ප්‍රතිසංස්කරණය වාගේම ගල්ඔය, රාජාංගනය, හුරුළු වැව, මින්නේරිය වැව ඇතුළු ඇළ වේලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 6,500ක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. මේවා ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ කටයුතු, ගරු කථානායකතුමනි. කෘෂි කර්මාන්තය, කර්මාන්ත ආදී මේ සියලු කටයුතු සම්බන්ධයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා.

විපක්ෂය හැම වෙලාවේම දකින්නේ වැරදි, අඩුපාඩු. ඇත්තටම අපි යහපත්, සද්භාවයෙන් කරන කටයුතු පිළිබඳව අපට ඇඟයීමක් අවශ්‍ය වෙනවා. මොකද, මේ කටයුතු සාර්ථකව මේ මහ පොළොවේ පැලපදියම් කරන්න ඕනෑ. මට මේ මොහොතේදී මතක් වෙනවා, සාහිත්‍යයේ තිබෙන අපි අහපු එක්තරා කවි දෙපදයක් වන "දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ - සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ" කියන කවි දෙපදය. සඳුන් කඳට, සඳුන් අරටුවට ගහන්න ගහන්න, කොටන්න කොටන්න, කපන්න කපන්න තමයි ඒ සඳුන් කඳ සුවඳවත් වෙන්නේ. ඒ නිසා විපක්ෂය අපට කොයි ආකාරයෙන් චෝදනා කළත්, මඩ ප්‍රචාර ගැහුවත්, අවලාද නැඟුවත් ජාතික ජන බලවේගයේ කාර්යභාරය අපි නිසි පරිදි ඉෂ්ට කරනවා. අඛණ්ඩව මේ රට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ගත කරන මිනිස්සු ඉන්න රටක් බවට පත් කරන්න ධෛර්යයෙන් අපි කටයුතු කරනවා කියන කාරණය අවධාරණය කරමින් මගේ අදහස් දැක්වීම නතර කරනවා. බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Ajith P. Perera. You have 18 minutes.

[පූ.භා. 10.40]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, අය වැය විවාදයකදී අපට කරුණු දෙකක් සලකා බලන්න වෙනවා. එකක් තමයි, රජයේ මූල්‍යමය තත්ත්වය - ගණන් හිලව්. අනෙක තමයි, රටේ ආර්ථිකය ගොඩනඟන්න අවශ්‍ය කරන නෛතික පරිසරය සකස් කිරීම සඳහා රජය විසින් ගන්නා ලද සහ ගන්නා වූ ක්‍රියාමාර්ග.

නීතිඥවරයෙක් හැටියට වාගේම ව්‍යවස්ථාකරණය පිළිබඳ උනන්දුවක් දක්වන කෙනෙක් හැටියට මම මේ විවාදයේදී පළමුවෙන්ම අවධානයට ලක් කරන්න කැමතියි, 2025 අය වැයේ ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට රටේ ආර්ථිකය සංවර්ධනය කිරීම උදෙසා ඉදිරිපත් කරපු ව්‍යවස්ථා සම්පාදන යෝජනා පිළිබඳව. ඒවා තමයි, ආයෝජන ආරක්ෂණ පනත, රාජ්‍ය - පෞද්ගලික හවුල් ආයෝජන කළමනාකරණ පනත, රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත, පොදු වාණිජ ව්‍යාපාර කළමනාකරණ පනත, සංඛ්‍යාලේඛන පනත, තක්සේරු පනත, පොදු ප්‍රසම්පාදන පනත, ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරිය පනත, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ රාමුව ශක්තිමත් කිරීමේ පනත, වී අලෙවි මණ්ඩල පනත සංශෝධනය කිරීමේ පනත සහ රාජ්‍ය ආයතන අතර තොරතුරු හුවමාරු කිරීමේ පනත.

ගරු කථානායකතුමනි, අලුත් පනත් 11ක් මේ වසර තුළ අරගෙන එන බවට ජනාධිපතිවරයා පොරොන්දු වුණා. හැබැයි, ඔබතුමා පුදුම වෙයි, අද වෙනකොට ඒ පනත් 11න්, එක පනතක්වත් සම්මත කරන්න අසමත් වෙලා තිබෙනවා. එකොළහෙන් බින්දුවයි. ෆේල් නේද, ගරු කථානායකතුමනි? ඒ කියන්නේ, රටේ ආර්ථිකය ගොඩනැඟීමට අවශ්‍ය කරන නෛතික වාතාවරණය සකස් කිරීම උදෙසා අත්‍යවශ්‍යයෙන්ම ගෙන ඒමට පොරොන්දු වෙච්ච පනත් 11න්, 1ක්වත් මේ වසර තුළ සම්මත කරන්න බැරි වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ පනත් 11න්, 3ක් අමතක කරලා, 8ක් නැවත වරක් මේ වසර තුළ කරනවා කියලා පොරොන්දු වෙලාත් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඔබතුමා කථානායකතුමා වශයෙන් විශේෂයෙන් අවධානයට ලක් කරන්න ඕනෑ දෙයක් තිබෙනවා. ව්‍යවස්ථා සම්පාදනය තමයි පාර්ලිමේන්තුවේ වගකීම වෙන්නේ. ගරු කථානායකතුමනි, නීති හදන එක අපේ වගකීම. මේ පාර්ලිමේන්තුව 2021දී නීති 30ක් හැදුවා; 2022දී නීති 46ක් හැදුවා; 2023දී නීති 34ක් හැදුවා; 2024දී නීති 50ක් හැදුවා. 2025 වර්තමාන රජය යටතේ සම්මත කළේ නීති 22යි. ඒකෙනුත් 12ක් ඊට කලින් කෙටුම්පත් කරපු ඒවා. අලුතින්ම හැදුවේ 10යි. පසුගිය වසර පහක කාලය තුළ අඩුවෙන්ම පනත් කෙටුම්පත් සම්මත කළ පාර්ලිමේන්තුව මේකයි, ගරු කථානායකතුමනි. ආර්ථික සංවර්ධනය උදෙසා පොරොන්දු වෙච්ච පනත් එකක්වත් සම්මත කළේ නැහැ. ඒ වාගේම පසුගිය වසර පහ තුළ, සමහර වෙලාවට මුළු ඉතිහාසයේම අඩුම පනත් ගණනක් සම්මත කරපු පාර්ලිමේන්තුව මේක. ඔබතුමා කථානායකතුමා හැටියට ඒ ගැන අධ්‍යයනය කරන්න. පාර්ලිමේන්තුවක කාර්යක්ෂමතාව, පාර්ලිමේන්තුවක වටිනාකම, පාර්ලිමේන්තුවක අගය මනින්නේ, මේ රටේ ජනතාව මේ පාර්ලිමේන්තුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ මේ කාර්ය මණ්ඩලය නඩත්තු කරන්න කරන වියදමට අර්ථයක් ලැබෙන්නේ රටකට අවශ්‍ය කරන නව නීති සහ නීති සංශෝධන අරගෙන ඇවිත් සම්මත කළාමයි. ඔබතුමා කථානායක වන මේ පාර්ලිමේන්තුව තමයි, ඉතිහාසයේ අඩුම පනත් ගණනක් සම්මත කළ පාර්ලිමේන්තුව. මට පසුගිය අවුරුදු පහ ගැන නිශ්චිතව කියන්න පුළුවන්. ඒ තොරතුරු තිබෙනවා. පසුගිය අවුරුදු පහේ අඩුම පනත් ගණනක් සම්මත කරපු පාර්ලිමේන්තුව මේක. ඒක සාර්ථකත්වය නම් මට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒක අපට පෙනෙන්නේ අසාර්ථකත්වයක් හැටියටයි. එක පැත්තකින්, ආර්ථිකය ගොඩනඟන්න අවශ්‍ය කරන පොරොන්දු වෙච්ච නීති සම්මත නොකරපු එක විතරක් නොවෙයි, පොදුවේ අඩුම නීති ගණනක් සම්මත කරපු, දුර්වලම පාර්ලිමේන්තුව මේක. ඒක බලවත් වූ කම්පනයට හේතුවක් බව මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට කරපු කථාවේදී අල්ලස හා දූෂණය මැඬලීම සම්බන්ධයෙන් ලොකු බරක් දුන්නා. පැය හතරහමාරක් එතුමා කථා කළා. මේ අය වැය දක්ෂම කවීකයා තෝරන ක්‍රියාවලියක් නම්, එතුමාට ඒ සම්මානය හිමි වෙනවා. නමුත්, ගරු කථානායකතුමනි, අය වැය කියන්නේ දක්ෂම කවීකයා තෝරන එක නොවෙයි, රටේ ආර්ථිකය ගොඩනැඟීමට, රට ගොඩනැඟීමට අවශ්‍ය කරන ප්‍රතිපත්ති එළිදක්වන, සංඛ්‍යාලේඛන එළිදක්වන ලේඛනය. එතුමා දීර්ඝ වශයෙන් කරපු කථාවේ, අල්ලස හා දූෂණය මැඬලීම සඳහා ලොකු බරක් තැබුවා. අපි ඒක අගය කරනවා. ඒක වෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ රටේ අල්ලස හා දූෂණය මැඬලීම පිළිබඳව අවංක උනන්දුවක් තිබෙනවා නම්, අල්ලස හා දූෂණය පිළිබඳව අවශ්‍ය කරන, ඒ වගකීම දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ප්‍රමාණවත් තරම් මුදලක් ලබා දෙන්න ඕනෑ. හැබැයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කිව්වේ මොකක්ද? "මට මුදල් අමාත්‍යාංශයෙන් ප්‍රමාණවත් තරම් මුදල් වෙන් කරන්නේ නැහැ. පනතේ තිබෙනවා, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ස්වාධීනව තමන්ගේ කටයුතු කිරීම සඳහා අවශ්‍ය අරමුදලක් ගොඩනැඟීමට. ඒ අරමුදල සඳහා මුදල් සපයන්නේ නැහැ. රජයෙන් අවශ්‍ය සහයෝගය ලැබෙන්නේ නැහැ" කියලා ඔහු කියනවා.

ගරු කථානායකතුමනි, කථාව නම් අල්ලස හා දූෂණය මැඬලීම අංක එක කියලා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා කියනවා, "මට ප්‍රමාණවත් තරම් මුදල් දෙන්නේ නැහැ" කියලා. ඒ වාගේම ඔහු නැවත කියනවා, "මම අධිකරණයට යනවා" කියලා. කාට විරුද්ධවද අධිකරණයට යන්නේ? මේ රජයට විරුද්ධව. "මම රජයට විරුද්ධව අධිකරණයට යනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කරන්න" කියලා කියනවා. ලජ්ජා වෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි. මේවා කථා කරලා විසඳා ගන්න අවශ්‍යයි නේ. එහෙම කරන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒකයි කියන්නේ, එළියේ ඉඳන් කථා කළාට අල්ලස හා දූෂණය මැඬලීමට අවශ්‍ය කරන ප්‍රතිපාදන සපයන්න, පහසුකම් සපයන්න කථාවක් නැහැ කියලා. දැන් කැබ් රථ ගන්න, ප්‍රවාහනය ශක්තිමත් කරන්න, මන්ත්‍රීවරුන්ට වාහන දෙන්න උනන්දුයි. හැබැයි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කරන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් තරම් සපයන්නේ නැති බව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රකාශයෙන්ම පැහැදිලියි.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ අල්ලස හා දූෂණය අපේ සංස්කෘතියේ කොටසක් බවට පත් වෙලා තිබෙනවා. ඒක ඉවත් කරන්න ඕනෑ කියන කාරණය අපි පිළිගන්නවා. 2015දී යහ පාලන රජය බලයට පත් වනවිට මේ අල්ලස හා දූෂණය පිළිබඳ නඩු වෙනත් නඩු සමඟ මිශ්‍ර කර විභාග කිරීමෙන් අවුරුදු 10, 15, 20 ගත වෙලා තිබුණා. අපි ඒ අවස්ථාවේදී මහාධිකරණ විනිශ්චයකාරවරුගේ සංඛ්‍යාව තිස්පහකින් වැඩි කළා. ඒ විතරක් නොවෙයි, අපි අලුත් අධිකරණයක් හැදුවා; අල්ලස් හා දූෂණ පිළිබඳ පමණක් නඩු විභාග කරන්න දූෂණ විරෝධී ත්‍රි පුද්ගල මහාධිකරණය අපි හැදුවා. අද ඕනෑම කෙනෙකුට බලාගන්න පුළුවන්, ශ්‍රී ලංකා නීති විද්‍යාලය ඉස්සරහා අලුතින්ම හදලා තිබෙන ඒ ගොඩනැඟිල්ල. එපමණක් නොවෙයි, තවත් අධිකරණ දෙකක් හදන්න අපි එකඟතාව පළ කළා.

ගරු කථානායකතුමනි, මේ රජය බලයට පත් වුණාට පස්සේ එක දිගට දිනපතා නඩු විභාග කිරීමේ බලය ඇති, අල්ලස් හෝ දූෂණ පිළිබඳ නඩු විශේෂිතව විභාග කිරීමට බලය ඇති මෙම

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

විශේෂිත ත්‍රි පුද්ගල මහාධිකරණයට, ස්ථිර ත්‍රි පුද්ගල මහාධිකරණයට එකම එක නඩුවක්වත් යොමු කරලා නැහැ. අධිකරණ ඇමතිතුමා සභාවේ ඉන්නවා නම් උත්තර දෙන්න, ඒ ඇයි කියලා. මේ රටේ අල්ලස හා දූෂණය නැති වෙලාද? බරපතළ අල්ලස හා දූෂණය පිළිබඳව විභාග කරන්න නඩු ඉතිරි වෙලා නැද්ද? මේකට අධිකරණ ඇමතිතුමා උත්තර දෙන්න ඕනෑ. වෙනම අධිකරණයක් හදලා, කෝටි ප්‍රකෝටි ගණන් ගොඩනැගිලිවලට වියදම් කරලා, එම අධිකරණය සඳහාම විශේෂිත වූ විනිශ්චයකාරවරු පත් කරලා, ත්‍රි පුද්ගල ස්ථිර මහාධිකරණය හදලා අද වනකම්; මෙම රජය බලයට පත් වූ දවසේ ඉඳලා, ජනාධිපතිතුමා එම තනතුරට පත් වූ දා ඉඳලා අද වෙනකම් අල්ලස හෝ දූෂණය පිළිබඳ නඩු එකක්වත් මේ ත්‍රි පුද්ගල මහාධිකරණයට යොමු කරලා නැහැ. ගරු කථානායකතුමනි, ඔබතුමාට පුදුම නැද්ද? මේවා වෙන්න පුළුවන්ද? මොකද, අල්ලස හා දූෂණය මැඩලීම මේ ආර්ථික සංවර්ධනයේ වැදගත්ම ගුණාංගයක්. ඒක එකම දේ නොවෙයි තමයි. හැබැයි, අද වෙනකම් ඒ පිළිබඳ අවධානයක් යොමු කරලා නැහැ. ඒ සම්බන්ධයෙන් ලජ්ජා වෙන්න ඕනෑ.

එක පැත්තකින් නීති සම්පාදනය කරන්නේ නැහැ. අනෙක් පැත්තෙන්, ඉක්මනින් නඩු විභාග කරලා, දූෂිතයන්ට දඬුවම් දීලා, රටට ලෝකයට ආදර්ශයක් දීලා, "දූෂණ කටයුතු කළොත් හිරේ යන්න වෙනවා, ඉක්මනින් නඩු අහනවා, නඩු කල් ගන්න බැහැ" කියන ඒ අදහස ස්ථිර කරන්න අපි හදපු ඒ ත්‍රිපුද්ගල මහාධිකරණය අද වැඩකට නොගෙන අතහැර දමා තිබෙනවා. ඒ අධිකරණය ශක්තිමත් කරන්න පාර්ලිමේන්තුව තුළ විතරක් නොවෙයි, ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඒ පනතට විරුද්ධව කරුණු කියපු අයට එරෙහිව පෞද්ගලිකව පෙත්සම්කරුවකු වශයෙනුත් ඉදිරිපත් වෙලා, ජනාධිපති නීතිඥවරු රඳවලා කරුණු කිව්වා. මට මතකයි, ආචාර්ය හර්ෂ ද සිල්වා, ඉරාන් වික්‍රමරත්න, මම, පෞද්ගලිකව පෙත්සම්කරුවෝ හැටියට ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේදී තර්ක කළා, ජනාධිපති නීතිඥවරු රඳවලා ඒ පනතට එරෙහිව ආපු බලවේගවලට. ඒ මොකද, දිනපතා නඩු අහන එක අවශ්‍යයි. සාමාන්‍ය මහාධිකරණයක නඩු කල් යනවා. හැබැයි, අපි අරන් ආපු අධිකරණ සංවිධාන පනතේ සංශෝධනය ප්‍රකාරව ගොඩනඟපු ත්‍රි පුද්ගල මහාධිකරණය සඳහා එක නඩුවක්වත් යොමු කරලා නැහැ. ගරු කථානායකතුමනි, එකක්වත් යොමු කරලා නැහැ. මාර ආණ්ඩුවක්, මේක. කථාව නම් අල්ලස හා දූෂණයට විරුද්ධයි කියලා. කයිවාරුව විතරයි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ලොකු කථාබහක් ඇති වුණා, අපේ රටේ අනාගතය වෙනුවෙන් ඒ අවශ්‍ය කරන නෛතික පරිසරය ගොඩ නඟන්න ඕනෑය කියන කාරණය සම්බන්ධයෙන්. අපි දන්නවා, එක පැත්තකින් විධායකය, අනික් පැත්තෙන් පාර්ලිමේන්තුව විධියට බලකේන්ද්‍ර දෙකක් තිබෙන බව. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විටින් විට සංශෝධනය වෙලා විකෘති තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ රටට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය, නැත්නම් වෙස්ට්මින්ස්ටර් ක්‍රමවේදය අපේ රටේ ස්ථාපනය කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි කියන එක ගැන එකඟතාවක් තිබෙනවා. පසුගිය ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායක මහත්මයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත්, සජිත් ප්‍රේමදාස මහත්මයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත්, ඒ හැම එකකම කිව්වේ එකම දේ. විවාදයක් නැහැ, එකම ප්‍රතිපත්තිය. සියයට 100ක්ම දෙනා මේ අදහසට එකඟයි.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි, ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් කිව්වා, කඩිනමින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනවා කියලා. කල්දමා තිබෙන පළාත් පාලන, පළාත් සභා මැතිවරණ වසරක් තුළ පවත්වනවා කියලා කිව්වා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපනය කිරීම සහ විධායක බලතල රහිත ජනාධිපතිවරයෙකු පත් කිරීම ගැන කිව්වා. ගරු කථානායකතුමනි, ඔබතුමා පුදුම වෙන්න ඇති, පැය හතරහමාරක් තිස්සේ ජනාධිපතිතුමා මේ රටේ තිබෙන හැම ප්‍රශ්නයක් ගැනම කථා කළා. ඊනෑ තරම් වෙලාව තිබුණා. ඒක එතුමාගේ දවස. විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක් නිදාගත්තා. ඒක වෙනම කථාවක්. එතුමා විදේශගත වෙලා ඉඳලා ඇවිල්ලා සිටියේ. නමුත් ඉතිරි ඔක්කෝම ඇහැරගෙන සිටියේ. අපි බලාපොරොත්තු වුණා, ප්‍රධානම පොරොන්දුව වන විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරලා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපනය කරලා, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගෙනැල්ලා, දේශපාලන සංස්කෘතිය වෙනස් කරන, ආර්ථිකය සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන යහපාලන ස්ථාවරයන් මේ රටේ ගොඩනඟන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනැඟීම ගැන කථා කරයි කියලා. නමුත් ඒ ගැන එක වචනයක් කිව්වේ නැහැ. ලෝකයේ තිබෙන හැම ප්‍රශ්නයක්ම කථා කරනවා; සතියක් ගණනේ කථා කරනවා; පාර්ලිමේන්තුවේ පැය ගණන් කථා කරනවා. අය වැයට පැය හතරහමාරක් කථා කළා. හැබැයි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගොඩනැඟීම ගැන අනුර දිසානායක ජනාධිපතිවරයා - මුදල් ඇමතිවරයා - වචනයක්වත් කියන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, පොරොන්දුවේ හැටියට නැවත ජනාධිපතිවරණයක් තියන්න බැහැ නේ. මම මීට කලින් මේ ගැන පාර්ලිමේන්තුවේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් අරගෙන ආවා. එදා කිව්වා, ඔච්චර ඉක්මනට කරන්න බැහැ, කඩිනමින් කිව්වාට කඩිනමින්ම නොවෙයි, අපි ඉක්මනින් මේක කරනවා කියලා. දැන් වසරකුත් ගත වෙලා. අඩු ගණනේ ඊළඟ අවුරුද්ද තුළ හරි මේක කරන්න. අපි කියන්නේ නැහැ, පළමුවැනි වාරයේ එතුමාගේ විධායක බලතල අයින් කරගන්න කියලා. අපට ඒක තේරෙනවා. නමුත් නැවත ජනාධිපතිවරණයක් තියෙන්න බැහැ. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් එන්න ඕනෑ. පාර්ලිමේන්තු ක්‍රමවේදය ස්ථාපනය වෙන්න ඕනෑ. වෙස්ට්මින්ස්ටර් ක්‍රමයේ පාර්ලිමේන්තුවක් ඇති වෙන්න ඕනෑ. විධායක බලය නොමැති ජනාධිපතිවරයෙක් ස්ථාපනය වෙන්න ඕනෑ. අපි නොවෙයි මේ කියන්නේ. ජනතාව අනුමත කරපු මේ ආණ්ඩුවේ -මාලිමාවේ- ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියන්නේ.

ගරු කථානායකතුමනි, ඇයි ජනාධිපතිතුමා මේ ගැන කථා නොකරන්නේ? ජනාධිපතිතුමා හම්බ වුණාම ඔබතුමාවත් අහන්නකෝ. ඔබතුමා ව්‍යවස්ථාදායකයේ ප්‍රධානියා නේ. නීති සම්පාදනය පිළිබඳ වගකිව යුතු පුද්ගලයා. මේ රටේ මැතිවරණ ක්‍රමය, මේ රටේ ආණ්ඩු ක්‍රමය වෙනස් වීම පිළිබඳව කාරණය මේ ව්‍යවස්ථාදායකයට -පාර්ලිමේන්තුවට- අතිශයින්ම වැදගත්. මොකද අපේ රාජකාරිය ව්‍යවස්ථා හදන එක. අපේ රාජකාරිය නීති හදන එක. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ, 2015 - 2019 කාලය තුළ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා වූ සාකච්ඡාව මත පදනම් වෙමින් මේ කාර්යය කරනවා කියලා. අපි දන්නවා, ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණත් ඇතුළුව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු සියලු පක්ෂ -සියයට 99ක්ම- අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතකට එකඟ වුණු බව. තව අඩුපාඩුකම් තිබෙන්න පුළුවන්. කථා කරන්න ඕනෑ. ඒක යාවත්කාලීන කර ගන්න ඕනෑ. පිළිගන්නවා.

ගරු කථානායකතුමනි, මාලිමාවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේම තිබෙනවා, කරන්න ඕනෑ මොකක්ද කියලා. හැබැයි, ඒවා සම්පූර්ණයෙන් අමතක කරලා දාලා තිබෙනවා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන නව ක්‍රමයක්, අලුත් පාලනයක්, අලුත් ක්‍රමවේදයක්, අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කිරීම සඳහා ඉවහල් වන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කිරීම

කියන කාරණය වංක ලෙස, කෛරාටික ලෙස පාවලා දීලා මහ හරිනවා නැවත වරක් මේ විධායක ජනාධිපති ක්‍රමය රස විඳිමින්. නැවත වරක් විධායක ජනාධිපති ක්‍රමය සඳහා ඡන්දයකට එන්න ලැහැස්ති වෙනවා. වෙන මොකුත් අපට තේරෙන්නේ නැහැ.

පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා තිබෙන්නේ වසරක් ඇතුළත. දැන් වසර පහුවෙලා. දැන් පාර්ලිමේන්තුවට එතුමා කියනවා, "සල්ලි තිබෙනවා. නීති හදන්න ඕනෑ" කියලා. නීති හදන එක එච්චර ගැටලුවක් නොවෙයි. කවුරුත් එකඟතාවක් තිබෙනවා, දැන් හදලා තිබෙන කොට්ඨාස සහ සමානුපාතික ඒ මිශ්‍ර ක්‍රමය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න බැහැ කියලා. එදා ජනතා විමුක්ති පෙරමුණත් ඒ ක්‍රමවේදයට විරුද්ධව මෙතැනදී ඡන්දය දුන්නා.

අනුර දිසානායක මැතිතුමා ඇතුළු ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් සියලුදෙනාම මේ පාර්ලිමේන්තුවේදී පළාත් සභා මැතිවරණය අත්හිටුවීමට ඡන්දය දුන්නා. එතුමාත් ඡන්දය දුන්නා. මාත් ඡන්දය දුන්නා. ඒ වාගේම අලුත් ක්‍රමවේදයක් අරගෙන එන්න කියලා ඉදිරිපත් කරපු වාර්තාව - සීමා නිර්ණය වාර්තාව - ප්‍රතික්ෂේප කරන්නත් ඡන්දය දුන්නා. එහෙම නම් ඔවුන්ටත්, අපටත් හැමෝටම වගකීමක් තිබෙනවා, පළාත් සභාවක් ඇති කරන්න. මොකද මේ පළාත් සභා නවය පුද්ගලයන් නව දෙනෙකු විසින් තනියෙන් පාලනය කරන්නේ. කෝටි, ප්‍රකෝටි ගණන් අතිශය විශාල මුදලක් තනි පුද්ගලයන්ගේ හිතුමනාපයට දෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය යටපත් වෙලා තිබෙනවා. මහජන නියෝජිතයන් නැති තැන දූෂණය වැඩි වෙනවා. ඒ වාගේම රටේ මිනිසුන්ගේ අවශ්‍යතා පිළිබඳ ගැඹුරු ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සභාවට විශාල බලතල ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා පළාත් සභාවල ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ගොඩනැඟීම සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වෙච්ච පොරොන්දුව ඉෂ්ට කරන්න ඕනෑ. ඒ සඳහා අවශ්‍ය වන නීතිය ඉතාම සරලයි. දැනටමත් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට ඒ කළ යුතු දේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, අපට සහාය දෙන්න කියලා. මේ පාර්ලිමේන්තුවේ අපි ඒකමතිකව ලැහැස්තියි, පළාත් සභා මැතිවරණයකට යන්න. ගරු කථානායකතුමනි, ඒක අවංකව කරන්න ඕනෑ. මැතිවරණ තියනවා. දිනනවා. පරදිනවා. ඒක සාමාන්‍ය දෙයක්. නමුත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඉස්සරහට යන්න ඕනෑ. පළාත් සභා ක්‍රමය ඉස්සරහට යන්න ඕනෑ. අලුත් ව්‍යවස්ථාවක් තුළ අලුත් ක්‍රමවේදයකට අපට යන්න පුළුවන්. හැබැයි, අලුත් ව්‍යවස්ථාවක් හදන්නේත් නැහැ. පළාත් සභා මැතිවරණයත් කල් දානවා. මේක සම්පූර්ණ වංක ක්‍රියාදාමයක් බව මම කියන්න ඕනෑ.

හැම දේ ගැනම කථා කරන අනුර දිසානායක මැතිතුමා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන පත් වෙච්ච දවසේ ඉඳලා අද වෙනකල් එක වචනයක් කථා කළේ නැහැ. ගරු අධිකරණ ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. මොනවා හරි ප්‍රගතියක් තිබෙනවා නම්, උත්තර දෙන්න පුළුවන්. මේ රටේ ආර්ථිකය ගොඩනඟන්න අවශ්‍ය කරන නෛතික පරිසරය ගොඩනඟන්න ඒ අවශ්‍ය කරන ශක්තිය දෙන්න, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍යයි. අධිකරණ ඇමතිතුමනි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව දැනට අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද? ඒ පිළිබඳව කමිටුවක් පත් කරලා තිබෙනවාද? ඒ සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවාද? මොකක්ද ප්‍රගතිය?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි, මට උත්තර දෙන්න අවශ්‍ය වෙන්නේ එක දෙයකටයි. ත්‍රිපුද්ගල මහාධිකරණයට අපි නඩු - trials-at-bar - කීයක් refer කළාද කියලා ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විශේෂ ත්‍රිපුද්ගල මහාධිකරණයට.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
අපේ ආණ්ඩුව ආවාට පස්සේ නේද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, නීතිඥවරයෙක් නිසා ඔබතුමාත් දන්නවා ඇති, ත්‍රිපුද්ගල මහාධිකරණයේ නඩුව පවත්වනවාද, නැද්ද කියන එක තීන්දු කරන්නේ, නීතිපතිවරයාගේ ඉල්ලීම මත අග්‍ර විනිශ්චයකාරතුමා, අධිකරණ සේවා කොමිෂන් සභාව. අධිකරණ ඇමති හෝ දේශපාලන ප්‍රවාහය නොවෙයි, කොයි නඩුව කොහේද අහන්නේ කියලා තීන්දු කරන්නේ. මා හිතන විධියට, ඔබතුමා ඒ ගැන දන්නවා ඇති. ඉතා ඉක්මනින් Chief Justice අවශ්‍ය දේවල් තෝරයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන මොකද කියන්නේ? ගරු කථානායකතුමනි, මගේ උගත් මිත්‍ර නීතිඥ හර්ෂණ නානායක්කාර මැතිතුමා පළමුවැනි ප්‍රශ්නයට උත්තර දීලා කිව්වා, ඒක නීතිපතිතුමා කරයි කියලා. සමහර කාරණා ගැන රජයේ ප්‍රතිපත්තිය පිළිබඳව නීතිපතිතුමාම කියන කල් ඉන්න ඕනෑ නැහැ. නීතිපතිතුමාට කියන්න ඕනෑ, බරපතළ නඩු ටික තෝරන්න, ඒවා අග්‍ර විනිශ්චයකාරතුමාට යවන්න, අග්‍ර විනිශ්චයකාරතුමාගේ අනුමැතිය ගන්න කියලා. අද වනකල් එහෙම යවලාත් නැහැ; අනුමැතිය අරගෙනත් නැහැ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම මම එතුමාගෙන් තවත් වැදගත් ප්‍රශ්නයක් ඇහුවා. ඒ තමයි, අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනවා කියලා වෙච්ච පොරොන්දුව ගැන. ඒ ගැන මොකද කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, පෙනෙනවා නේද, තිබෙන වංකකම? දේශපාලනික වංකකම? නිශ්චිතව අහපු ප්‍රශ්නය පැහැදිලියි. නමුත් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන වචනයක් කියන්නේ නැහැ. විධායක ජනාධිපතිකම ගැන රස වැටිලා, මේ කබල් ව්‍යවස්ථාව, මේ සංශෝධිත ව්‍යවස්ථාව නැවත නැවත එහෙමම අරගෙන යන්නයි, හර්ෂණ නානායක්කාර ඇමතිතුමා ඇතුළු කණ්ඩායම තීරණය කරලා තිබෙන්නේ. ඒක ලජ්ජාවට කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your time is over.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහියි; ජනමතයට විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The next speaker is the Hon. Anura Karunathilaka. You have 20 minutes.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
Hon. Speaker, since my name was mentioned, may I explain it?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, ගරු අධිකරණ ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, නීතිඥවරයෙකු වුණාම ඔයිට වඩා නීතිය ගැන දැන ගන්නට ඕනෑ. අධිකරණ සේවා කොමිෂන් සභාව සහ නීතිපති කරන ඒවාට දේශපාලනඥයන් ඇඟිලි ගහන්න යන්නේ නැහැ. එහෙම කළා නම්, එතුමන්ලා තවත් කථාවක් කියනවා. එතුමා තවත් ප්‍රශ්න රාශියක් නැඟුවා. අවුරුද්දයි නේ ගියේ. ඉවසලා ඉන්න. කොච්චර බිරුවත් අපි දන්නවා අප යා යුතු ගමන. කියන ඒවා ඔහේ කියාගෙන ගියාදෙන්; අපට ප්‍රශ්නයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා කථා කරන්න.

[පූ.භා. 10.59]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)
ගරු කථානායකතුමනි, බෙහෙවින්ම ස්තුතියි, කාලය ලබා දුන්නාට.

අපි දන්නවා, රටක් හැටියට අපට තිබෙන අභියෝගය. එක පැත්තකින් ආර්ථිකයේ පදනම ශක්තිමත් කරන්න ඕනෑ. තවත් පැත්තකින්, ඒ ශක්තිමත් පදනම මත ප්‍රමාණවත් සහ ඔරොත්තු දෙන ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යමින්, ඒ ආර්ථික වර්ධන වේගයේ ප්‍රතිලාභ මහ ජනතාවට ලබා දෙන්න ඕනෑ. ඒක, ආණ්ඩුවක් හැටියට තිබෙන වගකීමක්. ඒ වාගේම අපි දන්නවා, අප කොයි තරම් දුරට උත්සාහ කළත්, කොයි තරම් දුරට ශක්තිමත් ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගත්තත්, ඒ ආර්ථික ක්‍රියාවලියට අනුගත වෙන්න අපහසු, ඒකෙන් හැලිලා යන කොටසක් ඉන්න බව. අන්න ඒ කොටස, ආන්තිකරණයට ලක් වෙච්ච ඒ කොටස ගැන සොයා බලා, ඒ අය ඉලක්ක කර ගනිමින් ඒ අය නඟා සිටුවීම සඳහා වාගේම ඒ අයගේ සුබසාධනය නඟා සිටුවීම සඳහා වන වගකීම ආණ්ඩුවට තිබෙනවා. ප්‍රමාණවත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගනිමින් ආර්ථිකය ශක්තිමත් කරන අතරේ ඒ වනකල් ආන්තිකරණයට සහ පීඩාවට ලක් වන ජන කොටස් ඉලක්ක කර ගනිමින් ඔවුන් සවිබලගැන්වීමේ වගකීමත් ආණ්ඩුවකට තිබෙනවා. එතකොට මෙන්න මේ අරමුණු පෙරදැරි කරගෙන තමයි අප හැම අවුරුද්දකම අය වැය ප්‍රකාශය, අය වැය යෝජනා ඉදිරිපත් කරන්න ඕනෑ.

දැනටමත් ඉදිරිපත් වෙලා තිබෙන සංඛ්‍යාලේඛන අනුව අපි දන්නවා, 2024ට සාපේක්ෂව ඒ වන කොට දුර්වල වෙලා තිබිච්ච ආර්ථික පදනමේ යම් යම් ක්ෂේත්‍ර ඔස්සේ 2025දී ශක්තිමත් කරන්න ජාතික ජන බලවේග ආණ්ඩුව හැටියට අපි සමත් වෙලා තිබෙන බව. විශේෂයෙන්ම අපි දන්නවා, අත්‍යවශ්‍ය රාජ්‍ය වියදම් කපා හරින්නේ නැතුව අපි එක පැත්තකින් රාජ්‍ය සේවකයන්ගේ පඩි වැඩි කළා.

වසර ගණනාවක් අතරමැද බඳවා ගත්තේ නැති පිරිස් බඳවා ගැනීම සඳහා අනුමැතිය දුන්නා. ඒ කටයුත්ත ආරම්භ කළා. ඒ වාගේම, බිලියන ගණනක් මුදල් අලුතින් යොදවා, නතර වෙලා තිබුණු ව්‍යාපෘති ගණනාවක් නැවත ආරම්භ කළා. විශේෂයෙන් මහාමාර්ග ව්‍යාපෘති වාගේ දේවල්, ජල ව්‍යාපෘති වාගේ දේවල් වසර ගණනාවක් නතර වෙලා තිබුණේ. ඒවා නැවත ආරම්භ කිරීම සඳහාම රුපියල් බිලියන ගණනක් වියදම් කරන්න අපට සමහර වෙලාවට සිද්ධ වුණා. හැබැයි, ඒ සියල්ල අතරේ අපි විශ්‍රාම වැටුප් වැඩි කළා. ඒ වාගේම, ඒ සියල්ල අතරේ මූල්‍ය විනය පවත්වා ගනිමින් ප්‍රාථමික ගිණුමේ ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.3ක අගයක පවත්වාගෙන යන්න අපට පුළුවන්කම ලැබුණා. 2024ට සාපේක්ෂව ට්‍රිලියන 0.8ක් වෙච්ච ප්‍රාථමික ශේෂය ට්‍රිලියන 1.5 දක්වා වර්ධනය කරන්න මේ කාලය තුළ අපට පුළුවන්කම ලැබුණා. ඒ වාගේම, රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 16ක ප්‍රමාණයක පවත්වාගෙන යන්න අපට පුළුවන්කම ලැබුණා. සමහර අය කියනවා මේක මොන්ටිසෝරි ළමයෙකුටත් කරන්න පුළුවන් කියලා. හැබැයි, 2025දී කිසිම අතිරේක බදු මුදලක් පනවන්නේ නැතිව, ජනතාව මත අතිරේක බරක් පටවන්නේ නැතිව තමයි මේ කර්තව්‍යය කරලා තිබෙන්නේ. ඒ නිසා Montessori teachersලාගෙන් අපට අහන්න පුළුවන්, ඇයි ඔයගොල්ලන් බලයේ සිටි කාලයේ මේ දේවල් කරන්න බැරි වුණේ කියලා.

බදු නිසි පරිදි කළමනාකරණය කරමින්, බදු දැල ශක්තිමත් කරමින්, ඒ වන විටත් පනවන ලද බදු ඒක රාශි කර ගනිමින් තමයි රාජ්‍ය ආදායම වැඩි කර ගත්තේ, අතිරේක බදු පනවන්නේ නැතිව. රට තුළ මූල්‍ය උත්පාදනය සිදු කරනවා වාගේම, රට තුළ රුපියල් වැඩි ප්‍රමාණයක් එකතු කර ගන්නවා වාගේම, විදේශ මුදල් - ඩොලර්- උපයා ගැනීම සඳහා විදේශීය ප්‍රේෂණ, අපනයන ආදායම ඉහළ නැංවීම, සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කිරීම මේ කාලය තුළ කරන්න අපට පුළුවන්කම ලැබුණා. ආර්ථිකයේ පදනම දුර්වල කරන ක්ෂේත්‍ර අන්න ඒ වාගේ කරුණු මත ශක්තිමත් කරලා, ඒ පදනම ශක්තිමත් කරන්න අපට පුළුවන්කම ලැබුණා. හැබැයි, මෙහෙම ශක්තිමත් වුණාට මේ ආර්ථිකයේ නොවිසඳුණු ගැටලු ගණනාවක් තවමත් තිබෙන බව අපි දන්නවා. සියයට 47 තිබුණු labour force එකේ රැකියා නියුක්තිය සියයට 49 දක්වා සියයට 2කින් වැඩි කරන්න අපට පුළුවන්කම ලැබුණා. නමුත්, තවමත් තමන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වෙනත් සුදුසුකම් මත රැකියාවක් සොයාගන්න බැරි තරුණ තරුණියෝ ඕනෑ තරම් ඉන්නවා. ඒ වාගේම, ආන්තිකරණයට ලක් වෙච්ච අය තවමත් සමහර අංශවලින් පීඩාවට පත් වෙනවා, අප ඒ අය වෙනුවෙන් 2025 අවුරුද්ද තුළත් කොයි තරම් ව්‍යාපෘති ක්‍රියාත්මක කළත්. මේ විධියට ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍ය වාගේ දේවල්

සම්බන්ධයෙන් තවමත් සියයට සියයක් විසඳුණේ නැති ගැටලු ඕනෑ තරම් සොයාගන්න අපට පුළුවන්. එහෙම නම්, අන්න ඒ අයගේ ආර්ථික පදනම ශක්තිමත් කරලා, ආර්ථිකයේ තිබෙන ඒ ගැටලු විසඳන්න නම්, ඒ ගැටලු විසඳීමේ දිශානතියකට ළංවෙන්න නම්, අනිවාර්යයෙන්ම අපට අවශ්‍යයි ඉහළ ආර්ථික වර්ධන වේගයක්.

2025 අය වැය තුළ අප ඇත්තටම ඉලක්ක කරන්නේ අපේ ආර්ථිකයට ඔරොත්තු දෙන, ඒ වාගේම ආර්ථික වර්ධනය ඉස්සරහට පවත්වාගෙන යෑම සඳහා ප්‍රමාණවත් සහ ප්‍රශස්ත - optimal - ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යන්නයි. ඒ සඳහා කටයුතු කරන අතරේ අපට පෙනෙනවා, විශේෂයෙන් ආයෝජන ඉහළ නැංවීම සඳහා අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා මොනවාද කියලා. මට කලින් කථා කළ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ඒ සඳහා අවශ්‍ය සමහර නීති, අණ පනත් සම්පූර්ණ කරන්න අප විසින් කටයුතු කරනු ලැබුවේ නැහැ කියලා. උදාහරණයක් හැටියට ගත්තා, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සම්බන්ධ පනත් කෙටුම්පත. එය 2026 වසරේ මුල් කාලය තුළ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන්න අවශ්‍ය කටයුතු මේ වනකොට සම්පාදනය කරලායි තිබෙන්නේ. කැබිනට් අනුමැතිය අරගෙන, ඊට පසුව නීතිපති දෙපාර්තමේන්තුවට යවලා, ඒ කර්තව්‍යය දැන් තිබෙන්නේ අවසන් අදියරේ. ඒ වාගේම, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත සංශෝධනය කරන්න 2026 වසර තුළ අපි කටයුතු කරනවා කියන එක දැනටමත් ප්‍රකාශයට පත් කරලායි තිබෙන්නේ.

ඊළඟ එක තමයි, ආයෝජන ආරක්ෂණ පනත. මේ පනතත් 2026 වසරේ මුල් කාලය තුළ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කරන්න අවශ්‍ය කටයුතු මේ වනකොටත් සම්පාදනය කරලායි තිබෙන්නේ. ඒ අනුව, ඒ ගරු මන්ත්‍රීවරයා සඳහන් කළ පනත්වලින් ගණනාවක කටයුතු මේ වනකොට අවසන් අදියරේ තිබෙන්නේ. මේවා මග හැරලා කටයුතු කරන්න අපි ආණ්ඩුවක් හැටියට කොයි වෙලාවකවත් කටයුතු කරන්නේ නැහැ.

ඒ වාගේම ආයෝජන ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන නීති රීති ගෙන ඒමටත්, තිබෙන අණ පනත් සංශෝධනය කිරීමටත්, අලුත් අණ පනත් ගෙන ඒමටත් කටයුතු කරනවා. මේ අය වැයෙන් ආයෝජන කලාප සංවර්ධනය කිරීම තුළින්, කාර්මීකරණයේ ආර්ථික ප්‍රතිලාභ පළාත් මට්ටමින් ව්‍යාප්ත කිරීම සඳහාත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා නව අවස්ථා නිර්මාණය කිරීම සඳහාත් රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා.

විශේෂයෙන්ම වැදගත් වන කරුණ මේකයි. ජනාධිපතිතුමාත් අය වැය කථාවේදී කිව්වා, අපේ ඉඩම් පරිහරණ සැලැස්ම පිළිබඳව. අලුත් ආයෝජන ඇති කරනකොට ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් අපි දෙසැරයක් හිතන්න ඕනෑ, පැරණි කාලයට අදාළව තිබෙන ඉඩම් පරිහරණය පිළිබඳ ප්‍රතිපත්ති තවදුරටත් ඉදිරියට ගෙනයන්න ඕනෑද, එහෙම නැත්නම්, අලුත් ආයෝජනවලට හිතකර පරිසරයක් සූදානම් කර ගනිමින් අපේ ඉඩම් පරිහරණ සැලැස්ම පිළිබඳ කල්පනා කරන්න ඕනෑ ද කියන කාරණය.

ඒ විතරක් නොවෙයි, බොහෝ වෙලාවට අපට ආයෝජකයෝ එනවා. ආයෝජකයෝ ඇවිල්ලා ව්‍යාපෘති ගෙනෙනකොට, ඒ ව්‍යාපෘතියට ගැළපෙන විධියට තමයි සමහර වෙලාවට අපි ඉඩම් හොයන්නේ. සමහර වෙලාවට ගැළපෙන ඉඩම හොයා ගත්තාට ඒ අවශ්‍ය වන යටිතල පහසුකම් ගැන -විදුලි බලය, ජල සැපයුම- සොයා බලන්න වෙන්නේ ආයෝජකයා යෝජනාව අරගෙන ලංකාවට ආවාට පස්සේ. නමුත් එතෙක් ආයෝජකයෙක් බලාගෙන ඉන්නේ නැහැ. ඒ නිසා තමයි අපි කල්පනා කර තිබෙන්නේ ආයෝජනය කළ හැකි ඉඩම් හඳුනාගෙන, ඒ ඉඩම්වලට සුදුසු මොන වාගේ ආයෝජනද කියලා කල්පනා කරලා, ආයෝජකයන් එන්න කලින් ඒකට අවශ්‍ය යටිතල පහසුකම් හදලා ඉවර වෙලා, ඒ ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් මධ්‍යම ඩිජිටල් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කරන්න. එතකොට ආයෝජකයා ඔහුගේ යෝජනාව අරගෙන ආවාට පස්සේ අපට බලන්න පුළුවන්, ඒ ආයෝජකයාගේ යෝජනාවට ගැළපෙන ඉඩම කොහේද තිබෙන්නේ කියලා. ඒකේ යටිතල පහසුකම් ඒ වනකොටත් සංවර්ධන කරලා ඉවරයි. එතකොට ආයෝජකයාට පුළුවන් ඉතා ඉක්මනින් එයාගේ ආයෝජන කටයුතු පවත්වාගෙන යන්න. මේ විධියට ආයෝජනය ඉහළ නැංවීම සඳහා, ඒ වාගේම ආයෝජනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඇත්තටම මේ අය වැය ලේඛනය තුළ ඉතා සාධනීය යෝජනා ගණනාවක් ඇතුළත් වෙලා තිබෙනවා.

ඒ වාගේම වැදගත් වන කාරණයක් තිබෙනවා. රටේ ආර්ථික වර්ධන වේගය අත්පත් කර ගන්න නම්, විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ ඒ ව්‍යවසායකත්වය පුළුල් කිරීම සඳහා කටයුතු කරන්න ඕනෑ. එක පැත්තකින් ඔවුන් ආරක්ෂා කරන්නත්, ඒ වාගේම ඔවුන්ගේ ව්‍යවසායකත්වයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහාත් අපි කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා තමයි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනය සඳහා මේ අය වැයෙන් රුපියල් බිලියන 53.4ක මුදලක් වෙන් කරන්න යෝජනා කරලා තිබෙන්නේ. ඒ මුදල් වෙන් කරලා විතරක් නොවෙයි, එතැනින් පස්සේ ඒ හිතකර පරිසරය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන පරිපාලනමය ව්‍යුහය, ඒ වාගේම අවශ්‍ය වන වෙනත් යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා අය වැය යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. උදාහරණයක් හැටියට මේ යෝජනාව තුළ තිබෙනවා, කාර්මික සංවර්ධන මණ්ඩලය යටතට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන අංශය වාගේ ආයතන එකතු කරලා කාර්මික සංවර්ධන මණ්ඩලය තනි ආයතනයක් බවට පත් කරන්න. යම් යම් අනුමත කිරීම් ඉක්මනින් කර ගන්න, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාට, ඒ ආයෝජකයාට බලපාන තීන්දු තීරණ ඉක්මනින් කාර්යක්ෂමව ගන්න පුළුවන් වන විධියේ පරිපාලන ව්‍යුහයේ වෙනස්කම් ඇති කරන්න මේ අය වැය තුළ යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ කර්මාන්ත කලාප පිහිටුවීම සඳහා මූලික යෝජනාව තුළ රුපියල් මිලියන 4,000ක් වෙන් කර තිබුණා. ඒකට තවත් රුපියල් මිලියන 1,000ක් සමඟ රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට මෙවර අය වැයෙන් කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපට මතකයි, 2025දී ඇප රහිතව ව්‍යවසායකයන්ට ණය ලබා දීම සඳහා රුපියල් මිලියන 4,270ක් වෙන් කළ බව. ඒ යෝජනාව තුළ යම් අදහසක් තිබුණා, වෙනම බැංකුවක් හදන්න. හැබැයි, පසුකාලීනව වඩා ප්‍රායෝගික නිසා තිබෙන බැංකු උපයෝගී කර ගනිමින් එම මුදල ලබා දෙන්න අපි කටයුතු කළා. දැන් සමහරු අහනවා, කෝ අලුත් බැංකුව හැදුවාද කියලා. බැංකුව හැදුවේ නැති වුණාට පසුගිය සැප්තැම්බර් මාසය වනකොට රුපියල් මිලියන 4,027ක් -ඒ කියන්නේ, එම වෙන් කළ මුදලින් සියයට 94ක්- ඉක්මවා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඇප රහිත ණය ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. එතකොට ඒ අරමුණ සාර්ථක වෙලා නැද්ද? මෙම සාර්ථකත්වය නිසාම 2026 අය වැයෙන් ඒ සඳහා රුපියල් මිලියන 7,000ක් අලුතින් වෙන් කරලා තිබෙනවා.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙන අතරේ, ව්‍යාපාරිකයන්ටත් සහන ලබා දී තිබෙනවා. සාර්ථක ව්‍යාපාරිකයන්ට රුපියල් මිලියන 25 දක්වා ණය ලබා දෙන්නත්, කිසියම් ආර්ථික දුෂ්කරතාවකට මුහුණ පා තිබෙන ව්‍යාපාරිකයන් ඉන්නවා නම් එවැනි ව්‍යාපාරිකයන්ට

[ගරු අනුර කරුණාතිලක මහතා]

රුපියල් මිලියන 15 දක්වා ණය ලබා දෙන්නත් මුදල් වෙන් කර තිබෙනවා. ඊට අමතර සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් සඳහා රුපියල් මිලියන 50 දක්වා ණය ලබා දීම වෙනුවෙන් රුපියල් මිලියන 5,900ක් වෙන් කරලා තිබෙනවා. මෙන්න මේ විධියට එක පැත්තකින් ආර්ථික වර්ධන වේගය අත්පත් කර ගැනීම සඳහාත්, එම ආර්ථික වර්ධන වේගය අත්පත් කර ගැනීම සඳහා ආයෝජකයන්ට හිතකර පරිසරයක් ඇති කරන්නත්, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් ශක්තිමත් කරන්නත්, 2025 අය වැයේදී ගෙනාපු යෝජනා තවදුරටත් ශක්තිමත් කරමින් ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ අය වැය තුළ ඉදිරිපත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මම තව එක කාරණාවක් ගැන විතරක් කථා කරලා, අවසානයට යොමු වන්නම්. ඩිජිටල්කරණය කියන්නේ, ජාතික ජන බලවේගය ආණ්ඩුව ප්‍රමුඛවම අවධානය යොමු කර කටයුතු කළ වැඩ පිළිවෙළක්. 2025දී අපි ඒ සඳහා සාධනීය යෝජනා ගෙනාවා වාගේම, ඒ තුළින් තවදුරටත් ඉස්සරහට යමින් මේ අවුරුද්දේ රුපියල් මිලියන 25,500ක් ඒ වෙනුවෙන් වෙන් කරන්න කටයුතු කරලා තිබෙනවා. අපි දන්නවා ගිය අවුරුද්දේ හඳුන්වා දුන්න GovPay කියන system එක මිලියන 2,000කට වඩා ගනුදෙනු සංඛ්‍යාවක් මේ වනකොටත් අවසන් කර තිබෙනවා, ඉතා ශක්තිමත් හා සාර්ථක ව්‍යාපෘතියක් හැටියට. ඒ වාගේම රාජ්‍ය ලේඛන ඩිජිටල්කරණය සඳහා GovTech කියන ව්‍යාපෘතියක් ඇති කරලා, ඒ හරහා ලේඛන ඩිජිටල්කරණය කරලා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාව ඇති කිරීම සඳහා අවශ්‍ය යෝජනා ගණනාවක් මෙම අය වැය තුළ සඳහන් වෙලා තිබෙනවා.

ඒ වාගේම Digital Economy Council එකක් හදන්න, 2026 තුන්වන කාර්තුව වනකොට පළමු ඩිජිටල් හැඳුනුම්පත ලබා දෙන්න, විශේෂයෙන් භෞතික මුදල් - physical currency - ගනුදෙනු හැකිතාක් දුරට අඩු කිරීමේ යෝජනාවකුත් තිබෙනවා. ලෝකයේ දැන් තිබෙන trend එක ඒක. හැම transaction එකක්ම, සියලු transactions හැකිතාක් දුරට online platform එකකට ගෙනෙන එක තමයි ලෝකයේ trend එක. භෞතික මුදල් ගනුදෙනු අඩු කිරීම සඳහා, විශේෂයෙන්ම රාජ්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීමේදී online platform එක හරහා කරන ගනුදෙනු ධෛර්යවත් කිරීමට සේවා ගාස්තු අය නොකරන්න තීරණය කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන පද්ධති වැඩිදියුණු කරන්න රුපියල් මිලියන 1,000ක් සහ පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. මේ ආදී වශයෙන් ගත්තාම ඩිජිටල්කරණය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය යෝජනා, ඒ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර 2026 අය වැය තුළින් අපි කරුණු ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වෙන් කිරීම සම්බන්ධව සමහර අය අහපු ප්‍රශ්නයක් තිබෙනවා. අපි දත්ත මධ්‍යස්ථානයට අවශ්‍ය වන යටිතල පහසුකම් ඇති කිරීම සඳහා මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. සමහරු ඇහුවා, රුපියල් මිලියන 500ක් වෙන් කරලා දත්ත මධ්‍යස්ථානයක් ඇති කරන්න පුළුවන්ද කියලා. හැබැයි, ඒ අයට නොතේරෙන කාරණය මෙයයි. ඒ රුපියල් මිලියන 500 අපි වෙන් කරන්නේ දත්ත මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම්, ශක්‍යතා අධ්‍යයන සහ අනෙකුත් දේවල් කරන්න. ඒකෙන් අදහස් වෙන්නේ නැහැ ඒ රුපියල් මිලියන 500න් තමයි දත්ත මධ්‍යස්ථානය හදන්නේ කියලා. ඒකට අවශ්‍ය වන රාජ්‍ය සහ පෞද්ගලික හවුල්කාරිත්වය, එහෙම නැත්නම් වෙනත් ගැළපෙන ආයෝජන ආදර්ශ පාවිච්චි කරලා එම දත්ත මධ්‍යස්ථානය ඇති කරනවාය කියන තීරණය අරගෙන තමයි අපි කටයුතු කරන්නේ. ඒ සඳහා අවශ්‍ය වන යටිතල පහසුකම් ඇති කරන්න තමයි එම ව්‍යාපෘතියට මේ මිලියන 500 වෙන් කරන්නේ. ඒ වාගේම කෘත්‍රිම බුද්ධිය, විදේශීය පුහුණුව, ශිෂ්‍යත්ව ආදිය පාසල් දරුවන්ට සහ විශ්වවිද්‍යාලවලට ලබා දීමට, පර්යේෂණ අංශය ශක්තිමත් කරන්න තවත් මිලියන 7,750ක් වෙන් කරලා තිබෙනවා.

මම කැමැතියි, පොඩි වේලාවක් අරගෙන විශ්වවිද්‍යාල පද්ධතිය ගැන කථා කරන්න. විශ්වවිද්‍යාල පද්ධතිය සඳහා අපේ කාලය තුළ පසුගිය අවුරුද්දේ මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 2,500කින් වැඩි කළා, මේ අවුරුද්දේ තවත් රුපියල් 2,500ක් වැඩි කරලා, ඒක සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. වෛද්‍ය පීඨ සංවර්ධනය කිරීම සඳහා මිලියන 11,000ක්, පර්යේෂණ කටයුතු වර්ධනය කරන්න මිලියන 11,500ක්, උසස් අධ්‍යාපනය සඳහා සියලු ආබාධ සහිත දරුවන්ට මාසිකව රුපියල් 5,000ක් ලබා දෙන්න, නේවාසිකාගාර ප්‍රතිසංස්කරණයට, නවතා දැමූ ව්‍යාපෘති නැවත ආරම්භ කරන්න, විශ්වවිද්‍යාල පනතේ සීමිත වෙනස්කම් කිහිපයක් ආදී වශයෙන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පියවර ගණනාවක් මේ වෙනකොට අරගෙන තිබෙනවා. ඔය අතර සමහර කෙනෙකුට හිතෙන්න පුළුවන්, තමන්ට ආවේණික ගැටලු කිහිපයක් තවමත් තිබෙනවා කියලා. Bigger picture එක බලන්නේ නැතිව, විශ්වවිද්‍යාල පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා, අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට ගත්ත පියවර කල්පනා කරන්නේ නැතිව තමන්ට බලපාන පෞද්ගලික ප්‍රශ්නය සම්බන්ධයෙන් විතරක් කථා කරලා ඒක හුවා දක්වන්නත් අවශ්‍ය කෙනෙකුට පුළුවන්.

අවසාන වශයෙන් මම කල්පනා කළා, මේ අය වැය සම්බන්ධයෙන් රටේ ජනතාව මොනවාද කියන්නේ කියලා බලන්න. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සභාපති හේෂණ කුරුප්පු මැතිතුමා කියනවා, " 2026දී රජය බලාපොරොත්තු වෙනවා, ප්‍රාථමික ගිණුමේ අතිරික්තය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 2.5ක් විධියට පවත්වාගෙන යන්න. මේ අවුරුද්දේ සියයට 2.5කට වැඩි ප්‍රමාණයක අතිරික්තයක් තිබෙනවා. රජය අතිරික්තයක් එකතු කර ගැනීම තමයි බලාපොරොත්තු වෙන්නේ. ඒක හොඳ දෙයක්. එයින් ණය සේවාකරණය කරන්න පුළුවන්, ඒ අතිරික්තය යොදවලා" කියලා. ඒ වාගේම සංචාරක මණ්ඩලයේ මාර්ගෝපදේශකවරයෙක් සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීම සඳහා ගත්ත පියවර අගය කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඒ වාගේම කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ප්‍රසාද් සේරසිංහ, ඒ වාගේම පූජ්‍ය විජිතපුරේ විමලරතන හාමුදුරුවෝ වාගේ ආර්ථික ක්ෂේත්‍රයේ විද්වතුන්, අය වැයේ යෝජනා දැකලා ඒ සාධනීය පියවර අගයලා තිබෙනවා. ඔය අතරේ අපේ විපක්ෂයේ සමහර අයත් මේ සම්බන්ධයෙන් කථා කළා. මම තත්පර කිහිපයක් අරගෙන ඒකත් කියලා මගේ කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි. මම එක කථාවක් විතරක් ගන්නම්.

අපි දන්නවා කොළඹ ලෝටස් වටරවුම ආශ්‍රිත තදාසන්න ප්‍රදේශයේ ලොකු traffic එකක් හැදෙනවා. ඒ traffic congestion එක වළක්වා ගැනීම සඳහා Marine Drive එකට සමාන්තරව මුහුද මතින් පාරක් හදන්න අවශ්‍ය ශක්‍යතා අධ්‍යයනය නිම කරන්න මුදල් ප්‍රමාණයක් වෙන් කළා. මේක දැකපු ඇලෝසියස්ගේ යාළුවා කියනවා, "මුහුද මැදින් පාරක් හදනවා, එතකොට මාළු කොහොමද දෙපැත්තට එහාට මෙහාට යන්නේ?" කියලා. මම කියන්න කැමැතියි, ලෝකයේ මේ වාගේ හදපු පාරවල් ඕනෑ තරම්

තිබෙන බව. Atlantic Ocean එක, ඒ වාගේම Pacific Coast Highway එක, ආසන්නම රට වන ඉන්දියාවේ පැරණි මුම්බායි නගරය සහ නව මුම්බායි නගරය යා කරමින් මේ වාගේ මාර්ග ඇති කරලා තිබෙනවා, සම්පූර්ණයෙන් මුහුද මැද්දෙන්. ඇලෝසියස් මහත්තයාගේ යාළුවා කියන විධියට මාළු දෙපැත්තේ බලාගෙන ඉන්නවා. තාත්තා එක පැත්තක, අම්මා එක පැත්තක, පෙම්වතිය එක පැත්තක, පෙම්වතා තවත් පැත්තක. ඔරුවකින් යන්න පුළුවන් නම්, එතුමාට පුළුවන් ඔරුවෙන් ගිහින් කෙසෙල් ගෙඩි බෙදන්න, අර බලාගෙන ඉන්න මාළුවන්ට. හැබැයි මම දන්නේ නැහැ, මාළු කෙසෙල් ගෙඩි කනවාද නැද්ද කියලා. විපක්ෂයේ මහත්වරුන්ට කැමති නම් තමන්ගේ හීන ලෝකවල ඉඳගෙන මේ වාගේ ඕනෑ තරම් දේවල් කියන්න පුළුවන්. හැබැයි රටේ ජනතාව, විශේෂයෙන් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන විද්වත් උදවිය මේකේ තිබෙන සාධනීය තත්ත්වයන් දැකලා, මේ අය වැය ඉදිරියට යන්න ඕනෑ, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඉදිරියට යන්න ඕනෑ කියන එක දැනටමත් තීරණය කරලා තිබෙනවා. මම අවසාන වශයෙන් කියන්න කැමැතියි, "හොඳ දේ දකින්න, වැරදි දේ වැරදි විධියට දකින්න. හැබැයි හොඳ අමතක කරලා වැරදි දේ දකින්න එපා" කියලා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. K.V. Samantha Viddyarathna. You have 20 minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.22]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 වසරට අදාළ අය වැය ලේඛනය පිළිබඳව විවාද කරන මේ මොහොතේ, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා හැටියට මේ අය වැයේ මම ඉතාම සතුටු වෙන කොටසක් පිළිබඳව සඳහන් කරන්න කැමැතියි. මම වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ අයත්, මේ රටේ සිංහල, දෙමළ සහ මුස්ලිම් ජනතාවගෙන් බහුතරයකුත් ඒ කාරණය සම්බන්ධයෙන් ඉතා සතුටට පත් වෙයි කියා මම හිතනවා.

මොකද, මේ රටට මලෙයහම් ප්‍රජාව ඇවිල්ලා වසර 200ක් පිරෙනවා. ඇත්තටම ගත්තොත්, ඔවුන්ට තවම මේ රටේ මූලික අයිතිවාසිකම් සැලකිය යුතු ප්‍රමාණයකින් ලැබී නැහැ. ඔවුන් තවම ඉන්නේ කොම්පැනිවලට අයිති ලැයිම් කාමරවල. ඒ ලැයිම් කාමර සමහර විට ලොකු ලොකු ඇත්තන්ගේ සතුන්ට තිබෙන සැප සම්පත් සහිත කාමරවල තත්ත්වයේ ඒවා නොවෙයි. ඔවුන්ට නිවසක අයිතියක් නැහැ; ඉඩමක අයිතියක් නැහැ. වැසිකිළි පහසුකම් නැහැ, පිරිසිදු පානීය ජලය නැහැ. අන්න ඒ වාගේ දුක්ඛිත තත්ත්වයක සිටින ප්‍රජාවක් තමයි ඒ අය. අපට පුළුවන් වුණා, ඒ අයට පාරට බහින්න ඉඩ තබන්නේ නැතුව වැටුප් වැඩි කර දෙන්න. මොකද, ඉතිහාසය පුරාම ඔවුන් පාරට බැහැලා අරගළ කරලා, කඳුළු ගෑස් කාලා තමයි තමන්ගේ වැටුප් වැඩි කර ගත්තේ. එක වතු කම්කරුවෙක් හිනාවෙලා, සතුටු කඳුළු හෙළමින් මට කිව්වා, "අපි හීනෙකින්වත් හිතුවේ නැහැ, අපට මෙහෙම පඩියක් වැඩි වෙයි කියලා. මොකද, ඉතිහාසයේ අපිට එහෙම ලැබුණේ නැහැ" කියලා. ඉතින්, ඔවුන් සතුටු වෙනවා වාගේම මමත් ඒ ගැන සතුටු වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් කර තිබෙනවා, වතු කම්කරුවෙකුගේ වැටුප රුපියල් 350කින් වැඩි කරනවා කියලා. නමුත් අපි දැන් එම ප්‍රමාණය රුපියල් 400කින් වැඩි කර තිබෙනවා. ඒ අනුව සමාගම් විසින් රුපියල් 200ක් දෙනවා, තව රුපියල් 200ක් රජයෙන් දෙනවා. ඒ අනුව දෛනිකව රුපියල් 1,750ක වැටුපක් ඒ අයට ලැබෙනවා. එතකොට සේවකයෙක් දවස් 25ක් වැඩට ආවොත්, ඔහුගේ මාසික වැටුප රුපියල් 10,000කින් වැඩි වෙනවා.

හැබැයි, මේකත් එක්කම අපට පෙනී යනවා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගෙන් මේ කාරණයට විරෝධතා මතු වෙන්නට පටන් ගෙන තිබෙන බව. ඔවුන් දැන් යම් මතයක් හදන්න පටන් ගෙන තිබෙනවා. ඒ කට්ටිය ඒකත් ටිකක් පරිස්සමින් කරන්නේ. "අපි මේකට කැමැතියි. නමුත් මේක කරන්න බැහැ" වාගේ කථාවක් කියමින් යනවා. මම ඊයේත්, පෙරේදාත් මාධ්‍ය තුළ දැක්කා, සංවාදවලට යන මන්ත්‍රීවරුන් අහන කාරණයක්. "රජයේ මුදල් කොහොමද සමාගම්වලට දෙන්නේ? මේක වැරදියි, මේකට නීතියක් නැහැ, මේක දෙන්න පුළුවන්කමක් නැහැ" වාගේ කාරණා ඒ අය මතු කරනවා. දැන් අපිට තොරතුරු වාර්තා වෙනවා, ඒ අයගේ සමහර කණ්ඩායම්; පුරවැසියන් යොදා ගනිමින් රජයේ මුදල් සමාගම් වෙත දෙන්න හදනවා කියලා ඒ සම්බන්ධයෙන් අධිකරණයට යන්නට මතයක් හදන්නට ඒ අය මහන්සි ගන්නවා කියලා. ඒ අය මේ සම්බන්ධයෙන් කකුලෙන් අදිමින්, අහිංසක වතු කම්කරුවන්ට රුපියල් 200ක දීමනාවක් දෙන එක වළක්වන්නට උත්සාහ ගන්නා ස්වභාවයක් ඒ තුළ අපට පෙන්නුම් කරනවා. ඊයේ නාමල් මන්ත්‍රීතුමාත් පාර්ලිමේන්තුවේදී කිව්වා, වතු කම්කරුවාට දෙන්නේ නැතුව සමාගම්වලට දුන්නා නම් මීට වඩා හොඳයි කියලා. ඔව්, ඒ කට්ටිය ඒ කාලයේ සමාගම්වලට තමයි දුන්නේ. ඒ කට්ටියගේ හිතවත් අයට තමයි බදු සහන දුන්නේ. ඒ නිසා අපිටත් ඒ විධියේ යෝජනා කරනවා. මෙතැන කුමන්ත්‍රණකාරී තත්ත්වයක් තිබෙනවා. මම ඒ ගැනත් පැහැදිලි කරන්න ඕනෑකම තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයක් හැටියට පාර්ලිමේන්තුවේදී අය වැය ලේඛනයක් ඉදිරිපත් කරලා එය සම්මතවීමෙන්ම, එක පැත්තකින් එය නීතියක් බවට පත් වෙනවා. නීතිමය පැත්තෙන් බාධාවක් නැහැ. ඇත්තම තත්ත්වය ගත්තොත් ඔය ආණ්ඩුත්, මේ ආණ්ඩුවත් මේ රටේ කර්මාන්ත, ව්‍යාපාර සහ කම්කරුවා ආරක්ෂා කරන්න යම් යම් තීන්දු අරගෙන තිබෙනවා. ඉදිරියටත් අපි එවැනි තීන්දු ගන්නවා. මේ රටේ තිබෙන ණය ගෙවා ගන්න බැරි සමහර සමාගම්වල ණය -රජයට අය වෙන්න තිබුණු මුදල්- පසුගිය කාලයේ බොල් ණය හැටියට කැපුවා. දැන් මේ අය කියන විධියට නීතියට අනුව වතු කම්කරුවන්ට මේ මුදල දෙන්න බැරි නම් - අපේ අමාත්‍යාංශයෙන් තේවලට පොහොර දෙනවා; පොල්වලට පොහොර දෙනවා. සමාගම්වලට තේ පොහොර සහනාධාර, පොල් පොහොර සහනාධාර ඉතිහාසයේත් දුන්නා, දැනුත් දෙනවා. කර්මාන්තවලට උදවු කරනවා. මේ කට්ටිය දැන් මහන්සි ගන්නේ මොකකටද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ලේඛනයේ සඳහන් වෙනවා, ආබාධ සහිත ප්‍රජාවට පෞද්ගලික අංශය තුළ රැකියා ලබා දීමේදී එම මාසික වැටුපට අමතරව රජයෙන් උපරිමය රුපියල් 15,000ක් වන පරිදි ගෙවීමක් කරනවා කියලා. හැබැයි, මේ අය ඉදිරිපත් කරන තර්කය එතැනටත් ආවොත්, ඒකත් දෙන්න බැහැ නේ. මොකද, ඒවාත් කොම්පැනි නේ. මේ තර්ක ගෙනෙන්නේ මේවා නොදී සිටින තැනට වැඩ කරන්නයි. හැබැයි, අපි කියන්න කැමැතියි මේ රටේ වතු කම්කරු ජනතාව මේ

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

සම්බන්ධයෙන් චලනය වෙන්න අවශ්‍ය නැහැ; බිය වෙන්න අවශ්‍ය නැහැ කියලා. මොකද, ජනවාරි මාසයේ ඉඳලා මේ කියන වැටුප අපි අනිවාර්යයෙන්ම වතු කම්කරු ජනතාවට ලබා දෙනවා කියන පණිවුඩය මා ලබා දෙන්න කැමැතියි.

මෙතැන තිබෙන ප්‍රශ්නය කවුරුත් තේරුම් ගත යුතුයි. මේ රටේ වතු කම්කරුවා තමයි දැඩි මන්දපෝෂණයෙන් පෙළෙන්නේ; රක්ත හීනතාවෙන් පෙළෙන්නේ; සමාජ අසාධාරණයට ලක් වෙලා තිබෙන්නේ. ඒ වාගේ ප්‍රජාවකට අමතරව රුපියල් 200ක් ලබා දෙන්න හදනකොට ඒකටත් කකුල් මාට්ටු දමන්න හදනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක මහ ලොකු මුදලක් නොවෙයි, රුපියල් 200යි.

අන්න ඒ අයට දැනගන්නයි මම මේක කියන්නේ. නිල් පාට, කොළ පාට පක්ෂවල අය ආණ්ඩු කරන කාලයේ මගේ අමාත්‍යාංශය භාරව හිටපු ඇමතිවරුන්ට ලෝක බැංකුවෙන් ණයක් ලැබුණා. ඒකෙන් ASMP කියලා එකක් ගෙනාවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ව්‍යාපෘතියෙන් ආධාර දුන්නේ වැවිලි ක්ෂේත්‍රයේ සංවර්ධනයට. වැවිලි භෝගවලට අගය එකතු කරලා ව්‍යවසායකයන්ටත්, කර්මාන්තකරුවන්ටත් යම් ප්‍රමාණයක් දෙන්න කිව්වා. මම කියන්නම්, ඒ ආධාර දීපු අය කවුද කියලා. අපි තවම ලෝක බැංකුවට ඒ ණය ගෙවනවා. එදා ඒ මුදල් දුන්නේ ප්‍රදාන හැටියට. ඒ, ව්‍යවසායකයන්ට, කර්මාන්තකරුවන්ට, වැවිලි ප්‍රජාවට දුන් මුදල්. ඒ නම් ලැයිස්තුව දිගයි, මම ටිකක් කියන්නම්. ලෝක බැංකුවෙන් ලැබුණු ණය මුදල එදා දුන්නා, ආධාර හැටියට. කාටද දුන්නේ? Anoma Agro-Based Products (Pvt.) Limited කියන company එකකට දුන්නා. ඒක, හිටපු ප්‍රාථමික කර්මාන්ත අමාත්‍ය දයා ගමගේ මහතාගේ නෝනාගේ company එක. ඒකට රුපියල් ලක්ෂ 149.5ක් දුන්නා. දැන් එහෙම company එකකුත් නැහැ, ණය ගෙවන්නේත් නැහැ. මේක තමයි ඇත්ත කථාව. ඊට පස්සේ හිටපු අමාත්‍යාංශ ලේකම් බන්දුල වික්‍රමආරච්චිගේ පුතාට රුපියල් ලක්ෂ 82ක් දුන්නා. ඒ කියන්නේ, දයා ගමගේ හිටපු ඇමතිතුමාගේ ලේකම්. ලේකම්ලා, ඇමතිලා එදා ඒ විධියට තමයි ඒ මුදල්වලට ගැහුවේ. ඊළඟ එක, Asahi Constructions (Pvt.) Limited. කවුද මේ? ඒක රොෂාන් රණසිංහගේ නෝනාගේ company එකක්. ඒකට රුපියල් ලක්ෂ 180ක් දුන්නා. ඊළඟට, හිටපු නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩට රුපියල් ලක්ෂ 180ක් දුන්නා. ඊළඟට තිබෙනවා, Luck Ama (Pvt.) Limited කියලා company එකක්. ඒක කාගේද? ඒක ඔබතුමන්ලාගේ පක්ෂයේ ලක්ෂ්මන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමාගේ පුතාට අයිති එකක්. එතකොට ඩී.ජී.පී.ජේ. සෙනෙවිරත්නට රුපියල් ලක්ෂ 375ක් දුන්නා. ඊළඟට, Suhada Enterprises. ඒකේ අයිතිකාරයා කවුද? ඒ.ඩබ්ලිව්.කේ. බන්දුල. ඒ, කවුද? මහින්ද අමරවීරගේ සහෝදරයා. ඔහුට දුන්නා, රුපියල් ලක්ෂ 481ක්. දැන් මේ අහිංසක කම්කරුවාට රුපියල් 200ක් දෙනකොට තමයි අමාරුව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ ඊළඟ කාරණයත් අපි තේරුම් ගන්න ඕනෑ. ඒ දීපු සල්ලිවලින් බොහෝදෙනෙක් කර්මාන්තයක්, ව්‍යවසායක් ආරම්භ කළේ නැහැ. මේ දෙගොල්ලන්ම අවුරුදු 76ක් ආණ්ඩු කළේ කොහොමද කියලා දන්නවාද? කොළ පාට අය ඇවිල්ලා නිල් පාට අයට ගහනවා. නිල් පාට අය ඇවිල්ලා කොළ පාට අයට ගහනවා. ඒක මම මෙහෙම කියන්නම්.

"උන් හොරු කිය කියා අල්ලපු හොරෙක් නැත
මුන් හොරු කිය කියා දුන් දඬුවමක් නැත
උන් මුන් එකතු වී කා දැමූ රටක් ඇත
ඒ රට ඇතුළේ බත් කන හරක් ආයෙත් ඇත්තේ නැත"

අපි ඒ අයට කියන්න කැමැතියි, ඒ රට ඇතුළේ බත් කන හරක් ආයෙත් ඉන්නේ නැහැ කියලා. දැන් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ඇවිල්ලා තිබෙන්නේ. මේ කරපු දේවල් තේරුම් ගන්න. මම නම් කියපු අය ගත්ත සල්ලිවලින් ව්‍යාපෘතියක් කළේ නැහැ. නමුත් අපි ලෝක බැංකුවට ක්‍රමානුකූලව දීර්ඝ කාලීනව මේ ණය ගෙවන්න ඕනෑ. ලෝක බැංකුව මේවා නිරීක්ෂණය කරලා කිව්වා, මේ ව්‍යවසායයන් ආරම්භ කරලා නැහැ, මේ කර්මාන්ත ආරම්භ කරලා නැහැ, ඒ නිසා ණය දීර්ඝ කාලීනව ගෙවන්න දෙන්න බැහැ, වැරදි විධියට මුදල් පරිහරණය කළා නම් එකපාරටම ඒ මුදල ගෙවන්න කියලා. ඒගොල්ලන් අපේ ආණ්ඩුව ආපු ගමන්ම අපට බකට් එක ඇද්දා. ඊට පස්සේ අපි මොකද කළේ? අපි මුදල් අමාත්‍යාංශයෙන් ලියුම් ලිව්වා, අපි මේවා ක්‍රමානුකූලව, දීර්ඝ කාලීනව නඩු දමලා අය කරලා දෙන්නම්, අපට කල් දෙන්න කියලා. මේ අවුරුද්දේ ජූනි මාසයේ 02වැනි දා ලෝක බැංකුවෙන් මුදල් අමාත්‍යාංශයට ලියුමක් ආවා, කල් දෙන්න බැහැ, ව්‍යාපෘති කළේ නැත්නම් ඒක රජයේ දුර්වලකමක්, ඒ වැය කරපු මුදල් වහාම ගෙවන්න, නැත්නම් ලෝක බැංකුවෙන් ලංකාවට ආධාර දෙන්නේ නැහැ, කිසි දෙයක් දෙන්නේ නැහැ කියලා. මූල්‍ය වශයෙන් බංකොලොත් වෙච්ච නිසා අපට ලෝකයෙන් කැත නාමයක් ලැබිලා තිබෙනවා. ලෝක බැංකුවෙන් අනෙක් ජාත්‍යන්තර ආයතනත් හිර කළා නම්, අපට ඒ ආයතනවලින් කිසිම ආධාරයක්, උපකාරයක් ගන්න බැරිවනවා. ඒ නිසා මගේ අතින්ම අත්සන් කරලා 2025.06.30 දින Cabinet Paper එකක් දැම්මා, මෙහෙම ප්‍රශ්නයක් මතු වුණොත් ඒක රටට බලපානවා, ඒ නිසා ඩොලර් 508,863ක් -හිටපු මැති ඇමතිවරුන්ගේ සමාගම්වලට ගෙවපු ණය- ඉක්මනින්ම ලෝක බැංකුවට ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන්න කියලා. ඒ අයගේ සල්ලි අපි ගෙව්වා. හැබැයි, ඒ අය හොරකම් කළා කියලා අපි මේක නවත්වන්නේ නැහැ. දැන් නීතිපති හරහා දයා ගමගේ ඇතුළු ඔක්කෝමලාට අපි නඩු දාගෙන යනවා. එහෙම කරපු අය මාධ්‍යයට ගිහිල්ලා අහනවා, වතු කම්කරුවන්ට රුපියල් 200ක් දෙන්නේ මොන නීතියෙන්ද කියලා. මම අහනවා, මොන නීතියෙන්ද මේක කළේ කියලා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
එහෙම කියන්නේ කවුද?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
එහෙම කියන්නේ මම.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නැහැ, එහෙම ගෙවන එක හොඳයි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඒක දැන් කියන්නේ ඔබතුමා. ඔබතුමා මේ තර්කය ගැන හිතන්නකෝ.

මම දැක්කා, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා මාධ්‍යයට කිව්වා, - *[බාධා කිරීමක්]* ඉන්නකෝ. මම දැක්කා, *[බාධා කිරීමක්]* එතුමා කිව්වා, රුපියල් මිලියන 500 ප්‍රමාණයවත් නැහැ කියලා මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කිව්වා කියලා. මෙතැනදී හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒක කිව්වා. රුපියල් මිලියන 500 ප්‍රමාණයවත් නැහැ, ඕක ගෙවන්නේ කොහොමද, ඕක කෙරෙන එකක් නොවෙයි කියලා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා. *[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි. ඔබතුමා කිව්වා කියලා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා.

ඔබතුමා දන්නවාද, අපේ රටේ වතු කම්කරුවන් කීදෙනෙක් ඉන්නවාද කියලා? වතු කම්කරුවන් 140,000ක් පමණ ඉන්නවා කියලා එතුමන්ලා කිව්වා. කම්කරු අමාත්‍යාංශයේ අර්ථසාධක ලබන, පාරිතෝෂික ලබන, ලියාපංදිංචි කම්කරුවන් RPC වතුවල ඉන්නේ 87,600යි. අපි මේ සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. ඒ මුදලින් ඒක කරන්න පුළුවන්කමක් තිබෙනවා. මේ අය බොරු සමාජගත කරනවා; බොරු පිඹිනවා. අහිංසක මිනිහෙකුට රුපියල් 200ක් දෙනකොට තමයි රුදාව තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ තත්ත්වය අපි තේරුම් ගන්න ඕනෑකම තිබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, මෙතුමාට බාධා කරන්න ඉඩ දෙන්නද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි, මම මේක කියන්නේ සද්භාවයෙන්. Mike එක දෙන්නකෝ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඔබතුමාගේ වෙලාවෙන් ගන්න, මගේ වෙලාවෙන් නම් අඩු කරන්න එපා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඔබතුමා කථා කරලා යනවා නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
යන්නේ නැහැ, යන්නේ නැහැ, අපි ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mano Ganesan, you have been allotted 15 minutes.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි, මම සද්භාවයෙන් කියන්නේ, රුපියල් 200 දෙන්න. ප්‍රශ්නයක් නැහැ. ඒකේ කොතැන හරි නීතිමය ප්‍රශ්නයක් තිබෙනවා නම්, ආණ්ඩුවට පුළුවන් නේ එය විසඳාගන්න. *[බාධා කිරීමක්]* ප්‍රශ්නයක් නැහැ, ඒක හොඳයි, කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගිහිල්ලා වැරදි මත හදන එක නේ ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නීතියෙන් ප්‍රශ්නයක් ඇති වෙයි කියලා සැකයක් මතු කරනවා. එච්චරයි. නමුත්, ඒක හොඳයි. හොඳ දේ කරන්න. *[බාධා කිරීමක්]* මම සතුටු වෙනවා. මගේ කථාවේදී මම එය කියන්නම්.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් අරගෙන සමහරුන් අම්මගේ, අප්පගේ සොහොන් හැදුවා, ආච්චිගේ, මුත්තගේ සොහොන් හැදුවා, නාමල් දන්නේ නැති වුණාට. හමුදා සෙබළු දාලා රජයේ මුදල්වලින් ඒ සොහොන් හැදුවා. හැබැයි වතු කම්කරුවාට රුපියල් 200ක් දෙනකොට තමයි ප්‍රශ්නය. ආබාධිත ප්‍රජාවට රස්සාවක් දෙන්න රජයෙන් මුදලක් දැම්මාම තමයි ප්‍රශ්නය. ඉතින් මේ විධියට හොරා කාපු අයට දැන් රිදෙනවා. මොකක්ද දන්නවාද, මෙතැන තිබෙන ප්‍රශ්නය? දැන් දන්නවා, ඒ අයගේ පදනම බිඳ වැටෙනවා කියලා. වතු කම්කරු ජනතාව රජය පිළිබඳව පැහැදෙනවා කියලා දන්නවා. ඒක දැනෙනකොට එතුමන්ලාට රිදෙනවා. ඒකට ඉතින් අපට කරන්න දෙයක් නැහැ. මේවා ඔබතුමන්ලාට කරන්න තිබුණු දේවල් නේ. කරපු නැති එකට අපට කරන්න දෙයක් නැහැ.

ඊළඟට මම කැමැතියි, අය වැය ගැන තව කාරණයක් ඔබතුමා ඉදිරියේ කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ජන බලවේගය පූර්ණ අය වැය ලේඛනයක් ඉදිරිපත් කරපු පළමුවැනි වතාව මේක. ඇත්තටම පසුගිය අවුරුද්දේ ඉදිරිපත් කළ අය වැය පූර්ණ එකක් නොවෙයි. අපි අතුරු සම්මත ගිණුමකින් මාස 4ක් කටයුතු කළා. ඊට පසුව මාර්තුවල තමයි පසුගිය අවුරුද්දේ අය වැය ලේඛනය අපි සම්මත කර ගත්තේ. ඒකේ ඇත්තටම තිබුණේ, අඩයක් -කොටයක්, භාගයක්, කාලක්- වාගේ කෑලි. පූර්ණ අය වැය ලේඛනයක් අරගෙන ඇවිල්ලා තිබෙන්නේ දැන්. මේ අය වැය ලේඛනය ගේන අවස්ථාවේ අපි එකක් මතක තබාගන්න ඕනෑ. අපි මේ ගෙනෙන්නේ ලංකා ඉතිහාසයේ 80වැනි අය වැය ලේඛනය. එතකොට අය වැය 78ක් හදලා තිබෙන්නේ අර පැත්තේ අය. අපි දැන් ගේන්නේ දෙවන අය වැය ලේඛනය. අය වැය ලේඛන 78ක් හරියට හැදුණා නම්, මේ රටේ මෙච්චර සමාජ ප්‍රශ්න තිබෙන්න පුළුවන්ද? වතු කම්කරුවන්ට ඔච්චර දුක් විඳින්න වෙනවාද? ඔවුන්ට මෙච්චර කාලයක් ගෙයක් නැතිව ඉන්න වෙනවාද? ආබාධිත ප්‍රජාවට ඔහොම වෙන්න පුළුවන්ද? එහෙම වෙන්න බැහැ නේ. අපි මේ කරන්නේ අය වැය ලේඛන 78ක තිබුණු දෝෂ ලිහන එකයි. ඒ හින්දා ඒක තේරුම් ගන්න ඕනෑකම තිබෙනවා. අනෙක් එක, ඒ අයගේ 78 වසරක අය වැය ලේඛන ශක්තිමත් විධියට හැදුවා නම් මීට කලින් තමයි පොහොසත් රටක් හැදෙන්නේ, මිනිස්සුන්ට ලස්සන ජීවිත ලැබෙන්නේ. දැන් ඔබතුමන්ලා කියනවා නම් පූර්ණ නොවුණු අය වැය ලේඛනයකිනුත් භාණ්ඩාගාරය පිරී ඉතිරී යනවා කියලා, -මම මේ රටේ ජනතාවටයි මේක කියන්නේ, මේ ඇත්තන්ට කියනවා නොවෙයි- මේ අවුරුදු 5 ඉවර වනකොට අපේ භාණ්ඩාගාරය තව පිරී ඉතිරී යනවා විතරක් නොවෙයි, අපි මේවා පුරෝගෙන තබා ගන්නේත් නැහැ, මේවා බෙදනවා. වතු කම්කරුවන්ට රුපියල් 200 බෙදනවා, ආබාධිත ප්‍රජාවට බෙදනවා, දරුවන්ට බෙදනවා.

අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමන්ලා අය වැය හැදුවේ අපි අය වැය හදන පරිසරයකත් නොවෙයි. එතුමන්ලා රට භාර ගත් අවස්ථාවල ආර්ථිකය මේ විධියට බිඳ වැටිලා තිබුණේ නැහැ. නිදහස අරගෙන අය වැය ලේඛන හදනකොටත් බ්‍රිතාන්‍යයේ රන් පවුම් අපේ භාණ්ඩාගාරයේ තිබුණා. රට ණය වෙලා, වැටිලා තිබුණේ නැහැ.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

අපි භාර ගත්තේ බංකොලොත් රටක්, සුන්බුන් වෙච්ච රටක්. නටබුන් වෙච්ච රටක තමයි අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා අය වැය හදන්නේ. ඒ හින්දා මේක විශේෂයි. අය වැය ලේඛනය කියවාගන්න ක්‍රම තිබෙනවා. අපි අය වැය හදන්නේ එහෙම තැනක. ඒ හින්දා මම මේ දේත් කියන්න කැමැතියි.

ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ, අවුරුදු 76ක් තිස්සේ තිබුණු ගැඹුරු, අමාරු ප්‍රශ්න අපි දැන් එකින් එක විසඳා ගෙන, විසඳා ගෙන යන බව. කොළ පාට, නිල් පාට ආණ්ඩු කෙරුවාවේ හිටපු අය දැන් කියනවා, අපි තමයි අහවල් එක කළේ, අපි තමයි අහවල් පාර හැදුවේ, අපි තමයි අහවල් jobs දුන්නේ කියලා සමාජයේ නම් හදාගෙන තිබෙනවා කියලා. ඒ ඔක්කෝම තිබෙනවා. හැබැයි මම කියන්න කැමැතියි, වසර 76ක් තිස්සේ ඉතිරි කරපු කොට - භාග - මේ අය වැය ලේඛනයෙන් ගොඩක් දුරට විසඳා දෙනවා කියලා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනාධිපතිතුමා මේ අය වැය ලේඛනයෙන් පෙන්නුවා, මේ පාලකයෝ රටේ කම්කරු ජනතාවට ගෙවිය යුතු මුදල් ගෙවන්නේ නැතිව රුපියල් බිලියන ගණන් ගොඩ ගහගෙන තිබෙනවා කියන එක. අර්ථසාධක දීලා නැහැ; සේවක භාරකාර අරමුදලට සල්ලි දාලා නැහැ; පාරිතෝෂික දීමනා දීලා නැහැ.

මොනවාද, එහෙම දීපු නැති රාජ්‍ය ආයතන? සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගමේ දීලා නැහැ. අපේ JEDB එක, වැවිලි සමාගම් දීලා නැහැ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව දීලා නැහැ. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව ගෙවලා නැහැ. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව ගෙවලා නැහැ. ලංකා ධීවර සංස්ථාවේ ගෙවලා නැහැ. මේවා ඔබතුමන්ලා ඉතුරු කරපුවා. අය වැය ලේඛන හදනකොට මිනිසුන්ට දීමනා දෙන්න එපා යැ, ඔබතුමන්ලා බෙදා ගන්න එක පැත්තක දාලා. මිනිස්සුන්ට ඒවා බෙදනකොට තමයි අමාරුව. හැබැයි, ඒ කට්ටිය නීති හදලා නීති විරෝධී වැඩ කළා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශ්‍රාම යනකොට අප්පලාට, අම්මලාට බංගලා හදාගෙන තිබුණා, අතට පයට සේවකයෝ අරගෙන සැප සම්පත් හදාගෙන තිබුණා. අපි ජනතාවට පොරොන්දු වුණේ ඒවා අහෝසි කරනවාය කියායි. ඒවාත් කළා; ඒවා කරලා ජනතාවට දැන් ඒවායේ ප්‍රතිලාභ බෙදනවා.

භාණ්ඩාගාරය පුරවාගෙන ඉන්නේ නැහැ. මේ රටේ ජනාධිපති කෙනෙක් ආදර්ශයක් දුන්නා, තමන් පළමුවෙනියෙන් අත්හැරලා. තමන්ට වෙන් වෙච්ච, නීතියෙන් වෙන් කරපු සැප සම්පත් අත්හැරලා. ඇමති මණ්ඩලයත් පෙන්නුවා, පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමත් පෙන්නුවා, අත්හැරලා. දැන් වෙනස් හැන්දකින් බෙදනවා. ඉතිහාසයේ එතුමන්ලා කළේ අය වැයවලින් හොර රහසේ වැඩියෙන් එතුමන්ලාට බෙදා ගත්ත එකයි. ජනතාවට සුන් බුන් කටු ටික බෙදුවා. දැන් ජනතාවට බෙදනවා. ඒ හින්දා මේක ජනතාවාදී අය වැයක්. වාම ලක්ෂණ, ප්‍රගතිශීලී ලක්ෂණ සහිත අය වැයක්. මේ අය වැය, වමේම අය වැයක් කියලා කියන්නත් බැහැ. නමුත්, එහි ලක්ෂණ තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ රාජ්‍ය ආයතන 10ක සේවක අර්ථසාධක, සේවක භාරකාර අරමුදල්, පාරිතෝෂික දීමනා අවුරුදු ගාණක් නොදීපුවා ගොඩගැහිලා තිබෙනවා, රුපියල් මිලියන 11,000ක්. මේ නොගෙවා තිබෙන රුපියල් මිලියන 11,000 ගෙවීමට මේ අය වැයෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කරලා තිබෙනවා. එතුමන්ලා නොකරපුවා, එතුමන්ලා ඉතුරු කරපුවා, අපි කරනවා. හැබැයි, නම එතුමන්ලාගේ. එතුමන්ලා අවුල් හැදුවා; අපි අවුල් ලිහනවා. නම එතුමන්ලාගේ. ඒ කට්ටිය දේශපාලන වුවමනාවට සේවකයෝ බඳවා ගත්තා. එතුමන්ලා නම් ආණ්ඩුවට ආවාම, ඒ අනික් කට්ටිය බඳවා ගත් සමහරු එළියට දැම්මා. නමුත් අපි කවුරුවත් එළියට දැම්මේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථිර නැති සේවකයෝ 9,800ක් ඉන්නවා. බහුකාර්ය කියලා 100,000ක් ගත්තා. එක්කෙනෙක් එළියට දැම්මේ නැහැ. මේ 9,800ම මේ සැරේ ස්ථිර කරන්න අපි මුදල් වෙන් කළා. එතුමන්ලාගේ කොටස අපි සම්පූර්ණ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 15ක පොලියට බැංකුවෙන් ආධාර දුන්නා; පොලිය සියයට 15ක් දුන්නා. හැබැයි, මිනිස්සුන්ට දුන්නාට බැංකුවට ගෙව්වේ නැහැ. ගෙවපු නැති මුදල කීයද? රුපියල් මිලියන 55,000යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුපියල් මිලියන 55,000ක් මේ කට්ටිය ගෙව්වේ නැහැ. අපි 2025 අය වැයෙන් ඒකෙන් රුපියල් මිලියන 10,000ක් ගෙව්වා. මේ අවුරුද්දේ ඉතුරු ඔක්කෝම ගෙවන්න අපි සල්ලි දැම්මා. එතුමන්ලා විශ්‍රාමිකයන්ගෙන් හොඳ නමක් දිනාගෙන තිබෙනවා, වැඩි පොලියක් දුන්නා කියලා. නමුත් රටේ මුදල් ඒ විධියට පරිහරණය කළා. අපි ඒක බේරලා දෙනවා. ඒ වාගේම දඹුල්ලේ ශීතාගාරයක් හැදුවා. නමුත්, එළවලු දාන්න බැහැ; බී ලූනු හරි මොනවා හරි දාන්න බැහැ. කොටයක් තැබුවා. අපි ඒ ශීතාගාරය ඉදිකර අවසන් කර ගැනීම වෙනුවෙන් මේ වතාවේ අය වැයෙන් රුපියල් මිලියන 250ක් වෙන් කළා. මිල්කෝ (ප්‍රයිවට්) ලිමිටඩ්හි කිරි කර්මාන්තශාලාවක් හැදුවා, බඩල්ගම. ඒක අත්හැර දැම්මා; කැලෑ වෙන්න ඇරියා. ඔබතුමන්ලාගේ නම, හැබැයි අපි ඒක අත්හරින්නේ නැහැ. අපි මේ සැරේ ඒ කර්මාන්තශාලාවේ නිෂ්පාදන ආරම්භ කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 3,000ක් වෙන් කරනවා. ඔබ අවුල් හදනවා; අපි අවුල් ලිහනවා. ඔබ ජනතාව පීඩාවට පත් කරනවා; අපි ජනතාව පීඩාවෙන් ටිකෙන් ටික මුදා ගන්නවා. ඒකයි වෙනස කියලා මම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයේ අලුතෙන් බදු නැහැ. අලුත් බදු ගැහුවේ නැහැ නේ. බදු වැඩි කළේත් නැහැ නේ. අලුත් බදු වර්ග හැදුවේත් නැහැ. බදු වැඩි කළේත් නැහැ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදු අය කර ගන්න නිවැරදි ක්‍රමවේදයක් නම් හැදුවා. ඒකේදී දැන් ඔබතුමන්ලාම කියනවා, භාණ්ඩාගාරය පිරී ඉතිරී යනවා කියලා. ඉතින් මේ ඔබතුමන්ලා ගහපු බදු නේ. ඔබතුමන්ලාත් නිසි ක්‍රමවේදයට කටයුතු කළා නම්, ඔය භාණ්ඩාගාර පිරී ඉතිරී යන්න ඕනෑ, අද නොවෙයි. ඒවා පිරිලා ඉතිරිලා ගියා, එතුමන්ලාගේ ගෙවල්වලට. ඒවා තිබෙනවා, ඒ තැන්වල. නාමල්ලාගේ, රාජපක්ෂලාගේ, වික්‍රමසිංහලාගේ ගෙවල්වල ඒවා පිරුණා. මේ සැරේ අපි ඒවා එකතු කරලා ජනතාවට බෙදනවා. වෙනස, වෙනස.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ බෙදන ඒවායෙන් මොකක්ද වෙන්නේ ආර්ථිකයට? මේවා බෙදනකොට, ඒවා ජනතාව අතරට යනකොට ආර්ථිකය ප්‍රසාරණය වීමක් වෙනවා. වතු කම්කරුවා අතට යන රුපියල් 200 ආපසු වෙළෙඳ පොළට ඒවි. ඒ මිනිස්සු ඒ දරුවන්ට උගන්වන්න ඒ මුදල යොදාවි. ඒ වතු කම්කරුවාගේ බඩගින්නට උත්තරයක් ලැබේවි, මාසයකට රුපියල් 10,000ක් වැඩි වෙනකොට. එතකොට ඒ මුදල් වෙළෙඳ පොළට එනවා. ආර්ථිකය ප්‍රසාරණය වෙනවා. එතකොට ආර්ථිකය ඉදිරි ගමනක් යනවා. ඒ හින්දා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මෙතුමන්ලාට තේරුම් ගන්න බැරිකමක් නොවෙයි. මෙතුමන්ලා සමාජ ගැටලු හැදුවා; අපි සමාජ ගැටලු ටිකෙන් ටික විසඳ-විසඳා එනවා. දැන් කියනවා, පොරොන්දු ඉෂ්ට කළේ නැහැ කියලා. මම මේ රටේ ජනතාවට මතක් කරන්න කැමැතියි, තවම අපි එක පියවරයි තැබුවේ කියන එක. තව පියවර හතරක් තියන්න තිබෙනවා. තවම වසරයි ගෙවුණේ. තව වසර හතරක් ඉදිරියට යන්න තිබෙනවා. ඒ වසර හතර ගත වනකොට ඔය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ඒවා එකින් එක ඉෂ්ට වෙනවා. මෙතුමන්ලා කලබල වුණාට ජනතාව කලබල වෙන්න ඕනෑ නැහැ

කියලා මම ඔවුන්ට කියන්න කැමැතියි. ඒ වාගේම, අපි මේ කාරණයත් තේරුම් ගන්න ඕනෑ. මම මේ කාරණය මුලිනුත් කිව්වා. මේ රටේ ඉතිහාසයේ හිටපු පාලකයන්ගෙන් යමක් ලබන්න නම් මේ රටේ සාමාන්‍ය මිනිස්සුන්ට මොකක්ද කරන්න සිදු වුණේ? සාමාන්‍ය මිනිස්සුන්ට සිදු වුණේ පාරට බැහැලා ඒවා ඉල්ලා ගන්නයි. වතු කම්කරුවා පාරට බැහැපු බව මම කලිනුත් කිව්වා. ඒ වාගේම, මේ රටේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පාරට බැහැලා තමයි මහපොළ ශිෂ්‍යාධාර දීමනාව ඩිංගක් වැඩි කරගත්තේ. ඔබතුමන්ලා ආණ්ඩුව අත්හරිනකොට, අපි ආණ්ඩුව භාර ගන්නකොට මහපොළ දීමනාව විධියට තිබුණේ රුපියල් 5,000යි. ඒ දීමනාව සියයට සියයකින් වැඩි කරලා, මේ වතාවේ එය රුපියල් 10,000ක් කළා. ශිෂ්‍යයෝ පාරට බැස්සේ නැහැ; පාරවල් වැහුණේ නැහැ; කවුරුවත් අපහසුතාවට පත් වුණේ නැහැ. ඔවුන් හිතුවේත් නැහැ, එහෙම මහපොළ දීමනාව වැඩි කරයි කියලා. එහෙම හිතන නායකයෙක් දැන් ඉන්නවා; ප්‍රශ්න තේරෙන නායකයෙක් ඉන්නවා; හද ගැස්ම දැනෙන නායකයෙක් ඉන්නවා. එතුමා වතු කම්කරුවා ගැන බලනවා; ශිෂ්‍යයා ගැන බලනවා; ආබාධිත ප්‍රජාව ගැන බලනවා. ඒ විතරක් නොවෙයි. අන්තිමට එතුමා සත්තු ගැනත් හිතලා බලලා තීන්දු ගන්නවා. හැබැයි, සමහරු සත්තු වාගේ හැසිරෙනවා. ඉතින්, අපි මොකද ඒකට කරන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සභානායකතුමාගෙනුත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත් තව පොඩි වෙලාවක් ඉල්ලුවා. අද පොඩි වෙලාවක් වැඩියෙන් තිබෙන හින්දා වෙලාව ගන්න කියාත් කිව්වා. එම නිසා ඒ වෙලාව ලබා දෙන්න කියලා මම ඉල්ලනවා.

ඊළඟට මම කැමතියි, අය වැය ගැන කථා කරන්න. අය වැය ලේඛනයක් පුරෝකථනය කරගන්න, මැනගන්න ක්‍රම කිහිපයක් තිබෙනවා. සමාජය දැන් ඒක මනින්න ඕනෑ, ඔබතුමන්ලා මනින්න ඕනෑ. දැන් මේ අය වැය ලේඛනය හරියට මැන්නොත් මට මෙහෙම හිතෙනවා. මේ රජයේ ආර්ථික දිශානතිය බලා ගන්න පුළුවන් මේ අය වැය ලේඛනයෙන්. මේ අවුරුද්දේ ආර්ථිකය කොහේටද ගෙනියන්නේ කියාත් බලා ගන්න පුළුවන්. ඒ වාගේම, පාලකයන්ගේ අරමුණු තේරුම් ගන්නත් පුළුවන්. මෙතුමන්ලාගේ අරමුණු තේරුම් ගන්න පුළුවන්, මෙතුමන්ලා දක්වන අදහස්වලින්. අපේ අරමුණු තේරුම් ගන්න පුළුවන්, අපි හදපු අය වැය ලේඛනයෙන්. ඒ හින්දා ඒවා තේරුම් ගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ වාගේම මම මේ කාරණයත් පැහැදිලි කරන්න කැමැතියි. අපි බලාපොරොත්තු වන පරිදි පොහොසත් රටක් හදන්න නම් රජයට පමණක් මේ සියල්ල කරන්න බැහැ. රජය ඒ කටයුතු ශක්තිමත් කරනවා. දැන් වාහන ගෙනෙන එකටත් ලොකු දෝෂාරෝපණයක් තිබෙනවා. ඒ වාහන ගෙනෙන්නේ ඉතිහාසයේ වාගේ සුඛෝපභෝගී වාහන ගෙනැල්ලා ඒවා බෙදාගෙන පාලකයෝ සුඛ විහරණයට යන්න නොවෙයි. වාහන වැඩිපුර ප්‍රමාණයක් ගෙනෙන්නේ මේ රටේ රාජ්‍ය අංශය ශක්තිමත් කරලා, අපි මේ යොදන මුදල ඵලදායී ලෙස ප්‍රතිඵලයක් ලබා ගන්න පැත්තට කාර්යක්ෂම කර ගැනීමේ අවශ්‍යතාව සඳහායි. මගේ අමාත්‍යාංශයේ වුණත් තිබෙනවා, මහ කැඩි කැඩී යන වාහන. අමාත්‍යාංශයේ ලේකම්තුමා ළඟදී මහනුවර ගිහිල්ලා වාහනය මඟ නැවතුණා. එහෙම වාහන තිබෙන්නේ. ඒ වාහන වෙනුවට අලුත් වාහන ලබා දෙන්න ඕනෑ. නිලධාරින්ගේ ඒ ප්‍රශ්න නිරාකරණය කරන්නේ අපි ලොකු ඉලක්කයක් තියාගෙන, සියයට 5ක ආර්ථික වර්ධන වේගයක් බලාපොරොත්තුවෙන්. මේ අය වැයේ දිශානතිය දෙස බලනකොට ඔබතුමන්ලා කාටත් පෙනෙනවා, ආර්ථිකය ප්‍රසාරණය කරගන්න, ආයෝජකයෝ කැඳවා ගන්න අදාළ ක්‍රම මේ අය වැයේ යෝජනා වෙලා තිබෙන බව. ඒ වාගේම ඔබතුමන්ලා හදපු අඩකොට අයින් කරලා, මේ ආර්ථිකය ඉස්සරහට ගෙන යන පාරවල් නිර්මාණය කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි තනි කවුළු සංකල්පයට ඇවිල්ලා තිබෙනවා. ආයෝජකයෝ ආයෝජන මණ්ඩලයට -BOI- එනවා නම් හතර පොළේ, හත් පොළේ, දහ පොළේ ගිහිල්ලා ලේඛන අත්සන් කරමින්, පගා දෙමින් යන්න තිබුණු ක්‍රමය අයින් කරලා තනි කවුළුවකට ඇවිල්ලා තමන්ගේ ව්‍යාපෘති ඔක්කෝම කරගෙන යන්න පාරක් හදලා තිබෙනවා. එතකොට ඒ කවුළුව හරහා ආයෝජකයෝ එයි.

ඊළඟට, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මූල්‍ය පහසුකම් ලබා දෙන්න මෙවර අය වැයෙන් තීන්දු කරලා තිබෙනවා. එහෙම තීන්දු කරලා තිබෙන්නේ මොකටද? ඒ කට්ටියගේ අය මම ඉස්සෙල්ලා කිව්ව ජාතියේ මූල්‍ය පහසුකම් දෙන්නේ නැහැ. මේ මූල්‍ය පහසුකම් අපි ලබා දෙන්නේ ඇත්ත කර්මාන්තකරුවාට; ඇත්ත ව්‍යවසායකයාට; ඇත්ත සුළු කර්මාන්තකරුවාට. අන්න එතකොට ආර්ථිකය ප්‍රසාරණය වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඌන උපයෝජිත ඉඩම් ආයෝජකයන්ට දෙන්න තීන්දු ගත්තා. මගේ අමාත්‍යාංශයේ අක්කර 4,500ක් පත්තර දැන්වීම් දාලා ප්‍රසිද්ධියේ හෝ ඉල්ලන්න අවස්ථාව දුන්නා, කැමති ආයෝජකයෙකුට. ඉස්සර ඉඩම් දුන්නේ මම කලින් කිව්ව අර බෙදපු ක්‍රමයට. දැන් එහෙම බෙදිලි නැහැ. දැන් විනිවිදභාවයෙන් යුතුව ඒ ඉඩම් ඉල්ලන්න දෙනවා. තව මාසයක් යනකොට තව අක්කර 7,500ක් පමණ අපි ප්‍රසිද්ධ කරනවා. ඉල්ලන කෙනෙක් ඉල්ලන්න. අත්හැරපු බංගලා, අත්හැරපු ෆැක්ටරි ඇතුළු ඔක්කෝම ප්‍රසිද්ධ කරනවා. මේවා ඔක්කෝම ප්‍රසිද්ධ කරනකොට ආයෝජකයෝ එන්න පටන් ගන්නවා; ඩොලර් එන්න පටන් ගන්නවා; රැකී රක්ෂා බිහි වෙන්න පටන් ගන්නවා. මේක මෙතැන ඉන්න ගොඩක් අයට තේරෙනවා. එතකොට එතුමන්ලාට රිදෙනවා; භය හිතෙනවා; නන් දොඩවනවා; ආඩපළි කියනවා; ඔක්කෝම මෙතැනට ඇවිල්ලා විෂබීජ ටික වපුරන්න බලනවා. අන්න එහෙම කටයුතු කරමිනුයි යන්නේ.

ඇයි, අපි ඩිජිටල් ක්‍රමයට මේ රට ගෙනියන්න හදන්නේ? ඩිජිටල් ක්‍රමයට මේ රට පවත්වාගෙන යනකොට පහසුකම් වැඩි වෙනවා, තාක්ෂණය ලැබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, කෘත්‍රිම බුද්ධිය මේ රටේ කර්මාන්තවලට, ව්‍යාපාරවලට යොදවා ගන්න ඕනෑ කියලා. ඒ කෘත්‍රිම බුද්ධිය යොදවනකොට මේ කටයුතු ඉස්සරහට යනවා. මේ අඩකොට ඔක්කෝම අයින් කරනවා; සන්නිවේදනය පුළුල් කරනවා; මාර්ග පද්ධතිය සකස් කරනවා. මෙන්න මෙහෙම කළාම අපේ රටේ ආර්ථිකය පුළුල් වෙනවා. අලුත් රැකී රක්ෂා අවස්ථා උදා වෙනවා. ඒ හින්දා අපේ දෙවැනි වසරේ පූර්ණ අය වැය ලේඛනය සම්බන්ධයෙන් අපට විශාල බලාපොරොත්තුවක් තිබෙනවා. ආර්ථික වර්ධන වේගය සියයට 5 පන්නා ගන්න ඕනෑ කියාත් අපේ බලාපොරොත්තුවක් තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා, මේ ආර්ථික වර්ධන වේගය සියයට 7 දක්වා ගෙනෙන්න ඉදිරි අවුරුදුවල කටයුතු කරන්න ඕනෑ කියලා. ඒවාත් එක්ක තමයි මේ කටයුතු කරන්නේ. ඒක මෙතුමන්ලාට තේරෙන්නේ නැතුව නොවෙයි, තේරෙනවා. හැබැයි, පොඩි දේශපාලන කුහකකම් ටිකක් එනවා. එතුමන්ලාට කරගන්න බැරි

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

වෙච්ච ඒවා කෙරෙනවා කියනකොට එතුමන්ලාට දැනෙනවා, රිදෙනවා. ඉතින්, ඔබතුමන්ලා කර ගත්තේ ඔබතුමන්ලාට. හැබැයි, අනුර කුමාර ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කරන්නේ, මේ රටේ ජනතාවට. ඒ දෙකේ වෙනස ඒකයි කියලා මම තේරුම් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ රටේ ජනතාව පෝලිම්වල මැරුණේ එතුමන්ලාගේ කාලයේදී. හැබැයි, ඒ පෝලිම් ගැන නොවෙයි මම මේ කියන්නේ. අපේ රටේ කරාපිටිය බැලුවත්, කොළඹ බැලුවත්, නුවර බැලුවත්, පොළොන්නරුව බැලුවත් ඒ තිබෙන රෝහල්වල දිග පෝලිමක් තිබෙනවා, හදවත් සැත්කම් - bypass operations - කරගන්න. පෝලිමේ ඉන්න ඕනෑ අවුරුදු ගණන්. සමහර මිනිස්සු මැරෙනවා. මේක මානුෂීයවාදී අය වැයක්. ජනතාවගේ පැත්තෙන් හිතලා, සමාජ ප්‍රශ්න ගැන හිතලා, හෘද සැත්කම් සඳහා මහල් 16කින් යුක්ත නවීන හෘද රෝහල හදන්න රුපියල් මිලියන 12,000ක් වෙන් කරලා මේ අවුරුද්දේ මූලික වියදම ඒකට ලබා දෙනවා. අපි මුදල් ලබා දෙනවා, සමාජ ප්‍රශ්න විසඳන්න. මේ කට්ටියගේ කාලයේ මේ කට්ටියගේ ප්‍රශ්න විසඳා ගත්තා. හැබැයි, අපි අද මේ විධියට කටයුතු කරමින් යනවා.

අපි රැකී රක්ෂා 75,000ක් දෙනකොට, රේල් පාරේ අහිංසක, බම්බු ගේට්ටුකරුවන්ගේ දීමනාව වැඩි කරගන්න බැරි වෙච්ච ආණ්ඩුවල හිටපු අයට රිදෙන එකට කරන්න දෙයක් නැහැ. අවසාන වශයෙන් මේ කාරණය මම මේ රටේ ජනතාවට කියන්න ඕනෑ. මොකද, මෙතුමන්ලාට කියලා තේරුමක් නැහැ. දැන් මේ විධියට හොඳ ගමනක් යනකොට මේ ගමනට උදවු කරන්න, ආශීර්වාද කරන්න, ශක්තිය දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. කකුලෙන් ඇදලා, මාට්ටු දාලා වට්ටන්න උත්සාහ ගන්න ඕනෑ නැහැ. ඉතිහාසයේත් බුදුන්ට ගල් පෙරළපු කට්ටිය හිටියා වාගේ මෙතැනත් මේ ආණ්ඩුවක් හොඳ ගමනක් යනකොට ගල් පෙරළන කට්ටිය ඉන්නවා; බකට් අදින්න බලන කට්ටිය ඉන්නවා. එහෙම වෙන්න හේතුව මේකයි. දූෂණයට විරුද්ධව, විෂ මත්ද්‍රව්‍යවලට එරෙහිව නීතිය ක්‍රියාත්මක වෙනකොට ඒ අයට රිදෙනවා. ඒ අය පෝෂණය වෙන දේවල් නැති වෙනවා. ඒ වාගේම පාතාලය මඩිනකොට ඒ අයගේ ශක්තිය නැති වෙනවා; පැවැත්ම නැති වෙනවා. එහෙම වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුංචි කවියක මෙන්න මෙහෙම තිබුණා.

"පෙළක් තැන්වල හොඳම දේවල් ළඟ තියෙද්දිත් මිස් වුණා - ඒ හින්දා මිස් කර ගන්න එපා - බුදුන් දැකලත් දේවදත්තට නිවන් යන්නට බැරි වුණා"

ඒ නිසා මම මේ රටේ ජනතාවට මෙන්න මේ කාරණය කියනවා. ගල් පෙරළන කට්ටිය ඉන්නවා, බකට් දමන කට්ටිය ඉන්නවා, කකුල් මාට්ටු දමන කට්ටිය ඉන්නවා, හැබැයි ඔබ මේ රජයත් එක්ක ශක්තිමත්ව ඉන්න. අනිවාර්යයෙන්ම අපි මේ රටේ ජනතාවට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ලබා දෙනවා කියන එකඟතාව, පණිවුඩය නැවත නැවතත් තහවුරු කරමින් මගේ කථාව සමාප්ත කරනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Dr.) Elayathamby Srinath. You have 14 minutes.

[மு.ப. 11.49]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இந்த நாட்டின் எண்பதாவது வரவு செலவுத்திட்டமான இந்த அரசாங்கத்தின் இரண்டாவது வரவு செலவுத்திட்ட விவாதத்தில் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்குத் தங்களுக்கு எனது நன்றியையும் வணக்கத்தையும் தெரிவித்துக் கொள்கிறேன். இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ள நல்ல விடயங்களை நாங்கள் வரவேற்கின்றோம், பாராட்டுகின்றோம். மிக முக்கியமாக, இந்த நாட்டின் பொருளாதாரத்தை வலுப்படுத்துவதற்காக, வரவு செலவுத்திட்டத்தில் துண்டுவிழும் தொகையைக் குறைப்பதற்கும் நாட்டின் பணக் கையிருப்பை அதிகரிப்பதற்கு மான பல திட்டங்களை இந்த அரசாங்கம் முன்வைத்திருக் கின்றது. அதற்கப்பால், இதில் கூறப்பட்டுள்ள வடக்கு, கிழக்கு மாகாணங்களில் யுத்தத்தினால் பாதிக்கப்பட்டு இடம்பெயர்ந்த மக்களுக்கான வீட்டுத் திட்டம், மிக முக்கியமாக தோட்டத் தொழிலாளர்களின் சம்பள அதிகரிப்பு போன்ற விடயங்களைப் பாராட்டுகின்றோம்.

அதுபோல், மட்டக்களப்பு மாவட்டத்திலும் பல அபிவிருத்தித் திட்டங்களுக்காக நிதி ஒதுக்கப்பட்டு இருக்கின்றது. குறிப்பாக, கிரான் பாலம், பொண்டுகள் சேனைப் பாலம் போன்றவை தொடர்பில் எமது விண்ணப்பத் துக்கமைய துறைசார் அமைச்சர் அவர்கள் கவனமெடுத்து நிதி ஒதுக்கியதற்காகவும், அதனோடு இணைந்ததாக வாழைச்சேனை மீன்பிடித் துறைமுகத்தின் அபிவிருத்திக்காக கௌரவ அமைச்சர் அவர்கள் கொண்டுவந்த திட்டத்துக் காகவும், முந்தனை ஆற்றுத் திட்டத்தின்கீழ் கித்துல் - உறுகாமம் குளங்களின் இணைப்புக்கான அடிப்படை வசதிகளைச் செய்வதற்காகவும் பல்கலைக்கழகங்களுக்கு மேற் கொள்ளப்பட்ட நிதி ஒதுக்கீடுகளுக்காகவும் உண்மையிலே நாங்கள் நன்றி கூறுகின்றோம்.

அதேநேரம், மட்டக்களப்பு மாவட்டத்திலே நாம் கடந்த காலங்களில் வலியுறுத்தியது போன்று இன்னும் பல விடயங்கள் பாரிய பிரச்சினைகளாக இருக்கின்றன. அந்த மாவட்டத்திலே படுவான்கரை, எழுவான்கரை என்ற பிரதேசங்கள் இருக்கின்றன. அதில் படுவான்கரைப் பிரதேசம் மிகப் பின்தங்கிய பிரதேசமாக இருக்கின்றது. அங்கு உட்கட்டுமான வசதிகளையும் சுகாதார வசதிகளையும் மேம்படுத்த வேண்டிய பாரிய பொறுப்பு இருக்கின்றது. நாம் அதற்காகப் பல இடங்களிலே விண்ணப்பங்களை முன்வைத்திருக்கின்றோம். இந்தப் படுவான்கரைப்

பிரதேசத்திலே சுகாதார சேவைகளை மேற்கொள்ளும் பல வைத்தியசாலைகள் இருக்கின்றன. அந்த வைத்திசாலைகளை அபிவிருத்தி செய்ய வேண்டிய பாரிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது. ஏனென்றால், அவை மிக நீண்ட காலமாக அபிவிருத்தியைக் காணாத நிலையில் இருக்கின்றன. அதற்கப்பால் அங்கு பல பாலங்களையும் கிராம வீதிகளையும் அபிவிருத்தி செய்ய வேண்டிய பொறுப்பு இருக்கின்றது.

இதனோடிணைந்ததாக நான் இன்னுமொரு விடயத்தையும் கூற வேண்டும். மிக முக்கியமாக, மட்டக்களப்பு மாவட்டம் கடல்சார் வளத்தை மிக அதிகளவு கொண்டிருக்கின்ற பிரதேசம். அதனால் அங்குள்ள வாழைச்சேனைத் துறைமுகத்தை அபிவிருத்தி செய்வது மட்டுமல்லாது கதிரவெளியில் இருந்து பெரிய கல்லாறு வரையான கடற் பிரதேசத்திலே பல மீன்பிடித் துறைமுகங்களையும் அமைக்க வேண்டிய தேவை இருக்கின்றது. நாம் கடந்த காலங்களில் கூட கதிரவெளி, களுவங்கேணி போன்ற இடங்களிலே பல மீன்பிடித் துறைமுகங்களை அமைப்பதற்கான ஆலோசனைகளை முன்வைத்திருந்தோம். அதற்கான சாத்தியவள ஆய்வுகளை மேற்கொண்டு, அந்தப் பிரதேசத்தின் அடிப்படை வளங்களைப் பாதுகாத்து நாட்டின் உற்பத்தி களைப் பெருக்குவதற்கான முயற்சிகள் எடுக்கப்பட வேண்டும்.

கடந்த காலங்களிலே எமது பிரதேசத்தில் 400க்கும் மேற்பட்ட சிறிய, நடுத்தர, பெரிய குளங்கள் இருந்தன. இன்று அவை மிகக் குறைந்தளவில் இருக்கின்றன. வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம், வன இலாகா, மகாவலி அபிவிருத்தி அதிகாரசபை ஆகியவற்றுக்குச் சொந்தமான பல இடங்களிலே இந்தக் குளங்கள் இருக்கின்றன. அவற்றிட மிருந்து அந்தக் குளங்களை விடுவிப்பதன்மூலம்தான் இந்தப் பிரதேசத்தில் நீர்ப்பாசனத் துறையை வலுவாக்க முடியும்.

இதற்கப்பால், நான் மிக முக்கியமான ஒரு பிரச்சினையை இங்கே முன்வைக்க வேண்டும். மட்டக்களப்பு மாவட்டத்திலே அதிகளவில் கால்நடைகள் இருக்கின்றன. அவற்றுக்கான மேய்ச்சல் தரை பாரிய பிரச்சினையாக இருக்கின்றது. மயிலத்தமடு, மாதவனை மேய்ச்சல் தரைப் பிரச்சினை தொடர்பாக அந்த மக்கள் 750 நாட்களையும் தாண்டி வீதியிலே நின்று போராடுகின்றார்கள். மிகப் பெரும்பான்மைப் பலத்துடன் இருக்கின்ற இந்த அரசாங்கம் ஏன் அந்த விடயத்துக்கு முன்னுரிமை அளிக்கவில்லை அல்லது அதனைக் கண்டும் காணாமல் இருக்கின்றதா? என்ற பாரிய சந்தேகம் எழுகின்றது. அவர்கள் இன்றும் போராடிக்கொண்டுதான் இருக்கின்றார்கள். அத்தோடு, பட்டிப்பளை, வெல்லாவெளி, வாகரைப் பிரதேசங்களிலும் மேய்ச்சல் தரை என்பது பாரிய பிரச்சினை யாக இருக்கின்றது. அவற்றுக்கான செயற்றிட்டங்களை முன்னெடுப்பது பற்றிய பொறுப்புத் தொடர்பாக இந்த வரவு செலவுத்திட்டத்திலே சொல்லப்பட்டிருக்கவில்லை. அந்தப் பண்ணையாளர்களுக்கான வசதிகளைச் செய்து கொடுப்பது சம்பந்தமான எந்த விடயங்களும் முன்வைக்கப்படவில்லை.

அதற்கப்பால், நாம் கடந்த காலங்களிலும் முன்வைத்திருந்த விடயம்தான் யானை-மனித மோதல்! இதன்மூலம் மட்டக்களப்பு மாவட்டத்திலே பாரியளவு மனித உயிர்களும் உடைமைகளும் இழக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. அதற்காகப் பல திட்டங்கள் முன்மொழியப்பட்டிருந்தன. சுமார் 96 கிலோமீற்றர் அளவான யானை வேலிகள் அமைப்பதாக உறுதியளிக்கப்பட்டிருந்தும்கூட, இன்றுவரை 6 கிலோமீற்றர் கூட அமைக்கப்படவில்லை. மிக அதிகளவான யானைகள் அங்கு வயல்களைச் சேதப்படுத்துகின்றன; மனித உயிர்களை அழிக்கின்றன. அந்த வகையில், அங்கு வனசீவராசிகள் திணைக்களத்தின் உப அலுவலகங்களை அமைக்க வேண்டிய பாரிய பொறுப்பு இருக்கின்றது. இந்த வரவு செலவுத் திட்டத்தில் 5,000 பேரை வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்துக்கு உள்ளீர்ப்பதாகச் சொல்லப்பட்ட விடயத்தில், எமது மாவட்டத்துக்கு முன்னுரிமையளித்து குறித்த அலுவலகங்களை அமைத்து, அதற்குத் தேவையான அதிகாரி களையும் நியமிக்கப்பட வேண்டிய தேவை இருக்கின்றது. கடந்த வாரத்தில்கூட அந்த மக்கள் போராட வேண்டிய சூழ்நிலையில் தெருவுக்கு வருகின்ற நிலைமையில் இருந்தார்கள். ஏனென்றால், அங்கு உயிரிழப்புகள் பாரியளவில் நடந்துகொண்டே இருக்கின்றது. நட்ட ஈடு கொடுப்பதை மட்டுந்தான் அதற்குத் தீர்வாகக் கொள்ளாமல், அந்த மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாக முன்னெடுப்புகளைச் செய்யவேண்டி இருக்கின்றது.

அடுத்து, மட்டக்களப்புப் போதனா வைத்தியசாலை எமது மாவட்டத்துக்கு மட்டுமன்றிக் கிழக்கு மாகாணத்திற்கே இருக்கின்ற ஒரேயொரு போதனா வைத்தியசாலையாகக் காணப்படுகிறது. கடந்த வரவு செலவுத்திட்டத்திலே சுகாதார அமைச்சின் ஊடாக அங்கு MRI, Cath lab போன்ற விடயங்களுக்கு ஒதுக்கீடு செய்யப்பட்டது. இந்த வரவு செலவுத்திட்டத்திலும் Radiology - கதிரியக்கவியல் பகுதியைச் செய்வதற்காக நிதி ஒதுக்கீடு செய்வதாகக் கூறப்பட்டிருக்கின்றது. அதற்கப்பால், அங்கு பாரிய இட நெருக்கடி - நிலப்பரப்புப் பற்றாக்குறை - இருக்கின்றது. இந்த நெருக்கடியைத் தீர்ப்பதற்காக அருகிலுள்ள சிறைச்சாலை அமைந்துள்ள இடத்தை - அந்தக் காணியை - அச்சிறைச் சாலைக்கு ஏற்கனவே வேறு காணி ஒதுக்கப்பட்டிருக்கின்றது - பெற்றுத்தர நடவடிக்கையெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். அந்தச் சிறைச்சாலையில்கூட பாரியளவு இட நெருக்கடி காணப்படுகின்றது. சுமார் 350 பேரை வைக்க வேண்டிய இடத்திலே 700 பேருக்கும் மேல் வைக்கப் பட்டிருக்கிறார்கள். ஆகவே, ஒதுக்கப்பட்ட காணிக்கு அந்தச் சிறைச்சாலையை நகர்த்துவன்மூலம் மட்டக்களப்புப் போதனா வைத்தியசாலைக்கு குறித்த நிலத்தினை வழங்கக்கூடியதாக இருக்கும். எதிர்காலத்திலே அந்த வைத்தியசாலையின் சேவைகளை விஸ்தரிப்பதற்காக இந்தத் திட்டத்தை நாங்கள் மாவட்ட ஒருங்கிணைப்புக் குழுவில்கூட முன்வைத்திருந்தோம். அதற்குச் சாதகமான பதில் இன்னும் எங்களுக்குச் சொல்லப் படவில்லை.

மேலும், அங்கு 90 வருடங்களுக்கும் மேலான பழைமையான கட்டடமொன்று இருக்கின்றது. அந்தக் கட்டிடத்தில்தான் ENT சிகிச்சை நிலையம், தாய்-சேய் நல சிகிச்சை நிலையம், சத்திரசிகிச்சைக் கூடங்கள் மற்றும் ICU ஆகியவை இயங்கிக் கொண்டிருக்கின்றன. அந்தக் கட்டிடம் இடிந்து விழுமோ! என்ற பாரிய அச்சம் நிலவுகின்றது. இந்த வரவு செலவுத்திட்டத்தில் பல தள வைத்தியசாலைகள் உட்பட ஏனைய வைத்தியசாலைகளில் புதிய கட்டிடங்களுக்காகச் சுகாதார அமைச்சுக்கு நிதி ஒதுக்கீடுகள் செய்யப் பட்டிருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. அதுபோல், சுகாதார அமைச்சின் பிரதான திட்டத்தில் - master plan - அந்த வைத்தியசாலைக்கான 6 மாடிக் கட்டிடமொன்றை அமைக்கும் யோசனை முன்வைக்கப்பட்டிருக்கின்றது. எனவே, உடனடி யாக அதற்குரிய ஆய்வுகளை மேற்கொண்டு அதனை நிறைவேற்றுவதற்குரிய ஆயத்தங்களைச் செய்ய வேண்டும். இந்த விடயம் பல தரப்பினராலும் முன்வைக்கப் பட்டிருக்கின்றது. எனவே, இதற்கு முன்னுரிமை வழங்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

மட்டக்களப்பு போதனா வைத்தியசாலையில் subspecialistஇனருக்கு தனித்தனியான விடுதி வசதிகள் இல்லை. அவர்கள் மற்றைய விடுதிகளிலே நோயாளர்களைத் தங்க வைத்துச் சேவை செய்ய வேண்டிய நிலைமை இருக்கின்றது. குறிப்பாக, இலங்கை முழுவதும் அதிகளவு நீரிழிவு நோயாளிகள் இருக்கிறார்கள். ஆனால், அங்கு இந்தச் சிகிச்சைக்கான endocrinologistஇற்குரிய விடுதி வசதி இல்லாமையால் நோயாளர்கள் மற்றைய விடுதிகளிலே தங்கியிருந்து சேவையைப் பெறவேண்டிய தேவை இருக்கின்றது. மேலும், ஆயிரத்துக்கும் மேற்பட்ட கட்டில்கள் இருக்கின்ற அந்த வைத்தியசாலையிலே bed occupancy rate 80 சதவீதத்திற்கு மேலாக இருக்கின்றது. ஆகவே, கிழக்கு மாகாணத்திலே அந்த வைத்தியசாலையைப் பிரதான வைத்திய சாலையாக முன்நிறுத்தி, அதற்கான நிதி ஒதுக்கீடுகளைச் செய்து, இவ்வாறான அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்ள வேண்டிய பாரிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது.

அதற்கப்பால், இந்தப் புதிய கல்விச் சீர்திருத்தத்திலே மிக நல்ல பல விடயங்கள் இருக்கின்றன. வரலாறு பாடம் ஒரு தொகுதிப் பாடமாக இருந்தாலும் மட்டக்களப்பினுடைய வரலாறு புதிய கல்வித் திட்டத்தில் சேர்க்கப்பட வேண்டும். குறிப்பாக, உலக நாச்சியார் ஆண்ட வரலாறுகள் புதிய கல்வித் திட்டத்திலே வரலாறு பாடத்திலே சேர்க்கப்பட வேண்டும் என்ற விண்ணப்பத்தையும் நான் இந்த இடத்திலே முன்வைக்கின்றேன்.

மேலும், அங்கிருக்கின்ற கல்வி நிலையைப் பொறுத்த வரையிலே, கல்குடா வலயத்திலே பாரிய ஆளணிப் பற்றாக்குறை இருக்கின்றது. உதாரணமாக, கல்குடா கல்வி வலயத்திலே 75 கணித ஆசிரியர்கள் தேவையாக இருக்கின்றபோது 25 கணித ஆசிரியர்கள்தான் அங்கு கல்வி கற்பித்துக்கொண்டு இருக்கிறார்கள். அவர்களில்கூட பலர் DO appointmentஇல் வந்தவர்கள். மூன்றிலொரு பகுதியான கணித ஆசிரியர்களை வைத்துக்கொண்டு அந்தக் கல்வி வலயத்தின் ஊடாக எவ்வாறு அந்த மாணவர்களுக்குத் தகுதியான, தேவையான கல்வியை வழங்க முடியும் என்று யோசித்துப் பாருங்கள்! இவ்வாறான நெருக்கடிகள் எமது மாவட்டத்தில் இருக்கின்றன. வருகின்ற வருடத்திலே இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாக ஆளணியை மீள் நிரப்புவதாகச் சொல்லப்பட்டிருக்கின்றது. தயவுசெய்து அதனைச் செய்து தரவேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்திலே ஆசியர்களை உள்வாங்கு வதற்கான அல்லது பதவிகளுக்கான ஆளணிகளைப் பெற்றுக் கொள்வதற்கான திட்டங்கள் முன்வைக்கப்பட்டிருக்கின்றன. மிக முக்கியமாக, கல்குடா கல்வி வலயத்திலே மாணவர்களுக்கு உரிய தளபாட வசதிகளின்மை பாரிய பிரச்சினையாக இருக்கின்றது. மாணவர்கள் கீழே இருந்து அல்லது தகரக் கொட்டகைகளுக்குள் இருந்து அல்லது மரங்களுக்குக் கீழே இருந்து படிக்கவேண்டிய நிலை இன்றும் இருக்கின்றது. இவ்வாறான விடயங்கள் கருத்திலே கொள்ளப்பட்டு, இந்தத் தேவைகளை நிறைவேற்றுவதற்கு முன்னுரிமையளிக்க வேண்டியிருக்கின்றது. ஆகவே, இவற்றைக் கருத்திற் கொள்ளுங்கள்!

அதற்கப்பால், சுற்றாடல் அமைச்சைப் பொறுத்தளவிலே வனசீவராசிகள் திணைக்களத்துக்கான ஒதுக்கீடுகள் மிக முக்கியமாகக் காணப்படுகின்றது. அதற்கப்பால், சேனைப் பயிர்ச்செய்கை செய்யப்படுகின்ற காணிகள் மற்றும் பொதுவான இடங்களை வன இலாகாவிடமிருந்து விடுவிப்பதற்காகக் கடந்த காலங்களில் உங்களுடைய அமைச்சரவை மூலமாகப் பல அறிவுறுத்தல்கள் வழங்கப் பட்டிருந்தும்கூட, சில இடங்களிலே அவற்றை நிறைவேற்று வதற்குக் காலதாமதம் அல்லது பல இடையூறுகள் காணப்படுகின்றன. இவற்றை நிவர்த்தி செய்யவேண்டிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது. ஏனென்றால், மக்கள் உங்களிடம் சமத்துவத்தை எதிர்பார்க்கிறார்கள்.

அதற்கப்பால், "வருகின்ற மாவீரர் தினத்தில் எந்தவித நெருக்கடிகளும் இல்லாமல் மக்கள் அஞ்சலி செலுத்த முடியும்" என்று எங்களுடைய கௌரவ அமைச்சர் அவர்கள் சொல்லியிருந்தார். அதற்காக நான் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன். அதேவேளை, தாண்டியடி என்ற இடத்திலே ஒரு மாவீரர் துயிலும் இல்லம் இருக்கின்றது. அந்த இடத்திலே மாவீரர்களை நினைவுகூர அனுமதிக்க வேண்டுமென்று நாங்கள் பலமுறை கேட்டிருந்தோம்; மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் விண்ணப்பம் செய்திருந்தோம். அது தொடர்பாக எந்தவிதமான positiveஆன நிகழ்வுகளும் நடைபெறவில்லை. மாவீரர்கள் புதைக்கப்பட்ட இடங்களிலே அவர்களை மரியாதை செலுத்துவதற்கு இந்த அரசு ஓர் அனுசரணையாக இருக்கின்ற நிலையிலே, தாண்டியடிப் பிரதேசத்திலே இருக்கின்ற மாவீரர் துயிலும் இல்லத்திலே அஞ்சலி செலுத்துவதற்கு இம்முறை ஏற்பாடு செய்யப்பட வேண்டுமென்று நான் இந்த இடத்திலே கேட்டுக் கொள்கின்றேன்.

இந்த வரவு செலவுத்திட்டத்தில் முன்வைக்கப்பட்ட பல விடயங்கள் ஆரோக்கியமானதாக இருந்தாலும், குறிப்பாக யுத்தத்தினாலும் அதற்குப் பின்னரான பல புறக்கணிப்பு களாலும் சிதைந்துபோய் இருக்கின்ற எமது வட, கிழக்கு மண்ணைக் கட்டியெழுப்புகின்ற செயற்றிட்டங்களை, மக்கள் பிரதிநிதிகள் எல்லோருடைய வேண்டுகோளையும் ஏற்றுச் செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். கடந்த காலத்தில் உலக வங்கியினூடாகக் கொண்டுவரப்பட்ட திட்டத்தின்போது, எங்களுடைய எந்தவிதமான ஆலோசனை களையும் பெற்றுக்கொள்ள இந்த அரசு தவறியிருந்தது. அதனால், மட்டக்களப்பு மாவட்டத்தின் பிரதிநிதிகளாக இருக்கின்ற எங்களுக்கு, அந்த மக்களின் வேண்டுகோளை முன்வைப்பதற்குரிய சந்தர்ப்பம் மறுக்கப்பட்டிருந்தது. சமத்துவத்தைப் பேணுகின்ற இந்த அரசு இந்த விடயத்திலே மிகப் பொறுமையாக, நிதானமாக நடந்துகொள்ளவேண்டும் என்ற ஒரு வேண்டுகோளையும் முன்வைக்கின்றேன்.

அதற்கப்பால், இன்னுமொரு மிக முக்கியமான ஒரு விடயத்தையும் நான் இங்கு சொல்லவேண்டியிருக்கின்றது. அபிவிருத்தித் திட்டம் என்பதற்கு அப்பால், அரசியலில் தமிழ் மக்கள் உங்களுக்கு வாக்களித்ததைப் போன்று, தமிழ்த் தேசிய உணர்வுக்காக - தமிழ்த் தேசியத்துக்காக - எங்களுக்கும் வாக்களித்திருக்கின்றார்கள். வட, கிழக்கிலே தமிழ் மக்கள் மிக அதிகமாகத் தமிழ்த் தேசியத்துக்காகத்தான் வாக்களித்திருக் கின்றார்கள். ஆகவே, மாகாண சபைத் தேர்தலை நடத்தும் விடயத்திலே நிதியை ஒதுக்கிவிட்டதாக மட்டும் கூறி நின்றுவிடாது, உங்கள் கட்சியின் மூன்றில் இரண்டு பெரும்பான்மையினர் அங்கம் வகிக்கின்ற இந்த அரசு ஓர் இதய சுத்தியுடன் ஆகக்குறைந்த தீர்வாக இருக்கின்ற, சகல அதிகாரமும் கொண்ட மாகாண சபைத் தேர்தலை அடுத்த வருடத்திலே நடத்தி முடிப்பதற்கான உறுதிப்பாட்டுடன் அதற்கான முன்னெடுப்புகளைச் செய்ய வேண்டும்.

பல விடயங்களில், குறிப்பாகச் சட்டவிரோத போதைப் பொருள் பாவனை மற்றும் ஊழலுக்கு எதிரான விடயங்களில்

நீங்கள் எவ்வளவு தீவிரமாகச் செயற்படுகின்றீர்கள் என்பதை நாங்கள் காண்கின்றோம். அதனை வரவேற்கின்றோம்; அதற்காக எங்கள் ஆதரவுகளைத் தருகின்றோம். அதாவது, ஊழலுக்கு எதிரான நடவடிக்கைகள், போதைப் பொருள் எதிர்ப்பு விடயங்கள், பாதாள உலக எதிர்ப்பு விடயங்கள் போன்றவற்றுக்கெல்லாம் எங்களுடைய பலமான ஆதரவு உங்களுக்கு இருக்கின்றது. அதேநேரம், உங்களுடைய இந்தப் பலமான அரசு தமிழ் மக்களுக்கான உரிமைகளைக் கொடுப்பதிலே ஏன் உங்களுடைய அதிகாரத்தைப் பயன்படுத்த முயற்சிக்கவில்லை அல்லது உங்கள் ஆளுமையைப் பயன்படுத்த முயற்சிக்கவில்லை என்று கேட்கின்றேன். மிக முக்கியமாக, "கைதுசெய்யப்பட்ட அல்லது அரசியல் கைதிகளை விடுவிப்பதற்கான நடவடிக்கை எடுக்கப்படும், பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்படும்" என்று உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்திலே சொல்லப் பட்டது. ஆனால், அதற்கான நடைமுறைகள் எதுவுமின்றி, இன்று அந்த விடயத்தை மறந்தவர்களாக நீங்கள் செயற் படுவதையே காணக்கூடியதாக இருக்கின்றது. ஏன் நீங்கள் இந்த விடயத்திலே உறுதியான முடிவை எடுக்கவில்லை?

அடுத்து, இன்று சிறுவர்களுக்கான, பெண்களுக்கான பல சட்டங்களை நீங்கள் இயற்றுகின்றீர்கள்; அதற்காக எங்கள் ஆதரவுகளைத் தருகின்றோம். அன்று பாலச்சந்திரன் போன்ற பல குழந்தைகள் அநியாயமாகக் கொல்லப்பட்டார்கள். செம்மணியில் குழந்தைகள்கூட கொல்லப்பட்டுப் புதைக்கப் பட்டார்கள். ஆனால், அதற்கான நீதிப் பொறிமுறையைத் தருவதில், நீதி விசாரணையை நடத்துவதில் நீங்கள் பின்னிற்கின்றீர்கள். இசைப்பிரியா போன்ற பல பெண்கள் எவ்வாறான துன்பங்களைச் சந்தித்து இருப்பார்கள்? அதற்கான சர்வதேச நீதிப் பொறிமுறையை ஏற்படுத்துவதற்கு நீங்கள் தயங்கி நிற்கின்றீர்கள்? இவ்வாறான விடயங்கள் தமிழ் மக்களிடையே நம்பிக்கையீனத்தையும் மனக்கிலேசத்தையும் ஏற்படுத்துவதாக இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Elayathamby Srinath, your time is up.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Give me one more minute, Sir.

நீதியான ஓர் அரசாங்கத்தை நடாத்த விரும்புகின்ற, போதைப்பொருளுக்கு எதிராக, ஊழலுக்கு எதிராகப் போர் தொடுத்திருக்கின்ற உங்களுடைய மாண்புமிகு சனாதிபதி யையும் அரசாங்கத்தையும் நாங்கள் பாராட்டுகின்றோம். அதேபோன்று, தமிழ் மக்களுக்கான உரிமைகள் விடயத்திலும் நீங்கள் ஒரு தீர்க்கமான முடிவை எடுக்கவேண்டுமென மிக விநயமாகக் கேட்டுக்கொண்டு, உங்களுடைய எதிர்காலத் திட்டங்கள் மிகச் சரியாக இருக்கின்றபோது, அதற்கான எங்களின் ஆதரவு இருக்குமென்ற ஓர் உறுதிமொழியையும் தந்து, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ramalingam Chandrasekar. You have 14 minutes.

[பி.ப. 12.04]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு இந்த சந்தர்ப்பத்தை அளித்தமைக்கு நன்றி!

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය පිළිබඳව උතුරෙන් ඇසෙන කථා තිබෙනවා; උතුරේ ඉන්න විද්වතුන් කියන කථා තිබෙනවා. අන්න ඒ කථාවලින් එකක් තමයි, මේ සැරේ අය වැය සහ කලින් සැරේ අය වැය ජාතික සමගිය තවත් ශක්තිමත් කරන අය වැයක් කියන එක. අපේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ අපි වැඩියෙන්ම මැදිහත් වුණේ ජාතික සමගිය ගොඩ නැඟීමටයි. ජාතික සමගිය කියන්නේ අත්‍යවශ්‍ය එකක් කියන එක අපි දන්නවා; අපේ ආණ්ඩුවත් දන්නවා; අපේ ගරු ජනාධිපතිතුමාත් දන්නවා. අන්න ඒ නිසා අපි වැඩියෙන්ම කථා වුණේ, අපේ කවීකාවන් හැදුණේ අපේ ජාතික සමගිය ශක්තිමත් කරන දිශාවකටයි.

2026 අයවැය ඉදිරිපත් කළ දවසේ ඉඳලා මේ වනතුරුත් එය සිංහල මිනිස්සු, Tamil මිනිස්සු ඇතුළු සියලු ජාතීන්වල වැඩිහිටියන් පමණක් නොවෙයි, තරුණ තරුණියන් ආදි සියලු දෙනාම ප්‍රශංසා කරන අය වැයක් කියන එක ගැන විවාදයක් නැහැ. ඒ වාගේම, ජනමාධ්‍යවේදීන් ගත්තත්, සමාජ මාධ්‍ය ගත්තත්, විශේෂයෙන් දෙමළ භාෂාව කථා කරන පිටරටවල ඉන්න අය, ඩයස්පෝරාවේ අය ඇතුළු සියලු දෙනාම එහෙමයි. මට ඊයේ යාපනය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරයෙක් කථා කරලා කියපු කථාව තමයි, "චන්ද්‍රසේකර් ඇමතිතුමා, මීට කලින් අය වැයක් ඉදිරිපත් කළාට පස්සේ යාපනයට අරක නැහැ, මේක නැහැ, දෙමළ ජනතාවට අරක නැහැ, මේක නැහැ, නැත්නම් කඳුකරයට මේක නැහැ, එහෙම නැත්නම් මුස්ලිම් ජනතාවට මේක නැහැ කියලා කියනවා. එහෙම කථා මම වුණත් කියලා තිබෙනවා. අපි මේ සැරේත් ඔයගොල්ලන්ගේ වාර්තා ටික අරගෙන බැලුවා. නමුත් කිසිදු තැනකින් අපට සඳහන් කරන්න බැරි වෙලා තිබෙනවා, කොයි පළාතටද, නැත්නම් කොයි ජනතාවටද අඩු කොට සලකලා තිබෙන්නේ කියලා. මේක සියලුම ජනතාවට සියලුම පැතිවලින් සලකලා තිබෙන අය වැයක්; ඔයගොල්ලන් කලින් ගෙනාපු ජාතික සමගිය තවත් ශක්තිමත් කරන අය වැයක්" කියන එක.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த வரவு செலவுத்திட்டமானது கஜேந்திரகுமார் பொன்னம்பலம் போன்றவர்களுக்குக் கொஞ்சம் சரியில்லாமல் இருக்கலாம்! ஏனென்றால், அவர்கள் எதிர்ப்பு அரசியலில் நாட்டங்கொண்டு இருப்பவர்கள். அதனால் அவர்கள் இது சம்பந்தமாக விமர்சனங்களை மாத்திரம் முன்வைக்கலாம். இருந்த போதிலும்கூட, நான் ஒரு விடயத்தைச் சொல்கின்றேன். இலங்கையில் இருக்கின்ற தமிழ், சிங்கள, முஸ்லிம் மக்கள் உட்பட அனைவரும் இந்த வரவு செலவுத்திட்டத்தை மக்களுக்கான வரவு செலவுத்திட்டமெனக் கூறுகின்றார்கள். அந்த வகையில், எனக்கும் எங்களது அரசாங்கத்துக்கும் பெருமையாக இருக்கின்றது. இன்று நாங்கள் வரவு செலவுத்திட்டம் தொடர்பாக கூடுதலாகப் பேசுகின்றோம். எனினும், வட, கிழக்குப் பிரதேசங்களில் வாழுகின்ற தமிழ் மக்களுடைய பிரச்சினைகள் தொடர்பாகப் பேசுவது குறைவாகக் காணப்படுகின்றது. அந்த மக்கள் முகங்கொடுக்கின்ற பிரச்சினைகள் சம்பந்தமாகப் அவர்கள்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

பேசுகின்றார்களா? என்று பார்த்தால், அதுவும் கேள்விக் குறியாகக் காணப்படுகின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, உங்களுக்கும் நன்றாகத் தெரியும், கார்த்திகை மாதம் என்பது தமிழ் மக்களுக்கு முக்கியமானதொரு மாதம் என்று. விசேடமாக இந்த மாதம் மாவீரர்களை நினைவுகூருகின்ற மாதமாகும். அதுமாத்திரமல்ல, வடக்கு, கிழக்கில் வாழுகின்ற தமிழ் மக்கள் போரில் இறந்த தங்களுடைய பிள்ளைகளை, உறவினர்களை நினைவுகூருகின்ற மாதமுமாகும். நாங்கள் இந்த மாதத்தில் இருந்துகொண்டு கடந்த கால வரலாற்றைச் சற்று திரும்பிப் பார்க்கவேண்டி இருக்கின்றது. பல தசாப்தங்களுக்கு முன்னர், தமிழ் மக்களுக்கான உரிமைகளைப் பெற்றுக்கொடுக்க வேண்டுமெனப் போராடிய இளைஞர்களின் எதிர்பார்ப்புகள், அபிலாஷைகள் என்ன என்பதை நாங்கள் புரிந்துகொள்ள வேண்டும்.

தமிழ் மக்கள் நிம்மதியாகவும் சந்தோஷமாகவும் வாழக் கூடிய சூழலை ஏற்படுத்திக் கொடுப்பதற்காகவேண்டி அவர்கள் போராடி இருந்தால், அந்த இளைஞர்களுடைய கனவுகளை நனவாக்குகின்ற செயற்பாடுகளை இன்றைக்கு எந்தவொரு தமிழ் கட்சியாவது, தமிழ் அரசியல்வாதியாவது மேற் கொள்கின்றார்களா? அன்றைய காலகட்டங்களில் அந்த இளைஞர், யுவதிகள் செய்த அர்ப்பணிப்புகளையும் தியாகங்களையும் செய்கின்றார்களா? என்றால், அது கேள்விக்குறியே!

இன்று வட, கிழக்குப் பிரதேசங்களில் மக்கள் தொகை குறைவடைந்து வருகின்றது என்பது எங்கள் எல்லோருக்குமே தெரியும்! அதுமாத்திரமல்ல, இன்று வறுமை கூடிய மாகாணமாக வடக்கு மாகாணமும் அதற்கு அடுத்த படியாக கிழக்கு மாகாணமும் காணப்படுகின்றது. இன்று தேசிய உற்பத்திக்கு குறைந்தளவு பங்களிப்புச் செய்கின்ற மாகாணமாக வடக்கு மாகாணமும் அதற்கு அடுத்த படியாக முறையே கிழக்கு மாகாணமும் ஊவா மாகாணமும் காணப்படுகின்றது. அந்த வகையில் பார்க்கும்போது எங்களுக்குத் தெரிகின்றது, எங்களுடைய மாகாணங்களில் காணப்படுகின்ற பிரச்சினைகளை கடந்த கால ஆட்சியாளர்கள் ஏறெடுத்தும் பார்க்கவில்லை, அவற்றுக்கு உரிய தீர்வுகளை வழங்கவுமில்லை என்று. அவர்கள் தங்களுடைய மடியை மாத்திரம் நிறைத்துக்கொள்வதற்காக அரசியலை முன்னெடுத்தார்களே தவிர, தமிழ், முஸ்லிம் அல்லது மலையக மக்களுடைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுக்கவில்லை. அதன் விளைவாக இன்று வடக்கில் ஏற்பட்டிருக்கின்ற நிலைமை எங்கள் எல்லோருக்கும் நன்றாகத் தெரியும்!

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 1981ஆம் ஆண்டு யாழ். மாவட்டத்தில் 830,000 மக்கள் வாழ்ந்தார்கள். ஆனால், இன்று அங்கு 610,000 மக்களே வாழ்கின்றார்கள். அன்று யாழ். மாவட்டத்திலிருந்து 11 உறுப்பினர்கள் பாராளுமன்றத்துக்குத் தெரிவு செய்யப்பட்டார்கள். இன்றைக்கு 6 உறுப்பினர்களே தெரிவுசெய்யப்பட்டு இருக்கிறார்கள். அடுத்த வருடம் இந்த எண்ணிக்கை ஐந்தாக அல்லது நான்காகக்கூட குறைவடையலாம். அவ்வாறான நிலைமைதான் காணப்படுகின்றது. இன்று எங்களுடைய மக்களின் அரசியல் இருப்பு கேள்விக்குறியாகி இருக்கின்றது. இன்று அங்குள்ள அரசியல்வாதிகள் தங்களுடைய இருப்பையும் MP பதவியையும் மாத்திரம் தக்கவைத்துக்கொள்வதற்காகச் செயற்படுகின்றார்கள். இப்படியே போனால், நாளை MPsஐத் தெரிவுசெய்வதற்குக்கூட அங்கு மக்கள் இல்லாத ஒரு நிலைமை ஏற்படும். எனவே, நாங்கள் அந்த நிலைமைக்கான காரணத்தை நல்ல முறையில் அடையாளங்கண்டு, அந்த நிலைமையில் இருந்து அந்த மக்களை மீட்பதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுக்க வேண்டும். ஒருபுறம் நிலைமை இவ்வாறு இருக்க, மறுபுறம் தமிழ் மக்கள் வேகமாக நாட்டை விட்டு வெளியேறிக்கொண்டு இருக்கின்றார்கள். இதன் காரணமாக எங்களது தமிழ் மக்களுடைய குடிப்பரம்பல் மேலும் குறைவடைந்து வருகின்றது.

கல்வியில் புலமை மிக்கவர்களாக, சிறந்தவர்களாக விளங்குபவர்கள் யாழ்ப்பாணத்தவர்களே காணப்படுகிறார்கள் என்று கடந்த காலத்தில் பெருமையாகச் சொல்லப்பட்டது. ஆனால், கடந்த 10 ஆண்டுகளாக யாழ்ப்பாணத்தின் கல்வி நிலை தொடர்ச்சியாக பின்தங்கிய நிலையை நோக்கியே நகர்ந்து செல்கின்றது என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்! எனினும், ஒன்றை மறந்துவிட வேண்டாம். கடந்த 6-7 மாதங்களை நாங்கள் திரும்பிப் பார்க்கின்றபோது, வடக்கிலுள்ள கல்வியியலாளர்களிடத்திலும் கல்வி கற்கின்ற பிள்ளைகளிடத்திலும் புதிய நம்பிக்கை பிறந்திருப்பதைக் காணலாம். நிச்சயமாக, கல்விப் புலத்தில் உள்ளவர்களுடைய கல்வியை மேம்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க முடிவது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் மாத்திரமே ஆகும். கௌரவ கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்களே, இதை நீங்களும் புரிந்துகொள்வீர்களென நினைக்கின்றேன்.

இவை எல்லாவற்றையும்விட, இன்றைக்கு அங்கு பாரிய பிரச்சினையொன்று இருக்கின்றது. அதாவது, இன்றைக்கு போதைப்பொருள் மாபியாக்கள் வடக்கை ஆளுகின்றன; வடக்கு மக்களை அச்சம் கொள்ளச் செய்கின்றன. இந்த நிலைமையில் இருந்து வடக்கை மீட்பதற்கு வேறு எந்த அரசியல்வாதிகளும் முன்வரவில்லை. அது நீங்கள் ஆதரவளிக்கின்ற சஜித் அணியைச் சார்ந்தவர்களாக இருக்கலாம் அல்லது அவர்களது கும்பலைச் சாந்தவர்களாக இருக்கலாம்! கௌரவ மனோ கணேசன் அவர்களுக்கு நன்றாகவே தெரியும், இந்தக் கும்பலைச் சார்ந்தவர்கள் இன்று நேற்றல்ல, 1978ஆம் ஆண்டில் இருந்தே இந்த நாட்டில் அவ்வகையான மாபியாக்களையும் நாசகார வேலைகளை செய்கின்றவர்களையும் உருவாக்கி இருக்கின்றார்கள் என்று.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
එතුමාට විනාඩියක් දෙන්න, කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. The time will be deducted from your allotted time then.

Yes, Hon. G.G. Ponnambalam?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ அமைச்சர் அவர்களே, இரண்டு கேள்விகளைக் கேட்க விரும்புகின்றேன். முதலாவது, இப்போது நீங்கள் சொன்னீர்கள், கடந்த ஏழு மாதங்களாக வடக்கின் கல்வி நிலை சற்று உயர்வடைந்து வருகின்றது என்று. இதை நீங்கள் எதை அடிப்படையாக வைத்துச் சொன்னீர்கள்? இதை ஆதாரபூர்வமாகச் சொல்லுங்கள்! இரண்டாவது, உங்களுக்கும் தெரியும், வடக்கிலும் கிழக்கிலும் இராணுவம்தான் போதைப்பொருள் பிரச்சினைக்குப் பிரதான காரணம் என்று. எப்போது நீங்கள் அங்கிருந்து இராணுவத்தை வெளியேற்றப் போகிறீர்கள்?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் முதலில் சொன்னது போன்று, கடந்த காலங்களைவிட இன்று வடபகுதி கல்வி ரீதியாக முன்னேறி வருகின்றது. யாழ்ப்பாணத்தில் கல்வி கற்பதற்குப் பதிலாக தங்களது பிள்ளைகளை கொழும்புக்கு அனுப்புகின்ற நிலைமை ஏற்பட்டு இருக்கின்றது. அதுமாத்திரமல்ல, கடந்த இரண்டு மாதங்களுக்கும் மேலாக நூற்றுக்கும் அதிகமான பிள்ளைகளை வெளிநாட்டுக்கு அனுப்பவேண்டிய நிர்ப்பந்தத்துக்கும் உள்ளாகி இருக்கின்றார்கள். காரணம், இந்த போதைப்பொருள் மாபியாக்கள்தான். *[இடையீடு]* போதுமான ஆதாரங்கள் தேவையில்லை. யாழ்ப்பாணத்தில் இருக்கின்றவர்களுக்கு புலத்தில் உள்ள யதார்த்தம் புரிய வேண்டும். அந்த யதார்த்தத்தைப் புரிந்துகொள்ள முடியவில்லை என்றால், அதற்கு நான் ஒன்றும் செய்ய முடியாது. இரண்டாவதாக நீங்கள் சொன்னீர்கள், போதைப்பொருள் பிரச்சினைக்குப் பின்னால் இராணுவமும் பொலிஸும் இருக்கின்றது என்று. அதில் உண்மை இருக்கின்றது. ஆனால், இராணுவமும் பொலிஸும் வேறாக இல்லை. அங்கிருக்கின்ற மாபியாக்களோடு இணைந்து இருக்கின்றன. அந்த மாபியாக்களோடு அங்கிருக்கின்ற தமிழ் அரசியல்வாதிகளும் பிணைந்து இருக்கின்றார்கள். அண்மையில் அவ்வாறான அரசியல்வாதிகள் கைதுசெய்யப்பட்டும் இருக்கின்றார்கள்.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
තත්පරයක් දෙන්න, කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
By the way, you have only two more minutes.

Yes, Hon. G.G. Ponnambalam?

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

கௌரவ அமைச்சர் அவர்களே, இராணுவமும் பொலிஸும் போதைப்பொருள் விடயத்தில் சம்பந்தப்படுகிறது என்பதை நீங்கள் ஒப்புக்கொண்டதை நான் உண்மையிலேயே வரவேற்கின்றேன்; பாராட்டுகின்றேன். ஏனெனில், இதற்கு முன்னர் இருந்த அரசாங்கங்கள் அப்படிச் சொல்வதில்லை. நீங்கள் மாபியாக்கள் பற்றி சொன்னீர்கள். நீங்கள் இராணுவத்தைப் பொறுப்புக்கூற வைக்காமல் இருக்கும்வரை இந்த மாபியாக்களையும் இல்லாமல் செய்யப் போவதில்லை. ஏனென்றால், வடக்கில் இரண்டு பிரஜைகளுக்கு ஓர் இராணுவ சிப்பாய் என்ற அடிப்படையில் இராணுவம் இருக்கின்றது. இது உங்களுக்கும் தெரியும்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. G.G. Ponnambalam, we are running short of time. I think the Hon. Minister has almost finished his allocation. Hon. Ramalingam Chandrasekar, you have only one more minute.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

அங்குள்ள ஒட்டுமொத்த இராணுவத்தினர் மீதோ, பொலிஸார் மீதோ பழிசொல்ல முடியாது. அங்கிருக்கின்ற ஒரு சிலருடைய செயற்பாடுகள்தான் அப்படி இருக்கின்றன. அதேநேரம், நீங்கள் ஒன்றை மறந்துவிடக் கூடாது. அதாவது, உங்களுடைய அரசியல் கட்சிகளின், உங்களுடைய நண்பர்களுடைய அரசியல் கட்சிகளின் பிதாக்களும்கூட இந்த மாபியா கும்பல்களுக்குப் பின்னால் இருக்கின்றார்கள் என்பதை மறந்துவிடக் கூடாது. *[இடையீடு]* உங்களுடைய தல்ல, உங்களுடைய நண்பர்களுடைய கட்சிகளைச் சார்ந்தவர்களும் இருக்கிறார்கள் என்பதை மறந்துவிடக் கூடாது. எது எவ்வாறு இருந்தபோதிலும்கூட, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, your time is up now.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு 16 நிமிடங்கள் ஒதுக்கப்பட்டு இருந்தன. நான் 13 நிமிடங்கள்தான் பேசியிருக்கிறேன். எனக்கு ஒரு நிமிடம் தாருங்கள்!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
உங்களுக்கு 14 நிமிடங்கள்தான் ஒதுக்கப்பட்டு இருக்கிறது.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)

சரி, பரவாயில்லை! கடைசியாக ஒரு விடயத்தைச் சொல்லி முடிக்கிறேன்.

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

இன்றைக்கு நாங்கள் பாரிய அபிவிருத்தித் திட்டங்களை முன்னெடுக்கின்றோம். அதுமாத்திரமல்ல, மக்களுக்கு நம்பிக்கை ஏற்படக்கூடிய நிலைமையையும் கட்டியெழுப்பி இருக்கின்றோம். அதன் ஊடாக நாட்டில் இருக்கக்கூடிய தமிழ், சிங்கள, முஸ்லிம், மலே, பேகர் உள்ளிட்ட அனைத்து இன மக்களையும் ஒன்றிணைக்கின்ற செயற்பாடுகளை முன்னெடுத்து வருகின்றோம். அந்த முன்னெடுப்பை மேலும் மெருகூட்டுகின்ற விதமாக எதிர்வரும் டிசம்பர் மாதத்தில் Sri Lankan Dayஐ - இலங்கையர் தினத்தை - நடத்தி, அதனூடாக இலங்கையில் வாழுகின்ற அனைத்து மக்களையும் ஒரு கொடியின்கீழ் கொண்டுவந்து, நாட்டில் தேசிய ஒற்றுமையையும் மதங்களுக்கு இடையில் நல்லிணக்கத்தையும் சமத்துவத்தையும் ஏற்படுத்தக்கூடிய செயற்பாடுகளை நாங்கள் முன்னெடுக்க உள்ளோம். இதன்மூலம் வடக்கை, குறிப்பாக இன்றிருக்கின்ற யாழ்ப்பாணத்தை எதிர்வரும் காலங்களில் முன்னேறிய, மலர்ச்சியை நோக்கிச் செல்லக்கூடிய, அரசியல் மாபியாக்களிடமிருந்து விடுபட்ட யாழ்ப்பாணமாக மாற்று வதற்கு எங்களால் நிச்சயமாக முடியும் என்பதைக் கூறிக் கொண்டு, அதற்கு உங்களுடைய ஒத்துழைப்பைத் தருமாறு கேட்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I do not have much time. There have been a lot of catcalls coming from that side.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, this is not related to that.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I have to accommodate another speaker before lunch. - *[Interruption.]* Okay, I will give you a few seconds. What is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I will explain the point. I will never take time without a point to make. Sir, this is under Standing Order No. 82(1). Shall I read it or shall I explain it?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, you may explain.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එහි පැහැදිලිව තිබෙනවා, මේ සභාවේ පාවිච්චි කරන්න බැරි වචන පාවිච්චි කළා නම්, those should be expunged from Hansard and a satisfactory apology should be made. A few days ago, the Hon. Minister scolded me "තමුසේ" කියලා. එතකොට මම ඒක submit කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, this was announced by the Hon. Speaker. He had ordered to expunge that and also instructed the Secretary-Generals to go into that.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
No, Sir, this is regarding another incident, not about the same thing.

සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා කියලා, මන්ත්‍රීතුමියක් එක්කගෙන පිටරට යයි කියන කාරණය ගැන ලක්මාලි මන්ත්‍රීතුමිය කථා කරනකොට, ඒ ගැන Privilege Question එකක් ගෙනෙන්න කියලා කිව්වා. හැබැයි මට බැණපු එක විතරයි expunge කරන්නේ. "එක්ක ගෙන යනවා" කිව්වාම Privilege Question එකක් ගෙනෙන්න කිව්වා. එක්ක ගෙන යනවා කියන්නේ හොඳ එකක් නේ. මාව කවුරු හරි අක්කා කෙනෙක් එක්ක ගෙන යනවා නම් මම එනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. (Dr.) Ramanathan Archchuna, I will bring it to the notice of the Hon. Speaker. - [Interruption.] Could we move onto the next speaker? We are short of time.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තත්පරයක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Ramalingam Chandrasekar?

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ කාරණයත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මේ අර්චුනා මන්ත්‍රීවරයා එදා ඔබතුමාත් සිටි අවස්ථාවේ ඉලංකුමාරන් මන්ත්‍රීතුමාට "செம்மறி ஆடு" කියලා බැන්නා. "செம்மறி ஆடு" කියන්නේ, හොඳ වචනයක් නොවෙයි. ඒ නිසා එවැනි අපහාස කරන පුද්ගලයන් - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That, too, will be expunged. I think the Hon. Speaker mentioned that that Hon. Member, too, had used such words.

Next, the Hon. Major General (Rtd.) Aruna Jayasekera. You have 12 minutes.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Could we please listen to the Hon. Deputy Minister? Hon. Member, I will come back to you.

[අ.භා. 12.22]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

මම ප්‍රථමයෙන්ම ගජේන්ද්‍ර පොන්නම්බලම් මන්ත්‍රීතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. එතුමා කිව්වා, හමුදාවේ සහ පොලීසියේ අයවලුන් මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධයි කියලා. එහෙම තිබෙනවා නම් කරුණාකර අපට නම්වලින් ඒ තැන්, ඒ ඒකක, රෙජිමේන්තු, පොලිස් ස්ථාන මොනවාද කියලා දන්වන්න. එහෙම දන්වන්නේ නැතුව මේ වාගේ කාරණා නිකම් විවෘතව කියන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා. කරුණාකර අපට ඒවා දන්වන්න. අපි ඒ ගැන සොයා බලන්නම්. එවැනි ජාවාරම්වලට අපේ සම්බන්ධතාවක් නැහැ.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, let him continue because we have to suspend for lunch. By the way, I will not interrupt the speaker because he also has a little time left. We have to suspend by 12.30 p.m.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

අපේ ජාතික ජන බලවේගයේ අතිසාර්ථක දෙවන අයවැය පිළිබඳ විවාදයේදී අදහස් දක්වන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෑම ශ්‍රී ලාංකිකයෙකුම යහපත් ජීවිතයක් භුක්ති විඳිය යුතු බවට වන අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීමේ අවශ්‍යතාව යථාර්ථයක් කිරීම මුදුන්පත් කරගෙන තමයි මේ අය වැය ලේඛනය අපි ඉදිරිපත් කළේ. ඒ වාගේම සැමට ස්වෛරී, සමෘද්ධිමත් සහ යහපත් ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීම පෙරදැරි කරගෙන අපි ප්‍රතිපත්තිමය වශයෙන් පසුගිය අවුරුද්දක් වැනි කාලයක් තුළදී ඉතාම හොඳින් ගත්ත තීන්දු තීරණවල ඉදිරි ගමනක අවශ්‍යතාවට සකසන ලද අය වැයක්, මේක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දශක ගණනාවක් තිස්සේ පැවති රජයන්වලින් ගන්නා ලද අදූරදර්ශී, අයහපත්, මහජන විරෝධී, වැරදි ආර්ථික තීරණ නිසා මොකද වුණේ? ජනතාව දැඩි පීඩනයකට ලක් වුණා.

Hon. Deputy Speaker, we have seen what had been practised exclusively by previous regimes over a period of time. They adopted destructive economic policies and implemented a weak tax administration, granting tax benefits to their own cronies. There had been inefficiency and corruption. Corruption prevailed to a massive or major extent from State level down to the ground level. Tax avoidance or tax evasion had been tolerated by the previous regimes and no action had been taken. But, what did we do? We, the National People's Power, believe, as we had very explicitly expressed in our manifestos prior to elections, that ensuring the quality of life and social, cultural development of the citizens of the country depends on the correct economic policies adopted by us. And that, we have been practising always.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර රජයන් පැවැති කාලවල අපිට නිතරම අහන්න ලැබුණේ, මහ බැංකු මංකොල්ලය, මහ දූෂණ වළල්ල, සීනි වංචාව, සුදු ලූනු වංචාව, හෙජින් ගනුදෙනුව, මිග් දූෂණ සහ ගනුදෙනු, බාල බෙහෙත් ගෙන්වීම, ඇන්ටිජන් හොර ගනුදෙනු වැනි දේවල්. ඒ ආණ්ඩු ප්‍රසිද්ධ වුණේ මේවායින් තමයි. නමුත් අපි ඉතාම විනයගරුකව, අවබෝධයෙන් යුතුව සැලසුම් කරලා ඉතා ඕනෑකමින් ජනතා හිතවාදී ලෙස, ජනහිතකාමී ලෙස හදපු අය වැයක්, මේක. පසුගිය කාලවල ඔවුන් ඒ දේවල්වලට සම්බන්ධ වෙනකොට අපි ආවේ වැඩ කරන්න. ඒ නිසා අපි අනිවාර්යයෙන් මේ අය වැයෙන් ඉදිරි වර්ෂය තුළ වැඩ කරලා පෙන්වනවා. ඉදිරි වසර වැඩ අවුරුද්ද කියලා නම් කරලා තිබෙන්නේ. අපි අනිවාර්යයෙන් වැඩ පටන්ගෙන වැඩ පෙන්වනවා.

අපට ලැබුණු ජනවරමේ තිබෙන්නේ බලාපොරොත්තු. අපට ජනවරම ලැබුණු මොහොතේ ඉඳලාම සමස්ත ආර්ථිකය ස්ථාවර කිරීමටත්, රාජ්‍ය මූල්‍ය විනය තහවුරු කිරීමටත් කටයුතු කර තිබෙනවා. විනයක් නැත්නම් කවදාවත් කිසිම දෙයක් කරන්න බැහැ. ඒ නිසා අපේ පරම විශ්වාසය රාජ්‍ය මූල්‍ය විනය රැකීමයි, රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීමයි. මේවා අකාර්යක්ෂම කරලා තිබුණේ. අපි දූෂණයට තිත තිබ්බා. අපි විනිවිදභාවය ඉහළ නංවලා, ජනතාවට වගවීම තහවුරු කිරීමට කටයුතු කරලා ඉදිරිපත් කරන ලද අය වැයක්, මේක. අපි ඉතා පුළුල් ප්‍රතිසංස්කරණ වෙනසකින් පටන් ගත්තේ. එහි ප්‍රතිඵලය තමයි මේ අය වැයෙන් ප්‍රකාශ කරන්නේ. ගරු ජනාධිපතිතුමා එය ඉතාම පැහැදිලි ලෙස සඳහන් කරමින්, පසුගිය 7වැනි දා එය සභාගත කළා.

ඒ වාගේම ආර්ථික වර්ධනයට, නැත්නම් ආර්ථිකයේ සංවර්ධනයට විශ්වාසයක් ගොඩනැඟීම සඳහා නීතිය හා සාමය ස්ථාපිත කිරීම ඉතා වැදගත් වනවා. මෙම ආර්ථික වර්ධනය අත්පත් කර ගැනීම සඳහා අපි පළමුවෙන්ම ආර්ථිකය හා සමගාමීව නීතිය හා සාමය ස්ථාපිත කිරීමට විශාල පංගුවක් වෙන් කළා, විශාල අවධානයක් යොමු කළා. මෙතෙක් කල් තිබුණේ අවිධිමත්, එහෙම නැත්නම් පක්ෂපාතී සංස්කෘතියක්. නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කිරීම අපට ඉතාම අසීරු වුණා. පසුගිය කාලවකවානුවලදී පැවති රජයන් ඔවුන්ගේ ප්‍රතිපත්තියම තමයි නීතිය හැටියටත් අරගෙන තිබුණේ. ඒ නිසා නීතියේ ආධිපත්‍යය තහවුරු කරන ආයතන ස්වාධීන කිරීම තමයි අපි ඉස්සෙල්ලාම කළේ. විශේෂයෙන්ම පොලීසිය, ඒ වාගේම ආරක්ෂක අංශ අපි දේශපාලනයෙන් මුදා ගත්තා. ඒ වාගේම මත්ද්‍රව්‍ය හා සංවිධානාත්මක අපරාධ මැඩලීමට පියවර ගැනීම තමයි අපේ ආර්ථික වර්ධනයට, ආර්ථික ස්ථාවරත්වයට මහත් පිටුවහලක් වුණේ. ඒ නිසා ජාතික ජන බලවේගය ප්‍රතිපත්තිමය වශයෙන් ප්‍රකාශ කරන ලද "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන සංකල්පය අනුව අපි කියන දේ කරනවා කියන එක අනිවාර්යයෙන්ම මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ඒ අනුව පසුගිය අවුරුද්දක් වැනි කාලයක් තුළ සැලසුම් කරලා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියලා තිබෙන විධියටම අපේ ප්‍රතිපත්ති එකින් එක සම්පාදනය කරන්න තමයි මෙවැනි සාර්ථක අය වැයක් මෙවර අපි ඉදිරිපත් කළේ. සාර්ථක ආර්ථිකයක් ගොඩනැඟීමට අනිවාර්යයෙන්ම ආරක්ෂාවේ විශ්වාසය ගොඩනඟා ගන්න ඕනෑ. ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම, එහෙම නැත්නම් සංවිධානාත්මක අපරාධ ජාලය ආර්ථික වර්ධනයට මහත් තර්ජනයක් වුණා, බාධාවක් බවට පත් වුණා. ඒ මත්ද්‍රව්‍ය ජාවාරම් මැඩ පැවැත්වීම, නැවැත්වීම ලෙහෙසි පහසු දෙයක් නොවෙයි. Sir, it is a professional task or a job of work. A strategic approach is needed to crack it down. That, we implemented over a period of time and now, you could see what is happening; it is unfolding. Even this morning, we seized a large supply of drugs at the coastland in Kirinda. That, you could see on media today. So, to establish a stable economy, a strategic, coordinated mechanism, security, law and order are mandatory or a must. Therefore, we implemented that. Then, a secure environment is also needed. Our main or foremost strategic concern was restoration of the rule of law and order.

ඒ නිසා පසුගිය ඔක්තෝබර් 30වැනි දා පටන් ගත් "රටම එකට" ජාතික මෙහෙයුම වැඩසටහන අපි ඉදිරියටම ගෙනියනවා. ඒ සඳහා සෑම අංශයක්ම ආවරණය වන පරිදි මත්ද්‍රව්‍ය පාලන වැඩසටහන වෙනුවෙන් මේ අය වැයෙන් රුපියල් මිලියන 1,500ක් වෙන් කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. එවැනි වැඩසටහන්වල ප්‍රතිඵල පසුගිය අවුරුද්දේම අපි දැකගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වසරේ මෙහෙයුම්වලින් විතරක් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 20,000ක් අපි අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒක පොඩි පහේ ප්‍රමාණයක් නොවෙයි. ඒවා තිබුණා නම්, රාජ්‍යකරණයට, ආණ්ඩුකරණයට හා සාමයට කියන හැම දෙයකටම විශාල බලපෑමක් ඇති වෙනවා. රාජ්‍ය සේවය නවීකරණය, රාජ්‍ය සේවයේ ක්‍රියාකාරිත්වය, රාජ්‍ය ව්‍යවසායකත්වය කියන්නේ, ජාතික ආර්ථිකයට සහ සේවා සැපයීමට විශේෂ දායකත්වයක් සපයන කොටස්. පසුගිය කාලවකවානුවේ රාජ්‍ය සේවය අකර්මණ්‍ය කරලා තිබුණේ. පසුගිය අවුරුද්ද පුරා ක්‍රමානුකූලව රාජ්‍ය සේවය විධිමත් කරමින්, ඒ සියලු සැලසුම් සකස් කරලා, ඒ සියලු කොට්ඨාසවල සහභාගිත්වයෙන් තමයි, අපි මේ අය වැයට අවතීර්ණ වුණේ. රාජ්‍ය සේවකයින් ඒ සඳහා විශාල සේවයක් කළා. පසුගිය අවුරුද්ද තුළ අපේ ප්‍රතිපත්තියට අනුකූලව ඔවුන් හැඩගැහිලා, පොදු අරමුණක් කරා මේ රට ඉස්සරහට ගෙනියන්න, සෞභාග්‍යවත් රටක් ලෙස ඉදිරියට ගෙන යන්න, රාජ්‍ය සේවකයින් කරපු මෙහෙවරේ එක කොටසක් තමයි මේ අය වැයෙන් පිළිබිඹු වුණේ. ඒ නිසා අපේ බලාපොරොත්තුවත්, රටේ බලාපොරොත්තුවත්, මහජනයාගේ බලාපොරොත්තුවත් ගෞරවනීය රාජ්‍ය සේවයක් තුළින් ආර්ථිකයට ඵලදායී ලෙස දායකත්වයක් ලබා දීමයි. ඒ නිසා රාජ්‍ය සේවයේ විශ්වසනීයත්වය ගොඩනැඟීමටත්, රාජ්‍ය සේවයේ තිබෙන වැදගත්කම සනිටුහන් කිරීමටත්, රාජ්‍ය සේවයට කරන බඳවා ගැනීම් විධිමත් කිරීම සඳහාත් මෙවර අය වැයෙන් අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ ආයතනවල ඩිජිටල් ප්‍රවේශය ඉහළ නැංවීම සඳහාත් මෙවර අපි විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. රාජ්‍ය සේවය නවීකරණයට, එය කාර්යක්ෂම කිරීමට, ප්‍රතිඵලදායී රාජ්‍ය සේවයක්, ගෞරවනීය රාජ්‍ය සේවයක් මහජනයාට ලබා දීමට මේ අය වැයෙන් වෙන් කරන ලද මුදල මහත් පිටුවහලක් වෙනවා.

ඒ වාගේම පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය ආයතනවලට අවශ්‍ය වාහන, යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමටත් විශාල මුදලක් මෙවර අපි වෙන් කරලා තිබෙනවා. ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම් සඳහා ලබා දුන් පොලිය වෙනුවෙන් රජයේ දායක මුදල් ගෙවීමටත්, ඒ වාගේම රාජ්‍ය අංශයේ වැටුප් සහ විශ්‍රාම වැටුප් පිළිබඳ ගැටලුවලට විසඳුම් ලබා දීමට වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම සඳහාත්, ඒවායේ පරිපාලන කටයුතු සඳහාත් මෙවර අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය අංශයේ වැටුප් වැඩි වීමේ දෙවැනි අදියර සඳහා රුපියල් මිලියන 20,000ක් වෙන් කර තිබෙනවා.

විශේෂයෙන්ම තාවකාලික, ඒ වාගේම අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවා ගත් පිරිසකුත් රාජ්‍ය සේවයේ සිටිනවා. ඔවුන් ස්ථිර කිරීම සඳහා පසුගිය රජයන් විසින් විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබුණේ නැහැ. විධිමත් ලෙස ස්ථිර පත්වීම් ලබා නොදී අවම වැටුපක් ලබා දීලා රාජකාරි ඉටු කර ගැනීම තමයි සිද්ධ වුණේ. දැනට එවැනි 9,800ක පමණ පිරිසක් රාජ්‍ය සේවය තුළ සිටිනවා. පසුගිය රජයන් ඔවුන් වෙනුවෙන් කටයුතු කළේ නැහැ. හමුදාවේ විතරක් සේවය ස්ථිර කිරීම සඳහා 3,000කට වැඩි පිරිසක් ඉන්නවා. ඒ සඳහාත් විශාල මුදලක් මෙවර අය වැයෙන් වෙන් කර තිබෙනවා. මොකද, තාවකාලිකව බඳවා ගත් අය, අනියම් සේවකයෝ හැටියට බඳවා ගත් අය, ආදේශක හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගත් අය, සහන පදනම මත බඳවා ගත් අය බොහෝ අවස්ථාවල අපි ඉස්සරහට ඇවිල්ලා ඉල්ලා සිටියා, ඔවුන් ස්ථිර කරන ලෙස. විශේෂයෙන්ම ඔවුන්ගේ වැදගත්කම, රාජ්‍ය සේවයට ඔවුන්ගෙන් ඉටු වන මහඟු දායකත්වය සලකා බලා තමයි තාවකාලික පදනම මත බඳවාගෙන තිබෙන 9,800ක් පමණ වන එම සේවක පිරිස ස්ථිර කරන්න ජාතික ජන බලවේග රජය විසින් තීරණය කරලා තිබෙන්නේ. එම නිසා රාජ්‍ය සේවය නවීකරණයෙන් අපි බලාපොරොත්තු වන පොදු අරමුණ, එහෙම නැත්නම් ජාතික ජන බලවේග රජයේ ප්‍රතිපත්තිමය බලාපොරොත්තුවක් වන, ගෞරවනීය රාජ්‍ය සේවයක් ඇති කර පොදු මහජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කිරීම සඳහා මෙම නවීකරණ කටයුතුවලට වෙන් කරන ලද මුදල ඉතාම වැදගත් වන නිසා එය සාධාරණයි. මොකද, රාජ්‍ය සේවයේ ක්‍රියාකාරිත්වය, රාජ්‍ය ව්‍යවසායකත්වය, ජාතික ආරක්ෂාව සැපයීමට මෙම වෙන් කිරීම් විශේෂ දායකත්වයක් දක්වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Aruna Jayasekera, your time is up.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාල වකවානුවල රාජ්‍ය සේවය අකර්මණ්‍ය කරලා තිබුණා. අපි දැක්කා, ජනතාවගේ අප්‍රසාදයත් ඒ කෙරෙහි පළවෙලා තිබුණා. මේ අය වැයෙන් රාජ්‍ය සේවයට විශාල පංගුවක් වෙන් කරලා තිබෙන්නේත් ඒ නිසාමයි. මේක ඉතාම සාර්ථක අය වැයක්. මේ අවුරුද්දේ ගෙනා මෙම යෝජනාවලියේ ප්‍රතිඵල අප සැමට ලබන අවුරුද්දේ බලාගන්න පුළුවන්ය කියන කාරණය සඳහන් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්ථාවර නියෝග 29 (2) කියවන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have gone through this same thing before.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක අලුත් එකක්, තව අලුත් Privilege issue එකක්. මම ඉලංකුමාරන් මන්ත්‍රීතුමාගේ නම කිව්වා කියලා ගරු ධීවර ඇමතිතුමා බොරුවක් කිව්වා. Parliament (Powers and Privileges) Act එකේ, - *[බාධා කිරීමක්]* තත්පරයක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එය කියවන්නම්: "Willfully publishing any false or perverted report of any debate...-"

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, that was sorted out by the Hon. Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
No, Sir, this is a new one.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You may just quote that and then, it will be noted down. And, I will inform the Hon. Speaker.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, shall I raise it as a Privilege Question?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, please.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, what is your point of Order?

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Hon. Deputy Minister of Defence, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, I am not going to prolong this. Hon. Member, we have to suspend for lunch.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
Time තිබෙනවා නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Time තිබෙනවා නොවෙයි, දැන් මිනිත්තු 5ක් වැඩිපුර අරගෙන තිබෙනවා. The staff need to go for lunch, though we could go at any time.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිනිත්තුවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rishad Bathiudeen, just make it very short, please. Do not deprive the staff of their lunch time.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ගරු නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමනි, ඔබතුමා කිව්වා නේ පොලිසියයි, හමුදාවයි සම්බන්ධ නම් තොරතුරු දෙන්න කියලා. නොරොච්චෝලේ පොලිසියේ OIC දුරකථනයෙන් කථා කරලා ලොජ්කාරයාට කියනවා, "තව 6දෙනෙක් එනවා, ඔක්කෝම ලැහැස්ති කරන්න, ලබන මාසයේ ගෙවන්න තිබෙන මුදල් දෙන්න ඕනෑ නැහැ, රුපියල් 50,000ක් ගෙවන්න" කියලා. ඒ විධියට එතුමා කථා කරන voice එකක් ඇවිල්ලා තිබෙන්නේ. ඇත්තටම ඒ ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ව්‍යාප්තියට ඔහු තමයි සම්පූර්ණයෙන්ම සහයෝගය දෙන්නේ. නමුත් අද වන තුරු ඔහුට විරුද්ධව කිසිම action එකක් අරගෙන නැහැ. ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Aruna Jayasekera, do you want to respond?

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
අපි ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරන්නම්. බොහොම ස්තුතියි, ඒ පණිවුඩයට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 21ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවර අය වැය පිළිබඳව පැවැත්වෙන මේ විවාදයේදී දෙපාර්ශ්වයෙන්ම ඉදිරිපත් වුණු කරුණු ගැන සලකා සමස්තයක් ලෙස ගත් කළ මම හිතනවා, ශ්‍රී ලාංකික ජනතාවගේ පැත්තෙන් මේ අය වැය ගැන අවංක, නිර්ව්‍යාජ විවරණයක් මේ වෙලාවේ අවශ්‍යයි කියලා. බොහෝ වෙලාවට විපක්ෂයෙනුත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයෙනුත් ඉදිරිපත් වූ කරුණු තුළ මේ අය වැය පිළිබඳ සාධනීය සංවාදයක ගැඹුර නොතිබුණු බවයි මගේ නිරීක්ෂණය. මේක බොහොම අවංක කථාවක්. ඒ නිසා අපි ඉස්සෙල්ලාම වර්තමාන රජය ගැන විපක්ෂ දෘෂ්ටි කෝණයෙන් රජයේ සාධනීය පසුබිම ගැනත්, සාධනීය යම් යම් ලක්ෂණ ගැනත් අවංකව කථා කරමින් මේ කථාව පටන් ගන්නට ඕනෑ.

විශේෂයෙන්ම අද රටේ ප්‍රධාන පෙළේ ව්‍යාපාරිකයන්ගේ, මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන්ගේ ආකල්පයක් තිබෙනවා, පැවති පසුගිය ආණ්ඩුවලට වඩා මේ ආණ්ඩුව යටතේ ව්‍යාපාර කර ගන්න යෑමේදී කරදර අඩුයි කියලා. අපි ඒක අගය කරන්නට ඕනෑ. වෙන දා ඒ යම් යම් දේවල් වෙනුවෙන් දේශපාලනඥයන්ගේ පසුපස යන්න සිදු වෙලා තිබුණා. ඒකේ ගොඩක් වැඩි ගතියක් තිබෙන බව අපි සියලුදෙනාම නිරීක්ෂණය කළා. ඒ ගැන විවේචනයක් තිබුණා. නමුත්, ඒක දැන් මේ ආණ්ඩුව යටතේ අඩු වෙලා තිබෙනවා. ඒක අපි හොඳයි කියන්නට ඕනෑ නේ.

ඒ වාගේම, මේ දේශපාලනය ගැනත් යමක් අද මම කියන්නට ඕනෑ. අලුත් දේශපාලනයක් ගැන සංවාදයට ලක් කරන්න තරම් පසුබිමක් හැදිලා තිබෙනවාය කියන සාධනීය දියුණුවක් - development - තිබෙනවා. අලුත් අයට කථා කරන්න පුළුවන් වාගේ ගතියක් තිබෙනවා කියලා මතයක් හැදිලා තිබෙනවා. ඒක අගය කරන ගමන්ම මම මේ කාරණයත් කියන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ ආණ්ඩුවට ඡන්දය දුන්නු අයගේ ඒ අපේක්ෂා දැන් අපි මේ විධියට බොහොම විවෘතව කථා කරන අතරේ, ආණ්ඩුවේ අදූෂිතභාවය පිළිබඳ ඒ පතිවුතාව කැඩිලා තිබෙනවා. දූෂණ චෝදනා එල්ල වෙමින් පවතිනවා. එයින් සමහර දූෂණ චෝදනා සම්බන්ධ බැලූ බැල්මට සත්‍යයක් තිබෙන බව අපට නිරීක්ෂණය වෙනවා. එම නිසා මේ ගැන අපි සැලකිලිමත් විය යුතුමයි සහ ඒ ගැන අපි කථා කළ යුතුමයි.

ඒ වාගේම, මේ දේශපාලනය ගැන මම කිව්වා. අපි වාගේ අයට දේශපාලනය කරන්න තරම් පරිසරයක් හැදිලා තිබෙන නිසා ඒක අගය කරන ගමන් මම ඒ ගැනත් කිව්වා. හැබැයි, දැන් ආයෙමත් මේ දේශපාලනය, අර පරණ ඕල් දේශපාලනයට ගෙන යන බවකුත් පේනවා. විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමේ අරමුණින් ඒකපාර්ශ්වික දේශපාලනයක් සඳහා ගෙන යන්නට, විශේෂයෙන්ම විපක්ෂයේ ක්‍රියාකාරකම් පාලනය කරන්නට උත්සාහ කරන ගතියකුත් තිබෙනවා. ඒකත් මම කියන්නට ඕනෑමයි. හැබැයි, මේ අතරේ අපි මේ කාරණයත් කියන්නට ඕනෑ. අපි විපක්ෂය හැටියට පුළුවන් තරම් මේ රට ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක් ගැන සාධනීය සංවාදයක් ඇති කළ යුතුයි. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ වචනයෙන් කිව්වොත්, "අපට වැඩිය හොඳ වැඩක් තිබෙනවා නම් කියන්න." කියලා තේ එතුමා කියන්නේ. අන්න ඒ හොඳ වැඩේ කියන්නටයි අපි මේ උත්සාහ කරන්නේ. විපක්ෂයටත් මම නිතරම ආරාධනා කරන්නේ අන්න ඒ හොඳ වැඩේ ගැන කථා කරමු කියායි. පරණ වැඩේ අරගෙන ගිහිල්ලා අළෙවි කරන්න බැහැ කියලා අපටත් තේරෙනවා. එම නිසා අපි ඒ සංවාදයේ ඉන්නවා. ආණ්ඩු පක්ෂය වැඩිය කලබල වෙන්න නරකයි. අපේ බෙදීමක් නොවෙයි මේ තිබෙන්නේ. අපි අර හොඳ වැඩේට මුල පුරන ගතියකුයි මේ තිබෙන්නේ. ඒ සංවාදයයි අපි ආරම්භ කරලා තිබෙන්නේ.

දැන් අපි අය වැයට එමු. දැන් මොකක්ද මේ අය වැයෙන් සිද්ධ වුණේ? ඉස්සෙල්ලා කියන්න, අය වැය කියන්නේ මොකක්ද කියලා. අය වැය කියන්නේ, හුදු ආදායම්-වියදම් ගැන කථා කරන ප්‍රකාශනයක් නම් අපේ ජනාධිපතිතුමා පැය හතරහමාරක් කථා කරපු එක සාධාරණයි.

රුපියල් මිලියන 50ක් වියදම් කරපු එක ගැනත් විනාඩි 10ක් විතර කථා කළා. එතුමාගේ උත්සාහය අගය කරන්නට ඕනෑ, පැය හතරහමාරක් හිටගෙන හිටපු එක ගැන. හැබැයි, ඒ කථාවේ අන්තර්ගතයේ තිබුණාද අපේ ජාතියේ ප්‍රකාශනය? අපි ඉස්සරහට යන විධිය? අපි ණය ගෙවන විධියයි, ගොඩක් සල්ලි එකතු කර ගත්ත බවයි වාගේ කරුණු අතරේ, වියදම් කරන විධිය කියාගෙන කියාගෙන ගියා. හැබැයි, අපේ අල්ලපු රටේ සීතාරාමන් මැතිනියගේ අය වැය කථාව බලන්න. මම ගිය වතාවේත් ඒ ගැන කිව්වා, මේ වතාවේත් කියනවා. අන්න ඒ අය වැය කථාවේ තිබෙන දර්ශනය, ඒක ඇතුළේ තිබෙන ජාතික දර්ශනය - national philosophy - මේ අය වැයේ තිබුණේ නැහැ කියන එක මම කියන්නට ඕනෑ.

ඉතින් මෙතැනදී අපි කල්පනා කරලා බලන්නට ඕනෑ, එතුමන්ලාම කියන එතුමන්ලාට ලැබුණු වරම ගැන. එතුමන්ලාට ලැබුණු මේ අලුත් වරම අරගෙන, යකා වැහුණා වාගේ පරණ දේවල් කථා කරමින් ඉඳලා වැඩක් නැහැ. ඒවා ප්‍රතික්ෂේප කරන්න තමයි ආණ්ඩුවට වරමක් දීලා තිබෙන්නේ. එහෙම නැතුව වරම ගත්ත යක්කු වාගේ තොවිලයක් නටන්න නොවෙයි. ඒ වරමින් ප්‍රයෝජනයක් අරගෙන තිබෙනවාද? ඒ වරමින් අපේක්ෂා කළේ මොකක්ද? ඒ වරමින් අපේක්ෂා කළේ මේ රට ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක්. දැන් මේ රට ඉස්සරහට ගෙන යන වැඩ පිළිවෙළක් පෙනෙනවාද මේ අය වැය තුළ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි යන්නේ පරණ පාරේමයි; ඒ වැල් පාලමේමයි. සාර්ව ආර්ථික දත්ත අරගෙන, අපි අද අපේ fiscal position එක ස්ථාවර කරගෙන තිබෙනවා කියන්නේ මොකක්ද? අපි අර පරණ විධියටම ගණන් ටික හදලා දැන් ඉදිරිපත් කරනවා. ඒ, කාගේ සතුට සඳහාද? අර IMF එළදෙන දැන් සතුටු වෙලා ඉන්නවා. මොකද, මේ පැත්තෙන් අපි කවනවා. අපේ වත්තේ තිබෙන තණ කොළ ටිකත් කවනවා, වත්තේ තිබෙන පලතුරු ටිකත් කවනවා, වත්තේ තිබෙන අඹ ගෙඩි ටිකත් කවනවා, වත්තේ තිබෙන සියලු දේවල් කවනවා. ඒ

එළදෙන කනවා. ඒ එළදෙන හොඳට පෘෂ්ඨීමත්ව ඉඳගෙන, අනෙක් පැත්තට කිරි බුරුල්ල දාලා තිබෙනවා. එහෙන් කිරි ටික දොවනවා. එතකොට මොකක්ද වෙන්නේ? අපේ වත්තේ ඉන්න අපේ මිනිහා කෘශ වෙලා, නැති වෙලා, හිඟන්නෙක් වෙලා අන්තිම දුප්පත්භාවයට පත් වෙමින් ඉන්නවා.

දැන් බලන්න, මේ කියන සාර්ව ආර්ථික දත්තද අපේ microeconomic reality එක වෙලා තිබෙන්නේ කියලා? අද ඒ දත්ත දිහා බලන්න. දුප්පත්කම තුන් ගුණයකින් වැඩි වෙලා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. දුප්පත්කම තුන් ගුණයකින් වැඩි වෙලා නම්, විරැකියාව දෙගුණයකින් වැඩි වෙලා නම්, දුප්පත් මිනිහාගේ පඩිය ගැන මොකද හිතෙන්නේ? ඔබතුමියත්, මමත් දන්නවා, පඩිය වැඩි වුණේ නැහැ කියලා. පඩිය වැඩි වුණාය කියලා ඉලක්කම් දුන්නාට, ඒකත් අර යටින් බදු ගහලා දීපු නිසා ඔවුන්ගේ ක්‍රය ශක්තිය වැඩි වුණේ නැහැ. පඩිය වැඩි වුණා නම්, බඩු වැඩියෙන් ගන්න පුළුවන් වෙන්න එපා යැ. ඒ අයගේ ජීවිතයේ දියුණුවක් තිබෙන්න එපා යැ. ඉලක්කමක් ගැහුවාට වැඩක් නැහැ නේ. ඉතින් ඒ කිරි එළදෙනට අපි කන්න දීලා, කන්න දීලා පෘෂ්ඨීමත් කරනවා. ඒ කිරි එළදෙන කිරි ටික පිටට දෙනවා. අපේ මිනිහා අන්තිම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ඔබතුමන්ලා බලයට එනකොට කිව්වේ, සෞඛ්‍ය උපකරණවලට, පාසල් උපකරණවලට පනවා තිබෙන වැට් එක ඉවත් කරනවා කියලා. හැබැයි, දැන් IMF එකට භය වෙලා, ඒක වෙනස් කරන්නේ නැතුව ඒකට ගුණ්ඩු දමනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද කිරි පිටිවලටත් බදු ගහනවා නේ. කිරි පිටිවලටත් බදු ගහලා ඒ බදු ටික අරගෙන, අපේ මිනිහාගේ රීරි මාංසය හූරා කාලා කිරි ටික එහේට දුන්නාම කොහොමද අපේ මිනිහා මේකෙන් ගොඩ එන්නේ? ට්‍රිලියනයක් එකතු කරගෙන ප්‍රාථමික ගිණුම් ශේෂය වැඩි කළා කියලා පාරම් බාන අපේ නිර්ධන පාන්තික, සමාජවාදී, මාක්ස්වාදී, ලෙනින්වාදී, ට්‍රොට්ස්කිවාදී අපේ සියලු මිත්‍රයෝ අද ගමට ගිහිල්ලා ඒ අයගේ කාඩර්වරුන්ට මොනවාද කියන්නේ කියලා මම දන්නේ නැහැ. මට තේරෙන්නේ නැහැ ඒ කියන කථාව මොකක්ද කියලා. මොනවා කිව්වත්, ඒ කථාවේ මොනවා තිබුණත්, ඇත්ත කථාව තමයි ඒ ට්‍රිලියනය හොයා ගත්තේ තරුණයන්ගේ සිහින මත බදු ගහලා. තරුණයන්ට අපේක්ෂාවක් තිබුණා, පොඩි කාර් එකක් ගන්න. තරුණයන්ට අපේක්ෂාවක් තිබුණා, තමන්ට කියලා ගෙයක් හදා ගන්න.

තරුණයන්ට අපේක්ෂාවක් තිබුණා, ඩිජිටල් තාක්ෂණය භාවිත කරලා කීයක් හරි සොයාගන්න. ඒ ඔක්කොටම බදු ගහලා තමයි ඔය ට්‍රිලියනය සොයලා බැංකුවේ දමාගෙන පාරම් බාන්නේ, නිර්ධන පාන්තිකයා යැයි කියාගෙන ආපු මේ NPP ආණ්ඩුව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම දැක්කා පුවත් පත්වල තිබෙනවා, finance and leasing companiesවලින් රුපියල් බිලියන 1,160ක් ණය දීලා තිබෙනවාලු, වාහන ගෙනෙන්න. දැන් වාහන ගෙනැල්ලා තිබෙනවා. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත් වාහන හම්බ වුණාද, පොඩි මිනිහාට? මේ බදු ගහලා, බදු ගහලා ගත්ත ධනය නිර්මාණය වීම යට තිබුණු යථාර්ථය ඒක නොවෙයිද? හැබැයි, ඔබතුමන්ලාගෙන් ඒකද බලාපොරොත්තු වුණේ? ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම නැවත නැවතත් කියනවා, IMF එක දෙයියා කියලා හිතාගෙන, ඒක එකම විසඳුම කියලා සලකමින් නොදැනුවත්කමට කටයුතු කරනවා නම් අපට පුළුවන් ඒක විසඳා ගන්නට. මොකද, අපි මිත්‍රයෝ. මෙතැන තිබෙන්නේ හුදු නොදැනුවත්කමක් හෝ මේ විෂය පිළිබඳ අනවබෝධය නම් ඒක විසඳන්නට පුළුවන්. හැබැයි, මේක තක්කඩිකම නම්, ඒක අපට විසඳන්නට බැහැ. තමුන්ට ඡන්දය දුන්න ගමේ මිනිහා නැති භංගස්ථාන කරන්න මේ කියන වැල් පාලමේ අප ගෙනියන්න හදනවා නම්, අපට ඒකට කරන්න දෙයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට කියන්නට තිබෙන්නේ IMF එක ඉස්සරහා අන්ධ භක්තිකයන් ලෙස හැසිරෙන්න එපා කියලායි. බටහිරින් එන හැම දෙයක් දෙසම අන්ධ භක්තික ලෙස බලා හැසිරෙන්න එපා. අපි හොඳ ස්වදේශික ඥානයක් සහිත, ආත්ම ධෛර්යයක් සහිත මිනිස්සු. මේ ශ්‍රී ලාංකිකයෝ මොන තරම් හැපිලා තිබෙනවාද ඔය කියන විශාල බලවේග එක්ක දීර්ඝ කාලයක් තිස්සේ? ඉතින්, අපේ ඒ විභවයන් නිකම්ම අත්හැර දාලා, අමතක කර දාලා, ඔළුව නවාගෙන යටත් වෙන්න සූදානම් වෙන්න එපා කියලායි මට කියන්නට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට දුක, අපි ඔක්කොම නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන මෙතැනට ආපු අය නිසායි. එක් කෙනෙක්, දෙදෙනෙක් හැරෙන්නට බොහෝ දෙනා එහෙමයි. ඉතින්, අපට වගකීමක් තිබෙනවා. පෞද්ගලිකව මම වාමාංශික දේශපාලනය ගැන අදටත් විශාල විශ්වාසයක් තිබෙන, සමාජ සාධාරණත්වය ගැන විශ්වාසයක් තිබෙන පුද්ගලයෙක්. ධනය බෙදී යෑම පිළිබඳ විශ්වාසයක් තිබෙන පුද්ගලයෙක්. අපි නියෝජනය කරන්නේ මේ රටේ අවංක නිර්ධන පාන්තිකයන්. මමත් එන්නේ එවැනි සමාජ පසුබිමකින්. අපි සියලුදෙනාම විශ්වාස කරන දර්ශනය ඒක.

හැබැයි, අද ඒකද වෙන්නේ? අද වෙන්නේ සම්පූර්ණයෙන්ම ඒකේ අනික් පැත්ත. බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගිය වර අය වැයෙන් වෙන් කර තිබුණු ප්‍රාග්ධන ගිණුමෙන් සියයට 20ක් වියදම් කළේ නැහැ කියන්නේ මොකක්ද? මොකක්ද, මේ රටට වෙලා තිබෙන්නේ? මේ රටට වෙලා තිබෙන්නේ, අපි ඉස්සරහට යන්නේ නැහැ කියන එක. ඒක මේ රටේ මහජනතාවට තේරුම් කර දෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ප්‍රාග්ධන මුදල වැය කළේ නැහැ කියන්නේ, අපි රට එතැනම නවත්වා තිබෙනවා කියන එක. රට එතැනම නවත්වා තිබෙනවා විතරක් නොවෙයි, අපි නුදුරු අනාගතයේම බරපතළ අභියෝගවලට මුහුණ දෙනවා. ප්‍රාග්ධන ගිණුමේ වියදමකින් පමණයි රටක් ඉස්සරහට යන්නේ, සංවර්ධනය වන්නේ, දියුණු වන්නේ. පාරක් හදන්න ගියත් හැම අවුරුද්දකම අපට සියයට 15ක්, 20ක් වැඩියෙන් ගෙවන්න වෙනවා. දැන් මේවා ඔක්කොම කල් දමලා, සල්ලි ඔක්කොම එකතු කරගෙන බැංකුවේ දමාගෙන සුද්දන්ට විතරක් පාරම් බාලා හරියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඉතින්, අපි ඒ ගැන කථා කරන්න ඕනෑ. කොච්චර කථා කළත් වැඩක් නැහැ, මේවාට විසඳුමකුත් තිබෙන්නට ඕනෑ. එවැනි විසඳුමක් ගැන කථා කරන්නට ඕනෑ. එහෙම නැත්නම් කියයි හැම දාම කෑගහලා යනවා කියලා.

හැබැයි, විසඳුම මොකක්ද? බලන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපේ බාහිර ශේෂ පත්‍රය - external balance sheet - දෙස. ඒ ශේෂ පත්‍රයේ පෙන්වන්නේ මොකක්ද? Net International Investment Position - NIIP - කියලා column එකක් තිබෙනවා. NIIP එකේ අද තිබෙන්නේ බිලියන 50 ඉක්මවපු negative position එකක්. අපි මේවා පිළිගන්නට ඕනෑ. මේ negative position එකේ ගැටලුව විසඳා ගත්තේ නැත්නම් අපි ඉතාම අමාරුවක වැටෙනවා. ඉතින්, ඒක කරන්න නම් මොකක්ද කරන්න ඕනෑ? දැන් අපේ ජනාධිපතිතුමාගේ -මුදල් ඇමතිතුමාගේ - කථාවේ තිබුණාද අපි කොහොමද ධනය වර්ධනය කරගන්නේ කියලා? අහිංසක මිනිස්සුන්ට බදු ගහන ආකාරය නොවෙයි, අහිංසක මිනිස්සු රවටන ආකාරයත් නොවෙයි.

ඒ මිනිස්සුන්ටම බදු ගහලා, ඒ මිනිස්සුන්ට - අපේ වතු ශ්‍රමිකයන්ට - රුපියල් 200ක් දෙන වංචා සහගත ක්‍රමය නොවෙයි. අවංකව ධනයක් උපයලා, ඒ ධනය මේ රටේ සාධාරණව බෙදී යන්නේ කොහොමද කියන එක මේ අය වැය ලේඛනයේ තිබුණාද? තිබුණා නම් ඒ කොහේද?

[ගරු දිලිත් ජයවීර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා අපි යෝජනා කරන්නේ මේකයි. තෝරා ගත් ක්ෂේත්‍ර තුළ, තෝරා ගත් උපායමාර්ගික ක්ෂේත්‍ර කිහිපයක් තුළ රට ඉදිරියට ගෙන යෑමට අවශ්‍ය වන මූලෝපායික වෙනස්කම් කරන්නේ නැතිව, ඒ තුළින් අපි මේ රට ඉස්සරහට ගෙනියන ආකාරය පිළිබඳ ජනතාව අතර සංවාදයට ලක් කරලා, ජනතාවත් ඒකට බද්ධ කරගෙන, ජනතාවත් එක්ක ගමනක් ගියේ නැත්නම් මේ රට ඉස්සරහට යන්නේ නැහැ.

ඒ වාගේම අපි තෝරා ගන්නා ඒ ක්ෂේත්‍ර බලන්න. කෘෂිකර්මය ගැන කථා කළොත්, සංචාරක ව්‍යාපාරය ගැන කථා කළොත්, ඇඟලුම් ව්‍යාපාරය ඇතුළු වෙනත් එවැනි ව්‍යාපාර බොහොමයක් ආනයන මත යැපෙනවා, අවසාන product එක -භාණ්ඩ- එළියට ගන්නට. මේවා ගැන කථා කරන්නේ නැතිව අපි කොහොමද ඉස්සරහට යන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි කථා කරන්නේ නැහැ, අපේ භූ සම්පත් ගැන. අපේ භූ සම්පත් කොහොමද අවම ආනයනික බැඳියාවකින් යුතුව, යැපීමකින් තොරව, උපයෝගී කරගන්නේ? ඒවා බිලියන ගණන් හොයන්න පුළුවන් ක්ෂේත්‍ර. එතකොට අපේ ධීවර කර්මාන්තය ගත්තොත්, ආනයන යෙදවුම්වලින් තොරව ඒ හරහා අපට කොච්චර උපයන්න පුළුවන්ද? ඒ වාගේමයි අපේ තොරතුරු තාක්ෂණය. ඒක තමයි අපේ තාරුණ්‍යයේ අපේක්ෂාව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ ජනගහනයෙන් සියයට 50ක් Gen Z එකේ සහ Gen Alpha එකේ අය. එතකොට ඒගොල්ලන්ට මේ අවස්ථාව ලබා නොදී අපි කොහොමද රට ඉස්සරහට යනවා කියලා හිතන්නේ? එහෙම හිතන්න විධියක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපේ Net International Investment Position එක විසඳා ගන්නට අඩුම ගණනේ Foreign Direct Investment බිලියන 3ක්, 4ක් අවුරුද්දකට ලැබුණේ නැත්නම් අපි මහ විනාශයකට වැටෙනවා. මම ඒක වගකීමෙන් කියන්නේ. එතැනට එන්න නම් මේ හිඟන මානසිකත්වයෙන් එළියට එන්න ඕනෑ. අපි ලෝකය දෙස විවෘතව බලලා, උපායමාර්ගිකව කල්පනා කරලා, ඒ ඒ ක්ෂේත්‍රවලට අදාළ ආයෝජකයන්ට ලංකාවට එන්න අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම සඳහා කටයුතු කරන්නට ඕනෑ. අපේ රට මත්ද්‍රව්‍යවලින් පිරිලා. අපේ රටේ ඉන්නේ පට්ටපල් දූෂිතයෝ, හොරු, මේකේ ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ, දේශපාලන සංස්කෘතියේ ගන්න දෙයක් නැහැ, මේ සියල්ල විනාශයි, විනාශයි කියලා ලෝකයට කියමින් අපි කොහොමද ආරාධනා කරන්නේ මේ ලෝකයේ ඉන්න විශාල ආයෝජකයන්ට?එහෙම කිව්වාම විශාල ආයෝජකයන් එයිද? විශාල ආයෝජකයන්ට එන්න අවශ්‍ය පරිසරය හදන්න ඕනෑ. ඒ වාගේම ඔබ අපි හැම දාම කථා කරන "තනි කවුළු" යාන්ත්‍රණයක් හරහා ඒගොල්ලන් ආපු ගමන් වැඩ පටන් අරගෙන කරගෙන යන්න පුළුවන් අවස්ථාව ලබා දෙන්නට ඕනෑ. ඒකට මහන්සි වෙලා අපි වැඩකටයුතු කරන්න ඕනෑ. අපි එකතු වෙලා කටයුතු කරන්නත් ඕනෑ. ඒවා ඔක්කොම ඇත්ත.

හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රජය පළමුව වරද්දා ගන්නේ ඔවුන්ට දුන් ජන වරම හා ජන වරම පිටුපස තිබෙන ජනතා අභිලාෂ අනුව. ඒ වාගේම මේවා බොරුවෙන් කරගෙන යන්නට බැහැ කියලා තේරුම් ගන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේක කලින් උත්සාහ කරපු - tried-and-tested - formula එකක්. බොරුව, වංචාව, නාට්‍ය රඟ දැක්වීම්වලින් මේක ඉස්සරහට යන්නේ නැහැ. ඒ නිසා ඇත්ත කථා කරලා ඇත්තට මුහුණ දෙන්න. එතකොට මේ රටේ බුද්ධිමත් ජනතාව ඔබට ඇහුම්කන් දේවි. අපි ඇත්ත කතා කරමු. ඇත්ත කථා කරලා අපි ඉස්සරහට යන විධිය කථා කරමු.

ඒ වාගේම මේ රටේ දුගී දුප්පත් ජනතාව බාල විධියට රවට්ටන එක නවත්වන්නට ඕනෑ. ඒ මිනිස්සු හරිම පව්. ඇයි? ඒ මිනිස්සු මහත් බලාපොරොත්තු ඇතිව හැම දාම උදේට බලනවා මොකක් හරි වෙයිද කියලා. දැන් බැලුවා Budget එකෙන් ගොඩ යයිද කියලා. ඒ මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ, ඒ මිනිස්සුන්ට ඇත්තටම වෙච්ච දේ. අපි පැහැදිලි කරලා දෙන්නට ඕනෑ, ඔබ ගිහිල්ලා තිබෙන්නේ අන්තිම අවාසනාවන්ත මාර්ගයක කියන එක. ඒ නිසා නැවතත් කියනවා, ජනාධිපතිතුමා යෝජනා කරන මීට වඩා හොඳ වැඩක් කරන්නට. මීට වඩා හොඳ වැඩක් කියන්නේ මේ කරගෙන යන වැඩේ නොවෙයි. ඒ තමයි මේ රට ඉස්සරහට යන වැඩේ. මීට වඩා හොඳ වැඩක් කරනවා කියලා, අර කැබ් රථ 159ක් ගන්න ඕනෑ නිසා රටටම වරදින යෝජනාවක් ගෙනාවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇමතිතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, කරුණාකර ඔය වැඩේ නම් කරන්න එපා කියලා. ඕක ලංකාවේ සිදු වන විශාලතම දූෂණයක්. ඕක දූෂිතයි; සම්පූර්ණයෙන්ම දූෂිතයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
පැමිණිල්ලක් කරන්න.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
පැමිණිල්ල තමයි මේ කරන්නේ. ජනතා පැමිණිල්ල තමයි මේ කරන්නේ. උත්තරීතර පාර්ලිමේන්තුවේදී ජනතා පැමිණිල්ල තමයි මේ කරන්නේ. මේක තමයි දූෂිතම ගනුදෙනුව. මේක දූෂිතම ගනුදෙනුව විතරක් නොවෙයි, කුමන්ත්‍රණකාරීම ගනුදෙනුව. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විපක්ෂයෙනුත් ඉල්ලා සිටිනවා, මේ ලණුව නම් කන්න එපා කියලා. මේ දූෂණයට කර ගැහුවොත් මිනිස්සු අපටත් හෙණ ඉල්ලයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම කියන්නට ඕනෑ, මේ රටේ ව්‍යවසායකත්ව මනසකින් යුත් රාජ්‍යයක් බිහි කර ගැනීම සඳහා නිර්මාණශීලී සහ අවංක ආණ්ඩුවක් තිබිය යුතු බව. එවැනි ආණ්ඩුවක් තිබුණොත් විතරයි මේ රට ඉස්සරහට යන්නේ. ජනතාව බලාපොරොත්තු තැබුවත් අවසානයේ හැම වැඩකින්ම ආණ්ඩුව දැන් හොඳමට fail බව පැහැදිලියි කියන එක සඳහන් කරමින්, මා නිහඬ වෙනවා.

ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.21]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද, 2026 අය වැය දෙවනවර කියවීමේ විවාදයේ හතරවන දවස. සාමාන්‍යයෙන් මේ වෙද්දි අය වැය ගැන, අය වැයෙහි ආදායම් ඉපැයීම සහ සමහර වියදම් සම්බන්ධයෙන් කර තිබෙන

යෝජනා ගැන, අය වැයේ අලුත් යෝජනා ගැන බොහොම බරපතළ සාකච්ඡා ඉදිරිපත් වනවා. හැම අය වැයකදීම ආණ්ඩුවක් ඉදිරිපත් කරනවා, අලුත් ප්‍රතිපත්ති සහ අලුත් යෝජනා. ඒවා ගැන සාකච්ඡාවක් ඇති විය යුතුයි. හැබැයි, මෙම අය වැයේ විශේෂත්වය තමයි, එවැනි සාකච්ඡාවක් ඇති නොවීම. ගිය වර අය වැය ගත්තාම බොරුවට හෝ එහෙම සාකච්ඡාවක් ආවා නේ. මතක් කරලා බලන්න කෝ. අපි බලයට ඇවිල්ලා මාස කිහිපයකට පසුව, එනම් පෙබරවාරි මාසයේදී අය වැය ඉදිරිපත් කළාට පසුව, මාර්තු මාසයට වඩා අප්‍රේල් මාසයේ පඩි අඩු වෙනවා කියලා හරි විපක්ෂය මෙතැනදී තර්ක කළා; බොරුවට හරි එහෙම තර්ක කළා. නමුත් පඩි අඩු වුණේ නැහැ, බර ගණනකින් වැඩි වුණා. හැබැයි, එදා එහෙම හරි තර්ක කළා. මේ පාර විශේෂත්වය තමයි, විපක්ෂය පළමු වතාවට එහෙමවත් තර්ක නොකිරීම. ඒ වෙනුවට වෙනත් එක එක ඒවා කියනවා. එක්කෙනෙක් ඇවිල්ලා පනත් ගැන කියනවා. තව එක්කෙනෙක් ඇවිල්ලා තව කොහේ හරි වෙච්ච ප්‍රශ්නයක් ගැන කියනවා. ඒ කියන්නේ, අය වැය ගැන හැර අනෙක් සියලු දේවල් ගැන කථා කරනවා. අය වැය ගැන කථා කරන කොට අර වාගේ අසත්‍ය ප්‍රකාශත් කරනවා. අය වැය ගැන කවුරු හෝ කථා කළොත් අර වාගේ අසත්‍ය කියන එක තමයි මේ දක්වා සිදු වුණේ.

සාමාන්‍යයෙන් අය වැය දෙවන වර කියවීමේ විවාදයේ තුන්වන, හතරවන දවස වනකොට ආණ්ඩු පක්ෂයේ කථිකයන් විධියට උත්තර දෙන්න අපට කරුණු කාරණා කිහිපයක් විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් වෙලා තිබෙන්න ඕනෑ. නමුත්, එහෙම කරුණු කාරණා නැති තත්ත්වයක් ඇතුළේ නිශ්චිත කරුණු දෙකක් සහ සමහර අය කියපු අසත්‍ය සම්බන්ධයෙන් මගේ කථාවේදී අවධානය යොමු කරන්න මා බලාපොරොත්තු වෙනවා.

අය වැයක් කියන්නේ මොකක්ද කියලා බැලුවොත්, අය වැයක් ඇතුළේ තිබෙන්නේ account balance එකක් විතරක් නොවෙයි. ආදායම් සහ වියදම් පිළිබඳ balance එකක් විතරක් නොවෙයි. අය වැය කියන එක ඇතුළේ රටක ඉදිරි වසර සඳහා ආණ්ඩුවක් දිශාගත වෙන්නේ කොහොමද, වැඩ කරන්නේ මොන ආකාරයෙන්ද, ප්‍රමුඛතාව දෙන්නේ මොන මොන ක්ෂේත්‍රවලටද කියලා සඳහන් වෙනවා. ආණ්ඩුවේ දේශපාලන, ආර්ථික දිශාව තමයි අය වැයකින් සාමාන්‍යයෙන් සංකේතවත් වෙන්නේ. අපි හිතනවා, අපේ මේ අය වැය තුළත් ඒ ආකාරයෙන්ම අප මොන පැත්තටද යන්නේ, කොහොමද වැඩ කරන්නේ කියන එක සම්බන්ධයෙන් හරියට දිශාගත වීමක්, මඟ පෙන්වීමක් සිදු වෙලා තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟ අවුරුද්ද අපි කවුරු වෙනුවෙන්ද වැඩ කරන්නේ, කවුරු වෙනුවෙන්ද ප්‍රමුඛතාව දෙන්නේ, මොන පැත්තටද ආර්ථිකය අරගෙන යන්නේ කියන කාරණා ගැන මේ විවාදයේදී කථා කරනවා. හැබැයි, ලොකු විවේචන නැති වුණාට මට කලින් කථා කළ දිලිත් ජයවීර මන්ත්‍රීතුමා වාගේම සමහර මන්ත්‍රීවරු අසත්‍ය ප්‍රකාශ කළා; බොරු විවේචන ඉදිරිපත් කළා. උදාහරණයක් හැටියට මම කරුණු දෙකක් කියන්නම්. අපේ ආණ්ඩුව ගැන කථා කරමින් ඇවිල්ලා, දුප්පත්කම දැන් තුන්ගුණයකින් වැඩි වෙලා තිබෙනවා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දුප්පත්කම තුන්ගුණයකින් වැඩි වෙච්ච ඉලක්කම ගත්තොත්, ලංකාවේ දුප්පත්කම ගැන පසුගිය අවුරුදු කිහිපයම කථා කළේ 2019 අවුරුද්දට සාපේක්ෂව. මොකද, 2019 අවුරුද්දේ එය සියයට 14.3යි කියලා සඳහන් කළා. 2023 වනකොට එය සියයට 25ක් වෙලා තිබුණා. දැන් එය සියයට 22ක් වෙලා තිබෙනවා. එතකොට තුන්ගුණයකින් නොවෙයි, දෙගුණයකට වඩා වැඩි ගණනකින් 2022, 2023 වෙද්දී දුප්පත්කම වැඩි වුණා. දැන් එය අඩු වෙමින් තිබෙන්නේ. එතකොට 2019 සියයට 14.3කට තිබුණු දුප්පත්කම 2023 වෙද්දී සියයට 25ක් වුණේ කොහොමද කියලා අමතක කරන්නත් හොඳ නැහැ. 2019න් පසුව මොකක්ද ලංකාවේ වුණේ? 2019න් පසුව මොකක්ද ලංකාවේ වුණු දේශපාලන වෙනස? 2019න් පසුව තමයි මේ මන්ත්‍රීතුමන්ලා උදවු කළ පක්ෂය බලයට ආවේ. මෙතුමා අර ටීවී එක ඉස්සරහට ගිහිල්ලා කුරුල්ලෙකු අත්තටු විහිදනවා වාගේ අත් දෙක දිග හැරලා ෆොටෝ එකක් දාලා ඡන්ද ප්‍රතිඵල ඉදිරිපත් කළා මතකද? ඊට පසුව ආපු ආණ්ඩුවේ වසර තුනකට පසුව තමයි දුප්පත්කම සියයට 25 වුණේ. හරිද? දුප්පත්කම සියයට 25ක් වුණේ එතකොට. දැන් තමයි එම තත්ත්වය අමාරුවෙන් අඩු කරමින්, අඩු කරමින් යන්නේ. එම නිසා කථා කරද්දී ඒ ඉලක්කම් හරියට කියන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
Hon. Deputy Chairperson of Committees, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
එතුමා මගේ නම කියපු නිසා මම මේක කියන්නේ. ගරු තරුණ මන්ත්‍රීතුමනි, කාරණය මේකයි. 2019 ඉඳලා අපි උත්සාහයක් ගත්තා. හැබැයි ඔබතුමන්ලා උත්සාහ ගන්නේ නැහැ. ඔබතුමන්ලා ඒ වැල් පාලමේම යනවා. ඒකයි ප්‍රශ්නය. අන්න ඒකයි ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන්නේ.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඇත්තටම එතුමන්ලා උත්සාහ ගත්තා. අපිත් හිතනවා එතුමන්ලා උත්සාහ ගත්තා කියලා. හැබැයි ඒ උත්සාහයේ ප්‍රතිඵලය මොකක්ද? ඒ උත්සාහයේ ප්‍රතිඵලය, සියයට 14ට තිබුණු දුප්පත්කම සියයට 25 දක්වා ඉහළ ගිය එක, රට බංකොලොත් වෙච්ච එක, ලංකාව ළමා මන්දපෝෂයෙන් ආසියාවේ දෙවෙනි තැනට ආපු එක.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
සෑහෙන්න උත්සාහයක් අරගෙන තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඉතින් මේ වාගේ දේවල් එච්චර උත්සාහ කරලා කරන්න ඕනෑ දේවල් කියලා අපි නම් දන්නේ නැහැ. සාමාන්‍යයෙන් මේ වාගේ දේවල් නොකර ඉන්න තමයි උත්සාහ කරන්න ඕනෑ. නමුත් අපි උත්සාහ කරනවා එතුමන්ලා මේ රට ගෙනාපු තැන ඉඳන් ටික ටික ඉස්සරහට අරගෙන යන්න. ඒක කරන්නේ කොහොමද කියලා බලලා පසුගිය අවුරුද්ද තුළ අප දැරූ උත්සාහයේ සාර්ථකත්වයක් තිබෙනවා. මගේ කථාව අතරතුර මම ඒ ගැන කියන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනෙක් කාරණය මේකයි. ප්‍රාග්ධන වියදම්වලින් සියයට 20ක් ඉතුරු වෙනවා වාගේ කථාවක් විපක්ෂය කිව්වා. සාමාන්‍යයෙන් හැම අවුරුද්දේම වසර අවසානයේ ප්‍රාග්ධන වියදම්වලින් වියදම් කළ ප්‍රතිශතයක් තිබෙනවා. සාමාන්‍යයෙන් ලංකාවේ එම සංඛ්‍යාවෙහි මධ්‍යන්‍ය

[ගරු (වෛද්‍ය) නලින් ඉන්දික මහතා]

අගය සියයට 60ට වඩා මඳක් වැඩි හෝ එවැනි මට්ටමක තමයි තිබිලා තියෙන්නේ. අප අපේ පළමු අය වැය මාර්තු මාසයේ ඉදිරිපත් කළා වුණත්, එහෙම තත්ත්වයකදී වුණත් දැනට තිබෙන සංඛ්‍යා ලේඛන සහ මුදල් අමාත්‍යාංශයේ වාර්තා අනුව අපි බලාපොරොත්තු වෙනවා, මේ දෙසැම්බර් මාසය අවසාන වන විට ඒ අගය සියයට 70කට ආසන්න මට්ටමකට ගෙන එන්න අපට පුළුවන් වෙයි කියලා. අපේ පළමු අය වැය ගෙනාපු මේ වසරේ මාර්තු මාසයෙන් පසුව ගත වුණු කාලය ගත්තාම, ඒක ලොකු සාර්ථකත්වයක්. ඒ නිසා අප ඒ මුදල් වියදම් කිරීම සම්බන්ධයෙන් කිසි හයක් තබා ගත යුතු නැහැ. ඒක හරි විධියට, හරි ආකාරයට සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරද්දී ප්‍රකාශ කළා අපේ මේ අය වැයේ අරමුණ මොකක්ද කියලා. මේ අවුරුද්දේ මාර්තු මාසයේ අපේ ආණ්ඩුවේ පළමු අය වැය ගෙනාවා. ඊට මාස කිහිපයකට පසුව - දැන් - අපේ ආණ්ඩුවේ දෙවෙනි අය වැය ගෙනෙන්න අපට සිදු වෙලා තිබෙනවා. අප ගෙනාපු පළමුවෙනි අය වැයේ අරමුණ වුණේම ඒ වෙලාවේ මේ රටේ තිබුණු අසීරුතාව, ඒ අමාරුකම් අවම කිරීම සඳහා අමාරුකම් මැද හිටපු ජනතාවට යම් සහන ප්‍රමාණයක් වැඩිපුර දීමයි. ඒත් එක්කම, පළමුවෙනි මොහොතේම ඒ ජනතාවගේ ආර්ථිකය නඟා සිටුවීමයි. රනිල් වික්‍රමසිංහ කිව්වා වාගේ 2048දී රට හදන කල් පටි තද කරගෙන ඉන්න කියන තැනක අපි හිටියේ නැහැ. රට හැදිය යුතුයි, ආර්ථිකය හැදිය යුතුයි, හැබැයි මිනිස්සුත් ජීවත්වෙලා සිටිය යුතුයි. මොකද, මේ ගොල්ලන්ගේ පව්වලට, එහෙම නැත්නම් මේ රට පාලනය කළ අයගේ පව්වලට මේ රටේ මිනිස්සු වන්දි ගෙවන්න ඕනෑ නැහැ; මේ රටේ දරුවෝ මන්දපෝෂණයෙන් වන්දි ගෙවන්න ඕනෑ නැහැ. ඒ නිසා හැකි ආකාරයෙන් ඒ සඳහා ප්‍රමුඛතාව දීමක් තමයි අපේ පළමුවෙනි අය වැයෙන් කළේ, ආර්ථික ස්ථායීකරණයට අදාළ මූලික ක්‍රියාමාර්ග ගැනීමට අමතරව. ඒ ප්‍රතිපත්තියට අනුව තමයි රාජ්‍ය සේවයට ඉතිහාසයේ වැඩිම වැටුප් වැඩි කිරීම සිදු වුණේ, සියයට 40කින්. ඒ අනුව තමයි පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම සිදු වුණේ. ඒ අනුව තමයි පාසල් දරුවන්ගේ ආහාර වේලේ සිට අනෙකුත් සියලු දේවලට මුදල් වෙන් වුණේ. ආබාධිත දීමනා, වැඩිහිටි දීමනා, අස්වැසුම ප්‍රතිලාභ වැඩි කිරීම ආදි සියලු සුබසාධන ක්‍රියාවලි සිද්ධ වුණේ.

එතැනින් පස්සේ ඉදිරිපත් කරපු මේ අය වැය අපි සංවර්ධන අය වැයක් විධියට හඳුන්වනවා. මොකද, පසුගිය දවස් කිහිපයේම කථා වුණු විධියට මේ රටේ ආර්ථික ස්ථායීකරණය යම් ආකාරයකට ගොඩ නඟපු තත්ත්වයක් තුළ දැන් අපි විශ්වාස කරනවා මේ රට මෙච්චර කල් ළඟා කර ගන්න බැරි වුණු ආර්ථික වර්ධනීය දිශාවට, එහෙම නැත්නම් සංවර්ධනයේ දිශාවට ගෙන යන්න ඕනෑ, ඉදිරියට ගෙන යන්න ඕනෑ කියලා. ඒ අනුව තමයි මේ අය වැයෙහි මූලික උපායමාර්ගික අරමුණු විධියට ගරු ජනාධිපතිතුමා කාරණා 6ක් ඉදිරිපත් කරන්නේ. ඒවා අතර තිබෙනවා, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, ණය තිරසරභාවය සහතික කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම සහ ඩිජිටල්කරණය ප්‍රවර්ධනය. ඩිජිටල්කරණය, අපනයන සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය වාගේ තැන්වලින් ආර්ථිකය ඉහළට ගන්නා ගමන්ම, අනෙක් පැත්තෙන්, දිළිඳුකම තුරන් කිරීම, සැමට ප්‍රතිලාභ ලැබෙන ආර්ථිකයක් ගොඩ නැඟීම වාගේ සමාජීයකරණය වෙච්ච, ජනතාව බද්ධ කර ගත්තු සංවර්ධනයක් බවට පත් කරන ගමන්ම කළ යුතු ප්‍රධානම දෙයක් තමයි ලංකාවේ ණය තිරසරභාවය ඇති කිරීම. මේක තමයි ආණ්ඩුවක් විධියට අප මේ වෙලාවේ ආර්ථිකමය වශයෙන් ගත්තු ලොකුම පිම්ම, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඔබතුමන්ලා මතක් කරලා බලන්න ණය තිරසරභාවය, ආර්ථික වර්ධනය වාගේ මාතෘකාවලදී මේ ආණ්ඩුව ගැන ඔබතුමන්ලා බොහෝදෙනා කිව්වේ මොනවාද කියලා. ඡන්දයට කලින් කිව්වේ මේ ආණ්ඩුව ආවොත්, අනෙක් අය අකුළාගෙන යනවා කියලායි. ව්‍යාපාර අකුළාගෙන යනවා, අපේ ව්‍යාපාර වැටෙනවා, ජාත්‍යන්තරයත් එක්ක ගනුදෙනු කරන්න බැහැ කියලායි. ඔබතුමන්ලා ඔක්කොම වාගේ එහෙම තමයි කිව්වේ. හැබැයි මේ ගත වුණු කාලය තුළ අපි පෙන්වා තිබෙනවා මේ රටේ ආර්ථිකයට පසුගිය දශක කිහිපයේ පාලනය කළ කිහිපදෙනාට කරන්න බැරි වුණු දේ අප කර තිබෙන බව. ඒ කාලයේ මේ රටේ ණය අර්බුදයක් තිබුණා. මේ රටේ හැම ආණ්ඩුවක්ම ණය ගන්නවා. ඕනෑම රටක හැම අය වැයකම ණය තිබෙනවා. හැබැයි, ණය අර්බුදයක් කියන එක, ණය උගුලක හිරවීම කියන එක වෙනත් දෙයක්. මෙතෙක් කල් අපි එහෙම ණය උගුලක හිර වෙලා හිටියේ. අපි හිටියේ විෂම චක්‍රයකනේ. ගරු ජනාධිපතිතුමාගේ කථාවේදීත් එතුමා එය පෙන්වා දුන්නා. අප හිටියේ ණය සම්බන්ධයෙන් විෂම චක්‍රයක.

ඒ කියන්නේ අපි මේ අය වැයෙන් ගන්න ණය ප්‍රමාණය වැඩි කරනවා. එතකොට ලබන අවුරුද්දේ ගෙවන්න තිබෙන පොලී වාරික ප්‍රමාණය වැඩි වෙනවා. එතකොට ඊළඟ අවුරුද්දේ අය වැයට වැඩිපුර ණය ගන්න වෙනවා. ආදායම් සහ වියදම් අතර පරතරය දවසින් දවස දෙපැත්තට, දෙපැත්තට ගිහිල්ලා තමයි ආදායම රුපියල් බිලියන 5,100යි, වියදම රුපියල් බිලියන 7,100යි වාගේ අගයකට ඇවිල්ලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ආර්ථික කරුණුවලින් ගත්තොත් මේ අවුරුද්දේ අපේ ලොකුම ජයග්‍රහණය මොකක්ද? මේක හරවන්න, මේ ආදායමේ සහ වියදමේ විෂම චක්‍රය reverse කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒක නිසා තමයි 2025 අය වැයේදී අපි පුරෝකථනය කළ ආදායම රුපියල් බිලියන 5,100යි, වියදම් රුපියල් බිලියන 7,190යි කියන පරතරය වෙනස් කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ.

විශේෂයෙන් ආදායම් වැඩි කර ගන්නත් වියදම් අඩු කරගන්නත්, ඒ හරහා මේ රටේ ආදායම් වියදම් පරතරය -අය වැය පරතරය- අඩු කරගන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් හැම අවුරුද්දකම වෙන්නේ, උපකල්පනය කළාට වඩා වියදම් වෙන මුදල වැඩි වෙන එක. ඒක අඩු කර ගත්තා කියන්නේ, ප්‍රාථමික ගිණුමේ අතිරික්තය වැඩි වුණා කියන්නේ ඊළඟ අවුරුද්දේ අපට ගෙවන්න තිබෙන ණය පොලී ප්‍රමාණය අඩු වෙනවා කියන එක. ඒකේ තේරුම, ඊළඟ අය වැයේදී තවත් එහි පරතරය අඩු වෙනවා, ගන්න තිබෙන ණය ප්‍රමාණය අඩු වෙනවා කියන එක. මේ පරතරය ඈත් වෙමින් යන විෂම චක්‍රය වෙනුවට, මේක නැවත සාමාන්‍ය අතට හැරෙන දිශාවකට හරවා ගන්න අපට මේ පළමුවැනි අවුරුද්දේ පුළුවන් වෙලා තිබෙනවා. ඉතින්, ඒක ජයග්‍රහණයක්. මේක මේ රටේ ආර්ථික ඔස්තාර්ලාට, විශේෂඥයන්ට ලොකු ප්‍රශ්නයක්. ඒගොල්ලන් නේ ආර්ථිකය ගැන දැනගෙන හිටියේ. අපි නොවෙයි නේ. අපි පෙට්ටි කඩයක්වත් කර ගන්න බැරුව හිටපු කට්ටිය නේ. හැබැයි, ඒගොල්ලන්ට බැරි වුණාට අපට පුළුවන් වෙලා තිබෙනවා මේ ණය චක්‍රය කරකවන්න. ඒක ලොකු ජයග්‍රහණයක්. මේ රටේ ආර්ථිකය ගැන බලාපොරොත්තු තියාගන්න පුළුවන් ජයග්‍රහණය ඒක.

IMF එක පවා ලංකාවේ ණය තිරසරභාවය සම්බන්ධව පළ කරලා තිබුණු අදහස තමයි, debt-to-GDP ratio එක - ඒ කියන්නේ ණය සහ දළ ජාතික නිෂ්පාදනය අතර ratio එක - 2022 තිබුණේ සියයට 115යි, ඒක 2032 වෙද්දී සියයට 95 කරන්න පුළුවන් වෙයි කියන එක. හැබැයි, මේ අවුරුද්දේ අපට

පුළුවන් වෙලා තිබෙනවා ඒක සියයට 95ට ගෙනෙන්න. ඒ නිසා අපි විශ්වාස කරනවා, 2032 වෙද්දී ඒක සියයට 87කට ගෙනෙන්න පුළුවන් වෙයි කියලා. මේක තමයි අපේ ආර්ථික වර්ධනයේ පිම්මේ අපි නිරූපණය කරන දත්ත. මේවා බොරු නොවෙයි. 2023දී අපේ ආදායමින් දේශීය ණය ගෙවන පංගුව සියයට 80ට තිබුණු එක, 2025 වෙද්දී සියයට 52ක් කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. මේක ලබන අවුරුද්දේ තවත් අඩු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අය භාණ්ඩාගාරය හිස් කරලා, භාණ්ඩාගාරය හින්දපු කට්ටිය වුණාට, බලන්න හැමෝගේම කථාවල මොන වාගේ අදහසක්ද තිබුණේ කියලා. "භාණ්ඩාගාරයේ ට්‍රිලියනයක් තිබෙනවා. ඇයි ඒක තියාගෙන ඉන්නේ" කියලා හරි අමාරුවක් ඇවිල්ලා තිබෙනවා, දැන් සල්ලි ටිකක් තිබෙනවා කියලා. මෙච්චර කල් ඒ මුදල එකතු කරන්න කවුරුවත් මැදිහත් වුණේත් නැහැ. මෙච්චර කල් ඒක හින්දපු එක කළේ කරන තරමක්. පරිපූරක ඇස්තමේන්තු දමමින් අවුරුද්ද අවසානයේ ඇස්තමේන්තු කරපු වියදම්වලට වඩා ගොඩක් වියදම් කරමින් කටයුතු කළේ. හැබැයි, දැන් හැමෝම මේ ට්‍රිලියනය ගැන තමයි අහන්නේ. ඇත්ත. ට්‍රිලියනයක ලොකු මුදලක් තිබෙනවා. ඒ මුදල මේ රටේ ජනතාවගෙන්, මේ රටේ ආදායම්වලින් උපයපු ඒවා. මේ ආණ්ඩුව ඇවිල්ලා බදු වැඩි කළේ නැහැ. පසුගිය අවුරුද්ද තුළ මොකක්ද අපි අලුතින් ගහලා තිබෙන බද්ද? මොකක්ද අපි වැඩි කරලා තිබෙන බද්ද? VAT එක භාණ්ඩ කිහිපයක හරි ඉවත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. PAYE Tax ceiling එක ලක්ෂයේ ඉඳලා ලක්ෂ එකහමාර දක්වා උස්සන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය මදි කියලා අපි පිළිගන්නවා. ඒවා තව ඉහළට දැමිය යුතුයි. නමුත් IMF ව්‍යාපෘතියක ඉන්න, බංකොලොත් වෙච්ච රටක් විධියට මේ ප්‍රශ්නවලින් එළියට යන්න අදාළව අපි ඒ දේ කරලා තිබෙනවා. ආණ්ඩුව සහ රාජ්‍යය කාර්යක්ෂම කිරීම හරහා ඔබට කරන්න බැරි වුණු දේ අපි කරලා තිබෙනවා. මේ රටේ ආදායම් උපදවන එක වැඩි කරලා තිබෙනවා. රේගු ආදායම වැඩි වෙලා තිබෙනවා. සුරාබදු ආදායම වැඩි වෙලා තිබෙනවා. අනෙකුත් ආදායම් වැඩි වෙලා තිබෙනවා. සංචාරක ආදායම වැඩි වෙලා තිබෙනවා. ඒ සියල්ල වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩි වීමේ ප්‍රතිඵලය තමයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේ භාණ්ඩාගාරය පිරී ඉතිරී යෑම. අපි ගරු කරනවා එතුමා ඒක කියන්න අවංක වෙච්ච එක ගැන.

එතුමා ආර්ථික විද්‍යාව ගැන දන්නා කෙනෙක් නේ. ඒක නිසා එතුමා ඒ ගැන අවංකව කිව්වා. ආර්ථික විද්‍යා කොලීජියට ගියාට විපක්ෂ නායකතුමා කිව්වේ, මොන්ටිසෝරි ළමයෙකුට වුණත් ඒක කරන්න පුළුවන් කියලා. මොන්ටිසෝරි ළමයෙකුටත් කරන්න පුළුවන් කියලා හිතනවා නම් ඇයි ඒගොල්ලන් කළේ නැත්තේ? ඒගොල්ලනුත් ආණ්ඩු කළා නේ. 2015 ඉඳලා 2019 වෙනකල් ඒ අයත් ආණ්ඩුවක් කළා නේ. මොකක්ද ඒකේ ප්‍රතිඵලය? ඒ කාලය මේ රට බංකොලොත් වෙන්න අදාළ මූලික ආර්ථික කඩා වැටීමක් පටන් ගත්තු කාලයක්. ඒ කාලය පුද්ගලික බැඳුම්කර හිමියන්ගෙන් ණය අරගෙන, ලංකාවේ ණය බර වැඩි කරපු, මේ රටේ ආර්ථික වර්ධන වේගය අඩු කරපු අවුරුදු හතරක්, පහක්. එතකොට ඔය විශ්වවිද්‍යාල ළමයින්ට මේක කරන්න බැරි වුණා නේ. දැන් මොන්ටිසෝරි ළමයින්ට කරන්න පුළුවන් වැඩක් කියලා නේ කියන්නේ. හැබැයි, අපි ඒක කරලා තිබෙනවා. එහෙම කියන්න පුළුවන්, හැමෝටම. ඒගොල්ලන් හොඳ කථාකාරයෝ. කියන්න පුළුවන්. නමුත් මේ දේවල් කරලා පෙන්වලා නැහැ. අපි අවුරුද්දක් ඇතුළත ඒ දේවල් කරලා පෙන්වලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, භාණ්ඩාගාරයේ මුදල් තිබීම වැදගත් වෙන්නේ ඇයි? මම දැන් කථා කළා, දේශීය ණය පොලී අනුපාත අඩු වීමක් ගැන.

ඒ හරහා තමයි ණය ගැනීමේදී ඊට අදාළ පොලී අනුපාත පහත දමා ගන්නත්, අපේ ණය ගැනීමේ අවශ්‍යතාව භාගයක් කර ගන්නත් අපට පුළුවන් වන්නේ. මොකද, අපේ අත මුදලක් තිබෙන නිසා. එහෙම බැරි වුණාම තමයි අපට රාජ්‍යයක් විධියට ගිනි පොලියට ණය ගන්න වෙන්නේ. ඒ නිසා මේක නිකම් ජොලියට තියාගෙන ඉන්න එකක් නොවෙයි. යම් කෙනෙක් ආර්ථික විද්‍යාවේ මූලිකාංග දන්නවා නම්, ඒ ගැනත් දන්නවා. මේ සියල්ලත් එක්ක තමයි මේ වැඩ කටයුතු ඉදිරියට යන්නේ. ඒ වාගේම අනෙක් පැත්තෙන්, අපි ණය ගැනීමේ අවශ්‍යතාව අඩු කර තිබෙනවා. මේ ගෙනැවිත් තිබෙන වැඩ පිළිවෙළ රනිල්ගේ එකමයි කියනවා නේ. නමුත් රනිල්ට පුළුවන්ද මේ වාගේ කරන්න? බිලියන 4,000ක් ණය ගන්නවා කිව්වා. නමුත් බිලියන 3,740යි අරගෙන තිබෙන්නේ. ඊළඟ අවුරුද්දේ තව අඩු වෙනවා. ඒක තමයි මූල්‍ය විනය. මූල්‍ය විනයක් නොවෙයි, කිසිම විනයක් හදා ගන්න බැරි වෙච්ච දේශපාලන පක්ෂවලට රටේ මූල්‍ය විනයක් හදන්න බැහැ. නමුත් අපි ඒක කරලා තිබෙනවා. ඒ කරලා තිබෙන එකේ ප්‍රතිඵල තමයි මේ ඇවිල්ලා තිබෙන්නේ. මේක මේ නිකම් ඉලක්කම් හුවමාරුවක් නොවෙයි. ලංකාවේ ණය තිරසරභාවය සම්බන්ධයෙන්, මූල්‍ය විනය සම්බන්ධයෙන් බරපතළ පියවර ප්‍රමාණයක් අපි මේ අවුරුද්දේ අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට ලැබී තිබෙන ඉතුරු වෙලාව වෙන් කරන්නම්, මේ අයට මතු වී තිබෙන ගැටලු දෙකක් ගැන කථා කරන්න. එකක් තමයි, වාහන ගෙන්වීම. වාහන ගෙන්වීම ගැන දිගටම කථා කරනවා. මම හිතන විධියට කථා කරන්න මොකක්වත් මාතෘකාවක් නැති වෙද්දී කථා කරන්න හොඳ මාතෘකාවක්, ඒක. පළමු දවස් කිහිපයේ මාතෘකාවක් අරගෙන ගියා, මිලියන 12,500ක් වියදම් කරලා මන්ත්‍රීවරුන්ට වාහන ගෙන්වනවා කියලා. ඒ කථාව දවස් දෙකක් විතර අරගෙන ගියා. ඒ මිලියන 12,500ක් වෙන් කර තිබෙන්නේ රජයට අවශ්‍ය වාහන සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ 2,700ක් ගන්න කියලා පැහැදිලි කරලා, එයින් සෞඛ්‍ය අමාත්‍යාංශයට මෙච්චරක් තිබෙනවා, වනජීවී එකට මෙච්චරක් තිබෙනවා කියලා කිව්වාට පසු ඔන්න ඒ කථාව නවත්වා තිබෙනවා.

දැන් කියනවා, මන්ත්‍රීලාගේ වාහන ගැන. මේ තිබෙන චෝදනාව මොකක්ද? ජනාධිපතිතුමා කිව්වා වාගේම හරියටම මේ තිබෙන්නේ පර්මිට් චෝදනාව. වෙන මොකක්වත් නොවෙයි. මොකද, මේ වාහන ගෙන්වලා මන්ත්‍රීවරුන්ට ගෙවල්වලට ගෙනියන්න දෙන්නේ නැහැ නේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් ඒක කියා තිබෙනවා. අපි කියලා තිබෙන්නේ, කෝටි 4කට, 5කට විකුණන්න පුළුවන් ඒ පර්මිට් එක දෙන්නේ නැහැ කියලා. මේ රටේ ප්‍රාදේශීය ලේකම්වරුන්, ඉහළ මාණ්ඩලික නිලධාරීන් කියන සියලුදෙනා රාජකාරි වාහනයක් සහිතව වැඩ කරනවා නම්, ඇයි මන්ත්‍රීවරුන්ට එහෙම බැරි? මන්ත්‍රීවරුන්ට ඕනෑ, කෝටි 5ක වාහනයක් ගෙදර ගෙනියන්නද? එහෙම ඕනෑ නැහැ. ඒක වෙනස් කළ යුතුයි කියන පදනමින් තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 194වැනි පිටුවට ඒ කාරණය ජාතික ජන බලවේගයේ අපි ජනාධිපතිවරණයට කලින් ඇතුළු කළේ. ඒ ඇතුළු කළ දේ තමයි අපි මේ කරන්නේ. තමුන්නාන්සේලාට ඒක චෝදනාවට කාරණයක් නම් අපට කරන්න දෙයක් නැහැ. නමුත් මන්ත්‍රී පර්මිට් එක දෙන්නේ නැහැ. ජනාධිපතිතුමා කිව්වා වාගේ අපි ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් කියා තිබෙනවා. අපි ඒක ගැන කියලා තමයි ඡන්දය ඉල්ලුවේ. එසේ කියපු දේ තමයි අපි කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, බොහොම කනගාටුදායක කාරණයකුත් සඳහන් කළ යුතුයි. මම හිතන විධියට මට පසුව කථා කරන්නේ මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. මම දැක්කා, එදා අය වැය කථාව ඉදිරිපත් කරනකොට වතු කම්කරු ක්ෂේත්‍රයේ වැටුප් වැඩි කිරීම ගැන ජනාධිපතිතුමා සඳහන්

[ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා]

කරද්දී එතුමන්ලා සතුටු වුණා. මේක ඓතිහාසික පියවරක්. අපි හැමෝම ඒක පිළිගන්නවා. ලංකාවේ වසර 200කට ආසන්න කාලයක් තිස්සේ ඉතාම අසීරුවෙන් ජීවත් වන ජන ප්‍රජාවක් විධියට අපට වතු කම්කරු ජනතාව වෙන් කර හඳුනා ගන්න පුළුවන්. අපේ ජීවිත අත්දැකීම තුළ අපි ඒක දන්නවා. ඔවුන් අතර නිරක්තියෙන් පෙළෙන අය මොන මට්ටමින්ද ඉන්නේ, පෝෂණ ඌනතාව තිබෙන්නේ මොන මට්ටමින්ද, ඔවුන්ගේ ජීවිත ගත වෙන්නේ කොහොමද කියලා අපි දන්නවා. වතු කම්කරුවෙකුගේ දෛනික වැටුප -වතු හාම්පුතුන්ගෙන් රුපියල් 200ක් සහ රජයෙන් රුපියල් 200ක් සහිතව- රුපියල් 1,750ක් දක්වා වැඩි කරනවා කිව්වාම, මොකක්ද අපට හිතෙන්න ඕනෑ? එතුමන්ලාට එදා හිතුණා වාගේම අපටත් සතුටු හිතෙන්න එපායැ. ඒ ගැන මේ රටේ ඕනෑම මනුස්සයෙකුට සතුටු හිතෙන්න ඕනෑ. මේ මුළු රටම ඒ මිනිස්සුන්ට ණයයි. ඒ මිනිස්සු අවුරුදු 200ක් තිස්සේ රටට ඩොලර් ගෙනාපු, මේ රට සාරවත් කරපු, හැබැයි ඒ වෙනුවෙන් අවම වරප්‍රසාදයක්වත්, එහෙම නැත්නම් අවම වැටුපක්වත් ගත්තේ නැති මිනිස්සු. එවැනි ප්‍රජාවකට ලබා දෙන වැටුප වැඩි කිරීම සඳහා ගන්න තිබෙන සියලු උත්සාහ අරගෙන මේ මොහොතේ, - අර කියන විධියට ඒක හොඳයි තමයි- දැන් ලොකු තර්කයක් මතු කරගෙන එනවා, රජයෙන් රුපියල් 200 දෙන එක වැරදියි කියලා. මම දැක්කා, ඊයේ රූපවාහිනී වැඩසටහන්වලදීත් සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් ඒ ගැන කියා තිබුණා. ඒ වාගේම සමාජ මාධ්‍යවලත් ඔවුන් ඒ ගැන කියා තිබෙනවා මම දැක්කා. ඒක ඉතාම නරකයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒක ඉතාම නරක වැඩක්. අඩුම තරමින් එහෙම කියන්නේවත් කොහොමද? ඒ ජන ප්‍රජාව මේ රටේ සහනාධාර ලැබිය යුතු විශේෂ කොටසක් ලෙස සලකා -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

එහෙම සහනාධාර ලබා දෙනවා තමයි. එසේ ලබා දිය යුතුයි. මේක අද පටන් ගත් දෙයක් නොවෙයි. මේකට ඉතිහාසයක් තිබෙනවා. ඔබට මතක ඇති, යහපාලන ආණ්ඩුව පැවැති කාලය. දැන් රුපියල් 200ක් දෙන්නේ කොහොමද කියලා මේ කට්ටිය අහනවා. නමුත් 2015දී දීපු ඡන්ද පොරොන්දුවක් තමයි වතු කම්කරු වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කරනවා කියන එක. මනෝ ගනේසන් මන්ත්‍රීතුමාට ඒක මතක ඇති. හැබැයි මොකක්ද වුණේ? ඒ අවුරුදු 4ටම මොකක්වත් කළේ නැහැ. අන්තිමට 2019දී - [බාධා කිරීමක්]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
ඔබතුමාට තමයි ඊළඟට කථා කරන්න තිබෙන්නේ. මට තව විනාඩි දෙකයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න. මට විනාඩි දෙකයි තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
තරුණ මන්ත්‍රීතුමා, කේන්ති ගන්න එපා, තරහා ගන්න එපා. ඔක්කෝම එක ගොඩට දමන්න එපා. අපි අවුරුදු 4ක් තමයි යහ පාලන ආණ්ඩුවේ හිටියේ. ඒ කාලයේ විතරයි මම ඇමති කෙනෙකු විධියට හිටියේ. හැබැයි, මම අවුරුදු 20ක් පාර්ලිමේන්තුවේ හිටියා. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. නමුත් ඒ අවුරුදු 4ක කාලයේ විශාල සේවාවක් කරලා තිබෙනවා. දන්නේ නැත්නම්, දැන ගන්න ඒක. ඔක්කෝම එක ගොඩට දාලා කථා කරන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේදී උත්තර දෙන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඔක්කෝම එක ගොඩේ දමලා කථා කරන්න එපා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වරදවා වටහාගෙන ඉන්නේ. වරදවා වටහා ගන්න එපා. මම ඔබතුමාට චෝදනාවක් එල්ල කළේ නැහැ. මම ඔබතුමා ගැන කිව්වේ, එහෙම අදහසකින් නොවෙයි. මම ආණ්ඩුව ගැනයි කිව්වේ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඔබතුමා මගේ නම කිව්වා නේ.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
හරි. ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරද්දී ඔබතුමා සතුටු වෙනවා මම දැක්කා. ඒ නිසා ඒක ඔබතුමාට කරපු චෝදනාවක් නොවෙයි. මේක ඔබතුමාට කරන චෝදනාවක් නොවෙයි. යහපාලන ආණ්ඩුවේ ඒ අවුරුදු පහක කාලය තුළ වතු කම්කරුවන් වෙනුවෙන් මොනවත් කළේ නැහැ. ලජ්ජයි. 2021දී නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා තමයි හිටියේ. මේක, හැමදාම වෘත්තීය සමිති වතු හාම්පුතුන් එක්ක කේවල් කරලා කරපු වැඩක්. නමුත් වෘත්තීය සමිතිවලට ඒ බලය නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසයේ පළමුවැනි වතාවට ආණ්ඩුවක් ඒක ප්‍රශ්නයක් විධියට භාරගෙන, වතු හාම්පුතුන් එක්ක කේවල් කරලා, සාකච්ඡා කරලා තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. එහෙම කළාටත් පස්සේ සමහර මන්ත්‍රීවරු අහනවා, වතු කම්කරුවන්ට රුපියල් 200ක් දෙන්නේ ඇයි කියලා. මේකේ තිබෙනවා ජාතිවාදී පැත්තක්. මේ කවුරුවත් ගොවියාට පොහොර සහනාධාර දෙනකොට එහෙම අහන්නේ නැහැ. මේ කවුරුවත් ධීවරයාට ඉන්ධන සහනාධාර දෙනකොට එහෙම අහන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
අනෙකුත් සහනාධාර දෙනකොට එහෙම අහන්නේ නැහැ. ඒ නිසා එහෙම කරන්න එපා. ඒක, අපි හැමෝම සතුටු වෙන්න ඕනෑ කාරණයක්. වතු කම්කරු ජනතාව කියන්නේ, දිගින් දිගටම අපට ඡන්දය දීපු මිනිස්සු නොවෙයි. ඔවුන් කොළ පාටට ඡන්දය දීපු මිනිස්සු. ඔවුන් අන්තිමට තිබුණු මැතිවරණ දෙකේදී අපට ඡන්දය දීලා ඇති. හැබැයි, මේකෙන් සතුටු වෙන්න ඕනෑ ඔබතුමන්ලා. *[බාධා කිරීමක්]* ඔබතුමා නොවෙයි. ඔබතුමා මේක අදාළ කර ගන්න එපා. ඔබතුමාට නොවෙයි මේක කියන්නේ. එහෙම කියපු අයට කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මම බොහොම ගෞරවයෙන් ඉල්ලනවා, ඒ දේ කරන්න එපා කියලා. වතු කම්කරු ජනතාව වෙනුවෙන් මේ තබා තිබෙන පියවර පිළිගන්න. මෙතැනදිත් කකුලෙන් අදින්න එපා. මොකද, ඒක වැරදියි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු යූ.පී. අබේවික්‍රම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.42]

**ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு சட்டத்தரணி யூ.பீ. அபேவிக்ரம)
(The Hon. U.P. Abeywickrama, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි ජාතික ජන බලවේගය හැටියට පාර්ලිමේන්තුවට පත්වෙලා ඇවිල්ලා එළඹෙන නොවැම්බර් 21වැනි දාට තමයි වර්ෂයක් පිරෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ වර්ෂයක කාලය ඇතුළත මේ අවුරුද්ද සඳහා මාර්තු මාසයේ අය වැය සම්මත කරගත්තා. ප්‍රධාන මැතිවරණ දෙකක් පවත්වා, මේ වසරේ අප්‍රේල් මාසයෙන් පස්සේ තමයි අපේ ආණ්ඩුකරණය හරියටම ආරම්භ වුණේ. ඊට පස්සේ ගෙවී ගිහින් තිබෙන්නේ, මාස හය හතක කාලයක්. ජනාධිපතිතුමා එදා කිව්වා වාගේ මේ ගෙවී ගිය මාස කිහිපය තුළ ලංකා ඉතිහාසයේ පවත්වපු නිදහස් හා සාධාරණ ප්‍රධාන මැතිවරණ දෙකක් පවත්වන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ කඩා වැටිලා තිබ්බ, පදනමින්ම දෙදරලා ගිහිල්ලා විනාශවෙලා නන්නත්තාර වෙලා තිබ්බ ආර්ථිකය ස්ථාවර ආර්ථිකයක් බවට පත් කරන්නත් අපි සමත්වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ ආණ්ඩුකරණය ආරම්භ කළාට පස්සේ දීර්ඝ කාලයක් තිස්සේ මේ රට පාලනය කරපු ගතානුගතික, දූෂිත දේශපාලන කල්ලිවල ග්‍රහණයට ලක්වෙලා මේ රටේ සියලු මර්මස්ථාන -රාජ්‍ය සේවය ඇතුළු සියල්ලම- දේශපාලනීකරණයට ලක් වෙලා තිබුණු තත්ත්වයක් තුළ සමහර රාජ්‍ය ආයතනවල හිටපු -දේශපාලන හිතවත්කම්, සම්බන්ධකම් මත තනතුරුවලට පත් කරපු- සමහර නිලධාරින් අපේ පාලනය ආරම්භ කළාට පස්සේ සමහර තැන්වල ඉඳගෙන රජයේ ගමන් මාර්ගයට, රජයේ කටයුතුවලට බාධා වෙන විධියට වැඩ කළා. ඒ වාගේම පරාජිත දේශපාලනඥයන් සමඟ එකතුවෙලා මේ රජය මාස තුනෙන්, මාස හයෙන් කඩාගෙන වැටෙයි කියලා බලාගෙන හිටපු තත්ත්වයක් තිබුණා. ඒ සියලු සතුරු බලවේගවල අභියෝග පරාජයට පත් කරමින් ගෙවී ගිය වසර තුළ මේ රටේ ආර්ථිකය ස්ථාවර මට්ටමකට ගෙනෙන්නට අපි සමත් වුණා. අපි සාර්ව ආර්ථික විචල්‍යයන් ස්ථාවර කරලා, ඩොලරයේ අගය වර්ෂයක කාලයක් පුරාම රුපියල් තුන්සීය සීමාවේ තබා ගන්න කටයුතු කළා. ඒ වාගේම මේ රටේ ආදායම් වියදම් පරතරය සියයට 36කින් අඩු කරන්නත්, සහන ලැබිය යුතු සමාජ ස්ථර වෙත සහන ලබා දෙන්නත් කටයුතු කළා. විශේෂයෙන්ම අස්වැසුම ප්‍රතිලාභීන්ගේ දරුවන්ට රුපියල් 6,000ක දීමනාවක් පසුගිය අය වැයෙන් ලබා දුන්නා.

ජනාධිපතිවරයා මේ අය වැයෙන් මේ අවුරුද්දේත් එම සහනය ලබා දෙන බව ප්‍රකාශ කළා. ඒ වාගේම අපේ රාජ්‍ය ආදායම්, රාජ්‍ය බදු ආදායම් නිසි පරිදි කළමණාකරණය කරමින්, එකතු කරමින් ඒගොල්ලන් වාගේ තමන්ගේ හිතවතුන්ට, ජාවාරම්කාරයන්ට බදු සහන ලබා නොදෙමින්, රාජ්‍ය මූල්‍ය විනය ඉතාම ශක්තිමත් කරමින් භාණ්ඩාගාරය පිරී ඉතිරී යන ආකාරයට රාජ්‍ය ආදායම වැඩි කරන්න සමත් වෙලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ වාගේම අපි රටක් හැටියට සංචාරක ව්‍යාපාරයට සුදුසු වටපිටාවක් රට තුළ නිර්මාණය කරන්න සමත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සියල්ලටම වැඩිය අපි, ජාතික ජන බලවේගය රජය මේ රටේ බලයට පත් වෙනකොට සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියලු ජාතීන් අතරත්, කතෝලික, ඉස්ලාම්, බෞද්ධ කියන ආගම් අතරත් සැකය, එකිනෙකා කෙරෙහි අවිශ්වාසය, බිය ගොඩ නඟපු අවාසනාවන්ත රටක් නිර්මාණය කරලා තිබුණා. අපේ ජනාධිපතිවරයා මෙය අභියෝගයක් හැටියට භාර ගෙන ජනාධිපතිවරණයේදී උතුරු නැඟෙනහිර පළාත්වලින් යම් ප්‍රතිශතයක් ජයග්‍රහණය කළ බව අපි දැක්කා. ඒ වාගේම මහ මැතිවරණයට එනකොට ඒක විශාල ජයග්‍රහණයක් බවට පරිවර්තනය කරන්න අපි සමත් වුණා. අපි සියලු ජාතීන් අතර විශ්වාසය, සමඟිය ඇති කර, උතුරු නැඟෙනහිර, කඳුකරය ඇතුළු සියලු ප්‍රදේශවල ඉතාම සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාව, මානුෂික අයිතිවාසිකම් පිළිගන්නා, හැම ප්‍රජාවකගේම ගෞරවයට පාත්‍ර වන රටක් ලෝකයේ නිර්මාණය කරන්නට අපි සමත් වුණා. මේ දුෂ්ට බලවේගවලට නැවත ආපසු හැරවිය නොහැකි ලෙස මේ රටේ ජාතික සමඟියට අවශ්‍ය මූලාරම්භය මේ ගෙවී ගිය වසර තුළ අපි ලබා දීලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ වාගේම නීතියේ විධානය, ආධිපත්‍යය සහිත රටක් නිර්මාණය කරන්න අපි සමත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රටේ ආන්තික ජනතාවට, එහෙම නැත්නම් දුප්පත් ජනතාවට පමණක් ක්‍රියාත්මක වෙච්ච නීතිය දැන් මේ රටේ මැති ඇමතිවරුන්ට, හිටපු ජනාධිපතිවරුන්ට, ඒ වාගේම තරාතිරමක් නොබලා, පාට පක්ෂ භේදයක් නොබලා සැමට ක්‍රියාත්මක වෙනවා. අද ඕනෑම කෙනෙකුට නීතියේ පාලනයට යටත් වෙන්න සිදු වෙලා තිබෙනවා. අධිකරණය ඇතුළු අනෙකුත් විමර්ශන ආයතන, යුක්තිය පසිඳලන සියලු ආයතන අපි ශක්තිමත් කරලා තිබෙනවා. ඒවාට ස්වාධීනව කටයුතු කිරීම සඳහා අවශ්‍ය වටපිටාව නිර්මාණය කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජනතාවට උඩින් ඉන්න ජනතා විරෝධී, දූෂිත දේශපාලන සංස්කෘතිය කාලාන්තරයක් තිස්සේ මේ රට නඩත්තු කර ගෙන ගියා. රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට ආණ්ඩුක්‍රම

[ගරු නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා]

ව්‍යවස්ථාව සංශෝධනය කරලා, නීති පනවලා කරන්න පුළුවන් දෙයක් නොවෙයි, මේක. දේශපාලන ව්‍යාපාරයක් විධියට, ජනතා හිතවාදී, ජනතාව වෙනුවෙන් කැප වෙච්ච දේශපාලන ව්‍යාපාරයක් මේ රටේ නිර්මාණය කරන්න අපි සමත් වෙලා තිබෙනවා.

මේ සියලු තත්ත්ව යටතේ තමයි අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා අවුරුද්දක් ඇතුළත දෙවැනි අය වැය ඉදිරිපත් කළේ. එතුමාගේ දීර්ඝ දේශපාලන ඉතිහාසය තුළ සිදු කළ කැප වීම, පරිත්‍යාගය, පරිණත බව ඇතුළේ මේ වාගේ දේශපාලන ව්‍යාපාරයක නායකයකු හැටියට අත්පත් කර ගත්, වර්තමානයේ කිසිම දේශපාලන පක්ෂයක නායකයෙකුට නැති අභිමානයකින්, පෞරුෂත්වයකින් සහ විශ්වාසයකින් යුතුව මුදල් ඇමතිවරයා හැටියට එතුමා පැය හතරහමාරක් තිස්සේ අය වැය කථාව ඉදිරිපත් කළේ.

මේ අය වැය ඉදිරිපත් කිරීම ගැන ගත්තොත්, මෑත ඉතිහාසයේ කිසිම මුදල් ඇමතිවරයෙක් නොකළ ආකාරයට විශ්වසයකින් යුතුව එතුමා ම මැදිහත් වෙලා, අධ්‍යයනයකින් යුතුව ඉදිරිපත් කරපු හොඳ අය වැයක් බව කියන්න පුළුවන්. එතුමා මේ අය වැය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ සමාජ මාධ්‍යවල ඉන්න දේශපාලන අපතයෝ යම් යම් අදහස් ඉදිරිපත් කරන බව අපට පෙනෙන්න තිබෙනවා. ඒගොල්ලන්ට තිබෙන්නේ ඊර්ෂ්‍යාව, කුහකකම, දුෂ්ටකම. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා පැය හතරහමාරක් හිටගෙන කථාවක් කරනවා කියන එක එතුමාගේ දේශපාලන ඉතිහාසයේ විශාල අභියෝගයක් නොවෙයි. හැබැයි, ඔවුන්ට එහෙම දෙයක් කරන්න පුළුවන්කමක් නැහැ. අපි දැක්කා, පසුගිය කාලයේ බබ්-බබ් ගාමින් පොඩි එකාගේ ලියුම් කියවනවා වාගේ ඉදිරිපත් කරපු අය වැය කථා. ඉතින් එහෙම අයට ඊර්ෂ්‍යාවක් ඇති වන එක, කුහකකමක් ඇති වන එක අපට ප්‍රශ්නයක් නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ අය වැය සම්බන්ධයෙන් කිසිම සාධනීය විවේචනයක් කරන්න මේ අයට පුළුවන්කමක් නැහැ. කරන්න පුළුවන් ඔය වාගේ කෙඳිරිගෑම් තමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩි කිහිපයක් ඕනෑ, මේ කථාවත් කියලා මගේ කථාව අවසන් කරන්නට. මට කුඩා කාලයේ අත්දැකීමක් මතක් වෙනවා. අපි කොල්ලෝ කාලයේ ගහගන්න ගියාම, ගහගන්න බැරි සමහර කොල්ලෝ ගහගන්න ඇවිල්ලා, ගහගන්න බැරිව ගුටිකාලා අන්තිමට කෙළ ගහනවා. *[බාධා කිරීමක්]* කෙළ ගහලා දුවනවා. අන්න, ඒ මට්ටමට මේ අය වැයත් එක්ක විරුද්ධ පක්ෂය වැටිලා තිබෙනවා. අපේ අය වැය ගැන සාධනීය විවේචනයක් කර ගන්න බැරිව, මොනවා හරි කියලා කෙළ ගහලා දුවන තත්ත්වයට අද මේ දේශපාලනඥයෝ වැටිලා තිබෙනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් ලැබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
බොහොම ස්තුතියි, අපේ ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
පොඩ්ඩක් ඉන්න කෝ, mike එක දෙනකම්, point එක කියන්න.

Madam, ස්ථාවර නියෝග 92(2). අපට මේ සභාවේ point of Order එකක් ගන්න පුළුවන් කාරණා දෙකක් තිබෙනවා. එකක්, නම කියලා සටහන් කරලා තිබෙන්න ඕනෑ. දෙවැනි එක, ඇමති කෙනෙකුට උත්තර දෙන්න පුළුවන් අවස්ථාව. ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමියට අද විනාඩි පහක් කථා කරන්න අවස්ථාව දුන්නේ කොහොමද? කාන්තාවක් නිසාද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ස්ථාවර නියෝග 92(2) ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග 92(2).

කාන්තාව නිසාද, කාන්තාවට බඩගිනි නම්, එයාට දෙන්න පුළුවන් නම්, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එතැන point එකක් තිබුණා; point එකක් තිබුණා. කරුණාකරලා ඔබතුමා ඉඳගන්න.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
Madam, I rise to a point of Order. My name was mentioned.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දිගින් දිගටම මේ අර්චුනා මන්ත්‍රීවරයා විසින් පාර්ලිමේන්තුවේ තිබෙන බරපතළකම අවතක්සේරු කරමින් කරන ප්‍රකාශවලට ඉඩ ලබා නොදෙන ලෙස මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමා කථා කරන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට කථා කරන්න දෙන්නේ නැහැ. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ මේ Hon. (Dr.) Najith Indika තරුණ මන්ත්‍රීතුමා, කථා කරනකොට මගේ නම සඳහන් කරලා කරුණක් කිව්වා.*[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා නම කිව්වාට බැහැ. අපහාසාත්මක විධියට නම කියවුණා නම් තමයි අවස්ථාව ගත හැක්කේ. අපහාසයක් නොවෙයි නේ, ඔබතුමා ඉදිරිපත් කරපු කරුණ ගැන කිව්වේ. *[බාධා කිරීමක්]* ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නිහඬ කරන්න කෝ සභාව. *[බාධා කිරීමක්]* කරුණාකරලා නිහඬ කරන්න කෝ. වැඩක් නැහැ නේ, අපට කථා කරන්න බැහැ නේ. මම දැන් කථා කරන්නේ රටේ ඉතාම දුෂ්කර ජීවිත ගත කරන ජනතාව ගැන. *[බාධා කිරීමක්]* මම ඇත්ත කථා කරන්න යන්නේ. ඉඩ දෙන්න, අපට කථා කරන්න ඉඩ දෙන්න. සභාවේ කාලය අරගෙන දෙන්න කෝ, පොඩ්ඩක්. සෙල්ලමක් නොවෙයි, මේ සභාව. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Madam, I rise to a point of Order. [බාධා කිරීමක්] එතුමාට කථාව දෙන්න, අපි එපා කියන්නේ නැහැ.[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ point එක කියන්න කෝ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 92ම තමයි. මූලසුන යම් නියෝගයක් දුන්නාම, මූලසුනේ ඒ නියෝගය අභියෝගයකට ලක් කරන්න බැහැ, කිසිම මන්ත්‍රීවරයෙකුට. ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය, ඔබතුමිය එදා ආවේ නැති වුණාට, ගරු මූලසුන ඒ වෙලාවේ සුජීව සේනසිංහ මන්ත්‍රීවරයාට නියෝගයක් නිකුත් කළා ඒ නියෝගයට අභියෝග කරන්න මටවත් බැහැ. ඒ නිසා මූලසුන දැනගන්න ඕනෑ, රීති සහ නීති කියන්නේ මොකක්ද කියලා. ඒ නිසා සුජීව සේනසිංහ මන්ත්‍රීවරයාගේ වැරැද්ද ඒ මොහොතේ ගරු කථානායකතුමා නිවැරදි කළා. හැබැයි, ඒ අදාළ මන්ත්‍රීවරයාට හෝ ඒ කෙනාගේ නමට කැළලක් වෙනවා නම්, යෝජනාවක් ගෙනැල්ලා, ඒක ඒ අදාළ කමිටුවට යොමු කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හරි, ගරු කථානායකතුමාට කාරණය යොමු කරන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
එය එසේ නොවී, අර කට වාචාලකමට දොඩවලා තමන්ගේ හැකියාව, ධෛර්යය කොතැනද තිබෙන්නේ කියලා සමාජයට කියලා දෙන්න හදන්න එපා. ඒකට මූලසුන පාවිච්චි කරන්න දෙන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව කරන්න. දැන් ඉඳන් ඔබතුමාගේ වෙලාව.

[අ.භා. 1.55]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
දැන් ඉඳන් මගේ වෙලාව පටන් ගන්නේ.

අපේ Hon. (Dr.) Najith Indika තරුණ, ලස්සන - handsome - මන්ත්‍රීතුමා කථා කරනකොට මගේ නම සඳහන් කරලා කරුණක් කිව්වා. ඒ වාගේම ගරු සමන්ත විද්‍යාරත්න අපේ ගරු ඇමතිතුමාත් උදේ කථා කරනකොට මගේ නම සඳහන් කළ නිසා ඒ අවස්ථා දෙකේම මම නැඟිටලා උත්තර දෙන්න පටන් ගත්තා.

අය වැයෙන් වතු කම්කරු ජනතාවට රුපියල් 400ක් - රුපියල් 200ක් company account එකෙන්, රුපියල් 200ක් ආණ්ඩුවේ account එකෙන් - ලබා දීම ගැන දෙමළ ප්‍රගතිශීලී සන්ධානය හැටියට මම සතුටු වෙනවා. ඒ වාගේම ඒකට ස්තුතිවන්ත වෙනවා, ප්‍රශංසා කරනවා, අත්පුඩියක් ගහනවා. හරි නේ. ඒ වාගේම මා සමඟ මගේ පක්ෂයේ නියෝජ්‍ය නායකවරුන් වන දිගම්බරම් මැතිතුමාත්, රාධක්‍රිෂ්ණන් මැතිතුමාත් - ඒ දෙදෙනාම මේ අවස්ථාවේ මේ සභාවේ නැහැ - ඒ ගැන සතුට ප්‍රකාශ කරනවා. හොඳයි, ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම සමගි ජන සන්ධානය තුළ නැත්නම් මේ සභාව තුළත්, පිටතත් කොතැන හරි කවුරුහරි මන්ත්‍රීවරයෙක් මේ සම්බන්ධව මොනවා හරි සැකයක් මතු කරලා තිබුණා නම්, ඒ context එක තේරුම් ගන්න, ගරු නජිත් ඉන්දික මන්ත්‍රීතුමනි. Obviously, you can understand the context of their statements. ඒ කියන්නේ, මේ විධියට ආණ්ඩුවෙන් මුදලක් දෙන්න යනකොට නීතිමය ප්‍රශ්නයක් ඇති වෙයිද කියලා ඒගොල්ලන් අහනවා. එච්චරයි. ඒකෙන් තේරුම් යන්නේ ඒක දෙන්න එපා කියන එක නොවෙයි. ඒක දෙන්න ඕනෑ. අපි කියනවා නේ, ඒක දෙන්න කියලා. එතකොට හොඳයි නේ, සතුටුයි නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. කලබල වෙන්න එපා. ඒක පදනම් කරගෙන විවේචන කරන්න යන්නත් එපා. එහෙම එකක් නැහැ. එහෙම කියන්න අපි ඉඩ දෙන්නේත් නැහැ. ඒ වාගේ නීතිමය ප්‍රශ්නයක් ආවා නම් ඔයගොල්ලන් වගබලාගන්න. ඔයගොල්ලන්ට පුළුවන් නේ වගබලාගන්න. ඒ ගැන ජනාධිපතිතුමා එතුමාගේ කථාවේදී notify කළා. එච්චරයි. එතුමා දැනගන්න ඕනෑ, ඒ වාගේ ප්‍රශ්නයක් වුණා නම් වගබලාගන්න. මම කියන්නේ මේ වතු කම්කරු ජනතාවගේ ප්‍රශ්නය කරුණාකරලා ඒ අයගේ පඩියට පමණක් සීමා කරන්න එපා කියලා. විෂය භාර ඇමතිවරයා වන ඔබතුමාට මම ඒක කියන්න කැමැතියි.

[ගරු මනෝ ගනේසන් මහතා]

ගිය මාර්තු මාසයේත් අය වැයක් - Interim Budget - තිබුණා නේ. ගරු ඇමතිතුමනි, ඒ කාලයේ ඔබතුමා නැඟිටලා මට පොරොන්දුවක් දුන්නා. ඒ අවස්ථාවේදී ඔබතුමා කිව්වා, "පසුගිය ආණ්ඩු කාලයේ, රනිල් වික්‍රමසිංහ ආණ්ඩු කාලයේ හදාගෙන ගිය නිවාසවලින් තවත් නිවාස 1,300ක් ඉතුරු වෙලා තිබෙනවා, ඒවා දැන් අපි හදනවා. මමත් මේ සැරේ නිවාස 4,700ක් හදනවා. ඔක්කෝම නිවාස 6,000ක් දෙසැම්බර් 31ට පෙර හදලා දෙනවා" කියලා. නමුත් හදන්න බැරි වුණා. ප්‍රශ්නයක් නැහැ. ඒක සද්භාවයෙන් නේ ඔබතුමා කිව්වේ. මට ඒක තේරෙනවා. ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා ඒ පදනම මත මම දැන් ඔබතුමාට කැගහන්න යන්නේ නැහැ, බොරු පොරොන්දු දුන්නා කියන්නේ නැහැ කියලා. පොරොන්දුව ඉෂ්ට වුණේ නැහැ නේ. ඒකට කමක් නැහැ. ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ විශාල වැඩක් කරලා, අපට ලියුම් දුන්නා. ප්‍රශ්නයක් නැහැ. ලබන අවුරුද්දේ ඒක කරන්න.

ඒ වාගේම ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා, "මේ සැරේ මිලියන 4,090ක් ඉන්දියානු ක්‍රමය යටතේ invest කරලා ගෙවල් 2,000ක් හදනවා" කියලා. ගැටුමක් තිබෙනවා නේ, එතැන. යම් පරස්පරයක් තිබෙනවා නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගිය අවුරුද්දේම කිව්වා, ගෙවල් 1,300කුත්, 4,700කුත් - 6,000ක් - හදනවා කියලා. එය සඳහන් වන හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. ඉතින් ඔක්කෝම ගෙවල් 6,000ක් නේ. ජනාධිපතිතුමා කියනවා, ගෙවල් 2,000ක් කියලා. ඒ නිසා එතැන ගැටලුවක් තිබෙනවා. කරුණාකරලා අපට ඒක පැහැදිලි කරලා දෙන්න. අපි Committee Stage වෙලාවේදී මේ ගැන කථා කරමු; ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේදී කථා කරමු. එතකොට ඔබතුමා පැහැදිලි කරලා දෙන්න.

ඔබතුමා ගිය වතාවේ මෙතැනදී මට ම මේ කරුණත් කිව්වා. ඔබතුමාට වඩා ඔබතුමාගේ අමාත්‍යාංශ ලේකම්වරයා වන ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහත්මයා හැම දාම කථා කරද්දී කිව්වා, මේ හදන්න යන්නේ තනි ගෙවල් නොවෙයි, තට්ටු නිවාස කියලා. ඒකට අපි විරුද්ධ වුණා. අපි දැනුත් ඒකට විරුද්ධ වෙනවා. අපි හැම දාම ඒකට විරුද්ධ වෙනවා. කොළඹ තට්ටු නිවාස හදන්න. නමුත් වතුවල හදන්න එපා. කඳු උඩ තට්ටු නිවාස හදන්න එපා. ඔබතුමා ගිය සැරේ මගේ ප්‍රශ්නයට උත්තරයක් දුන්නා. තනි ගෙවල් තමයි හදන්නේ කියලා අද වාගේම එදාත් ඔබතුමා කිව්වා. දැන් මේ අවුරුද්ද ඉවර වෙලා ලබන අවුරුද්දට යනවා නේ. ලබන අවුරුද්දේ හදන්නේ මොනවාද කියන එක ගැනත් ඔබතුමාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ විවාදයේදී මට කියන්න. දැන් උත්තර දෙන්න ඕනෑ නැහැ. ඔබතුමාට ඒකට උත්තර දෙන්න දැන් මගේ වෙලාව දෙන්න බැහැ. ගෙවල් කීයක් හදනවාද, තනි ගෙවල්ද, තට්ටු ගෙවල්ද හදන්න යන්නේ කියලා එතකොට මට කියන්න. ඒ වාගේම ගිය අවුරුද්දේ ඔබතුමා කියපු අර ගෙවල් 6,000 හදන්න බැරි වුණා නේ. ඒක පිළිගන්න ඕනෑ. ඒක තමයි අපි විපක්ෂයක් හැටියට ප්‍රශ්න කරන්නේ.

අපි ප්‍රශ්න කරනකොට ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු, විශේෂයෙන් කඳුකරයේ සිට පත් වෙලා මේ සභාවට ආපු ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරුන්ට මා සමඟ හරි තරහයි. ඒ අය අපි එක්ක තරහයි. එතුමන්ලා පාර්ලිමේන්තුවේදීත් අපට බණිනවා, පිටදීත් බණිනවා. ඒක පොඩ්ඩක් කියලා හදන්න; ඒ අයට කියලා දෙන්න. මොකද, ගරු ජනාධිපතිතුමා මා ගැන දන්නවා. එතුමා ඇවිල්ලා මා එක්ක කථා කළා. එතුමා මා ගැන හොඳට දන්නවා. දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ පාඨමාලාවක් හදනවා නේ, "Learn with Ranil" කියලා. ඔබතුමන්ලාත් "Learn with Anura" කියලා එකක් හදන්න. මෙතැන දැන් ඇමතිවරු 6දෙනෙක් ඉන්නවා නේ. ඒගොල්ලන්ට ඒ පාඨමාලාව ලබා දෙන්න. මොකද, senior මන්ත්‍රීවරු සමඟ සාකච්ඡා කරන්නේ, මිත්‍රශීලීව කථා කරන්නේ, අදහස් බෙදාගන්නේ කොහොමද කියලා ජනාධිපතිතුමා දන්නවා. හැබැයි, ඒගොල්ලන් දන්නේ නැහැ. ඒගොල්ලන් බණිනවා. ඒ නිසා ඒක නවත්වාගන්න කියලා ඒ අයට කියන්න.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நான் ஒன்றைச் சொல்ல விரும்புகிறேன். சம்பள அதிகரிப்பு விடயம் சம்பந்தமாக TPA கட்சிக்கு ஆர்வம் பெரிதாகக் கிடையாது. ஏனென்றால், நாங்கள் சம்பள நிர்ணய சபையிலும் இல்லை; கூட்டு ஒப்பந்தச் செயற்பாட்டிலும் இல்லை. காரணம், தொழிலாளர்களாக இருப்பவர்கள் நிரந்தரத் தொழிலாளர் களாக இருக்கக் கூடாது; அவர்கள் அந்த நிலைமையில் இருந்து மாறி, பங்காளராக மாற வேண்டும் என்பதுதான் எங்களுடைய கொள்கையாக இருக்கின்றது. அவர்கள் 200 வருடங்களாகப் பரம்பரை பரம்பரையாக அப்படியே தொழிலாளர்களாக வாழ்ந்து மடியக் கூடாது. அவர்கள் பங்காளர்களாக மாற வேண்டும். தோட்டத் தொழில் துறை கூட்டுறவு முறைமைக்கு மாற்றப்பட வேண்டும். System change என்று சொல்லி ஆட்சிக்கு வந்த இந்த அராசங்கத்தால்தான் அதைச் செய்ய முடியும். செய்யுங்கள்! கூட்டுறவு முறைமைக்குத் தோட்டத் தொழில் துறையை மாற்றி, அதன்மூலமாக அவர்களைச் சிறு தோட்ட உடைமை யாளர்களாக மாற்றி, பங்களாராக மாறுவதுதான் நிரந்தரமான தீர்வென்று நான் நினைக்கிறேன். அதைவிடுத்து, ஒவ்வொரு வருடமும் 1,000 ரூபாய், 2,000 ரூபாய் 3,000 ரூபாய் என்று சண்டையிட்டுக் கொள்வது நியாயமானதல்ல என்பது என்னுடைய கொள்கையாக இருக்கின்றது. அதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும்.

அதேபோல, இந்தச் சம்பள விடயத்துக்கு அப்பால் கௌரவ அமைச்சர் அவர்கள் இங்கு இருக்கும்போது காணி விடயம் சம்பந்தமாகச் சொன்னேன். அவர் இந்த வருடம் மார்ச் மாதத்திலே கொண்டுவரப்பட்ட இடைக்காலப் பாதீட்டின் போது டிசம்பர் 31க்கு முன்னர் 6,000 வீடுகள் கட்டித் தருவதாக உறுதியளித்தார். ஆனால், செய்ய முடியவில்லை. அந்த வாக்குறுதி நிறைவேறாத வாக்குறுதியாகப் போனது. மலையகம் அதை அறிந்துகொள்ள வேண்டும். நாங்கள் கோபப்படவில்லை. உங்களால் சொன்னதைச் செய்ய முடியவில்லை; நல்லெண்ணத்தில் சொன்னதைச் செய்ய முடியவில்லை. பரவாயில்லை! ஆனால், அடுத்த வருடம் எத்தனை வீடுகள் கட்டுவீர்கள் என்று சொல்ல வேண்டும். ஏனென்றால், தயவுசெய்து எங்களுடைய மக்களின் பிரச்சினைகளைச் சம்பளம் என்ற விடயத்தில் மாத்திரம் முடக்க வேண்டாம். அவர்கள் ஒரு தேசிய இனம்! நீங்கள் ‘மலையகம்’ என்ற வார்த்தையை அடிக்கடி சொல்கிறீர்கள்; அது நல்ல விடயம். அந்த வார்த்தையைக் கண்டுபிடித்தது நீங்கள் அல்ல, நாங்கள்! அரச ஆவணத்தில் அதனைக் கொண்டுவந்தது நீங்கள் அல்ல, நாங்கள்! இருந்தாலும், நீங்கள் அதைச் சொல்வது நல்ல விடயம். ஆனால், ‘மலையகம்’ என்பது வெறும் புவியியல் பகுதியல்ல, அது ஓர் இன அடையாளம்! அரசியல் அடையாளம்! இலங்கையில் வாழும் ஈழத் தமிழர்களையும் மலையகத் தமிழர்களையும் சேர்த்துத்தான் ‘இலங்கைத் தமிழர்’ என்ற அடையாளம்! ‘ஈழத் தமிழர்’, ‘மலையகத் தமிழர்’ என்பது உள்ளக அடையாளம் என்பது என்னுடைய நிலைப்பாடாக இருக்கின்றது. பிரச்சினை இல்லை! ஆகவே, அதைச் செய்யுங்கள்!

இங்கே பாருங்கள்! பெருந்தோட்டப் பிராந்தியத்திற்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபை - වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය - என்ற

அதிகாரசபையொன்று இருக்கின்றது. இந்த அதிகாரசபையை மூடி ஒழித்துவிட இந்த அரசாங்கம் முயற்சி செய்தது. நாங்கள் அதை எதிர்த்துக் குரல் கொடுத்ததோடு, TPA கட்சியின் தலைவர் என்ற வகையிலே மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்களுக்கும் நான் கடிதம் எழுதினேன். அதில், அப்படிச் செய்ய வேண்டாம். அந்த அதிகாரசபை அவசியமானதென நான் அவருக்கு நிரூபித்திருந்தேன். அதற்கு உடனடியாக, "உங்களது கடிதம் கிடைத்தது. நாங்கள் அதைக் கவனத்தில் எடுக்கிறோம்" எனப் பதில் அனுப்பியிருந்தார். இன்று பாருங்கள்! அந்த அதிகாரசபைக்குக் கடந்த ஆட்சிக் காலத்தில் ரணில் விக்கிரமசிங்க அவர்கள் ஒதுக்கிய அதேயளவு நிதிதான் மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களும் ஒதுக்கியிருக்கின்றார்.

ගරු ඇමතිතුමා, ඒක තේරුම් ගන්න. පසුගිය වකවානුවේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙන් කරපු රුපියල් මිලියන 5ක මුදල තමයි මෙවරත් ඔබතුමන්ලා වෙන් කර තිබෙන්නේ. ඒක වහන්නේ නැහැ, අයින් කරන්නේ නැහැ කියලා ඔබතුමන්ලා අපට පොරොන්දුවක් දුන්නා වුණාට, යටි අරමුණ වෙලා තිබෙන්නේ ඒක වහලා දමන්න තමයි. එක්කෝ ඔබතුමාට තිබෙනවා, ඒ අරමුණ. එහෙම නැත්නම් ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්ට - ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහත්මයාට- තිබෙනවා. අපි ඒ ගැන දන්නේ නැහැ. ඒක තේරුම් ගන්න. මේක අපි පෙන්වලා දෙන්න ඕනෑ. මම පාර්ලිමේන්තුවට ආවේ පොල් ගාන්න නොවෙයි නේ. අපි මේවා කියලා දෙන්න ඕනෑ නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම එතුමාගේ කථාවට බාධාවක් කරන්න බලාපොරොත්තු වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි මට,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
බාධා කරන්න, බාධා කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ඔබතුමා අපෙන් අහපු ප්‍රශ්න ටිකට නිසි පැහැදිලි කිරීමක් කළොත් හොඳයි කියලා මම හිතනවා. එකක් තමයි, වතු නිවාස සම්බන්ධ කාරණය. අපට ඇත්තටම 2025දී සැලැස්මක් තිබුණා, නිවාස 4,700ක් හදන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාදේශීය ලේකම්වරු ප්‍රමුඛ 5දෙනෙකුගෙන් යුත් කමිටුවකින් ප්‍රතිලාභින් 4,700ක් ඒකට තේරුවා. ඒ සියලු තොරතුරු අපි ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට භාර දුන්නා. අධි නාය යෑම් අවදානමේ ඉන්න පවුල් ටිකම තමයි අපි තේරුවේ. පරණ නිර්ණායකවල තිබුණා, ඒ අය වතු කම්කරුවෙක්ම විය යුතුයි ආදී වශයෙන් කොන්දේසි ටිකක්. ඒවාත් ඇතුළත් කර තෝරා ගන්න තිබුණු වටිනාම කණ්ඩායමකට - අධි අවදානමේ සිටින කණ්ඩායමකට - නිවාස දෙන්නයි අපි ගියේ. නමුත්, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට යම් යම් පාර්ශ්ව විසින් ගිහිල්ලා වෙනත් නොයෙක් කරුණු පෙන්වා දීලා තිබුණා. ඒ ප්‍රශ්නයත් එක්ක ඒ කටයුත්ත වළක්වනු ලැබුවා. ඒ අනුව තමයි අපි පසුගිය දවස්වල බණ්ඩාරවෙලදී 2,056කට නිවාස හදා දීමේ හිමිකම් පත්‍ර ලබා දුන්නේ. ඒ නිසා අපට සියයට සියයක්ම බැරි වුණත්, අපි සියයට 50ක කොටසක්වත් එතැනදී දිනා ගත්තාය කියන එක ඔබතුමාට මම පැහැදිලි කරන්නම ඕනෑ. පසුගිය වර්ෂයේ නිවාස 1,300ක් හැදීමේ වැඩසටහනේ පැන නැඟුණු යම් යම් ගැටලු ගැන ඊයේත් අපි සාකච්ඡා කළා. ඉදිකිරීම් දැන් කොන්ත්‍රාත් ක්‍රමයට නේ යන්නේ. ඒවා භාර ගත්ත අයගේ යම් යම් ඉතිරි කොටස් තිබෙනවා. ඒ කටයුතු ටික කරගෙන යනවා.

ඒ වාගේම ඔබතුමා දැන් මතු කරපු වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් පැහැදිලි කළොත්, ඔබතුමා පිළිගනීවි ඇත්තටම ඒකට ඉතිහාසයේ Budget line එකක් වෙනම තිබුණේ නැහැ කියන එක. පළමුවෙනි වතාවට තමයි Budget එකට ඒක ගෙනාවේ. ඉස්සර ඒක Budget line එකේ තිබුණු එකක් නොවෙයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඉස්සර තිබුණා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
නැහැ, තිබුණේ නැහැ. ඉතිහාසයේ පළමුවෙනි වතාවට තමයි වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය Budget line එකට ගෙනාවේ. මෙවර තමයි ඉතිහාසයේ පළමුවෙනි වතාවට ඒකට වෙනම,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගිය අවුරුද්දේත් තිබුණා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
නැහැ, ගිය අවුරුද්දේ තිබුණේ නැහැ. ඔබතුමා හොඳට බලන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
රුපියල් ලක්ෂ 50ක් වෙන් කරලාත් තිබුණා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
නැහැ. මෙවර Budget එකෙන් තමයි Budget line එකක් හැටියට අපි මුදල් වෙන් කළේ. ඒ හින්දා අපේ අරමුණ හැටියට තිබෙන්නේ ඒක ශක්තිමත් කරලා ආයතනයක් හැටියට පවත්වා ගෙන යන්නයි. ඔබතුමාත් ඒකට ලියුම් එවා තිබුණා. බොහොම ස්තුතියි. ඒක අහෝසි කිරීමේ තැනක අපි නැහැ.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒක අහෝසි කරන තැනක නැත්නම් අපි සතුටු වෙනවා. ප්‍රශ්නයක් නැහැ. හැබැයි, Budget line එකේ තිබුණා. ඔබතුමා හොඳට check කරන්න. ඒකට රනිල් වික්‍රමසිංහ

[ගරු මනෝ ගනේසන් මහතා]

ජනාධිපතිතුමාගේ කාලයේ රුපියල් ලක්ෂ 50ක් වෙන් කර තිබුණා. ඒ වෙන් කිරීම තමයි මෙවරත් කරලා තිබෙන්නේ. ඒකයි මම පෙන්වා දෙන්නේ.

අනෙක් කාරණය තමයි, ඔබතුමන්ලාගේ ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාට Planters' Association of Ceylon එකෙන් ලියුමක් එවා තිබෙනවා. ඒගොල්ලන් කියනවා, මේ අධිකාරිය පිළිගන්න බැහැ කියලා. ඒගොල්ලන් කවුද එහෙම කියන්න? ඒගොල්ලන්ට එහෙම කියන්න තිබෙන අයිතිය මොකක්ද? මම දන්න විධියට කවුරු හරි ඒගොල්ලන්ට කියලා ලියුමක් ගෙන්වා ගෙන තිබෙන බව තමයි අපට පේන්නේ. අපි එහෙමයි හිතන්නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න කෝ. මගේ මතය මට කියන්න ඉඩ දෙන්න කෝ. එහෙමයි මට පේන්නේ. කවුදෝ එහෙම ලියුමක් ලියන්න කියලා ඉල්ලනවා. මේ අධිකාරිය නැති කරන්න උත්සාහ කරනවා. ඇමතිතුමා, අධිකාරිය කියන්නේ,- අලුත් ආයතනයක් නේ හදලා තිබෙන්නේ. ආයතන කිහිපයක් රටේ හදනවා නේ. ඔබතුමන්ලාත් අලුත් ආයතන හදනවා නේ. ඕනෑ නම් හදනවා නේ. ඕනෑ නැත්නම් වහලා දමනවා නේ. ඒ වාගේ අලුත් ආයතන හදන්න පුළුවන් නේ. ඒවා හදනකොට හෙමින් හෙමින් තමයි Budget line එකට එන්නේ. මේකේ වෙන මොනවත් කාරණා නැහැ. මේ, දුෂ්කර ජන කණ්ඩායමක්. මේගොල්ලන්ගේ අවසාන පිරිසට ප්‍රජා අයිතිය ලැබුණේ 2003දී. ඒගොල්ලන්ගේ වතු පාසල්වල අවසාන කොටස ජාතික පද්ධතිය තුළට ඇතුළු වුණේ 1947දී. We are late starters. Therefore, our performances are low. ඔබතුමන්ලා මේවා දැනගන්න. වෙන කාරණාවක් නැහැ.

අපේ performance low; දියුණුව අඩු වෙලා තිබෙන්නේ. දියුණුව අඩුයි කියලා කියන්නේ, නිවාසවලින් පමණක් නොවෙයි. නිවාස, ඉඩම, අධ්‍යාපනය හා සෞඛ්‍ය මේ හැම තැනකම අඩුවීම තිබෙනවා. ඒ නිසා අමාත්‍යාංශ අටක් සම්බන්ධ කරගෙන, coordinate කරගෙන, ඒ ගොල්ලන් දියුණු කරන්න ඕනෑ කියලා, ඒ මතය උඩ තමයි අපි මේක හැදුවේ. අධිකාරිය අපේ කාලයේ අපි හැදුවේ. ඒ නිසා මේ අධිකාරිය හදපු විශේෂ කාරණාවේ හරය මොකක්ද කියලා තේරුම් අරගන්න. නැත්නම් මේක කරන්න බැහැ නේ. ඒක තේරුම් අරගත්තා නම්, මේකට විරුද්ධව වැඩ කරන්නේ නැහැ. ඒ නිසා මේ ආයතනය තවදුරටත් වැඩි දියුණු කරගෙන, වැඩ කරගෙන යන්න. ප්‍රශ්නයක් නැහැ.

අනෙක් එක තමයි, අර මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ, අපි TPA එක - Tamil Progressive Alliance එක - හැටියට විතරයි ආණ්ඩුවේ හිටියේ; අපි කොටස්කාර පක්ෂයක්. දැන් ඔබතුමන්ලාගේ NPP ආණ්ඩුවේ JVP එකත් ඉන්නවා, තව කණ්ඩායම් ඉන්නවා නේ. ඒ වාගේ අපිත් හිටියා. අපේ පක්ෂයෙන් රටේ ජනාධිපති වෙලා නැහැ, අගමැති වෙලා නැහැ. ඒ නිසා ඒ කාලයේ වෙච්ච පව් ටික ඔක්කොම අපේ ඔළුවට දමන්න එන්න එපා. ඒක හොඳට අවබෝධ කර ගන්න. එදා ජනාධිපතිතුමා කථා කරනකොට, මම නැඟිටලා ප්‍රශ්න කරන කොට, මම කවුද කියලා කිව්වා නේ. ඒ නිසා ඒක තේරුම් අරගන්න. අපි එහෙම නොවෙයි. අනෙක් එක තමයි, සමගි ජන සන්ධානය කියන්නේ, UNP එකම නොවෙයි. UNP එකෙන් ඉවත් වෙච්ච ප්‍රගතිශීලී කණ්ඩායමක් ඒක. ඒක තේරුම් අරගන්න. ඒකේ තමයි අපිත් කොටස්කාරයෝ වෙලා ඉන්නේ. ඒ නිසා මේවා අවබෝධ කරගෙන කථා කරන්න. නිකම් කට තිබෙන පළියට නැඟිටලා අත දික් කරලා ඔක්කොම හොරු කියලා කියන්න එපා. ඒක වැරැදියි. ඒක හොඳ නැහැ. එහෙම කියන කොට අපිත් ප්‍රශ්න කරන්න ඕනෑ නේ, අහන්න ඕනෑ නේ. අපි අහන කොට තරහ වෙන්නත් එපා, කේන්ති ගන්නත් එපා. මොකද, උදේත් මම කිව්වා කේන්ති ගන්න එපා කියලා. ඔබතුමා මට කියනවා මම කේන්ති ගන්නවා කියලා. මම කේන්ති ගන්නේ නැහැ. මම ආවේ විෂය ගැන කථා කරන්න. මම ජනතාව වෙනුවෙන් කථා කරන්නේ, වෙන මොනවත් නැහැ. ඒක තේරුම් අරගන්න.

කරුණාකර මලයගම් ජනතාවගේ දියුණුව පඩිවලට පමණක් සීමා කරන්න එපා. පඩි දුන්නා නම් හරි කියලා හිතන්න එපා. පඩි දෙන්න, company එකේ account එකෙනුත් දෙනවා, ආණ්ඩුවේ account එකෙනුත් දෙනවා. ඒ ගැන ගැටලුවක් තිබුණා නම්, ඒකට බාධාවක් නොවන විධියට වග බලා ගන්න. ඔබතුමන්ලාගේ වගකීම ඒක. ප්‍රශ්නයක් නැහැ, අපි ප්‍රශංසා කරනවා. ඒක හොඳයි, නරක නැහැ. නමුත්, ඔබතුමන්ලා ඊට එහා හිතන්න ඕනෑ. ඒ අයට ඉඩම් අයිතිය ලබා දෙන්න ඕනෑ, ගෙවල් හදලා දෙන්න ඕනෑ. ගෙවල් හදලා දෙන්න ඕනෑ කරන මුදල් සම්බන්ධයෙන් ඉන්දියාවෙන් ඔබතුමන්ලාට උදවු උපකාර ලැබෙනවා. ඒ කවුද සාකච්ඡා කළේ? නරේන්ද්‍ර මෝදි අගමැතිතුමා එක්ක සාකච්ඡා කළේ අපි. අපි සාකච්ඡා කරලා ඒක ලබා දුන්නේ. කමක් නැහැ. ඒ ලබා දුන්නේ මට නොවෙයි, අපේ පක්ෂයට නොවෙයි, ශ්‍රී ලංකා ආණ්ඩුවට. දැන් ආණ්ඩුව භාරව ඉන්නේ ඔබතුමන්ලා. ඔබතුමන්ලා ඒ වැඩේ කරගෙන යන්න, ප්‍රශ්නයක් නැහැ.

හැබැයි, ඉතිහාසය අමතක කරන්න එපා. අපි මොනවත් කළේ නැහැ කියලා කියන්න එපා. අපි කරලා තිබෙනවා; හුඟක් දේවල් කරලා තිබෙනවා. ඒ අයට අවශ්‍ය ප්‍රාදේශීය සභා ලබා දීලා තිබෙනවා, ලේකම් කාර්යාල ලබා දීලා තිබෙනවා, පාසල් ලබා දීලා තිබෙනවා, පාසල්වලට ඉන්දියාවෙන් උදවු උපකාර ලබා දීලා තිබෙනවා. ඒවා ගණන් හදලා බලන්න. ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය පමණක් නොවෙයි නේ සම්බන්ධ. ඔබතුමාගේ අමාත්‍යාංශයත් සම්බන්ධ වෙලා තිබෙනවා, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමාගේ අමාත්‍යාංශයත් සම්බන්ධ වෙලා තිබෙනවා, කම්කරු අමාත්‍යාංශය හැටියට. ඒ වාගේම, මුදල් අමාත්‍යාංශයත් සම්බන්ධ වෙලා තිබෙනවා. ඒවායේ ඉන්න අය මේවා දන්නවා. අපි කරපු දේවල් ඒ අය දන්නවා. ඒක පැහැදිලි කර ගන්න. එහෙම නැතුව අපි මොනවාත් කළේ නැහැ කියලා ඔබතුමන්ලා වාගේ senior ඇමතිවරුන් මේ විධියට කථා කරන නිසා තමයි, ඔබතුමන්ලා යටතේ ඉන්න, නැත්නම් ඔබතුමන්ලා සමඟ වැඩ කරන, මලයගම් ජනතාව නියෝජනය කරමින් මේ සභාවට ඇවිල්ලා තිබෙනවා කියලා හිතා ගෙන ඉන්න, මැති-ඇමතිවරුන්, මන්ත්‍රීවරුන්ට - අපට- මේ පාර්ලිමේන්තුව තුළත් පිටතදීත් කෑගහන්නේ. එතකොට ඒවාට අපට උත්තර දෙන්න වෙයි. එච්චරයි තිබෙන්නේ, වෙන මොනවත් නැහැ. ඒ නිසා ඒක පැහැදිලි කර ගන්න.

මම නැවතත් මතක් කරන්න කැමැතියි, කරුණාකරලා අපේ ජනතාවගේ බලාපොරොත්තුව, වුවමනාව, කැමැත්ත, ගමන පඩිවලට පමණක් සීමා කරන්න එපා, ඊට එහා හිතන්න කියලා. ඒ අයගේ ඉඩම් අයිතිය ලබා දෙන්න. ඒ ඉඩම් අයිතිය සීමා කරන්න එපා. අර plantation companies කියන විධියට වැඩ කරන කම්කරුවන්ට පමණක් නොවෙයි, හැමෝටම අවශ්‍යයි ඉඩම්. ඔබතුමන්ලාගේ "හැටන් ප්‍රකාශනය" තුළත් ඒක පැහැදිලිව කියලා තිබෙනවා. ඒක පාවා දෙන්න එපා. වතු ප්‍රදේශවල ලක්ෂ 10ක් ජීවත් වෙනවා. ඒකෙන් ලක්ෂ එකහමාරයි කම්කරුවෝ ඉන්නේ. ඉතුරු අයත් ජීවත් වෙන අය. එතැන හැමෝටම ඉඩම් අවශ්‍ය වෙනවා. ඒ ගොල්ලොත් ශ්‍රී ලාංකිකයෝ නේ. පිටරට මිනිස්සු නොවෙයි නේ. ඔබතුමන්ලා ඒ කාලයේ පන්ති පහක් හදලා, ජනතා විමුක්ති පෙරමුණ පටන් ගන්න කොට, දෙවැනි පන්තියේ තිබුණේ ඉන්දියානු ජාතිවාදය. ඒක හදලා ගත්තේ ඔබතුමන්ලා තමයි. ඒ කළු ඉතිහාසය අපි දන්නවා. මම ඒවා මතක් කරන්න කැමැති නැහැ. ඒක ඉතිහාසයට භාර දෙනවා. නමුත්, ඉස්සරහට යන්න ඕනෑ. ඒක තේරුම් අරගන්න.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලුතිනන් කමාන්ඩර් විශ්‍රාමික ප්‍රගීත් මධුරංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කියවුණේ නැහැ.

[අ.භා. 2.13]

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2026 අය වැය ලේඛනය සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ මටත් කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඔබතුමියට බොහොම ස්තුතියි.

පළමුකොටම මම මේ කාරණය සඳහන් කරන්නට ඕනෑ. මීට පෙර කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් පොඩි අදහසක් දැක්වුවා, ශ්‍රී ලංකා පොලීසිය සහ ත්‍රිවිධ හමුදාව යම් අවස්ථාවල මත්ද්‍රව්‍ය ව්‍යාප්ත කිරීමට සම්බන්ධ වීමක් ගැන. ඒක සමාජගත කරන්නට වාගේ උත්සාහ කරලා කථා කළා. ඒ ගැන නිවැරදි කිරීමක් කරන්නට ඕනෑ, මමත් ඒ ක්ෂේත්‍රයේ හිටපු පුද්ගලයෙක් වශයෙන්. ඉතාම විනය ගරුක, ඒ වාගේම වෘත්තීය නිපුණතාවකින් යුත් ත්‍රිවිධ හමුදාවක් සහ පොලීසියක් තමයි අපේ ශ්‍රී ලංකාව තුළ ඉන්නේ. ඔවුන් "රටම එකට" ජාතික ව්‍යාපාරය හරහා රටම වනසන මත්ද්‍රව්‍ය ව්‍යාපාරය නීත්‍යනුකූලව වළක්වන්නට සැදී පැහැදී දිවා රෑ නොබලා වෙහෙස මහන්සි වෙලා වැඩ කටයුතු කරනවා. යම්, යම් තැන්වල ගැටලු තිබෙන්න පුළුවන්. හැම කොට්ඨාසයකම මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙච්ච, ඒ ව්‍යාපාරවලට සම්බන්ධ වෙච්ච පුද්ගලයන් ඉන්න පුළුවන්. එහෙම මොනවා හරි තිබෙනවා නම්, ඒ ගැන අප දැනුවත් කරන්න. තරාතිරමක් බලන්නේ නැතිව ඒකට අවශ්‍ය කටයුතු කරන්නට අපි සූදානම්. නමුත් සමස්තයක් වශයෙන් ඒ චෝදනාව ත්‍රිවිධ හමුදාවට සහ පොලීසියට එල්ල කරන්නට එපා කියන යෝජනාව කරන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි -ජාතික ජන බලවේගය රජය- මේ රට භාර ගත්තේ ඉතාම බැරෑරුම් අවස්ථාවක. මොකද, අපි මේ රට භාර ගනිද්දී රටේ ආර්ථික පදනම දෙදරා ගොස් තිබුණේ. ඒත් එක්කම දශක ගණනාවක් පැවැති සාර්ව ආර්ථික අස්ථාවරභාවයක් තිබුණා. ඒත් එක්කම රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා තිබුණා. ව්‍යුහාත්මක අසමතුලිතතා තිබුණා. පැවති පාලනවල දැඩි දුර්වලතා හේතුවෙන් සමස්ත ආර්ථිකයම දැඩි අවදානම් තත්ත්වයකට මුහුණ පා තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අස්ථාවරත්වය හේතුවෙන් ජනතාවගේ සිතුම් පැතුම් බොඳ වී සුණුවිසුණු වී ගිය, වැටුණු රටක් තමයි ඇත්තටම අපට භාර ගන්නට ලැබුණේ. ඒක කොයි තරම්ද කියනවා නම් Fitch Ratings අනුව ගත්තාම, ශ්‍රී ලංකාවේ දිගුකාලීන විදේශ මුදල් නිකුත් කරන්නන්ගේ ණය පැහැර හැරීමේ ශ්‍රේණිගත කිරීම, සීමිත පැහැර හැරීමේ තත්ත්වයට, ඒ කියන්නේ restricted default කියන තත්ත්වයට පහළ දමලා තිබුණා. ඒත් එක්කම Moody's ආයතනය ආයෝජන සේවාව දිගුකාලීන විදේශ මුදල් නිකුත් කරන්නන්ගේ ශ්‍රේණිගත කිරීමෙන් අපි පහළ මට්ටමකට දමලා තිබුණා. S&P දර්ශකයේත් වරණීය පැහැර හැරීම -selective default - කියන තත්ත්වයට අප පත් කරලා තිබුණා, අපි රට භාර ගනිද්දි.

අපේ ගරු ජනාධිපතිතුමා සහ ජාතික ජන බලවේගය රජය මේ රට භාර ගැනීමෙන් පසුව ශ්‍රී ලංකාව ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම්වල CCC Plus දක්වා ඉහළ තැනකට නංවාලන්නට ඒ ශ්‍රේණිගත කිරීමේ ආයතන කටයුතු කළා. ඒත් එක්කම Moody's ආයතනය අපි ස්ථාවර දැක්මක් සහිතව කටයුතු කරන රජයක් විධියට සහ ස්ථාවර ආර්ථික තත්ත්වයක් ඇති රජයක් විධියට දැකලා අපේ ණය ශ්‍රේණිගත කිරීම ඉහළ දමන්නට කටයුතු කළා. ඒ තුළින් ශ්‍රී ලංකාවට පුළුවන්කම ලැබුණා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝක වෙළෙඳ පොළට යළි පිවිසෙන්නට සහ ලෝක වෙළෙඳ පොළේ යම් කොටසක් නැවත අත්පත් කර ගන්නට. අන් කිසිවක් නිසා නොවෙයි අපට එම අවස්ථාව ලැබුණේ. කවුරු මොනවා කිව්වත්, ලංකාව ඒ තත්ත්වයට ඔසවා තබන්නට අපට හැකි වුණේ සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීමට ජාතික ජන බලවේගය රජය තුළ තිබෙන දැඩි කැපවීම නිසායි. ඒත් එක්කම රාජ්‍ය මූල්‍ය විනය දිගින් දිගටම ශක්තිමත් කිරීමට අපි කරන්නා වූ කැප කිරීම තුළ. රාජ්‍ය ආයතන ශක්තිමත් කරන්නට මේ රජය දිගින් දිගටම නිරන්තරයෙන් කරන කැපවීම තුළ. දූෂණයට තිත තබමින් විනිවිදභාවය ඉහළ නැංවීමට කරන්නා වූ කැපවීම තුළ. ඒත් එක්කම ජනතාව කෙරෙහි වගවීම තහවුරු කිරීම සහ ඉතා පුළුල් වූ ප්‍රතිසංස්කරණ වෙනස්කම් රජය මඟින් ආරම්භ කිරීම නිසා තමයි මේ කඩා වට්ටලා තිබුණු අපේ රටට,- කඩා වැටුණු රටක් නොවෙයි කඩා වට්ටපු රටක්- ණය ශ්‍රේණිගත කිරීම්වල ස්ථාවර තත්ත්වයකට එන්නට පුළුවන්කම ලැබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ කරුණු තුළින් අපට කෙටි කාලයක් ඇතුළත රාජ්‍ය මූල්‍ය ශක්තිමත් කරන්නට පුළුවන්කම ලැබුණා. සාර්ව ආර්ථිකය සහ සමාජ ස්ථාවරත්වය යළි ස්ථාපිත කරන්නට අපි හැකි වුණා. ඒ තුළින් ආර්ථිකයේ සියලු අංශවල වර්ධනයක් ඇති කරගන්නට අපට ලැබුණු හැකියාවත් එක්ක දළ දේශීය නිෂ්පාදිතය සියයට 4.8කින් ප්‍රසාරණය කරගන්නට අපට හැකියාව ලැබුණා. ඒත් එක්කම අපනයන ආදායම වැඩිවීම, සංචාරක ආදායම වැඩිවීම, විදේශ ප්‍රේෂණ වැඩිපුර ගලා ඒම හේතුවෙන් දළ නිල සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන හයකට වඩා වැඩි මට්ටමක රඳවාගන්නට අපට හැකියාවක් ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇමෙරිකානු ඩොලර් බිලියන හයකට වඩා වැඩි තත්ත්වයකට අපි අපේ දළ නිල සංචිත ප්‍රමාණය වැඩිකර ගත්තේ සීමා කරපු ආර්ථිකයක් තුළ නොවෙයි.

සීමා කරපු ආර්ථිකයක් තුළ නම් මේ වෙද්දී අපට පුළුවන්කම ලැබෙනවා මේ ප්‍රමාණය ඩොලර් බිලියන 8කට, 9කට එහා ගෙන යන්න. නමුත් මේ ආර්ථිකයේ අනෙක් වැඩ කටයුතු කරන ගමන්, රථවාහන ගෙන්වන්නට වෙළෙඳ පොළ විවෘත කිරීම ආදිය කරන ගමන් තමයි අපි සංචිත ප්‍රමාණය වැඩි කරගෙන තිබෙන්නේ. වාහන ගෙන්වීම උදාහරණයක් විධියට ගෙන බැලුවොත්, මේ වෙද්දී ඩොලර් බිලියන 2.5කට ආසන්න ප්‍රමාණයක LCs open කරලා තිබෙනවා. අන්න ඒ විධියට, ආර්ථිකයේ වැඩ කටයුතු සීමා නොකර ආර්ථිකය ඉදිරියට ගලා යන්නට අවස්ථාව සලස්වමින් තමයි අපි මේ ඩොලර් බිලියන 6කට වඩා වැඩි සංචිත ප්‍රමාණයක් ඇති කරලා තිබෙන්නේ.

[ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2006 වසරේ සිට දශක 2කට පසුව තමයි දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 16ක රාජ්‍ය ආදායමක් අප මෙසේ අත්පත් කර ගනිමින් සිටින්නේ. ඒත් එක්කම, රජය විසින් කරන්නා වූ ඉතාම ඉහළ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දේශීය ආදායම් එක් රැස් කිරීමට දරන්නා වූ දායකත්වය ශක්තිමත් කිරීම, ඩිජිටල්කරණය, රාජ්‍ය වියදම් කළමනාකරණය මඟින් ඉහළ ප්‍රාථමික අතිරික්තයක් වාර්තා කිරීමට රජය විධියට අපි සමත් වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම ප්‍රාථමික අතිරික්තය මේ වන විට නිරන්තරයෙන් අඛණ්ඩව ඉහළ යෑමට ලක් වෙලා තිබෙනවා. ඒත් එක්කම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රජයේ ණය ප්‍රමාණය 2022 වර්ෂයේ සිට පැවතුණේ සියයට 114.2ක අගයක. එම අගය 2026 වසර වන විට සියයට 96.8ක් දක්වා කැපී පෙනෙන ලෙස අඩු කර ගන්නට අපි මේ කරපු ප්‍රතිසංස්කරණ සහ කරපු කැපවීම හේතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ඉදිරිපත් කර තිබෙන 2026 අය වැය ප්‍රධාන උපාය මාර්ගික අරමුණු 6ක් යටතේ ගළපා වැඩ කරගෙන යෑමට තමයි අප කටයුතු සකස් කරලා තිබෙන්නේ. ඒකේ පළමුවැනි උපාය මාර්ගය තමයි, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක් ලබා ගැනීම. අපි සියයට 7ක් ඉක්මවා යන ආර්ථික වර්ධනයක් ළඟා කර ගනිමින් එහි ප්‍රතිලාභ රටේ සෑම ප්‍රදේශයකම, සෑම ජන කොට්ඨාසයකම හඬක් නොමැති, හඬක් ඇති සියලු ජනතාව වෙත බෙදී යන ආකාරයට සහතික කිරීමට අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යනවා. ඒ සඳහා ජන සහභාගිත්වයෙන් ආර්ථිකය වර්ධනය කිරීම, සියලු ක්ෂේත්‍රවල ඵලදායිතාව ඉහළ නැංවීම, නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කිරීමට 2026 අය වැයෙන් යෝජනා කර තිබෙනවා. ඒත් එක්කම පෞද්ගලික අංශය සහභාගි කරවාගත් ආයෝජන රජයේ ආර්ථිකය මෙහෙයවන ප්‍රධාන බලවේගය බවට පත් කර ගන්නටත් අපි යෝජනා කර තිබෙනවා.

අපේ දෙවැනි උපාය මාර්ගික අරමුණ තමයි, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් ලබා ගැනීම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මුදල් විශුද්ධිකරණයට එරෙහි රාමුව 2026දී තවත් ශක්තිමත් කරන්නට අපි යෝජනා කර තිබෙනවා. ඒත් එක්කම, ජාතික අපනයන සංවර්ධන සැලැස්ම - 2025 මඟින් වෙළෙඳ පොළ පුළුල් කර ගැනීමට කටයුතු කරනවා. ඒ වාගේම, ජාතික තනි වෙළෙඳ කවුළුව - Trade National Single Window System - ඇති කිරීම තුළින් සියලු ආයෝජකයන්ට එකම බිමක, සම බිමක ආයෝජනය කරන්න හැකි වෙනවා. පසුගිය රජයයන් කාලයේ ඒ සඳහා සම බිමක් තිබුණේ නැහැ, විසම බිමක් තිබුණේ. ඔවුන්ගේ හිතවතුන්ට බදු සහන සහ වරප්‍රසාද දෙන වාතාවරණයක් තිබුණේ. නමුත්, මේ ජාතික තනි වෙළෙඳ කවුළුව -Trade National Single Window System - තුළින් සියලුදෙනාට සම බිමක් ඇති කරන්නට රජය බලාපොරොත්තු වෙනවා. රජය ඒ සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ 3වැනි උපායමාර්ගික අරමුණ තමයි, ණය තිරසරභාවය සහතික කිරීම. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2022 වර්ෂයේදී ප්‍රකාශ කර තිබෙනවා, ලංකාව තුළ ණය තිරසරභාවයක් නොමැති බවට. ණය තිරසරභාවයක් නැහැ කියා ඒ අය ප්‍රකාශ කර තිබෙන්නේ පසුගිය රජයන් කර තිබුණු වගකීම් විරහිත, ප්‍රමුඛතා නොවන ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කිරීම වාගේ දේවල් නිසායි. ඒත් එක්කම, ලබා ගත් ණයවලින් අවශ්‍ය වත්කම් ඉපැයීමක් කරගෙන නොතිබීම සහ ඒ ආරම්භ කර තිබෙන ව්‍යාපෘති නියම කාලයට අවසන් නොකිරීම නිසායි. නමුත් අපි රජය විධියට ණය තිරසරභාවය තහවුරු කිරීම සඳහා මේ වන විට පැහැදිලි සැලැස්මක් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ආයතනය මඟින් සකස් කර තිබෙනවා. ඒ සඳහා තවත් වැඩ කටයුතු කරමින් පවතිනවා.

2028දී ණය ගෙවීමට නොහැකි බවට සමහර උදවිය යම් යම් ප්‍රකාශ නිකුත් කරනවා. ඒ සම්බන්ධයෙන් යම් යම් මත සමාජගත කරන්නට සමහර උදවිය උත්සාහ ගනිමින් සිටිනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. 2024දී විදේශීය ණය සේවාකරණය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,674ක් රජය විධියට අපි ගෙවා තිබෙනවා. 2025 වසරේ විදේශීය ණය සේවාකරණය ඩොලර් මිලියන 2,435ක් වනවා. ඒ ඩොලර් මිලියන 2,435න් සැප්තැම්බර් 30වන විට ඩොලර් මිලියන 1,948ක් ගෙවා අවසන් කර තිබෙනවා. ඒත් එක්කම, 2025 දෙසැම්බර් 31වන විට ඉතිරි ඩොලර් මිලියන 487ත් ගෙවා අවසන් කරන්න අපි සූදානම් වෙනවා. ඊට අදාළව 2024 අවුරුද්දට සාපේක්ෂව මේ අවුරුද්දේ අපට තිබුණේ ඩොලර් මිලියන 761ක වැඩිවීමක් පමණයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2028 වසරේ අප විසින් ගෙවිය යුතු විදේශ ණය සේවාකරණය ඇමෙරිකානු ඩොලර් මිලියන 3,259ක් පමණයි. එය 2025 ගෙවූ ණය මුදලත් එක්ක බැලුවාම අපට තවත් වැඩි වන්නේ ඩොලර් මිලියන 824ක් පමණයි. එම නිසා 2028 වසරේ ණය ගෙවීමට අපට කිසිදු ගැටලුවක් ඇති වන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ශ්‍රී ලංකාව විසින් අත් පත් කර ගන්නා රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.3ක් හා සියයට 15.4ක් ඉක්මවා යන පරිදි පවත්වා ගැනීම කළ යුතු වෙනවා. නියමිත කාලයට රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයට පත් කිරීම මඟින් 2028 සිට 2035 දක්වා ගෙවිය යුතු වාර්ෂික පොලී අනුපාතයට සියයට 0.75ක් අඩු කිරීමක් ලබා දීමට ණය හිමියන් එකඟ වී තිබෙනවා. ඒ අනුව වසරකට ඩොලර් මිලියන 7.9ක ණය සේවාකරණයේ වාසියක් ලැබෙන බැවින් එම ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට රජය කටයුතු කරනවා.

අපගේ 4වන උපායමාර්ගික අරමුණ තමයි, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම. ඒ සඳහා අපි නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැඟීමට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඉලක්කගත සහනාධාර, අවශ්‍ය තාක්ෂණය සහ වෙළෙඳ පොළ ප්‍රවේශය ලබා දීමට කටයුතු කරනවා. මහා පරිමාණ නිෂ්පාදන සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය වර්ධනය කිරීමටත්, දේශීය නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමටත් අවධානය යොමු කරනවා.

අපගේ 5වන උපායමාර්ගික අරමුණ තමයි, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම. විශේෂ රැකවරණය අවශ්‍ය පුද්ගලයන් සඳහා ශක්තිමත් වැඩ පිළිවෙළක් සකස් කරන අතර, ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය ජාතික ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ

ග්‍රාමීය ජනතාවට ලැබෙන පරිදි 2026 වර්ෂයේදී ආර්ථිකය ගමට රැගෙන යෑම වේගවත් කිරීමට කටයුතු කරනවා. ඒ සඳහා ආර්ථික අවස්ථා බහුල කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, නිෂ්පාදන ආර්ථිකය ප්‍රවර්ධනය, සැලසුම් සහිත නාගරීකරණය, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කරනවා.

ඩිජිටල්කරණය ප්‍රවර්ධනය අපගේ 6වන උපායමාර්ගික අරමුණයි. ඩිජිටල්කරණය, ආර්ථික වර්ධනය සහ සමාජ ජීවිතය උසස් කිරීමේ උපායමාර්ගික ප්‍රවේශයක් ලෙස 2026 අය වැය මඟින් හඳුනාගෙන තිබෙනවා. එමඟින් රාජ්‍ය පාලනය හා සේවා සැපයීම වඩා විනිවිදභාවයෙන් කාර්යක්ෂමව ඉටු කරන්නට හැකි වෙනවා. රට තුළ විශාල ඩිජිටල් ආර්ථිකයක් ඇති කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එමඟින් අලුත් වෙළෙඳ පොළ සඳහා ප්‍රවිෂ්ට වෙන්න අපට පුළුවන්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.24]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපි මෙවර සභාගත කළේ අපගේ දෙවන අය වැය ප්‍රකාශයයි. අප මෙයින් ගෙන එන්න උත්සාහ කළේ, රටේ ආර්ථික ප්‍රතිපත්ති මත පදනම් වුණු වසරක වැඩ පිළිවෙළක්. එම වසරක වැඩ පිළිවෙළ හරහා සහ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය හරහා මේ රටේ ජනතාවගේ ජන ජීවිතය ගුණාත්මක වශයෙන් ඉහළ තලයකට ඔසවා තබන්න අපි බලාපොරොත්තු වෙනවා.

මේ අය වැය දිහා විවිධ අයට විවිධ කෝණවලින් බලන්න පුළුවන්. දේශපාලනික විවේචනය කෙසේ වෙතත්, මේ රටේ ප්‍රාමාණික උගතුන්ට, බුද්ධිමතුන්ට මේ අය වැය දිහා බොහොම විශ්ලේෂණාත්මකව, ආර්ථික සිද්ධාන්ත මත පදනම් වෙලා හොඳ සාධනීය විවේචන ඉදිරිපත් කරන්න පුළුවන්. ගරු ජනාධිපතිතුමා මේ අය වැය ප්‍රකාශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ, මේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රාමාණික වියතුන් බොහොම සාධනීය විවේචන ඉදිරිපත් කරලා තිබෙනවා අපි දැක්කා. මේක ආර්ථික විනයක් සහිත අය වැයක්, සාමාන්‍ය ක්ෂේත්‍රවලට වඩා, වෙන දා ඉදිරිපත් කරන අය වැය ප්‍රකාශවලට වඩා බොහොම සංවේදී විෂය ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි බොහොම පුළුල් මනසකින් බලපු අය වැයක් ආදි ප්‍රකාශ ද ඒ විවේචන අතර තිබෙනවා අපි දැක්කා.

ඒ වාගේම, "මේ ආණ්ඩුව විසින් සමස්තයක් හැටියට සාර්ව ආර්ථිකය ස්ථාවර කරලා තිබෙන බව අපි පිළිගන්නවා" කියලා ආර්ථික විද්‍යාව පිළිබඳව බොහෝ දැනුමක් ඇතැයි සමාජය පිළිගන්නා විපක්ෂයේම දේශපාලන නායකයන් ප්‍රකාශ කළා. ඒ වාගේම "හොඳ දේට හොඳයි කියන්න අපි පැකිළෙන්නේ නැහැ" කියලා ඔවුන් මේ සබා ගැබේදීම මේ අය වැය ප්‍රකාශයට යම් පිළිගැනීමක් ලබා දුන්නා; මේ අය වැය ප්‍රකාශය ගැන ධනාත්මකව අදහස් දැක්වීමක් කළා. මේක ධනාත්මක විවේචනයක් විධියට ගන්න කියලා  කියද්දී, සාර්ව ආර්ථිකයේ අරමුණු මේ ආණ්ඩුව මේ අය වැයෙන් ළඟා කරගෙන තිබෙනවා කියලා කෙනෙක් කියද්දී විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු විවිධ මතවාදවල එල්බ ගනිමින් කථා කරනවා. ඒ වාගේම, අපි බොහොම සංවේදීව මේ අය වැය හරහා විප්ලවීය තීන්දු ගන්න කොට, ඒක එහෙම කරන්න එපා කියලා ඒ අය ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා මම දන්නේ නැහැ.

අපි උදාහරණයක් ගනිමු. දශක ගණනාවක් මුළුල්ලේ තමන්ගේ ජීවිතයම මේ රටේ තේ පඳුරු අස්සේ කැප කරපු ජනතාවක් තමයි වතු කම්කරු ජනතාව කියන්නේ. අපේ රටේ වතු ආර්ථිකයේ ශක්තිමත්භාවය ගත්තොත්, එහි ජීව ගුණය තිබෙන්නේ ඒ වතු කම්කරු ජනතාව අතේ. හැබැයි, ඒ වතු කම්කරු ජනතාවට ලැයිම් කාමරයෙන් එහාට තමන්ගේ ජීවිතය පිළිබඳ බලාපොරොත්තු තිබුණේ නැහැ. වතු කම්කරු ජනතාව කියන්නේ, තමන්ගේ දේශපාලන නායකයන් බොහොම ලස්සන කථා කියන කොට අත් පොළසන් නාදයක් දෙනවා ඇරෙන්නට එතැනින් එහාට කවදාවත් තමන්ගේ ජීවිතයේ ආලෝකයක් දැක්කේ නැති පිරිසක්. ඒ අයගේ දෛනික වැටුප ඉහළ නැංවීම සඳහා අපි යම්කිසි ආකාරයක විප්ලවීය තීරණයක් ගත්තා. ඒක විප්ලවීය තීරණයක්. අපි ඒ තීරණය ගනිද්දී අපේ රටේ පොදු මහ ජනතාවගේ බදු මුදල්වලින් එම සේවකයන්ගේ වැටුප් වැඩි කරන්න එපා කියන්න තරම් හෘදය සාක්ෂියක් නැති පිරිසක්  ඒ අදහස් දැක්වීම කරන්නේ කොහොමද කියලා අපට මේ වෙලාවේ බොහොම කනගාටුදායක අදහසක් තමයි තිබෙන්නේ. කෝ, ඒ සහකම්පනය? කෝ, ඒ තෙතමනය? මේ රටේ අව වරප්‍රසාදිත ජන කොට්ඨාසයක  ජීවිතවල ගුණාත්මක පරිවර්තනීය වෙනසක් වෙනුවෙන් ආණ්ඩුව පියවරක් ගනිද්දී ඒක විවේචනය කරනවා වෙනුවට ඒකට සහාය දෙන්න කියන එක තමයි අපට මේ වෙලාවේ කියන්න තිබෙන්නේ. ඒ මහජන නියෝජිතයන්ට ජනතාවගේ ප්‍රසාදය ඕනෑ නම්, මේ කාරණය ධනාත්මකව දකින්න කියලා මම කියනවා.

සාර්ව ආර්ථිකය ගත්තොත්, අපි කියනවා මේක කුලුනු කිහිපයක එකතුවක් කියලා. ආර්ථික ස්ථායීතාව ඇති කිරීම, ආර්ථික නිදහස ඇති කිරීම, ආර්ථික සුරක්ෂිතභාවය ඇති කිරීම, සාධාරණ ආදායම් ව්‍යාප්තිය, තිරසාර සංවර්ධනය, ආර්ථික කාර්යක්ෂමතාව, ආර්ථික වෘද්ධිය වේගවත් කිරීම කියන කාරණාවලින් තමයි සාර්ව ආර්ථික අරමුණු කියන එක නිර්මාණය වෙලා තිබෙන්නේ.

එතකොට, මේ අරමුණු ළඟා කර ගැනීම සඳහා අපි ප්‍රධාන මාවත් හයක් ඔස්සේ මේ අය වැය හරහා වසරක සැලසුම එළලා තිබෙනවා. ඒ තමයි,  තිරසර, සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධන වේගයක් කියන සැලසුම. මේ වෙනුවෙන් අද මේ වෙනකොට අපි අපේ රට සංචාරක ගමනාන්තයක් බවට පමණක් පත් කරන්න නොවෙයි, හොඳම සංචාරක ගමනාන්තය බවට පත් කරන්න පියවර අරගෙන තිබෙනවා. ඒ සඳහා අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක් ළඟා කරගෙන, එහි ප්‍රතිලාභ සෑම ජන කොට්ඨාසයකටම ලබා දෙන්නට අවශ්‍ය සැලසුම් අපි සකස් කරලා තිබෙනවා. වැදගත්ම කාරණය තමයි "ණය ගෙවන්න බැහැ" කියලා හැමෝම කියද්දී අපි ණය තිරසරභාවය අත්පත් කර ගනිමින් ඉන්න එක. ඒ වාගේම ඒක අපේ ප්‍රධාන උපාය මාර්ගික අරමුණක් බවට පත් වෙලා තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳු බව තුරන් කිරීම, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය යන හැම උපාය මාර්ගික අරමුණක් ඔස්සේම අපි බලාපොරොත්තු වෙච්ච ආකාරයට අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් බවට පත් කර ගන්න මේ වෙද්දී අපි ක්‍රියා කරමින් යනවා.

[ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා නිවැරදි නම්, මුලින්ම රුපියල් 225ක් තමයි මහපොළ ශිෂ්‍යාධාරය විධියට ලැබුණේ. එයින් රුපියල් 200ක් දුප්පත් අම්මා තාත්තාට ගමට යවලා, රුපියල් 25කින් මාසය ගැටගසා ගත්ත දරුවෝ තමයි අද මේ රටේ වැඩිහිටි පරම්පරාවේ කොටසක් හැටියට ඉන්නේ. ඒ තත්ත්වය අදත් එක්ක සංසන්දනය කරලා බලනකොටත් ලොකු වෙනසක් නැහැ. රුපියල් 10,000ක මහපොළ ශිෂ්‍යාධාරය අරගෙන, ඒකෙන් තමන්ගේ මාසයට හරියන වියදම් ටික කළමනාකරණය කරගෙන, ඒකෙන් කීයක් හරි ගෙදර ඉඳන් ඉගෙන ගන්න දුක් විඳින නංගිට මල්ලිට පොත පත ගන්න ගමට යවා ගන්න අද විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට අවස්ථාවක් ලැබී තිබෙනවා. මමත් එවකට මහපොළ ශිෂ්‍යාධාරය ලබපු විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක්. ඒකේ වාසිය කොච්චරක්ද කියන එක අත්දැකීමෙන්ම දන්නා කෙනෙකු විධියට මමත් හිතනවා, මේවා තමයි අපි ධනාත්මකව දැකලා මේ සමාජය තුළ කතිකාවක් බවට පත් කර ගත යුත්තේ කියලා.

ඒ වාගේම රටේ චින්තනය පෙනෙන්නේ, රටේ නායකයාගේ චින්තනයෙන්. රටේ නායකයා තිරිසන් සතා ගැන පවා හිතන නායකයෙක් කියන එකෙන් අපට පෙනෙනවා, රටේ චින්තනය මොකක්ද කියලා. වීදි සුනඛයන්ගේ සුබසාධනය වෙනුවෙන් රුපියල් මිලියන 100ක් වෙන් කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. අපි දන්නවා, ගෑස් කාමරවලට දමලා වීදි සුනඛයෝ ඝාතනය කරන්න, cyanide injections දීලා වීදි සුනඛයෝ ඝාතනය කරන්න A/C කාමරවල ඉඳලා තීන්දු තීරණ ගන්නකොට, ඒ වීදි සුනඛයන් ඉන් මුදාගෙන, වීදි සුනඛයන් නිසා ජනතාවට මතුවෙලා තිබෙන අර්බුදයටත් පිළියම් සොයලා, හොඳම පිළියම ක්‍රියාත්මක කිරීම සඳහා අපි ආණ්ඩුවෙන් විශාල මුදලක් වෙන් කරලා තිබෙනවා. වීදි සුනඛයන්ගේ සුබසාධනය සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරනකොට ඒක විද්‍යුත්පතිවරුන්ගේ සුබසාධනය වෙනුවෙන් වෙන් කරපු වැය ඇස්තමේන්තුවේ මුදලත් එක්ක සංසන්දනය කරලා, වීදි සුනඛයන්ට මෙච්චරයි, විද්‍යුත්පතිවරුන්ට මෙච්චරයි කියලාත් විවේචනය කරන, මාධ්‍ය ප්‍රකාශ නිකුත් කරන අය අපි දකිනවා. මම අහනවා, මේ රටේ ශිෂ්‍ය ප්‍රජාව එක්ක, අනාගත පරම්පරාව හදන විද්‍යුත්පතිවරු එක්ක කොහොමද වීදි සුනඛයන්, එහෙම නැත්නම් මේ රටට ප්‍රශ්නයක් වෙලා තිබෙන වීදි සුනඛයන්ගේ සුබසාධනයට වෙන් කරපු මුදල සංසන්දනය කරන්නේ කියලා. ඒ වාගේ පටු තැනකට එන්න එපා. ඒ වාගේ පටු විවේචන කරන්න එපා. මොකද, ඒ හැම විෂය ක්ෂේත්‍රයක් කෙරෙහිම සංවේදී වෙලා, හැම මාතෘකාවක් ගැනම සංවේදී වෙලා අපි මේ කථා කරන්නේ, අපට ප්‍රමිතිගත රටක් ඕනෑ නිසා. ආර්ථික වර්ධනයම නොවෙයි, රටක් දියුණු වෙනවා කියන්නේ. අපට සැලසුම්සහගත රටක් ඕනෑ; විනයානුකූල රටක් ඕනෑ; මිනිසුන්ට අභිමානයෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් ඕනෑ; පිරිසිදු රටක් ඕනෑ. අන්න ඒ නිසා තමයි අපි මේ අය වැය හරහා, හැම අය වැයකදීම පොදුවේ ඉලක්කගත කාරණාවලට ඔබ්බෙන් ගිහිල්ලා, මේ හැම ක්ෂේත්‍රයක් කෙරෙහිම සංවේදී වෙලා කටයුතු කරලා තිබෙන්නේ.

ඒ වාගේම අපි දන්නවා, ආයෝජකයන් ලංකාවට එනකොට -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසානයි.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මම කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපි ආයෝජකයන්ට හිතකර රටක් නිර්මාණය කිරීම වෙනුවෙන් ශක්තිමත් නීති රාමුවක් හදමින් තිබෙනවා. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පනත් කෙටුම්පත මේ වෙද්දී මහජන මත විමසුම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. අපි ඒක සම්මත කර ගන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ආයෝජන ආරක්ෂණ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම වෙනුවෙනුත් අපි මේ වෙද්දී පියවර අරගෙන තිබෙනවා. ඉතින්, අපට අවශ්‍යයි පොහොසත් රටක් හදන්න, ලස්සන ජීවිත ගොඩනඟන්න. විපක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ට වාගේම රටේ සියලු මහජනතාවට අපි ආරාධනා කරනවා, රට හදන්න පක්ෂ අවශ්‍ය නැහැ, පාට අවශ්‍ය නැහැ, භේද අවශ්‍ය නැහැ, එකට එකතු වෙන්න කියලා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 2.33]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் நிதி அமைச்சரென்ற வகையில் சமர்ப்பித்த இந்த வரவு செலவுத்திட்டம் தொடர்பாக ஆளுங்கட்சியினர் ஆதரித்தும் எதிர்க்கட்சியினர் எதிர்த்தும் கருத்துகளைச் சொல்லிக் கொண்டிருக்கின்ற இவ்வேளையிலே, இதிலேயுள்ள ஒருசில நல்ல விடயங்களையும் சொல்லவேண்டிய தேவைப்பாடு இருக்கின்றது.

எமது மன்னார் மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்குள்ள மக்கள் விவசாயம் மற்றும் மீன்பிடித் தொழில் மூலமாகத்தான் ஜீவனோபாயத்தைத் தேடிக் கொள்கின்றார்கள். அந்த விவசாயிகளுடைய நலன் கருதி நாங்கள் அன்று - நான் அமைச்சராக இருந்த காலத்திலே - நல்லாட்சி அரசாங்கத்தினூடாக 'மல்வத்துஓயா' திட்டத்தை அநுராதபுரத்திலிருந்து ஆரம்பித்து வைத்தோம். அப்போது 500 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்து அந்த வேலையை ஆரம்பித்தோம். அதன் பிறகு, வந்த கோட்டாபய அரசாங்கம் அதைக் கைவிட்டிருந்தது. இருந்தபோதிலும், இந்த அரசாங்கம் அதற்காக 5,000 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருக்கின்றது. அதற்காக இந்த அரசுக்கு அந்த மக்கள் சார்பாக நன்றி சொல்கின்றேன்.

அதேபோல, பெருந்தலைவர் அஷ்ரஃப் அவர்கள் ஆரம்பித்துவைத்த நிந்தவூர் கலாசார மண்டபத்துக்கான கட்டிட வேலைகள் பூரணப்படுத்தப்படாமல் நீண்டகாலமாகக் கவனிப்பாரற்று இருக்கின்றது. அந்த மண்ணிலேயிருந்து இந்தப் பாராளுமன்றத்திற்கு வந்த பாராளுமன்ற உறுப்பினர் கௌரவ எம்.ஏ.எம். தாஹிர் அவர்கள் அந்தக் கட்டிடத்தைப் பூரணப்படுத்துவதற்காக அரசாங்க அதிபர், ஆளுநர், பொறியியலாளர்கள் மற்றும் இன்னோரன்ன அத்தனை பேருடனும் கதைத்து, மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா அவர்களுடைய தலைமையிலே நடைபெற்ற நிந்தவூர்

அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் அதற்கான அனுமதியைப் பெற்று, அதன்பிறகு பிரதி அமைச்சர் மாண்புமிகு வசந்த பியதிஸ்ஸ அவர்களுடைய தலைமையிலே நடைபெற்ற மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் அதற்காக அனுமதியைப் பெற்று, மாண்புமிகு ஜனாதிபதியிடம் வேண்டுகோள் விடுத்ததற்கிணங்க, 300 மில்லியன் ரூபாயை அதற்காக இந்த வரவு செலவுத்திட்டத்திலே ஒதுக்கியமைக் காகவும் எங்களுடைய மனமார்ந்த நன்றியை இந்த அரசுக்குத் தெரிவிக்கின்றோம்.

எங்களுடைய சகோதர இனமான மலையக சமூகத்தினுடைய சம்பளத்திற்காக அரச பணத்திலிருந்து ஒரு நாளைக்கு 200 ரூபாய் வழங்குவதற்காக முன்மொழியப் பட்டுள்ளது. இது அந்த மக்களுக்கு ஒரு வரப்பிரசாதமாக அமையும் என்று நாங்கள் நம்புகின்றோம். அதற்காகவும் எங்களுடைய நன்றியை இந்தச் சபையிலே தெரிவிக்கின்றோம்.

அதேபோல, drugs கட்டுப்பாடு தொடர்பாக இந்த அரசாங்கத்தினால் மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகள் இந்நாட்டுக்கு மிகவும் தேவையானதாகும். ஏனென்றால், எங்களுடைய அழகான நாடு; நல்ல கல்விச் சமூகத்தைக் கொண்ட நாடு இன்று drugs பாவனையினால் மிக மோசமான ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றது. அதனைத் தடுப்பதற்கான உங்களுடைய முயற்சி வரவேற்கத்தக்கது; அதற்காக எங்களுடைய பூரண ஒத்துழைப்பை நாங்கள் வழங்குவோம். என்றாலும் இதை அரசியல் ஆக்காதீர்கள்! அது எந்தக் கட்சிக்காரராக இருந்தாலும், அரசியலில் சம்பந்தப் பட்டவர்கள் என்பதற்காக உண்மையான கள்வர்களை அல்லது drug dealerஐ நாங்கள் காப்பாற்றுகின்ற அந்தப் பாவத்தைச் செய்துவிடக் கூடாது! உங்களுடைய கட்சிக்காரர்களாக இருக்காலாம் அல்லது மாற்றுக் கட்சிக்காரராகவும் இருக்காலாம், யாராக இருந்தாலும் තරාතිරම නොබලා, அதாவது தகுதி பார்க்காமல் அவர்களுக்கான தண்டனையை வழங்கி, இதைக் கட்டுப்படுத்த நடவடிக்கை எடுப்பீர்களாக இருந்தால் நிச்சயமாக இந்த நாட்டிலேயுள்ள எதிர்காலச் சந்ததியினரைக் காப்பாற்ற முடியும் என்று நான் நம்புகின்றேன்.

இந்த அரசாங்கம் வட, கிழக்கில் யுத்தத்தால் பாதிக்கப்பட்டவர்களின் வீடமைப்புக்காக நிதி ஒதுக்கீடு செய்திருக்கின்றது. குறிப்பாக, யாழ்ப்பாணத்திலிருந்து 1990ஆம் ஆண்டு இடம்பெயர்க்கப்பட்ட பல்லாயிரக் கணக்கான முஸ்லிம்கள் கவனிப்பாரற்ற ஒரு சமூகமாகக் காணப்படுகின்றார்கள். அவர்கள் அங்கு மீள் குடியேறச் சென்று காணி இல்லாமல் அந்தரப்பட்டபொழுது, அந்த மாவட்டத்தின் எந்தவோர் அரசியல்வாதியும் அவர்களைக் கவனிக்கவில்லை. நான் வன்னி மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்தி அமைச்சராக இருந்த காலத்தில் என்னால் முடிந்ததை அவர்களுக்குச் செய்தாலும், காணி பெற்றுக்கொடுக்கின்ற விஷயத்திலே, ஓர் அங்குல அரச காணியைக்கூட யாரும் அந்த மக்களுக்குப் பெற்றுக் கொடுக்கவில்லை. அதனால், அந்த மக்களில் அதிகமானவர்கள் வெளியேறி விட்டார்கள்; இன்னும் கொஞ்சப் பேர் இருக்கிறார்கள். அவர்களிலே கொஞ்சப் பேருக்கு இருப்பதற்கு வழி இல்லாத காரணத்தினால் நாங்கள் ஒரு private காணியை வாங்கிக் கொடுத்திருக்கிறோம்.

அந்தக் காணியிலே கொட்டில் போட்டுக்கொண்டு, தண்ணீர் வசதி இல்லாமல் அவர்கள் மிகவும் கஷ்டத்தில் இருக்கிறார்கள். ரணில் விக்கிரமசிங்ஹ அவர்களுடைய கடந்த அரசாங்கக் காலத்திலே, நான் அன்றிருந்த ஆளுநரின் ஊடாக 120 மில்லியன் ரூபாய் நிதியை அவர்களுடைய பாதை, மின்சாரம், தண்ணீர் மற்றும் கால்வாய் வசதிகளுக்காகப் பெற்றுக் கொடுத்தேன். அந்தப் பணம் அநுர குமார திஸாநாயக்க அவர்கள் சனாதிபதியாக வந்த பிறகு திருப்பி அனுப்பப்பட்டு விட்டது. அதுபற்றி எங்களுடைய அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்களிடம் பலமுறை சுட்டிக் காட்டினேன்; இளங்குமரன் MPயிடமும் சொன்னேன். ஆனால், இதுவரையும் அவர்கள் யாரும் ஒரு நாள்கூட அந்த மக்களைப் போய்ப் பார்க்கவில்லை. ஆளுநராகப் புதிதாக வந்திருக்கின்றவரிடத்திலும் இதுபற்றி குறிப்பிட்டேன். இதற்கு முன்னர் இருந்த ஆளுநர்தான் அந்தப் பணத்தைக் கேட்டுப் பெற்றார்; இன்றைய ஆளுநர் அது சம்பந்தமாக எந்த நடவடிக்கையும் எடுக்கவில்லை. நான் அவரோடு இன்று காலையிலிருந்து தொலைபேசியில் தொடர்புகொள்ள முயற்சித்தேன்; இதுவரையில் அவரைத் தொடர்புகொள்ள முடியவில்லை. என்றாலும், அரசாங்கம் ஒதுக்கியிருக்கின்ற அந்தப் பணத்தின்மூலம் 25 - 30 குடும்பங்களுக்காவது வீடுகளைக் கட்டிக் கொடுக்க வேண்டுமென அவரிடத்திலும் நான் வேண்டுகோள் விடுக்கின்றேன். அத்துடன், அங்கு நீங்கள் 2,000 வீடுகளைக் கட்டவிருக்கின்றீர்கள் எனக் கேள்விப்படுகின்றேன்; இதில் தயவுசெய்து அந்த மக்களையும் கவனத்தில்கொள்ளுமாறு வேண்டுகோள் விடுக்கின்றேன்.

நான் அமைச்சராக இருக்கும்பொழுது ஏற்கனவே மன்னாரிலே ஒரு கூட்டுறவு co-op buildingஐக் கட்டுவதற்கான வேலையை ஆரம்பித்தேன். அதைக் கட்டிமுடிக்க இன்னும் 600 மில்லியன் தேவை என்று State Engineering Corporation - SEC—சொல்லியிருந்தது. அரசாங்கத்துக்குத் தலையிடி கொடுக்காமல் நான் வெளிநாடொன்றின் அரசாங்கத்தோடு கதைத்திருந்ததன் அடிப்படையில், அந்த 600 மில்லியன் ரூபாய் பணத்தைத் தருவதற்கு அவர்கள் தயாராக இருக்கிறார்கள். எங்களுடைய வசந்த சமரசிங்ஹ அவர்களுடைய அமைச்சினுடைய செயலாளருக்கு அது தொடர்பான விஷயங்களை நான் தெரியப்படுத்தினேன். அதற்காக அமைச்சரவைப் பத்திரம் சமர்ப்பிப்பதாகச் சொல்லப்பட்டது. ஆனால், ஒரு வருடம் ஆகிவிட்டிருந்தும் இதுவரை அமைச்சரவைப் பத்திரம் சமர்ப்பிக்கப்படவில்லை. இது அரச அதிகாரிகளுடைய அசமந்தப்போக்கா அல்லது அமைச்சருடைய அசமந்தப்போக்கா எனத் தெரியவில்லை. வெளிநாட்டு உதவியாக - grantஆக - இலவசமாகக் கிடைக்க இருக்கின்ற பணத்தை ஏன் பெறுவதற்குத் தயங்குகின்றார்கள் என்று எனக்குத் தெரியவில்லை. எனவே, இது சம்பந்தமாகக் கௌரவ அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்கள் அவசரமாக நடவடிக்கை எடுக்கவேண்டும் என்று வேண்டுகோள் விடுக்கின்றேன்.

மன்னார் சிலாவத்துறையிலே எங்களால் ஆரம்பிக்கப்பட்ட ஒரு hall கட்டி முடிக்கப்படாது அரைகுறையிலே இருக்கிறது. அதன் எஞ்சிய கட்டிடத்தைத் தான் கட்டித் தருகின்றேன் என்று அன்று UDAஇற்குப் பொறுப்பாக இருந்த அமைச்சர் அவர்கள் சொன்னார். அவர் எல்லா வேலைகளையும் செய்தாலும், அவசரமாக அமைச்சரவை மாற்றம் - reshuffle - ஏற்பட்டதனால், அதற்கான பணம் ஒதுக்கப்படவில்லை. இன்று நான் அந்த அமைச்சரைக் கேட்டபொழுது, தான் இது சம்பந்தமாக அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்களுடன் பேசுவதாகச் சொன்னார். எனவே, அதையும் கட்டித் தருமாறு இந்த அரசாங்கத்திடம் கேட்கின்றோம். அந்தக் கட்டிடம் கட்டப்படவில்லை என்றால், ஏற்கெனவே செலவழித்த பணம் வீணாகப் போய்விடும் என்பதை இங்கு சுட்டிக்காட்ட வேண்டிய தேவை இருக்கிறது.

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

அதேபோல, எங்களுடைய மாண்புமிகு சனாதிபதி அவர்களை மன்னார் காற்றாலை சம்பந்தமாகச் சந்திக்கச் சென்றபொழுது, மன்னார் - புத்தளம் பாதை சம்பந்தமாகவும் குறிப்பிட்டிருந்தோம். அப்போது அவர், தான் அந்தப் பாதையை எப்படியாவது திறந்து தர நடவடிக்கை எடுப்பதாக எங்களிடத்திலே சொன்னார். மாண்புமிகு சனாதிபதி அவர்கள் ஒரு மேடையில் பேசியபொழுதும் அந்தப் பாதை பற்றி குறிப்பிட்டிருந்தார். அந்தப் பாதையினூடாகப் போக்குவரத்து வசதியைச் செய்வதன்மூலம் வடக்கிற்கும் தெற்கிற்கும் இடையேயான 100 கிலோமீற்றர் தூரம் குறைக்கப்படுகின்றது. அந்தப் பாதை திறக்கப்படுவது நிச்சயமாகச் சுற்றுலாப் பயணிகளுக்கும் பிரயோசனமாக அமையும். அதேபோல, வடக்கிலே இருக்கின்ற உற்பத்திப் பொருட்களுக்கு நல்ல விலை கிடைக்கும்; எரிபொருள் பாவனை குறையும். ஆனால், அது சம்பந்தமாக இந்த வரவு செலவுத்திட்டத்திலே எதுவுமே சொல்லப்படவில்லை என்பது வேதனையாக இருக்கின்றது. ஆகவே, தயவுசெய்து அதை முன்னெடுக்குமாறு அன்பாக நான் கேட்டுக் கொள்கிறேன்.

அதேபோல, மன்னார் காற்றாலை மின் உற்பத்தித் திட்டம் சம்பந்தமாகவும், கனிய மணல் அகழ்வு சம்பந்தமாகவும் அந்த மக்கள் மத்தியிலே இருக்கின்ற சந்தேகத்தைப் போக்குவதற்காக அமைச்சரவையிலே ஒரு பத்திரம் சமர்ப்பிக்கப்பட்டது. அது சம்பந்தமாக எந்தவொரு clearஆன முடிவு எங்களுக்கு இதுவரையும் தெரியாது. அதையும் தெளிவுபடுத்துமாறு அந்த மக்கள் கேட்கிறார்கள்.

மன்னார் தீவு ஓர் அழகான தீவு, சுற்றுலாத் துறைக்கு உகந்த தீவு, மீன்பிடித் துறைக்கு உகந்த தீவு. அதனை இந்த நாட்டில் இருக்கின்ற ஓர் international island என்று சொல்லலாம். இந்த விடயங்களைத் தாண்டி, அங்கு ஏற்கெனவே 150 'மெகாவாட்' மின்சார உற்பத்திக்கான காற்றாலைகள் இருக்கின்றன. எனவேதான் அங்குள்ள மக்கள், புதிய காற்றாலைத் திட்டத்தை அங்கிருந்து மன்னார் பெரிய நிலப்பரப்புக்குக் கொண்டுசெல்லுமாறு கேட்கிறார்கள். அவர்கள் கேட்பதிலும் நியாயம் இருக்கின்றது. ஆகவே, இது சம்பந்தமாக மக்களோடு கலந்துரையாடி, மக்களுடைய விருப்பத்துக்கேற்ப முடிவை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றோம். நான் இங்கு குறிப்பிட்டதுபோல மன்னார் தீவு, சுற்றுலாவுக்கு முக்கியத்துவம் வாய்ந்த ஓரிடம். நீங்கள் அதை அழகான முறையில் அபிவிருத்தி செய்யலாம். ஆனால், இந்த வரவு செலவுத்திட்டத்திலும் சுற்றுலா அமைச்சுக்கான ஒதுக்கீட்டில் அதுபற்றி எதுவும் சொல்லப்படவில்லை. மன்னார் தீவையும் அழகுபடுத்துங்கள், அபிவிருத்தி செய்யுங்கள், சுற்றுலாப் பயணிகளை வரச் செய்யுங்கள்!

மேலும், தலைமன்னாரில் இருக்கின்ற jettyஐப் புனரமைப்பதற்காக ஏற்கெனவே, நிமல் சிறிபால த சில்வா அவர்கள் அமைச்சராக இருந்தபோது 600 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு, பத்திரிகைகளில் கேள்வி மனு கோரப்பட்டது. அதற்குரிய நடவடிக்கைகள் இப்போது நிறுத்தப்பட்டிருக்கிறது. தேவையென்றால், நாங்கள் இந்திய அரசாங்கத்துடன் பேசி அதற்குரிய பணத்தை grantஆகக்கூட பெற்றுத்தர முடியும். தயவுசெய்து அதனைச் செய்வீர்களாக இருந்தால், இலங்கைக்கும் இந்தியாவுக்கும் இடையில் boat service ஆரம்பிப்பதன்மூலம் தலைமன்னாரில் இருந்து 28 கிலோமீற்றர் தூரத்திலிருக்கின்ற இந்தியாவுக்கு இலகுவாகச் செல்ல முடியும். முன்னைய காலத்தில் கொழும்பு கோட்டையில் ரயில் ticketஐ எடுத்து, இராமேஸ்வரத்தில் போய் இறங்கியிருக்கின்றார்கள். குறித்த jettyஐப் புனரமைக்கின்ற போது இந்தியாவிலிருந்து one billion tourists வருவதற்கான வாய்ப்பு இருக்கிறது. அதன்மூலம் இன்னும் எங்களுடைய நாட்டின் வருமானத்தை அதிகரித்துக்கொள்ள முடியும். அந்தப் பிரதேசம் சுற்றுலாத் துறையில் முன்னேறுகின்றபோது, அங்கே வாழ்கின்ற ஏழை மக்களினதும் தொழில் இல்லாத மக்களினதும் அந்தப் பிரதேசத்தினதும் பொருளாதாரம் மேம்படக்கூடிய வாய்ப்பு இருக்கிறது. எனவே, அது சம்பந்தமாக ஆக்கபூர்வமான நடவடிக்கையை இந்த அரசாங்கம் எடுக்கவேண்டும்.

இந்த அரசாங்கத்தில் நான் காண்கின்ற ஒரு குறைபாடு என்னவென்றால், வெளிநாடுகளிலிருந்து முதலீடு செய்வதற்காக இங்கு வருகின்ற நிறுவனங்கள், முதலீட்டாளர்களுக்கு அவர்கள் யாரைச் சந்திப்பது, எங்கு சந்திப்பது, யாருடன் கதைப்பது என்பது சம்பந்தமாக ஒரு clear picture இல்லாமையாகும். நீங்கள் ஆட்சியமைத்து ஒரு வருடம் சென்று விட்டது. இன்னும் ஓரிரு வருடத்திலே மக்கள் உங்களிடம் நிறைய விடயங்களை எதிர்பார்ப்பார்கள். எனவே, தயவுசெய்து முதலீடுகளை வரவழைப்பது சம்பந்தமாக ஆக்கபூர்வமான நடவடிக்கையை முன்னெடுங்கள்! அதில்தான் இந்த நாட்டினுடைய எதிர்காலம், எங்களுடைய எதிர்காலச் சந்ததியினரின் வேலை வாய்ப்பு எல்லாம் தங்கியிருக்கின்றது என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அதேபோல, புல்மோட்டையில் இருக்கின்ற Lanka Mineral Sands Limited - LMS என்ற கனியவள நிறுவனத்தில் கடந்த அரசாங்கக் காலத்திலே தொழில் வழங்கப்பட்ட நூற்றுக்கும் மேற்பட்ட இளைஞர்கள் சம்பளமில்லாது வேலை செய்கின்றார்கள். சிலருக்கு வழங்கப்பட்ட தொழிலை நிறுத்தி வைத்திருக்கின்றார்கள். நான் இந்த விடயம் சம்பந்தமாக கௌரவ அமைச்சர் சுனில் ஹந்துன்னெத்தி அவர்களிடம் பலமுறை சொல்லியிருக்கின்றேன். இந்தச் சபையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் உரையாற்றும்போது 9,000 பேருக்கு நிரந்தர நியமனம் வழங்கப்படவுள்ளதாகச் சொன்னார். அவ்வாறு நியமனங்களை வழங்குகின்றபொழுது, தயவுசெய்து அந்த LMS நிறுவனத்தில் தொழில் செய்கின்ற அந்த labourersக்கும் நிரந்தர வேலை வாய்ப்பைக் கொடுங்கள்! அந்தப் பிரதேசத்திலிருக்கின்ற வளத்தினூடாக இந்த நாட்டுக்கு அந்நியச் செலாவணியாகக் கோடிக்கணக்கான பணம் வந்துகொண்டிருக்கின்றது. எனவே, அந்த ஊரில் உள்ள இளைஞர்களுக்கு அந்தத் தொழிலைக் கொடுங்கள்! இந்த விடயத்தை அவசரமாகக் கவனத்தில் எடுங்கள்!

அதுபோல், கௌரவ கமத்தொழில் பிரதி அமைச்சர் நாமல் கருணாரத்ன அவர்கள் சபையில் இருக்கின்ற வேளையில் ஒரு விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, முத்துநகர் விவசாயிகள் "எங்களுடைய காணிகள் பறிக்கப்பட்டு, வேறு நிறுவனங்களுக்கு கொடுக்கப்பட்டுவிட்டது. அதற்கு மாற்றுக் காணியைத் தாருங்கள் அல்லது அந்தக் காணியைத் தாருங்கள்!" என்று கேட்கின்றார்கள். நான் அது சம்பந்தமாக கௌரவ பாராளுமன்ற உறுப்பினர் ரொஷான் அவரிடம் கதைத்தபோது அவர் சொன்னார், "அவர்கள் வேறு யாருடனோ - පෙරටුගාමීயைச் சேர்ந்தவர்களோடு - சேர்ந்து போராடுகின்றார்கள்" என்று. அவர்களுக்கு පෙරටුගාමීஐத் தெரியாது. පෙරටුගාමීயைச் சேர்ந்தவர்கள் போய் இவ்வாறானதொரு போராட்டத்திலே இணைந்து கொண்டிருக்கலாம். அதற்காக அந்த விவசாயிகளை நீங்கள் பழிவாங்கிவிடாமல், அந்த விடயத்தில் கவனத்தைச் செலுத்தி, தங்களுடைய வாழ்வாதாரத்துக்காக விவசாயம் செய்வதற்கு நிலத்தைக் கேட்கின்றவர்களுக்கு அந்த நிலத்தைக்

கொடுங்கள்! அங்கு நிறையக் காணிகள் forestஇன்கீழ் இருக்கின்றது. அவை உண்மையில் forestக்கு உரிய காணிகள் அல்ல; இடையில் forestக்குச் சொந்தமாக்கப்பட்ட காணிகள். அவற்றை மீளப் பெற்று அந்த விவசாயிகளுக்கு, 1 ஏக்கருக்குப் பதிலாக 2 ஏக்கர் காணியைக் கொடுத்து அவர்கள் விவசாயம் செய்வதற்கு வழிசெய்யுங்கள்! அவ்வாறு கொடுக்கின்றபோது அவர்கள் சந்தோஷமடைவார்கள். எனவே, அது சம்பந்தமாக ஆக்கபூர்வமான நடவடிக்கையை எடுங்கள்!

அதேபோன்று கிழங்கு, வெங்காயம் மற்றும் உளுந்துச் செய்கையை எடுத்துக்கொண்டால், ஒரு காலகட்டத்தில் வவுனியா மாவட்டம் உளுந்துச் செய்கைக்குப் பெயர் போனதாக இருந்தது; அங்குதான் அதிகமான உளுந்து உற்பத்தி செய்யப்பட்டது. இந்த வருடம் யாரும் அங்கு உளுந்துச் செய்கையை மேற்கொள்ளவில்லை, கௌரவ அமைச்சர் அவர்களே! ஏன் அவர்கள் செய்யவில்லை என்றால், உளுந்துக்கான விலை இல்லை. இந்தியாவிலிருந்து அதிகளவிலான உளுந்து இறக்குமதி செய்யப்பட்டுள்ளது. உங்களுடைய அமைச்சுக்கும் வர்த்தக அமைச்சுக்குமிடையே சரியான cooperation இருந்திருந்தால், இவ்வாறு இறக்குமதி செய்திருக்க மாட்டார்கள். கமத்தொழில் அமைச்சுதான் விவசாயிகளைப் பாதுகாக்க வேண்டும். எனவே, உங்களுடைய அனுமதியில்லாமல் உணவுப்பொருள் இறக்குமதிகளைச் செய்வதற்கு எந்தவிதத்திலும் அனுமதிக்கக் கூடாது. நானும் வர்த்தக அமைச்சராக இருந்தவன். நாங்கள் - கமத்தொழில் அமைச்சு, Fisheries Ministry வர்த்தக அமைச்சு - எல்லோரும் குறித்த விடயங்கள் சம்பந்தமாக 3 - 4 மாதங்களுக்கு முன்னரே, வாரத்துக்கு ஒரு முறை ஒன்றுகூடி, எவ்வாறு விவசாயி களுடைய உற்பத்திகளான கிழங்கு, வெங்காயம் போன்றவற்றையும் ஏனைய உற்பத்திகளையும் பாதுகாப்பது என்பது தொடர்பாகக் கலந்தாலோசித்து, முடிந்தவரையில் அவர்களைப் பாதுகாத்தோம். அதுபோல், தயவுசெய்து நீங்களும் இதில் கவனம் செலுத்துங்கள்! இன்று வவுனியாவில் உளுந்துச் செய்கையைச் செய்கின்ற விவசாயிகள் பஞ்சத்தில் வாழ்கின்றார்கள். அங்கு ஒரு விவசாயக் குடும்பம்கூட உளுந்துச் செய்கையைச் மேற்கொள்ளவில்லை; எல்லோரும் கைவிட்டுவிட்டார்கள். எனவே, உளுந்துச் செய்கையைக் காப்பாற்றுவதற்கு விசேடமான வேலைத்திட்டங்களை முன்னெடுங்கள் என்று கௌரவ பிரதி அமைச்சர் நாமல் கருணாரத்ன அவர்களிடம் வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, புத்தளம் அருவக்காட்டுப் பிரச்சினை சம்பந்தமாக நான் இங்கு சொல்லியாக வேண்டும். நாங்களெல்லாம் - ஓரிலட்சம் முஸ்லிம் மக்கள் - வெறும் கையோடு அகதிகளாக வந்தபொழுது, எங்களை வரவேற்றவர்கள் புத்தளம் மாவட்ட மக்கள். கடந்த தேர்தலிலே புத்தளம் தேர்தல் தொகுதி மக்கள் அதிகமான வாக்குகளை NPPக்குத்தான் அளித்தார்கள். அங்கு போட்டியிட்ட NPP உறுப்பினர்களில் அதிகமானவர்கள் MPக்களாக வருவதற்குப் புத்தளம் தொகுதி மக்களின் வாக்குகள் பிரயோசனமானது. தேர்தல் காலங்களில், சனாதிபதி வேட்பாளர் உட்பட அங்கு இன்று MPஆக இருக்கின்றவர்கள்கூட சொன்னார்கள், "அருவக்காட்டுத் திட்டத்தை முன்னெடுக் கமாட்டோம்" என்று. அத்திட்டத்தை ஏற்கனவே இருந்த அமைச்சர்கள் முன்னெடுத்தபோது, அரசாங்கத்தில் இருந்துகொண்டு அதை எதிர்த்தவர்கள் நாங்கள்; அதற்கு எதிராக இந்தப் பாராளுமன்றத்திலும் அமைச்சரவையிலும் குரல் கொடுத்தவர்கள் நாங்கள். அவ்வாறு இருக்கும்போது, தற்போது, இந்த அரசு 2.5 பில்லியன் ரூபாயை அருவக்காட்டுத் திட்டத்துக்காக ஒதுக்கீடு செய்திருக்கின்றது.

நேற்றைய தினம் அந்த மாநகர சபையில் இருக்கின்ற உங்களுடைய கட்சி உறுப்பினர்கள், எங்களுடைய கட்சி உறுப்பினர்கள் எல்லோருமாக அதற்கெதிராக roadஇலே ஆர்ப்பாட்டத்தில் ஈடுபட்ட நிலையை நாங்கள் பார்த்தோம். ஆர்ப்பாட்டங்களை அதிகரிக்காதீர்கள்! அவ்வாறான ஒரு திட்டத்துக்கு நிதி ஒதுக்குவதற்கு முன்னர் அந்தப் பிரதேச மக்களோடு கலந்துரையாடுங்கள்! அங்குள்ள பாதிரியார்கள், மௌலவிமார் மற்றும் பௌத்த மதகுருமார் நீண்டகாலமாக அதற்கு எதிர்ப்புப் போராட்டங்களை முன்னெடுத்து வந்திருக்கிறார்கள். எனவே, தயவுசெய்து அந்தத் திட்டத்தை நிறுத்தி, அந்தப் பிரதேச மக்களோடு கலந்துரையாடி, அந்தத் திட்டத்தை அந்தப் பகுதியில் இருந்து மாற்றுங்கள்! அந்தப் பகுதிக்கு அத்திட்டத்தைக் கொண்டுவராதீர்கள்! அதற்காக ஒதுக்கப்பட்டுள்ள நிதியை வேறு திட்டங்களுக்கு மாற்றுங்கள்! மேலும், புத்தளம் ஆஸ்பத்திரி சம்பந்தமாக நிதி உதவி செய்வதாகச் சொன்னீர்கள்; எதுவுமே நடக்கவில்லை. அதுபோல், அந்தப் பிரதேசத்தில்தான் கடந்த காலங்களில் சீமெந்துத் தொழிற்சாலை, நுரைச்சோலை அனல் மின்திட்டம் போன்ற பல அநியாயங்கள் நடந்துள்ளன. அழகான அந்தப் பிரதேசத்தைக் கட்டிக் காப்பதற்குப் பதிலாக, அதனை ஒரு குப்பைமேடாக மாற்றி விடாதீர்கள் என்று மிகவும் அன்பாகக் கேட்டு, இந்தச் சந்தர்ப்பத்தை அளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු මුනීර් මුලෆ්ෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[අ.භා. 2.48]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය විවාද ගැන අපි ආපසු හැරිලා බලනකොට මෙවර අය වැය සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව ඉතාම සාධනීය තොරතුරුත්, ඉතාම නිෂේධනීය තොරතුරුත් ඉදිරිපත් කරන්න උත්සාහ ගත්තා. අය වැය විවාදය ආරම්භ කරන්නේ විපක්ෂයෙන්. විපක්ෂයෙන් මේ විවාදයට පළමුවෙන්ම බැට් කරන්න එවන්නේ හොඳම පිතිකරුවා, දක්ෂම පිතිකරුවා; විෂය ගැන හොඳට දන්නා කියන කෙනෙක්. එහෙම නම්, විපක්ෂයෙන් අය වැය විවාදය ආරම්භ කරනකොට, විශේෂයෙන්ම එතුමා තමයි සජබයේ ආර්ථික විද්‍යාව පිළිබඳව නිපුණතාවක් තිබෙන කෙනා, මහ පෙන්වන්නා. එතුමා ප්‍රකාශ කරනවා "සාර්ව ආර්ථිකය සම්පූර්ණ කර ඇත" කියා. ඒක අපට වාසියක්. ඊළඟට කියනවා, "දූෂණ විරෝධී වැඩ පිළිවෙළ අපි අනුමත කරනවා, ඒක බොහොම හොඳ එකක්" කියලා. ඊළඟට කියනවා, "ආර්ථික ස්ථාවරත්වය රැක ගන්න 2025 අවුරුද්දේ -මේ පසුගිය කාලයේ- සමත් වුණා" කියලා. ඊළඟට කියනවා, "මෙච්චර වාහන ගෙනෙන්න පුළුවන් වෙයි කියලා අපි හිතුවේත් නැහැ, අපි නොහිතපු දෙයක් වුණා" කියලා. ඊළඟට කියනවා, "රාජ්‍ය භාණ්ඩාගාරය පළමු වතාවට උතුරා යමින් තිබෙනවා" කියලා. ඊළඟට කියනවා, "තවමත් ජනතාව මේ ආණ්ඩුව සමඟ ඉන්නවා" කියලා. මෙන්න මේ කාරණා ටික එතුමා ප්‍රකාශ කළා. මේක තමයි ඇත්ත.

එහෙම නම්, මේ පදනමත් එක්ක, එතැනින් පස්සේ විපක්ෂයේ සමහර අය ඉදිරිපත් කරපු විවේචන ගත්තොත්, මූලික වශයෙන් ඉදිරිපත් කරපු ඒ ප්‍රකාශ එක්ක ගැටෙනවා. එහෙම නම්, විපක්ෂය දැන් පිළිගන්නේ මේකෙන් කොයි එකද? මෙන්න මේ තත්ත්වයත් එක්ක රාජ්‍ය භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා ගිහින් තිබෙනවාය කියන එක පිළිගනිමින් විපක්ෂ නායකතුමා කියනවා, "ඕක ඉතින් මොන්ටිසෝරි ළමයෙකුටත් කරන්න පුළුවන් නේ, බදු ගහලා ගහලා එහෙම කරන්න පුළුවන් නේ" කියලා. අපි බදු ගහලා නැහැ, තිබුණු බදු කළමනාකරණය කරලා තිබෙනවා. බදු නොගෙවපු අය බදු ගෙවලා තිබෙනවා. පසුගිය කාලයේ බදු නොගෙවා මහ හරිමින් හිටපු අය හිතා මතා, ස්වේච්ඡාවෙන්ම බදු ගෙවන්න පෙලඹුණා. එහෙම ගොඩක් අය අපට හමු වෙලා තිබෙනවා.

විපක්ෂ නායකතුමාගේ සහෝදරිය හොර සල්ලි බැංකුවකට අරගෙන ගිහිල්ලා අහු වෙනවා නේ; මාට්ටු වෙනවා නේ; පැනලා දුවනවා නේ. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
චෝදනාවක් එනවා නේ; චෝදනාවක් එනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාගේ සහෝදරිය නිර්දෝෂියි. ඇයට යම් පුද්ගලයෙකු විසින් වංචාවක් කරලා, ඒ වරද කරපු කෙනාට එරෙහිව මහාධිකරණයේ නඩු පවරලා, ඔහු හිරේ යවලා, ඒ පීඩාවට ලක් වෙච්ච එතුමියට වන්දිත් ලැබුණා. ඒ නිසා මේ කියන්නේ සම්පූර්ණ අසත්‍ය කථාවක්. කරුණාකරලා ඔය වාගේ කැත කථා කියන්න එපා. දැන් ඔබතුමන්ලා නියෝජ්‍ය ඇමතිලා; ආණ්ඩුවක ඉන්නේ. මේක අන්තිම වැරදි වැඩක්, අන්තිම නින්දිතයි. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කථා කරන්න, වාදයකට යන්න එපා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

චෝදනාවක් තිබුණා කියලායි මම කිව්වේ. චෝදනාවක් තිබුණා. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කොහේද චෝදනාවක් තිබුණේ? *[බාධා කිරීමක්]*

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

සරල විධියට රාජ්‍ය භාණ්ඩාගාරය පුරවන්න පුළුවන් නම් ඒක ගැටලුවක් නැහැ. මෙතැන පැහැදිලිව ප්‍රකාශ වෙන්නේ කුහකකම. *[බාධා කිරීමක්]* චෝදනාවක් තිබුණා කියලායි මම කිව්වේ. මහින්ද රාජපක්ෂ මහත්තයා එතුමාගේ කටින්ම කියනවා, "ප්‍රේමදාස මහත්තයාගේ දුව හින්දා මම බේරා ගත්තා" කියලා. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමායි එහෙම ප්‍රකාශ කළේ. *[බාධා කිරීමක්]*

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මහින්ද රාජපක්ෂ කියන ඒවා විශ්වාස කරනවාද?

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

එහෙම චෝදනාවක් තිබුණා. එහෙම ප්‍රකාශයක් තිබුණා. මේක ප්‍රසිද්ධ කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය භාණ්ඩාගාරය ඒ විධියට පුරවන්න බැහැ. ඒක සරල වැඩක් නොවෙයි. විපක්ෂය සද්භාවයෙන් ඉදිරිපත් කරන විවේචන භාර ගන්න අපි සූදානම්. හැබැයි, කුහකකමින් ඉදිරිපත් කරන විවේචන භාර ගන්න අපි සූදානම් නැහැ කියන කාරණාව මේ වෙලාවේ කියන්න ඕනෑ. මේ සියලු කාරණා එක්ක මේ අය වැය ලේඛනය පරිශීලනය කරලා බලනකොට අපේ රටේ සියලු ජන කොටස්වලට සාධනීය බලාපොරොත්තු තියාගන්න පුළුවන් අය වැයක් විධියට මේ අය වැය නම් කරන්න පුළුවන්.

මේ දවස්වල ගොවි ජනතාවගේ පැත්තෙන් මතු වෙච්ච කාරණාවක් ගැනත් මම මේ වෙලාවේ පැහැදිලි කරන්න ඕනෑ. අද

අර්තාපල් ගොවියාගේ, ලොකු ලූනු ගොවියාගේ ගැටලුවක් මතුව තිබෙනවා. තවත් ගොවි කාණ්ඩ කිහිපයක ගැටලු ප්‍රමාණයක් නිර්මාණය වුණා. අපි කියන්න කැමැතියි, කෘෂි කර්මාන්තය පැත්තෙන් ගත්තාම, අපි වී නිෂ්පාදනය වැඩි කර ගැනීමට අදාළ වැඩ පිළිවෙළක් දියත් කර තිබෙන බව. පසුගිය යල කන්නය ගත්තොත්, මෑත ඉතිහාසයේ දැවැන්තම අස්වැන්න ඒ අවස්ථාවේ අපි ගත්තා. ඒ වාගේම අපි ඉලක්කසහගත ගමනක් යනවා. අපි භෝග 13ක් තෝරා ගෙන ඒ භෝග 13 ප්‍රවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක් දැන් දියත් කරලා තිබෙනවා. අපි දැන් එහි යම් සාර්ථක තැනකට ඇවිල්ලා තිබෙනවා. අපි තවත් ඉස්සරහට යනවා. උදාහරණයක් ගත්තොත්, මුං ඇට පිට රටින් ගෙන එන එක අපි නතර කෙරුවා. අපට ඉදිරියේදී මුං ඇට පිට රටින් ගෙනෙන්න ඕනෑ නැහැ. අපේ අවශ්‍යතාව ඉක්මවා මුං නිෂ්පාදනයක් රට තුළ මේ වනකොට තිබෙනවා. ඒ මුං ඇටවලින් පංගුවක් රජය මිලදී ගැනීමත් මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා.

බඩඉරිඟු නිෂ්පාදනය ගත්තොත්, කලින් වසරට සාපේක්ෂව මෙවර නිෂ්පාදනයේ සැලකිය යුතු වැඩි වීමක් වෙලා තිබෙනවා. අනෙකුත් හැම භෝගයකම නිෂ්පාදනයත් එහෙමයි. ලොකු ලූනු ගත්තොත්, අපි ආණ්ඩුව ගන්න කාලය වෙනකොට ලොකු ලූනු නිෂ්පාදනය තිබුණේ මෙට්‍රික් ටොන් 7,000කට අඩු ප්‍රමාණයක්. හැබැයි, මේ වනකොට මෙට්‍රික් ටොන් 62,000කට ආසන්න නිෂ්පාදනයක් ලොකු ලූනුවලින් ලැබිලා තිබෙනවා. අර්තාපල්වල තත්ත්වයත් ඒකයි. මේ නිෂ්පාදන ක්‍රියාවලිය උඩට එනකොට වෙළෙඳ පොළ සම්බන්ධ යම් යම් ගැටලු මතු වෙලා තිබෙනවා.

මම මේක අවස්ථාවක් කර ගන්නවා, අපේ ආදරණීය ගොවි ජනතාවට මේ කාරණය කියන්න. ඔබේ හද ගැස්ම අපට හොඳින් දැනෙනවා. ඔබේ දුක වේදනාව, ඔබ විඳින ගැහැට අපට හොඳින් දැනෙනවා. අපේ ගොවි ජනතාවට මතක ඇති, අපේ ජනාධිපතිතුමා අලුත් සහල් මංගල්‍යයේදී ප්‍රකාශ කෙරුවා, "ගොවි ජනතාවගේ සියලු ගැටලු අපි ක්‍රමානුකූලව බේරනවා; විසඳනවා. හැබැයි, වෙළෙඳ පොළ ප්‍රශ්නය එක පාරට බේරන්න බැහැ. අපට ඒ සඳහා කන්න තුන, හතරක් ලබා දෙන්න" කියලා. එතුමා එහෙම ඉල්ලීමක් කෙරුවා. වෙළෙඳ පොළ ප්‍රශ්නයත් අපි ක්‍රමානුකූලව බේරාගෙන එනවා. ලංකාවේ ප්‍රධානම භෝගය වී. මේ වන විට වී ගොවියාගේ වෙළෙඳ පොළ ප්‍රශ්නය අපි සැලකිය යුතු මට්ටමකින් බේරලා තිබෙන්නේ; විසඳලා තිබෙන්නේ. අපි ගොවියාට සාධාරණ උත්තරයක් ලබා දීලා තිබෙනවා. ලංකාවේ සියලු ගොවි සංවිධාන පසුගිය දවසක එකතු වෙලා ඒ අය මේ පිළිබඳව බොහොම සතුටින් මාධ්‍යවලටත් ප්‍රකාශ කෙරුවා.

එහෙම නම් වී සම්බන්ධ ප්‍රශ්නයෙන් පස්සේ ඉතුරු භෝග පිළිබඳ ප්‍රශ්නත් අපි ක්‍රමානුකූලව බේරන්න ඕනෑ. එම නිසා ඒ ප්‍රශ්නත් අපි ක්‍රමානුකූලව නිරාකරණය කරමින් ඉන්නවා. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. වෙළෙඳ අමාත්‍යාංශයේ මැදිහත්වීම යටතේ ලොකු ලූනු මිලදී ගැනීම අපි ආරම්භ කළා. තඹුත්තේගම, දඹුල්ල වැනි ප්‍රදේශවල ලොකු ලූනු අපි මිලදී ගන්නවා; තවමත් මිලදී ගන්නවා. ඒ වාගේම බෝගහකුඹුර, කැප්පෙටිපොල, නුවරඑළිය යන ස්ථානවල අර්තාපල් මිලදී ගැනීමත් කරනවා. හැබැයි, එහිදී ගොවියාට යම් යම් ගැටලු මතු වුණා. ඒක අපි පිළිගන්නවා. ඒ ගැටලු ටිකත් අපි නිරාකරණය කරන්න ඕනෑ. අද උදේ වනකොට දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට ලොරි 50කට ආසන්න ප්‍රමාණයක ලොකු ලූනු ගෙනාවා. කිලෝවක් රුපියල් 175 ගණනේ ඒ ලොකු ලූනු ටික ගොවි ජනතාවට විකුණා ගන්න අවස්ථාව ලැබුණා. මේ වනකොට මේ ප්‍රශ්නය යම් ප්‍රමාණයකට සමනයට පත් වෙමින් තිබෙනවා. හැබැයි, මේ සඳහා ස්ථිර විසඳුමක් අවශ්‍යයි.

මේ ගැන ඊයේත් අපේ සාකච්ඡාවක් තිබුණා. අපේ ලාල් කාන්ත ඇමතිතුමා, මම, අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා, අපේ අමාත්‍යාංශවල නිලධාරින් ඇතුළු අපි ඔක්කෝම එකතු වෙලා මීට පිළියමක් වශයෙන් ක්‍රියාත්මක කළ හැකි වැඩ පිළිවෙළක් පිළිබඳව සාකච්ඡා කළා. මේ අය වැයෙන් ජනාධිපතිතුමා රුපියල් මිලියන 1,000ක මුදලක් වෙන් කර තිබෙනවා, වී, බඩඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු කියන භෝගවල වෙළෙඳ පොළ ප්‍රශ්නය නිරාකරණය කරන්න. ඒ අනුව තමයි ඊයේ ලාල් කාන්ත ඇමතිතුමා මේ සම්බන්ධ යම් ප්‍රකාශයක් කළේ. ඒකට තව එකතු කිරීමක් මම කරනවා. ඉදිරියේදී ගොවි ජනතාවගේ මේ භෝගවලට නිශ්චිත මිලක් ප්‍රකාශ කරලා, රජය මැදිහත් වෙලා එම භෝග මිලදී ගැනීම මීට වඩා ක්‍රමවත්ව ආරම්භ කරනවා.

ඒ වාගේම අපි විශේෂයෙන්ම අවධානය යොමු කරනවා, නිෂ්පාදන වියදම අඩු කරන්නත්. එතැනදි අස්වැන්න වැඩි කර ගැනීමත් අදාළ වනවා. අස්වැන්න වැඩි කර ගැනීම ඇතුළේ නිෂ්පාදන වියදම අඩු කර ගන්න පුළුවන්. ඒ වාගේම අනෙකුත් යෙදවුම් සඳහා යන නිෂ්පාදන වියදමත් අඩු කර ගන්න ඕනෑ. අපි ඒවා ගැනත් කල්පනා කර තිබෙනවා. ඒ තුළින් පාරිභෝගිකයාටත් සහනයක් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙනවා. එහෙම නම් මේ තත්ත්වය ඇතුළේ ගොවි ජනතාවගේ වෙළෙඳ පොළ ප්‍රශ්නයත් අපි ක්‍රමානුකූලව එකින් එක විසඳනවා කියන කාරණයත් මේ වෙලාවේ මා සඳහන් කරනවා.

විශේෂයෙන්ම වතු කම්කරු ජනතාව පිළිබඳව ගත්තොත්, අදත් මෙතැන අපි අහගෙන ඉන්නකොට ඒ වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි කිරීම ගැන ඉතාම නිෂේධනීය ලෙස සමහරුන් කරුණු හුවා දැක්වුවා, රජයේ මුදල් කොම්පැනිවලට ලබා දෙන්නේ කොහොමද යනාදී වශයෙන්. ඇත්තටම අපි ඒ පිළිබඳව කනගාටු වෙනවා. පාන් පිටි ටිකක් ගෙනැල්ලා රොටියක් පුච්චලා, හකුරු කෑල්ලක් කාලා කහට කෝප්පයක් බීලා ජීවත් වන අහිංසක මිනිස්සුන්ගේ රොටිය පුච්චන භාජනයට පයින් ගහන්න එපා කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. අද ඒ ජනතාවට සොච්චම් මුදලක් රජයේ මුදල්වලින් දෙනකොට ඒකට විරුද්ධව කථා කරන අය, මහ බැංකුව කඩනකොට, ජනාධිපති අරමුදලේ සල්ලි කෝටි ප්‍රකෝටි ගණන් කොල්ල කනකොට, තමන්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීලා පිට රට යවන්න ඒ සල්ලි ගන්න කොට කථා කළේ නැහැ. හිටපු අගමැති කෙනෙක් රුපියල් ලක්ෂ 300ක් ගත්තා.

ඒ විතරක් නොවෙයි. ගෙවල් ගිනි තැබීමට අදාළව රුපියල් කෝටි ප්‍රකෝටි ගණනින් වන්දි ගන්නකොට, ලොතරැයි මණ්ඩලයේ සල්ලි හොරකම් කරනකොට, රටේ සල්ලි කාබාසිනියා කරනකොට මේ අය කථා කළාද? එහෙම හොරකම් කරපු කී දෙනෙක් අද වනකොට හිර ගෙදර ඉන්නවාද? දැන් කී දෙනෙකුට චෝදනා එල්ල වෙලා තිබෙනවාද? අදත් එක්කෙනෙක් අත්අඩංගුවට පත් වෙනවා, හොරකම් කරලා, කප්පම් අරගෙන. අව්වට කර වෙවී, වැස්සට තෙමී තෙමී, රොටියක් කාලා, කහට කෝප්පයක් බීලා මේ මහ පොළොව අස්වද්දන්න මැදිහත් වන අහිංසක වතු කම්කරුවන්ට සොච්චම් මුදලකින් වැටුප් වැඩි කිරීම, රටේ මහජන මුදල් ඒ විධියට කාබාසිනියා කරන අය ඉතාම කුහක ලෙස දැකීම පිළිබඳව ඇත්තටම අපි කනගාටු වෙනවා. ඒ තත්ත්වයත් එක්ක මම අවසාන වශයෙන් ප්‍රකාශ කරන්න කැමැතියි, අනිවාර්යයෙන්ම මේ අය වැයත් එක්ක අපට ලොකු පිම්මක් පනින්න පුළුවන් බව. අපි ඒ පිම්ම අනිවාර්යයෙන්ම පනිනවා. අපි මේ රට යහපත් සුරක්ෂිත තැනකට අනිවාර්යයෙන්ම ගෙන යනවා. අපේ ආණ්ඩුවට ඒක කරන්න පුළුවන් කියන විශ්වාසය පළ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු මංජුල සුරවීර ආරච්චි මහතා**
(மாண்புமிகு மஞ்ஜுள சுரவீர ஆரச்சி)
(The Hon. Manjula Suraweera Arachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ගැන කථා කිරීමට ප්‍රථමයෙන් මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ, විශේෂයෙන්ම අපට ඡන්දය දීපු අල ගොවියා, ලූනු ගොවියා, උඩරට එළවලු ගොවියා මේ වෙලාවේ මුහුණ දීලා තිබෙන ඉතා සංවේදී තත්ත්වය කියන්න ඕනෑ. ඒ පිළිබඳව අපට කම්පනයක් තිබෙනවා. මොකද, මේ හදා ගත්ත ආණ්ඩුව ගොවි, කම්කරු ජනතාවගේ ආණ්ඩුවක්. මේක රටේ ප්‍රගතිශීලී ජනතාවගේ ආණ්ඩුවක්. සමහර ගැටලු අපට පැන නැඟිලා තිබෙනවා, ඉතාම කෙටි කාලයක් තුළ විසඳන්න බැරි, නමුත්, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් ඔස්සේ සැබෑ පිළිතුර සොයා ගැනීමට යම් කාල පරාසයක් ගත වන. අන්න ඒ වාගේ ගැටලුවකට තමයි අල ගොවියා, විශේෂයෙන්ම බී ලූනු ගොවියා සහ උඩ රට එළවලු ගොවියා මුහුණ දීලා ඉන්නේ. මේ මොහොතේ ඔවුන්ට මුහුණ දෙන්න සිදු වී තිබෙන මිල පිළිබඳ ප්‍රශ්නයට, මිල පිළිබඳ ගැටලුවට අප සංවේදී වනවා. ඒ වෙනුවෙන් ආණ්ඩුව හැටියට අපි ගොවි ජනතාවට කනගාටුව ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම වත්මන් ආණ්ඩුවේ කෘෂිකර්ම ඇමතිතුමා, කර්මාන්ත ඇමතිතුමා සහ වෙළෙඳ ඇමතිතුමා ඒකාබද්ධ වූ යාන්ත්‍රණයක් හරහා ඉදිරියේදී ස්ථාවර මිලක් සහතික කරමින් ඉදිරි කන්නයේ සිට එම ප්‍රශ්නයට සැබෑ පිළිතුරක් සොයන්න උත්සාහ ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ සංවාදයට ගන්නේ මේ රටේ 80වන අය වැය. ආණ්ඩුවක් විධියට අපි වර්ෂයකට ආසන්න කාලයක් තුළ අය වැය දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. මේ අය වැය රටේ සංවර්ධනය ඉලක්ක කරගෙන, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ අරමුණ සහිතව, කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් ඔස්සේ පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උදා කිරීමේ අරමුණ පෙරදැරිව රටේ ජනතාවත් එක්ක සාමූහිකව ගනු ලබන උත්සාහයක්. නමුත්, අපට තේරෙනවා විපක්ෂයේ කණ්ඩායම් මෙම අය වැය බොහොම සැහැල්ලුවට ගෙන, අවතක්සේරු කරමින්, අවඥාසහගත ස්වරූපයෙන් කථා කරන බව. අය වැය 78ක් හදන කල් ඒවාට නායකත්වය දුන්, ඒවාට උල්පන්දම් දීලා කටයුතු කළ, ඒ ජන බලය තුළ ජනතාව අපහසුතාවට පත් කළ, ශ්‍රී ලංකාව බංකොලොත් රාජ්‍යයක් ලෙස ලේබල් ගහන කල්ම රට පාලනය කළ කණ්ඩායම් විසින් ඒ සමහර විවේචන කරනකොට අපට ඇත්තටම ඒ විවේචන ගැන තිබෙන්නේ අනුකම්පාවක් වාගේම පිළිකුලක්. මොකද, නොහැකියාව, අකාර්යක්ෂමතාව, බැරිකම, හොරකම හා නාස්තිය කියන කාරණා ඇතුළේ දූෂණයෙන් හා වංචාවෙන් ඉහ වහා ගිහිල්ලා මේ රට කාබාසිනියා කළ උදවිය මේ පාර්ලිමේන්තුව තුළ වැදි බණ දෙසන තරම් පිළිකුලක් අපට තවත් නැහැ. විශේෂයෙන්ම අපි අවුරුද්දක කාල සීමාවක් ඇතුළේ හොරා කෑම නවත්වා තිබෙනවා. වංචා, දූෂණ නවත්වා තිබෙනවා. නාස්තිය නවත්වා තිබෙනවා. හොරකම, නාස්තිය, දූෂණය හා වංචාව නැවැත්වීම ඇතුළේම අවුරුද්දක කාල සීමාව තුළ භාණ්ඩාගාරය පිරෙන්න පටන් අරගෙන තිබෙනවා. අවුරුදු 78ක කාල සීමාවේ භාණ්ඩාගාරය හිස් වෙන්න, රටේ මුදල් නාස්ති වෙන්න බලපෑවේ ඒ අය අනුගමනය කළ දේශපාලන ක්‍රියාමාර්ග, උපාය මාර්ග කියන එක, ආර්ථිකය වැරදි ගමනක ගෙන ගියේ ගියන එක පිළිගන්න තරම් නිහතමානිකමක් ඒ අයට නැතිකම තමයි අපට දකින්න තිබෙන්නේ.

මෙම අය වැය තුළින් විශේෂයෙන්ම වතු කම්කරු ජනතාව වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් මෙම ආණ්ඩුව ඉටු කර තිබෙන බව අපි දන්නවා. අපි පොරොන්දු වුණා, වතු කම්කරු ජනතාවගේ ජන ජීවිතය උසස් කරන ගමනක් මේ අය වැය තුළින් ආරම්භ කරනවා කියලා. මේ අවුරුදු පහ ඇතුළේ ඉදිරි කාල සීමාවේදී අය වැය තුළින් අපි ඔවුන් උසස් සමාජ මට්ටමට ගෙනෙන්න අවශ්‍ය කරන සියලු වට පිටාව නිර්මාණය කරනවා කියන එක අපි ජන වරම ලබා ගන්නකොට කිව්වා. ඒ අනුව රටේ ආර්ථිකයට දායක වන මධ්‍යම කඳුකරයේ, විශේෂයෙන්ම 87,500ක් වන වතුකරයේ වැඩ කරන ජනතාවගේ, වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,750 දක්වා වැඩි කරන්න පුළුවන් වෙලා තිබෙනවා. වතු කම්කරුවෙකුගේ දෛනික වැටුප රුපියල් 1,350ක් ලෙසයි තිබුණේ. ඒක ප්‍රමාණවත් වැටුපක් නොවෙයි. මේ වනවිට නුවරඑළිය දිස්ත්‍රික්කයේ තේ කර්මාන්තයේ දැවැන්ත කඩා වැටීමක් තිබෙනවා. වතු යායවල් පාළු වෙමින් තිබෙනවා. තේ කර්මාන්තයට අදාළ යෙදවුම්වල මිල වැඩි වෙලා තිබෙනවා. නමුත්, ඒ තත්ත්වය තුළත් මේ රටේ ආර්ථිකය ඉහළට නංවන්න සමාගම් කටයුතු කරමින් ඉන්නවා. ඒ සමාගම්වලට මේ වෙලාවේ තිබෙන ආර්ථික හැකියාව අනුව වතු කම්කරුවාට දෛනිකව රුපියල් 200ක් වැඩි කරලා දෙන්න තීන්දු කරනකොට, ආණ්ඩුව පැත්තෙන් - විශේෂයෙන් ජනාධිපතිතුමා - පැමිණීමේ දිරි දීමනාවක් ලෙස රුපියල් 200ක් දෙන්න තීන්දු කරලා තිබෙනවා. අපි දන්නවා, බිඳ වැටිලා තිබුණු ආර්ථික තත්ත්වය තුළ, බංකොලොත් වුණු රටක් තුළ පවා ඉතා හොඳ ආර්ථික කළමනාකරණයක් කර ගනිමින් උදවු අවශ්‍ය සහ වැඩි-වැඩියෙන් දායක වෙන්න ඕනෑ කණ්ඩායම්, ප්‍රජාව හඳුනාගෙන ආණ්ඩුව ඒ අය වෙනුවෙන් කටයුතු කරමින් සිටින බව. වතු කම්කරුවෙකුගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කර ගත හැකි ආකාරයට මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 5,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාව විධියට අපි මධ්‍යම කඳුකරයේ වෙසෙන පීඩාවට පත් වුණු ඒ අහිංසක ජනතාව වෙනුවෙන් ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට අය වැයකින් රුපියල් 200 ගණනේ දෛනික දිරි දීමනාවක් ලබා දීමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ ලබා දුන් මහා ආදර්ශය වෙනුවෙන් ජනාධිපතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අපි දන්නවා, වතු ජනතාව නිසි නිවාසයක් නැතුව අව්වෙන්, වැස්සෙන් පීඩාවට පත් වෙමින් මහා කඳු මුදුන්වල ලැයිම් කාමර ඇතුළේ සිටින බව. සමහර මිනිස්සු අවුරුදු 200ක් පරණ ලැයිම් කාමරවල ඉන්නවා. ඒ නිවාස පද්ධතිය අලුත් කිරීම, ඔවුන්ට වර්තමානයට ගැළපෙන නිවාස පද්ධතියක් ස්ථාපිත කිරීම ආණ්ඩුවේ වැඩක්. මේ ජනතාවාදී ආණ්ඩුව, ජනාධිපතිතුමා ප්‍රමුඛව අපි හදා ගත්ත ආණ්ඩුව විසින් 2026 වසරේ නිවාස 4,000ක් හදන්න අවශ්‍ය සැලසුම් සියල්ල සකස් කරමින් තිබෙනවා. ඒවා අපි ලබා ගත්ත ජයග්‍රහණ; වැඩ කරන පීඩිත ජනතාව ලබා ගත්ත ජයග්‍රහණ.

අපේ දිස්ත්‍රික්කයේ අලුත්වැඩියා කළ යුතු ග්‍රාමීය පාරවල් 611ක් තිබෙනවා. කිලෝමීටර 4,500කට වැඩිය හදන්න තිබෙනවා. මෙතෙක් ඒවාට කිසිම අයිතිකාරයෙක් නැහැ. PRDA එකටවත්, RDA එකටවත් හදන්න බැරි වුණු ග්‍රාමීය පාරවල් 611ක් තිබෙනවා. මෙවර අය වැය තුළින් රුපියල් මිලියන 324,000ක මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, ග්‍රාමීය පාරවල් සහ ප්‍රවාහන සහ මහා මාර්ග ක්ෂේත්‍රය දියුණු කර ගන්න. 2026 අය වැය තුළින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඩයගම පැත්තට යන්න තිබෙන පාරවල්, ලක්ෂපාන පැත්තට යන්න තිබෙන පාර, මතුරට පැත්තට යන්න තිබෙන පාර, තලවකැලේ පැත්තට යන්න තිබෙන පාරවල්, කොත්මලේ පැත්තට යන්න තිබෙන පාරවල් වාගේ හද්දා පිටිසර පාරවල් ඇතුළු නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 10ක් ඇතුළේ තිබෙන මූලික පාරවල් 611කින් සැලකිය යුතු ප්‍රමාණයක් හදන්න මුදල් වෙන් කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒක අපි ලබා ගත්ත ජයග්‍රහණයක්. ඒක අපේ නුවරඑළිය දිස්ත්‍රික්කය ලබා ගත්ත විප්ලවීය වෙනසක්. ඒ වෙනුවෙන් ජනාධිපතිතුමා දායක වෙලා තිබෙනවා. ඒ වෙනුවෙන් එතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. නුවරඑළිය කියන්නේ, හැම දාම කුඩම්මාගේ සැලකිල්ලට ලක් වුණු දිස්ත්‍රික්කයක්. නුවරඑළිය දිස්ත්‍රික්කයට මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරපු තීරණාත්මක, ඓතිහාසික අය වැයක් තමයි මෙවර ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක අපි ලබා ගත්ත ජයග්‍රහණයක්.

විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ National Water Supply and Drainage Board එකෙන් ලබා දෙන පානීය ජලය ලබා ගන්නේ සියයට 11යි. පාසල් දරුවන් ඇතුළු සියයට 89ක් සත්ව අසූචි මිශ්‍ර ජලය සහ බැර ලෝහ අඩංගු ජලය පානය කරනවා. එහෙම නම් මේ අය වැය අපට තීරණාත්මක වෙන්නේ මිනිසුන්ගේ මූලික අවශ්‍යතාවක් බවට පත් වුණු පිරිසිදු පානීය ජලය ලබා දීමේ අයිතිය තහවුරු කරමින් පානීය ජල ප්‍රශ්නය විසඳන්න රුපියල් මිලියන 85,700ක් අය වැය හරහා වෙන් කිරීම නිසායි. ඒ වෙන් කළ මුදල් ප්‍රමාණය යටතේ රුපියල් මිලියන 2,000ක් වෙන් කරලා තිබෙනවා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පානීය ජලය සියයට 11 මට්ටමේ සිට සියයට 22 දක්වා සියයට සියයකින් වැඩි කරන්න. අවුරුදු 76ක් මේ රට පාලනය කළ අය පිරිසිදු පානීය ජලය ලබා දුන්නේ සියයට 11ක ප්‍රමාණයක් වුණත්, අපි අවුරුද්දක් ඇතුළත ඒක සියයට 22 දක්වා සියයට සියයකින් වැඩි කරන්න කටයුතු කරමින් සිටිනවා. මේවා අපි ලබා ගත්ත ජයග්‍රහණ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි දන්නවා, සුදු අධිරාජ්‍යවාදීන්ගේ කාලයේ තේ කර්මාන්තයත් එක්ක බැඳිච්ච ප්‍රධාන නගරය වන්නේ හැටන් නගරය බව. හැටන් කියන්නේ දෛනිකව මිනිසුන් 50,000කට ආසන්න ප්‍රමාණයක් ගැවසෙන නගරයක්. සුද්දාගේ කාලයේ හැටන් බැංකුව හදා තිබෙන්නේත් එම නගරයේ. හැටන් කියන්නේ ඉතා අකාර්යක්ෂම, පිළිවෙළක් නැති නගරයක්. අන්න ඒ නගරය අවුරුදු 3ක සැලසුමක් තුළ 2028 වසරේදී දියුණු නගරයක් බවට පත් කිරීම සඳහා සංවර්ධනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 2,000ක මුදලක් යෝජනා කර තිබෙනවා. එම සැලසුමට වෙන් කළ මුදලින් පළමුවැනි මිලියන 500 ජනාධිපතිතුමා මේ අය වැය හරහා අපට ලබා දීලා තිබෙනවා. විපක්ෂය මේක සැහැල්ලුවට දැක්කාට, ඔවුන් නුවරඑළිය දිස්ත්‍රික්කයට කරපු දේකුත් නැහැ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට පීඩාවට පත් කළ එක විතරයි ඔවුන් කළේ. ඒ ජනතාවගේ රීරි මාංසය උරා බීපු එක විතරයි ඒ අය කළේ. එසේ නොසලකා හැර තිබුණු දිස්ත්‍රික්කයක් දියුණු කිරීම සඳහා මේ අය වැය හරහා මුදල් වෙන් කරමින් අපට දැවැන්ත ජයග්‍රහණයක් ලබා දීලා තිබෙනවා.

අද වනවිට විපක්ෂයේ අය කලබල වෙලා තිබෙන බවක් අපි දකිනවා. නමුත් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මෙම අය වැය සම්බන්ධයෙන් එතුමන්ලාගේ ධනාත්මක අදහස් ප්‍රකාශ කළා. වතු ජනතාව, පීඩාවට පත් වෙලා සිටින ජනතාව ඉන් මුදා ගැනීම සඳහා ඉදිරිපත් වුණු හොඳම අය වැය මේ අය වැය බව එතුමන්ලා ප්‍රකාශ කරද්දී, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේ අය වැයට විරුද්ධව කථා කරමින්, වතු ජනතාවට රුපියල් 200ක් ආණ්ඩුවෙන් ලබා දෙන යෝජනාවට විරෝධතාව දක්වනවා; ඒ සම්බන්ධව මැසිවිලි නඟනවා. අපි දන්නවා, අපේ අය වැය සම්බන්ධයෙන් 2025 සිට හොඳ අධ්‍යයනයක යෙදී සිටියා, තොන්ඩමන් මැතිතුමා. එතුමා ඒක හොඳින්, මනා ලෙස විශ්ලේෂණය කළ නිසා තමයි එතුමා ඉන්දියාවෙන් විවාහයක් කරගෙන යන්න හදන්නේ. මම හිතන විධියට, 23වැනි දා එතුමාගේ විවාහ උත්සවය තිබෙනවා. අපි ඒකටත් එතුමාට සුබ පතනවා. ඉන්දියාව පැත්තටම යන්න වාගේ අදහසක් එතුමාට තිබෙනවා. හේතුව, වතුකරයේ ජනතාව රවටා ගෙන හිටපු යුගය දැන් නිමා කර තිබෙන්නේ. ජනතාව ඓතිහාසික තීන්දුවක් ගත්තා. වතුකරයේ තවත් පරණ සෙල්ලම්වලට ඉඩක් නැහැ. ඒ නිසා එතුමාට බින්න බහින්න වෙන්නේ ඉන්දියාවේ. එතුමා ඉන්දියාව පැත්තට යන වෙලාවට හෝ ආපසු ඇවිල්ලා යනකොට හෝ අවශ්‍ය කොට්ට, මෙට්ට, පැදුරු ටිකත් අරගෙන ගියා නම් හොඳයි කියා අපි කියනවා.

ඒ වාගේම මෙම අය වැයට විරුද්ධ වෙන්න බලාගෙන සිටින නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න කැමැතියි, එතුමන්ලා කරගෙන හිටපු මොකක් හෝ පරණ බිස්නස් එකක් -රෙදි බිස්නස් එක වාගේ එකක්- කරගෙන නැවත ඉන්න පුළුවන් කියන කාරණය. එහෙම නැත්නම් අර ලවර්ස් ලීප් දිය ඇල්ල පැත්තේ ඉඩම්වල එළවලු ටිකක් වගා කරගෙන ගොවිජන රක්ෂණ ක්‍රමයටත් දායක වෙලා ඒ වාගේ දෙයක් කරගෙන ඒ අයට ඉන්න පුළුවන්. නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් විපක්ෂය නියෝජනය කරමින් ආපු මන්ත්‍රීවරු කවුරුන් හෝ මේ අය වැයට විරුද්ධ වෙලා, වැඩ කරන ජනතාවගේ මේ ආණ්ඩුවට විරුද්ධ වෙලා, වැඩ කරන වතු කම්කරුවන්ට වැඩි කළ සොච්චම් මුදලට විරුද්ධ වෙලා ඡන්දය පාවිච්චි කරන්න බලාගෙන ඉන්නවා නම්, කොට්ට, මෙට්ට, පැදුරු හකුළා ගෙන ඉන්දියාවටම තමයි ඒ අයටත් යන්න වෙන්නේ කියන පණිවුඩය දෙමින් මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.14]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකය ගැන අපේ ජ්‍යෙෂ්ඨ විශේෂඥ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළා. ඒ නිසා මම මේ අවස්ථාවේ ඒ ගැන වැඩිය කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ ආණ්ඩුව පත් කරගෙන අපේ රටේ අහිංසක, දුප්පත් ජනතාව අවුරුද්දක කාලයක් තිස්සේ විඳින දුක් ගැහැට ගැන මේ සභාව දැනුවත් කරන්නයි මම බලාපොරොත්තු වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය ආර්ථිකය දියුණු කරන්න, දේශීය කර්මාන්ත දියුණු කරන්න, රටේ ජනතාවගේ ජීවිත නගා සිටුවන්න, කුසට ආහාර සපයන්න නායකත්වය ලබා දෙන ගොවියා, ධීවරයා නඟාසිටුවන්න අවශ්‍ය කිසිම වැඩ පිළිවෙළක්, කිසිම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න මේ රජයෙන් සැලසුම් කර නැහැ. විශේෂයෙන්ම අද ගොවියා ගොවිතැනින් ඉවත් වෙනවා. සුළු පරිමාණ ගොවියා නඟාසිටුවීමට මේ රජය තුළ වැඩ පිළිවෙළක් ඇත්තේම නැහැ. වී ගොවියා අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම අද වනවිට අල ගොවියා මහ පාරට බැහැලා තිබෙනවා. ඒ වාගේම ලූනු ගොවියා අද අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පසුගිය අවුරුද්දේ මේ රජය ලබා ගැනීම සඳහා වත්මන් ඇමතිවරු වෙලේ, මඩේ, කුඹුරේ, කමතේ ගොයම කාගෙන, මඩ නාගෙන, පස්ස පැත්ත සුදු මහත්වරුන්ට අමුඩ අන්දවා කොළඹට ගෙන්වා උද්ඝෝෂණ කරලා, මහ පාරට බැහැලා, ගොවීන් රවට්ටලා, ගොවීන් අන්දලා - *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

අමු මාළු කැවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

අමු මාළු කැවේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

[ගරු දිලිප් වෙදආරච්චි මහතා]

ගොවි ජනතාව අන්දලා, මේ රටේ ජනතාව මුළා කරලා බලය ලබා ගත්තා. නමුත්, අද ගොවියෝ මහ පාරට බැහැලා මේ රජයට ශාප කරනවා කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ධීවර ජනතාව ඉන්නවා. බලාගෙන ඉන්න, පොඩ්ඩක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ගත්ත දවසේ ඉඳලාම බදු ගහනවා. බදු ගහලා රටේ ජනතාව පරිභෝජනය කරන ආහාර ද්‍රව්‍යවල මිල වැඩි කරලා තිබෙනවා. බඩු මිල වැඩි කරලා, කන බොන සෑම දෙයකම මිල වැඩි කරලා රටේ ජනතාවට අද ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා කරලා තිබෙනවා. අද හාල් කිලෝවක මිල කීයද? රුපියල් 180යි. පොල් ගෙඩියක මිල කීයද? රුපියල් 180යි. අද ලූනු මිල කීයද? මිනිස්සු පරිභෝජනය කරන අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල, ආහාර ද්‍රව්‍ය සියල්ලේම මිල අද වැඩි වෙලා තිබෙනවා. සිල්ලර බඩුවල මිල වැඩිවෙලා තිබෙනවා, ගෑස් මිල වැඩිවෙලා තිබෙනවා, විදුලි බිල වැඩිවෙලා තිබෙනවා, ජල බිල වැඩිවෙලා තිබෙනවා, වරිපනම් ගාස්තු වැඩිවෙලා තිබෙනවා, බෙහෙත්වල මිල වැඩිවෙලා තිබෙනවා, පාසල් දරුවන්ගේ පොත්පත්වල මිල වැඩිවෙලා තිබෙනවා. ඒවාට බදු සහනයක් ලබා දෙනවා කිව්වාට ඒවා ලබා දුන්නේ නැහැ. ඒ වාගේම බස් ගාස්තු, සබන්, පවුඩර් ඇතුළු හැම දෙයකම මිල මේ රජය වැඩි කරලා තිබෙනවා. ඒ විධියට වැඩි කරලා, බදු ගහලා භාණ්ඩාගාරයේ මුදල් වැඩි කරලා තිබෙනවා කියලා අර මන්ත්‍රීතුමෙක් කිව්වා. කන්න බොන්න නොදී භාණ්ඩාගාරයේ මුදල් වැඩි කරලා මොකටද, ගරු මන්ත්‍රීතුමනි? මිනිස්සු අද ජීවත් වෙන්නේ අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා. ගම්බද මිනිස්සුන්ට බෙහෙත් ටිකක් ගන්න විධියක් නැහැ. අපේ ඉස්පිරිතාලවල බෙහෙත් නැහැ. බෙහෙත් තුණ්ඩුව විතරයි දෙන්නේ. ඒවා ගන්න ෆාමසිවලට යන්න ඕනෑ. රුපියල් 5,000ක්, 6,000ක් වැඩිහිටියන්ට වැඩි කර ලබා දීලා, මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා කරපු ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුව කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණයන්ට කිව්වා, ජපන් මෝටර්සයිකල් ලබා දෙනවා කියලා. ත්‍රිරෝද රථ ලබා දෙනවා, රුපියල් ලක්ෂ 12ට විට්ස් කාර් ලබා දෙනවා කිව්වා. එහෙම කියලා ජනතාව ඇන්දුවා. රජයේ සේවකයා ඇන්දුවා, තරුණයන් ඇන්දුවා. අන්දලා මහ පාරට බස්සලා ඡන්දය ලබා ගත්තා. නමුත් ඒ තරුණයන්ගේ විට්ස් කාර්, ජපන් මෝටර්සයිකල්, ත්‍රිරෝද රථ ලබා ගන්නා සිහිනය, අද සිහිනයක්ම බවට පත්වෙලා තිබෙනවා. එහෙම වෙන්නත් ඕනෑ, කයිවාරුවට රැවටුණාට. අද එය සිහිනයක්ම වෙලා තිබෙනවා. ඒ ගහපු බදු නිසා වාහන ගන්න එක සිහිනයක් වෙනකොට, මේ පාර අය වැයෙනුත් තව බද්දක් ගහලා තිබෙනවා. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද කියලා සියයට 15ක් පනවා තිබෙනවා. මේ ආණ්ඩුව තිබෙනකම්, විට්ස් කාර් නොවෙයි කරත්තයක්වත් ගන්න හම්බ වෙන්නේ නැහැ.

මම අධ්‍යාපනය ගැනත් කථා කරන්න ඕනෑ. පාසල් දරුවන්ට පාසල් උපකරණ සහ පොත්පත්වලට, පෙර පාසලේ සිට විශ්වවිද්‍යාල දක්වා අවශ්‍ය ද්‍රව්‍යවලට පනවා තිබෙන බදු ඉවත් කරනවා කිව්වා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා වේදිකාවක් වේදිකාවක් ගානේ ගිහිල්ලා කිව්වා, අධ්‍යාපනය ලබන දරුවන්ගේ පොත්පත් ඇතුළු පාසල් උපකරණ සියල්ලටම ගහපු බදු ඉවත් කරනවා කියලා. නමුත් අද වෙනතුරු කිසිම බද්දක් ඉවත් කළේ නැහැ. දරුවන්ට රුපියල් 6,000ක් දෙනවා කිව්වා පොත්පත් ලබා ගන්න. රැවටිල්ල, මුළාව තිබෙන්නේ.

අපේ නායකතුමා, සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටේ පාසල්වලට බස් රථ ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා. මා ඉන්න හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල්වලට විතරක් බස් රථ 38ක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම smart classrooms ලබා දීමේ වැඩ පිළිවෙළ ආරම්භ කළා. මේ සියල්ලම ආරම්භ කරලා ලබා දෙමින් යනකොට මේගොල්ලෝ සජිත් ප්‍රේමදාස පාසල්වලට යන එක නැවැත්වුවා. මේගොල්ලෝ නීතියක් දමලා ඒක නැවැත්වුවා. දැන්, බස් රථ දෙනවාද, smart classrooms හදනවාද? මොනවාද දෙන්නේ? අනුර කුමාර ජනාධිපතිතුමාට ඕනෑ නම් සජිත් ප්‍රේමදාසට කියන්න පුළුවන්, "විපක්ෂ නායකතුමනි, බස් රථ බෙදා දීම නැවත ආරම්භ කරන්න, ටැබ් ලබා දීමේ වැඩ පිළිවෙළ නැවත ආරම්භ කරන්න" කියලා. පාසල් සිසුවියන්ට පෑඩ් ලබා දෙන්න කියලා යෝජනා කරනකොට, පාසල්වලට බස් රථ දෙනකොට "පෑඩ් මෑන්" "බස් මෑන්" කියලා විහිළු කළා. අපේ නායකයා ඒවා ඉදිරියට කරගෙන යෑමේ බලාපොරොත්තුවෙන් තමයි මේ රටේ පාලනය භාර ගන්න හැදුවේ. ජනතාව ඔබතුමන්ලාට රැවටුණා; මුළා වුණා. ජනතාව ඔබතුමන්ලාට ඡන්දය දීලා අද හුල්ල හුල්ල ඉන්නවා, ගලේ පහරපු බළලුන් වාගේ. ඔන්න ඕක තමයි රටේ ජනතාවට වෙලා තිබෙන්නේ.

මම මතක් කරන්න ඕනෑ, වෛද්‍ය ක්ෂේත්‍රය ගැනත්. අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ අපේ රාජිත සේනාරත්න මැතිතුමා සෞඛ්‍ය අමාත්‍යවරයා හැටියට සිටියදී රජයේ රෝහල්වල හෘදය සැත්කම් නොමිලේ කළා. ඒ වාගේම පිළිකා රෝගීන්ට සීමාවකින් තොරව ඖෂධ ලබා දුන්නා. *[බාධා කිරීමක්]* වතුර? වතුර දුන් කට්ටිය ගැන අහගන්න, නාමල් රාජපක්ෂ මැතිතුමාගෙන්. රාජිත සේනාරත්න මැතිතුමා යහ පාලන ආණ්ඩුව කාලයේ පිළිකා රෝගීන්ට සීමාවෙන් තොරව ඖෂධ ලබා දුන්නා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
එතුමන්ලාට දැන් ඔක්කෝම පැටලිලා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඔව්, එතුමන්ලාට දැන් වයර් මාරු වෙලා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ඒක ඇත්ත.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ අය ගිහිල්ලා වයර් ගහ ගන්න ඕනෑ, අර පැත්තේයි, මේ පැත්තේයි දෙකේම. මගෙන් අහගන්න එපා.

එදා හොඳ තත්ත්වයේ ඇස් කණ්ණාඩි සහ කාච ලබා දුන්නා. ඖෂධ වර්ග 380ක මිල අඩු කළා. එදා ලේ පරීක්ෂා කළේ නොමිලේ. අද ලේ පරීක්ෂා කරවා ගන්න වෙන්නේ සල්ලිවලට. අද අහිංසක, දුප්පත් ජනතාව රෝහල්වලට ගියාම මුදල් වියදම් කරලා තමයි පරීක්ෂණ සෑම දෙයක්ම කර ගන්න සිදු වෙන්නේ. *[බාධා කිරීමක්]* අද ශල්‍යකර්මයක් කරන කොට වෛද්‍යවරයාටයි, පොඩි පොඩි බඩු මුට්ටු ගන්නයි රුපියල් 50,000ක් විතර යනවා. එදා ඒවා නොමිලේ ලබා දුන්නේ. මතක තබා ගන්න. එදා ඒවා නොමිලේ ලබා දුන්නේ. අද වන කොට සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කිසිම සේවාවක් ජනතාව වෙනුවෙන් ඉෂ්ට වෙන්නේ නැහැ. අද දුප්පත්

මිනිහා අසරණ වෙලා ඉන්නේ. අද දුප්පත් මිනිහාට බෙහෙත් ටික ගන්න විධියක් නැහැ; ඉන්සියුලින් එකේ NovoMix එක තිබෙනවා වුණත් NovoRapid එක නැහැ. අද ඒ ඉන්සියුලින් එක වෙළඳ පොළේ නැහැ. ඉන්සියුලින් දෙන එන්නත් කටුව නැවෙනවා. මොකද, බාල එන්නත් කටු තමයි ගෙනෙන්නේ. මේ සෞඛ්‍ය ඇමතිවරයාත් වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ කෙනෙක්. එතුමාත් කළුතර ඉන්න නිසා රාජිත සේනාරත්න මැතිතුමාගෙන් උපදෙස් ලබා ගන්න කියලා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා ඒ ක්ෂේත්‍රයේ කටයුතු ටික හරියට කරන්න.

වරායෙන් ගන්නා රුපියල් 50, මහා භාණ්ඩාගාරයෙන් අය කරන රුපියල් 50, කාංචනගේ සාක්කුවට ගිය රුපියල් 50 එකතු කරලා - ඒ රුපියල් 150 අරගෙන - ලාම්පුතෙල් සහනාධාරය ඇතුළුව ඉන්ධන සහනාධාරය ධීවරයන්ට ලබා දෙනවා කිව්වා. නමුත්, අද ධීවර ජනතාව වෙනුවෙන් සතයක්වත් වෙන් කරලා නැහැ. වාලච්චේන වරාය ඉදි කරන්න මුදල් වෙන් කරලා තිබෙනවා. ඊට අමතරව තවත් කීපයකට විතරක් මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත්, ධීවර නියෝජ්‍ය ඇමතිවරයා පන්දම් පත්තු කරගෙන බෝට්ටුවෙන්, ඔරුවෙන් ගංගාවේයි, මුහුදේයි ගිහිල්ලා, වෙලේයි, මඩෙයි හැම තැනකම ගිහිල්ලා තමයි ධීවර ජනතාව රවට්ටලා ඡන්දය ලබා ගත්තේ. නමුත්, අද ධීවරයන් වෙනුවෙන් තඹ සතයක් වෙන් කරලා නැහැ, මේ ආණ්ඩුවෙන්.

ඒ වාගේම, පසුගිය කාලයේ ලුණු හිඟයක් ඇති කළා. ලුණු හිඟයක් ඇති කරලා රයිගම් සමාගමට පිටරටින් ලුණු ගෙන්වන්න අවස්ථාව ලබා දුන්නා. එතැනින් කොමිස් ගහ ගත්තා. ඒ වාගේම හාල්, ලූනු, අල වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ලක්ම පිටරටින් ගෙන්වා ගෙන ඒවායින් කොමිස් ගහ ගත්තා. පැලවත්තට කොමිස් යනවා. තව කාට කාට යනවාද කියලා අපි දන්නේ නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
Sir, I rise to a point of Order.

**ගරු දිලිප් වෙදආරච්-චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කාගේවත් නම් කියන්නේ නැහැ. මගේ වෙලාව දෙන්න බැහැ. හොරකම, කොමිස් ගැහිල්ල සාර්ථක කර ගන්න,- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ කථාවේදි වැරැදි අදහසක් ඉදිරිපත් කළා. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතැන Point of Order එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න. *[බාධා කිරීම්]*

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජයෙන් කන්ටේනර් 332ක් ගෙන්නුවා, මේ අවුරුද්ද ඇතුළත. ඒ කන්ටේනර් 332න් හම්බන්තොට දිස්ත්‍රික්කයට කන්ටේනර් 2ක් ආවා. කුඩු සහ අයිස් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය කිලෝ 6000 ගණනේ තිබෙන කන්ටේනර් 2ක් ආවේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ එවැනි කොම්පැනි තුනක් ආරම්භ කරන්න රජයේ අනුග්‍රහයෙන් කන්ටේනර් දෙකක් එව්වා කියන එක මම ප්‍රකාශ කරනවා. *[බාධා කිරීම්]* ඒක නැහැ කියන්න බැහැ. *[බාධා කිරීම්]* ඒක නැහැ කියන්න බැහැ. *[බාධා කිරීම්]* කට වහගන්න. ඒක නැහැ කියන්න බැහැ. *[බාධා කිරීම්]* අපේ දිස්ත්‍රික්කය කුඩුවලින් පෝෂණය කළේ මේ ආණ්ඩුවයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. *[බාධා කිරීම්]* මම මේ ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. *[බාධා කිරීමක්]*

කරුණාකරලා, මට තව විනාඩි 2ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 4ක් තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
හොඳයි, බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වෙලාව වැඩියි වගේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
වැඩි නැහැ, මට වෙලාව මදි.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 576හි පිහිටුවන ආරක්ෂක කමිටුවලට තමන්ගේ පක්ෂයේ කණ්ඩායම් දාලා පොලීසියත් සම්බන්ධ කරගෙන ආරක්ෂක කමිටු හදන්න එපා. ඒ ආරක්ෂක කමිටු හදද්දී ඒ ගමේ ඉන්න පක්ෂ හතරේම නියෝජිතයන් ඇතුළත් කර ගන්න, මේ කුඩු වසංගතය නැති කරන්න ඕනෑ නම්. පක්ෂ හතරේම අය ඇතුළත් කරගෙන, පොලීසියේ නිලධාරිනුත් ඇතුළත් කරගෙන මේ කුඩු වසංගතය නැති කරන්න. අපේ ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් මේ උවදුර තිබෙනවා. මේ කුඩු වසංගතය නැති කරන්න ඕනෑ නම්, මෙන්න මේ කියපු විධියට ආරක්ෂක කමිටු ස්ථාපිත කරලා කටයුතු කරන්න. එහෙම කටයුතු කරලා මේ කුඩු වසංගතය නැති කරන්න. එහෙම නැත්නම් මේක නැති කරන්න බැහැ. අද හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒවා ව්‍යාප්ත වෙලා ඉවරයි. කොච්චර කිව්වත්, මේක මේ රජයෙන් කෙරුණු වැඩක්. පසුගිය දවස්වල අයිස් මත්ද්‍රව්‍යය ඇල්ලුවා; කුඩු ඇල්ලුවා. උණාකුරුවෙන් බෑවා; ඒ කුඩු ඇල්ලුවා. නමුත් ආපු බෝට්ටු ඇල්ලුවේත් නැහැ, වෙන දෙයක් වුණේත් නැහැ. අල්ලා ගත්තු කට්ටිය කිහිප දෙනෙකු ඉදිරිපත් කළා, උසාවියට. පරීක්ෂණය සඳහා තියා ගත්තේ,- *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කුඩු වසංගතය ඉවරයක් කරන්න හම්බන්තොට දිස්ත්‍රික්කයේ විශේෂ මෙහෙයුමක් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කළා, මේක අපේ ශාපයක් කියලා. අපේ ශාපය තමයි ඒගොල්ලන්ට බලපාන්නේ කිව්වා. අපේ ශාපය ඒගොල්ලන්ට බලපාලා තිබෙන්න නම් අපේ පක්ෂයේ නායකවරු අවුරුදු 77ක් පොල් ගාලා තිබෙන්න ඕනෑ. ජේවීපී එකේ ශාපය තමයි අපි මේ ගෙවන්නේ. එදා මහවැලි ව්‍යාපාරය කරන කොට විරුද්ධ වුණා. අද සියයට 50ක් විදුලිය ලබා දෙන්නේ මහවැලිය ආශ්‍රිතව. එදා ගොවි ජනපද පිහිටුවලා ඒවායේ ගොවියෝ පදිංචි කළා. ඒ ගොවීන් ජීවත් කරවන්නේත්, රටේ ජනතාවට කන්න බත සපයා දෙන්නේත් ඒ මහවැලි ව්‍යාපාරය කරපු නිසා.

එදා ඇඟලුම් කර්මාන්ත හදන කොටත් විරුද්ධ වුණා; සුද්දන්ට ජංගි මහනවා කිව්වා. එදා සුද්දන්ට ජංගි මහනවා කියපු ඒ ඇඟලුම් කර්මාන්ත 200 තුළ සේවය කරන මේ රටේ තරුණ කාන්තාවන් අදත් ජීවත් වෙනවා. එදා ඒවාට අකුල් හෙළුවා; හදන්න එපා කිව්වා. ඒ වාගේම, ඇල්ල - වැල්ලවාය පාර හදන කොට, ඒක කරන්නේ ඇමෙරිකානු ප්ලේන් බාන්නයි කියලා ඒක නතර කරන්න කිව්වා. එදා ඔබතුමන්ලාගේ නායකයෝයි එහෙම කිව්වේ. ඒ කටයුතු නතර කරන්න කිව්වා. අද ඔබතුමන්ලා ඒ පාරවල හොඳට යනවා.

ඒ වාගේම, expressway එක හදන කොට අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා එදා කිව්වා, බල්ලන්ට පාර මාරු වෙන්න බැහැ කියලා. අද හොඳට යනවා, ඒ හදපු expressway එකේ. ඇඹුල්තියල් ගේන්න රාජපක්ෂලා ඒක හැදුවා කිව්වා. අද මහත්තුරු වාගේ expressway එකේ හොඳට යනවා. ලජ්ජයි!

ඒ වාගේම වරාය නගරය, කෙරවලපිටිය බලාගාරය හදන කොට ඒවාටත් විරුද්ධ වුණා. නමුත්, අද විදුලි බලය ලබා දෙනවා කෙරවලපිටිය බලාගාරයෙන්. වරාය නගරයේ විවෘත කිරීම්වලටත් ගියා ජනාධිපතිතුමා. එදා ඉන්දියානු වෙළෙඳ ගිවිසුම්වලටත්, සිංගප්පූරු වෙළෙඳ ගිවිසුම්වලටත් විරුද්ධ වුණා. පෞද්ගලික විශ්වවිද්‍යාල හදන කොටත් විරුද්ධ වුණා; උද්ඝෝෂණය කළා; මහ පාරට බැස්සා. දැන් මේ මන්ත්‍රීවරුන්ගේ දරුවෝත් යන්නේ ඒ පෞද්ගලික විශ්වවිද්‍යාලවලට නේද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
එදා පෞද්ගලික රෝහල් හදන කොට විරුද්ධ වුණා. පෞද්ගලික පාසල් හදන කොට විරුද්ධ වුණා. දැන් ඒ පාසල්වලට යනවා ඔබතුමන්ලාගේ දරුවෝත්. එහෙම නම්, ඒ ගරු මන්ත්‍රීතුමාට මා කියන්නේ මේකයි. අපේ පක්ෂවලට බණින්න එපා. ඔබතුමන්ලාගේ පක්ෂයේ වාගේ කුහක මිනිස්සු අපේ ගාව නැහැ. මේ පක්ෂ ටික එකතු වෙලා තමයි අවුරුදු 77ක් මේ රට මෙච්චර කල් ගෙනාවේ. ඒවා නැති කළේ ඔබතුමන්ලා 1988-89 කාලයේ ඒවා ගිනි තියලා; විනාශ කරලා. ඒ කාලයේ රට සුන් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.29]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

නව රජයේ දෙවැනි අය වැය ගැන කරුණු දක්වද්දී, මුලින්ම මා කියන්න කැමැතියි, මේ අය වැය හදලා තිබෙන්නේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයත් එකතු කරගෙන බව.

මගේ කථාව පටන් ගන්න කලින් මේ කාරණය කියන්න කැමැතියි. මේ අය වැය කථාවත් එක්ක අපට දීලා තිබෙනවා, අය වැය විශ්ලේෂණය කරන තවත් පොත් 10ක්. ඒ පොත් 10 අතර අය වැය, ආර්ථිකය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තා තිබෙනවා; විශ්ලේෂණ තිබෙනවා; දත්ත සටහන් තිබෙනවා. මේ පොත් දුන්නේ කියවන්න. සමහරු පරණ පොතක් දිග ඇරගෙන මෙතැන කථා කළාට ඇති වැඩක් නැහැ නේ. මේ පාර්ලිමේන්තුවටම වයසට ගිය අය ඉන්නවා. හැබැයි, මේ පොත් 10න් එකක් හරි බලාගෙන ආවා නම්, හොඳ කථාවක් කරන්න තිබුණා. ඒ නිසා මම ආරාධනා කරනවා, පුළුවන් නම් මේ පොත් ටික අධ්‍යයනය කරලා ජනතාවට දෙයක් ඉගෙන ගන්න පුළුවන් විධියට කථා කරන්න කියලා. එය, මේ පාර්ලිමේන්තුවේ අවුරුදු ගාණක් හිටියා කියනවාට වඩා හොඳයි. විවේචනයක් කළාට කමක් නැහැ, මේ පොත් ටිකත් අධ්‍යයනය කරලා. පරණ පොත් ටික පැත්තකින් තියලා අදට ගැළපෙන හොඳ හරවත් කථාවක් කළා නම් හොඳයි කියලා මා හිතනවා.

මෙතැන ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මොකක්ද දන්නවාද? සත්‍යය නොදැන යමක් අසත්‍ය යැයි කියන්නේ මෝඩයෝ කියලා අපි දන්නවා.

සත්‍යය නොදැන යමක් අසත්‍යයි කියනවා නම්, ඒ අය මෝඩයෝ. මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඒ අය සත්‍ය දන්නේ නැහැ. හැබැයි තිබෙන ප්‍රශ්නය ඒකමත් නොවෙයි. සත්‍ය දැනගෙන ඒත් අසත්‍යයි කියන්නේ මෝඩයන්ට එහා ගිය අපරාධකාරයෝ. ඇයි මම එහෙම කියන්නේ? එහෙම කියන්නේ මම නොවෙයි, ගැලීලියෝ ගැලිලි. සත්‍ය දන්නවා. ඒ දැනගෙනත් ඒක අසත්‍යයක් කියනවා; බොරු කියනවා.

දැන් කිව්වා නේ, ධීවර කර්මාන්තයට මොකුත් වෙන් කරලා නැහැ කියලා. මාර ප්‍රශ්නයක් නේ මේක. අඩු ගණනේ ඒ අය වැය කථාව අහගෙන ඉන්න ඕනෑ. නැත්නම් මේවා අධ්‍යයනය කරන්න ඕනෑ. මේ පොත් ටික පෙරළලා බලන්න. 2026 අය වැයෙන් කෘෂිකර්මාන්තයට වෙන් කරලා තිබෙනවා, රුපියල් බිලියන 135.5ක්. ඒ යටතේ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 70.7යි. ප්‍රාග්ධන වියදම් රුපියල් බිලියන 64.8යි මේ, කෘෂිකර්මාන්තයට විතරක් වෙන් කළ මුදල. මාළු රසත් බලන නිසා ධීවර කර්මාන්තයට වෙන් කළ මුදලත් කියන්නම්කෝ. ධීවර කර්මාන්තය සඳහා රුපියල් බිලියන 10.6යි. ඒ යටතේ පුනරාවර්තන වියදම් සඳහා රුපියල් බිලියන 4.1යි. ධීවර කර්මාන්තය වෙනුවෙන් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදල රුපියල් බිලියන 6.5යි. මම කිව්වා වාගේ සත්‍ය දැනගෙන අසත්‍ය කියන්නේ කවුද කියලා මම ආයේ කියන්නේ නැහැ. ඒ නිසා එතැනට වැටෙන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම තව එකක් කිව්වා, බදු ගැන. බද්දක් ගහලා තිබෙනවා කිව්වා. දවස් 4ක් තිස්සේ අපේ ආණ්ඩුව නියෝජනය කරමින් අපේ මන්ත්‍රීවරු දිගින් දිගටම මේ ගැන අදහස් දැක්වූවා. ඒ වාගේම, ඒ ප්‍රකාශන වාර්තා තිබෙනවා. ඒ හැම එකේම තිබෙන දේ තමයි, මේ අවුරුද්දේ අපි කිසිම බද්දක් ගහලා නැහැ කියන එක. හැබැයි දිගින් දිගටම ඒ බොරුවක් කියාගෙන යනවා. නමුත් අලුත් බද්දක් අපි එකතු කරලා නැහැ. මේ අවුරුද්දේ අපි කිසිම බද්දක් ගහලා නැහැ. මේ අවුරුද්දේ බද්දක් එකතු වෙලා නැහැ. ඒ නිසා නොමග යවන්න එපා. අසත්‍ය පතුරුවන්න එපා. සත්‍ය දැනගෙන අසත්‍ය පැතිරුවොත් එහෙම, ඔබතුමන්ලා වැටෙන්නේ අපරාධකාරයන් ගණනට. මොකද ඒ? අපි දැන් හොඳටම දන්නවා, සියයට 7ක ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යනවා කියලා. ඒක හොඳ නැද්ද? ඒක සත්‍යයක් නොවෙයිද? ඒක හොඳයි. ඒ වාගේම, අපේ විදෙස් නිල සංචිත ඇමෙරිකානු ඩොලර් බිලියන 6ට වඩා ඉක්මවන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒක හොඳ නැද්ද? ඒක හොඳයි. ඒක වෙලා තිබෙන දෙයක්. ඒ වාගේම, අපේ රාජ්‍ය ආදායම ගැන කථා කරද්දී 2024 මුල් මාස 9ට සාපේක්ෂව 2025 ගත්තොත් මම කියන්නම්, සත්‍ය දේවල් ටිකක්. 2025දී අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 8.5 සිට වැඩි වෙලා තිබෙනවා ඇමෙරිකානු ඩොලර් බිලියන 9.1 දක්වා. මේක අසත්‍යයද? මේවා තේරෙන්නේ නැහැයි කියලා හිතනවා නම්, බොරුවට නිදාගෙන ඉන්නවා නම් ඒ අයගෙන් මම අහන්නේ මේවා අසත්‍යද කියලායි.

ඊළඟට, සේවක ප්‍රේෂණ ගැනත් කථා කරන්න ඕනෑ. දැන් සමහරු කියනවා නේ, මේක අර කාගෙ කාගෙ හරි අය වැයක් කියලා. අපි හැදුවා, ඉතුරු ටික මේ අය කරගෙන යනවා කියනවා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදෙස්ගත වෙලා ඉන්න අපේ ඒ සේවකයන්ගේ වැටුප පසුගිය කාලයේ ලංකාවට එව්වේ නැහැ කියලා කිව්වා නේ. ඇයි ඒ? විශ්වාසයක් තිබුණේ නැහැ, රට හදයිද, නැද්ද කියලා. ඒ වෙනුවට වුණේ මොකක්ද? මේ රටේ හිටපු, සියලු හැකියාවන් තිබෙන පුද්ගලයන් විශාල ප්‍රමාණයක් රට හැර ගියා. ඒගොල්ලෝ රට දාලා යයිද, මේගොල්ලෝ මේ රට හදයි කියලා විශ්වාසයක් තිබෙනවා නම්? ඒ අය රට දාලා ගියා. හැබැයි අද මොකද වෙන්නේ? එදා එවන්නේ නැතුව තිබුණු සල්ලි ප්‍රමාණය, ඒ ප්‍රේෂණ ප්‍රමාණය 2024 පළමුවැනි මාස 9ට වැඩිය අද වෙද්දී වැඩිවෙලා තිබෙනවා. එදා, 2024දී එව්වේ ඇමෙරිකානු ඩොලර් බිලියන 4.8යි. 2025දී ඔවුන් එවලා තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 5.8ක්. ඇමෙරිකානු ඩොලර් බිලියන 4.8 ඇමෙරිකානු ඩොලර් බිලියන 5.8 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා.

ඒ වාගේම සංචාරක ඉපයීම් ගත්තොත්, සංචාරක ඉපයීම් ඇමෙරිකානු ඩොලර් බිලියන 2.3 ඉඳන් 2.5 දක්වා 2025දි වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රජයේ ආදායම් ප්‍රදාන රුපියල් ට්‍රිලියන 2.9 සිට 2025 මුල් මාස 9 තුළ රුපියල් ට්‍රිලියන 3.8 දක්වා වර්ධනය කරගෙන තිබෙනවා. එතකොට මේවා සත්‍ය නොවෙයිද? මේවා ගැන නොදැන ද මේ කරුණු කියන්නේ? නැහැ, දැනගෙනයි කියන්නේ. ඒ නිසා තමයි කියන්නේ, දැනගෙන බොරු කියන්න එපා, ජනතාව නොමඟ යවන්න එපා කියලා.

අපි මෙච්චර ආර්ථික වර්ධනයක් ගත්තේ, ප්‍රාථමික ශේෂය රුපියල් ට්‍රිලියන 0.8 සිට රුපියල් ට්‍රිලියන 1.5 දක්වා වැඩි වීමක් පෙන්නුම් කරන්නේ මොකක් නිසාද? ඒකට ප්‍රධාන හේතුව අපි ගත්තු ක්‍රියාමාර්ග. දූෂණ, වංචා අවම කරලා, රාජ්‍ය සේවය කාර්යක්ෂම කරලා, විධිමත් බඳවා ගැනීම් නැවතත් ආරම්භ කරලා, රාජ්‍ය සේවකයන්ට විශ්වාසයක් ඇති කරලා අපි ගත්තු ක්‍රියාමාර්ග නිසා රජයේ සේවකයන් අපිත් එක්ක ලොකු ගමනක් යන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ නිසා අපට පුළුවන් වෙලා තිබෙනවා, මූල්‍ය කළමනාකරණය තුළින් මේ රට ස්ථාවර තැනකට ගේන්න. ඒක ජයග්‍රහණයක් නොවෙයිද? අද රට ස්ථාවර වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට කරන්න බැරි වුණු දේ අපි කරලා තිබෙනවා. අද රට ස්ථාවර වෙලා තිබෙනවා. රට ස්ථාවර කළේ කොහොමද කියන එක ගැන ඔබතුමන්ලා නොදන්නවා නොවෙයි. හොඳටම දන්නවා.

පසුගිය කාලයේ රැකියා දෙන එක නවත්වලා තිබුණා. බඳවා ගැනීම් කළේ නැහැ. විශ්‍රාම වැටුප දෙන්න ඕනෑ අයට 2016 සිට විශ්‍රාම වැටුප නොදී හිටියා. බඳවා ගැනීම් කළේ නැහැ. රජයේ සේවකයන්ට දෙන්න ඕනෑ වරප්‍රසාද දුන්නේ නැහැ. හැබැයි, අපි මොකද කළේ? මේ වෙද්දී 75,000කට ආසන්න ප්‍රමාණයකට රජයේ රැකියා දෙන්න ක්‍රියාමාර්ග ගනිමින් පවතිනවා. දැන් වෙද්දීත් විවිධ රාජ්‍ය ආයතනවලට බඳවා ගැනීම් කරමින් පවතිනවා. එහෙමයි අපි කටයුතු කරන්නේ. රජයේ ආදායම වැඩි කර ගත්තා වාගේම, විශ්‍රාම වැටුප ගෙවන්න තීරණය කළා වාගේම, රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න බඳවා ගැනීමුත් කරලා තිබෙනවා.

තවත් බොරු කියමින් යනවා සේවා වියුක්තිය ගැන. දැන් කියනවා, "අනේ රස්සා නැති වෙලා, සේවා වියුක්තිය වැඩි වෙලා" කියලා. මම කියන්නම්, ඒ ගැන. 2024 පළමුවෙනි කාර්තුවේදී සියයට 4.5කට තිබුණු සේවා වියුක්තිය 2025 පළමුවෙනි කාර්තුවේදී සියයට 3.8 දක්වා අඩු වෙලා තිබෙනවා. අපට පුළුවන් වෙලා තිබෙනවා, සේවා වියුක්තිය අඩු කරලා ශ්‍රම සහභාගිත්වය සහිත, එහෙම නැත්නම් ශ්‍රමය ඵලදායී විධියට යොදා ගැනීමේ ගමන ආරම්භ කරන්න. අපි කියන්නේ නැහැ සියල්ල කළා කියලා. ඒ නිසා 2024 පළමුවෙනි කාර්තුවේදී ශ්‍රම බලකායේ සහභාගිත්වය සියයට 47.1 ඉඳන් 2025 පළමුවෙනි කාර්තුව වෙනකොට සියයට 49.7 දක්වා වර්ධනය කරගන්න පුළුවන් වෙලා තිබෙනවා. අපි ශ්‍රම බලකා සහභාගිත්වය වර්ධනය කරගෙන තිබෙනවා.

ඒ වාගේම තව මූලික කාරණාවක් මම මේ වෙලාවේ කියන්න ඕනෑ. වතු කම්කරුවන් ගැන, මලෙයහම් ජනතාව ගැන කථා කළා. මොකද, මේ රුපියල් 200 දෙන්න බැරි? රුපියල් 400ක

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය ]

වැටුප් වැඩිවීමක් දෙන්න කියලා රජය තීරණය කරලා තිබෙනවා, මේ අය වැයෙන්. වතු සමාගම් රුපියල් 200ක් දෙනවා. රජය තීරණය කරලා තිබෙනවා, රුපියල් 200ක් දෙන්න. මේ රුපියල් 200 දෙන්න බැහැයි කියන එකේ තර්කය තමයි, "මේ, රජයේ මුදල් නේ. මේ, බදු ගෙවන ජනතාවගේ මුදල් නේ" කියන එක. මම අහන්න කැමතියි, අවුරුදු 200ක් තිස්සේ මේ මිනිස්සු බදු ගෙව්වේ නැද්ද? මේ මිනිස්සු ඩොලර් හම්බ කරලා මේ රටට එව්වේ නැද්ද? මේ මිනිස්සු අපේ මිනිස්සු නොවෙයිද? කාරණා තුනක් මම අහන්නම්. මේ මිනිස්සු අපේ -ශ්‍රී ලාංකීය- මිනිස්සු නොවෙයිද, මේ මිනිස්සු වක්‍ර බදු විධියට බදු ගෙව්වේ නැද්ද, මේ මිනිස්සු අපට ඩොලර් එව්වේ නැද්ද? ඒවායින් නොවෙයිද ඔයගොල්ලන් ජීවත් වුණේ? ඔය විරුද්ධ වන විපක්ෂයේ කිසිම කෙනෙක් විදේශ මුදල් මේ රටට ගෙනැල්ලා තිබෙනවාද? හැබැයි, ඒ මිනිස්සු අවුරුදු 200ක් තිස්සේ අපේ ඩොලර් සංචිතයට මුදල් එකතු කළා. ඒ නිසා ඒගොල්ලන්ට අයිතියක් තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි දැන් පොහොර සහනාධාරය දෙනවා, ධීවරයන්ට සහනාධාර දෙනවා, භූමිතෙල් සහනාධාරය දෙනවා. පසුගිය අවුරුද්දේ අපට පුළුවන් වුණා, පෙර පාසල් ගුරුවරුන්ට -පෞද්ගලික අංශයේ ඉන්න පෙර පාසල් ගුරුවරුන්ට- රුපියල් 1,000ක් වැඩි කරන්න. අපි දිරි ගැන්වීම් සහන දෙනවා. දිරි ගැන්වීම් සහන දෙන්නේ, අපට -රජයට- වගකීමක් තිබෙන නිසා ඔවුන් එලදායි සේවයක යොදවන්න. ඒ නිසා අපි පෙර පාසල් ගුරුවරුන්ගේ සේවයට ගරු කිරීමක් විධියට ඔවුන්ගේ කාර්යක්ෂමතාව වැඩි කරලා ජීවත් වෙන්න පුළුවන් වැටුපක් ඔවුන්ට ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම අයිතියක් මේ මලෙයහම් ජනතාවට නැද්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
සමාවෙලා මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ ජනතාවටත් මේ අයිතිය තිබෙනවා. ඒ නිසා ලජ්ජයි, අපට. මේ රටට මෙච්චර දෙයක් කරපු, මේ රටට අයිතියක් තිබෙන මේ රටේ ජනතාවගේ වැටුප් වැඩිවීමට විරුද්ධ වීම පිළිබඳව මගේ විරෝධතාව ප්‍රකාශ කරනවා.

නැවතත් මේ රටේ ආර්ථික ස්ථායිතාව ඇති කරමින්, රටේ ජනතාවට ජනතාවාදී අය වැයක් ඉදිරිපත් කරමින් ඒ ප්‍රතිලාභ විඳින්න පුළුවන් විධියට උදවු කරපු සියලුදෙනාට ස්තුතිවන්ත වෙමින්, අපේ රටේ ජනතාවට 2026 අය වැය යථාර්ථයක් කරගන්න පුළුවන් වේවා කියා පතමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.42]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය විවාදයේදී මීට මොහොතකට පෙර විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් ප්‍රකාශ කළා, වාහන මත සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පැනවීම පිළිබඳව. සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මීට පෙර පනවපු බද්දක්. මේ බද්ද හරියාකාරව එකතු කරගත්තේ නැති නිසා ආනයනික අවස්ථාවේදී හෝ නිෂ්පාදනය කර විකිණීමේදී මේ බද්ද එකතු කරගැනීමක් තමයි අපි මේ අය වැයේ සඳහන් කරලා තිබෙන්නේ. ඒ කියන්නේ, මේක අලුතින් පනවපු බද්දක් නොවෙයි.

ඒ මන්ත්‍රීතුමා ධීවර කර්මාන්තය ගැනත් ගොඩක් දේවල් කිව්වා. මේ අය වැයෙන් ධීවර වරායවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. ධීවර වරායන්වල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් තවදුරටත් වැඩි කිරීම සඳහා දැනට ලබා දී ඇති ප්‍රතිපාදනවලට අමතරව රුපියල් මිලියන 1,000ක් ලබා දීමට යෝජනා කරලා තිබෙනවා. ඊළඟට, බේරුවල, අම්බලන්ගොඩ, කුඩාවැල්ල, නිල්වැල්ල ඇතුළු තෝරාගත් ධීවර වරායවල පවතින යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් මිලියන 300ක් වෙන් කරලා තිබෙනවා. ධීවරයන්ගේ ආරක්ෂාව ඉහළ නැංවීමට නවීන තාක්ෂණය ලබා දීම සඳහා රුපියල් මිලියන 350ක ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම මත්ස්‍ය අස්වැන්න ඉහළ නැංවීම සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කරලා තිබෙනවා. චන්ද්‍රිකා තාක්ෂණය භාවිත කරමින් මත්ස්‍ය බිම් හඳුනාගැනීම සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. මත්ස්‍ය බීජ සැපයුම වැඩි කිරීම සහ ගුණාත්මක මිරිදිය මසුන් ලබාගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීමට රුපියල් මිලියන 100ක් වෙන් කරනවා. මම හිතන විධියට, එතුමා හිටපු ධීවර රාජ්‍ය ඇමති. නමුත් එතුමා මේ අය වැය කථාවේ ධීවර කර්මාන්තයට සම්බන්ධ තොරතුරු ටිකවත් හරියට අධ්‍යයනය කරන්නේ නැතිව තමයි අද මේ විවාදයට සහභාගි වෙන්න ඇවිත් තිබෙන්නේ. ඒ ගැන ඉතාම කනගාටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බොහෝ අවස්ථාවල අය වැය කථා අහලා තිබෙනවා. අපි කවුරුත් හැම දාම උනන්දු වුණේ අය වැයෙන් ජනතාවට ලැබෙන සහන මොනවාද කියන එක පිළිබඳවයි. අපේ පළමුවැනි අය වැය, ඒ කියන්නේ 2025 වසර සඳහා අය වැය ඉදිරිපත් කරනකොටත් ජනතාව බැලුවේ ඒ අදහසින්. අපි බලයට පත් වෙලා පසුගිය දෙසැම්බර් මාසයේ පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළා. පෙබරවාරි මාසයේ අපි අය වැය ඉදිරිපත් කළා. ඊට මාස මාස හතකට පස්සේ දැන් 2026 වසර සඳහා අය වැය ඉදිරිපත් වෙලා තිබෙනවා. විපක්ෂයේ සමහර ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු දැන් කියනවා, 2025 අය වැය යෝජනා implement වෙලා තිබෙන්නේ සියයට 20ක් කියලා. මේ මන්ත්‍රීවරු ආයතනවල සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරලා, අවුරුද්ද අන්තිමට ඒ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක වීම පිළිබඳව පසුවිපරම් - review - කරලා නැහැ කියලා මම හිතනවා. ඒක නිසා තමයි සියයට 20 කථාව කියන්නේ. සමහරවිට එතුමන්ලා දන්නේ නැතිව ඇති, මේ සංවර්ධන ව්‍යාපෘතිවලට මුදල් වෙන් වුණාට ඒ මුදල් ගෙවීම් කරන්නේ නොවැම්බර් මාසයේ, දෙසැම්බර් මාසයේ කියලා.

මම අද උදේ හොරණ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව කැඳවලා ආවේ. ආසන්න වශයෙන් අපි මේ වසර අවසන් වනවිට හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සංවර්ධන ව්‍යාපෘති සියයට 95ක් අවසන් කරනවා කියන සහතිකය අද මට ලැබුණා. ඒක නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් හරියට මේවා අධ්‍යයනය කරන්න. එතකොට තමයි ඔබට තොරතුරු ලැබෙන්නේ, දැන් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව. අපට මාස හයයි තිබුණේ, මේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න. නමුත්, අපි ඒ පිළිබඳව නිසි පසු විපරමක් කළා. ඒ නිසා අපි මේ අවුරුද්ද අවසන් වන විට සියයට 95ක්, එහෙම නැත්නම් සියයට 100ක්ම ඒ සංවර්ධන ව්‍යාපෘති අවසන් කරනවා කියන සහතිකය ජනතාවට දෙන්න සූදානම්.

2026 වසර සඳහා තමයි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව පූර්ණ අය වැයක් ඉදිරිපත් කළේ. අපි පසුගිය 2025 අය වැය ඉදිරිපත් කරද්දී ඉතා සීමිත කාලසීමාවක් තමයි තිබුණේ. අපේ මේ අය වැය තුළින් සියලු සමාජ ස්තර ආමන්ත්‍රණය කරලා තිබෙනවා. මේ අය වැය ඉදිරිපත් කරනකොට, අපට තිබුණු අභියෝග මොනවාද? 2025 අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ආර්ථිකය ස්ථාවර කරන අභියෝගය අපට තිබුණා. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ අභියෝගය තිබුණා. ජාත්‍යන්තර විශ්වාසය නැවත දිනා ගන්නා අභියෝගය තිබුණා. සමාජයේ ආන්තික කොටස්වලට ජීවත්වීමේ අයිතිය තහවුරු කරන අභියෝගය තිබුණා. ජනගහනයෙන් හතරෙන් එකක් දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින අවස්ථාවක තමයි අපි මේ ආණ්ඩුව භාර ගත්තේ. ඒ වාගේ විවිධ අභියෝගවලට මුහුණ දෙමින් තමයි, 2025 අය වැයට සම්බන්ධ සංවර්ධන වැඩ කටයුතු අපි ක්‍රියාත්මක කළේ. මුළු ලෝකයම, මුළු රටම පිළිගත්තා, මීට පෙර හිටපු පාලකයෝ අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් කළා කියලා. විදේශ රටවල් අපට ණය ආධාර දුන්නේ නැහැ. තරුණයෝ රට හැර යන්න පටන් ගෙන තිබුණා. දරුවන් විදේශ රටවලට යවලා අධ්‍යාපනය ලබා දෙමින් හිටපු දෙමවුපියන්ට දරුවන්ගේ අධ්‍යාපනයට මුදල් යවන්න විධියක් නැති වුණා. විදේශ විනිමය නැති නිසා පශ්චාත් උපාධි පුහුණුව නැවතිලා තිබුණා. එහෙම තත්ත්වයක තිබියදී තමයි, අපි රට භාර ගත්තේ.

අපි ආණ්ඩුව ගන්නකොට මොකක්ද වෙලා තිබුණේ? රටේ ආර්ථික පදනම මුළුමනින්ම දෙදරලා තිබුණා, බිඳවැටිලා තිබුණා. දශක ගණනාවක් තිබුණු සාර්ව ආර්ථික අසමතුලිතතාව, ආදායමට වඩා වියදම් කිරීම, සැලසුම් කළ ප්‍රමාණයට වඩා ණය ගැනීම, උද්ධමනය ඉහළ යෑම, ආර්ථික වර්ධනය බාලවීම, රාජ්‍ය ණය පංගුව ඉහළ යෑම, ව්‍යුහාත්මක අස්ථාවරත්වය, අකාර්යක්ෂමතාව නිසා මේ රට දුර්වල රාජ්‍යයක් බවට පත් වෙලා තිබුණා. ආණ්ඩුවත්, ජනතාවත් ලොකු පීඩනයක හිටියේ. රට බංකොලොත් වෙලා තිබියදීත් 2024 සැප්තැම්බර් මාසයේ අපි රට භාර ගෙන, 2025 වසර සඳහා පසුගිය මාර්තු මාසයේ අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී විශ්‍රාම වැටුප් වැඩි කරන්නට හැකි වුණා. ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දුන්නා. ධීවරයන්ට භූමිතෙල් සහනාධාරය ලබා දුන්නා. පසුගිය අය වැයෙන් රජයේ සේවකයන්ගේ පඩි වැඩි කළා. වෘත්තිකයන්ගේ උපයන විට ගෙවීමේ බද්ද ගෙවිය යුතු අවම වැටුප් සීමාව රුපියල් එක්ලක්ෂ පනස්දහස දක්වා වැඩි කළා. අස්වැසුම දීමනාව වැඩි කළා. අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් ළමුන්ට පොත් හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමට රුපියල් 6,000ක්, පාවහන් මිලදී ගැනීමට රුපියල් 3,000ක් දුන්නා. නවතා තිබුණු සංවර්ධන වැඩ කටයුතු ආරම්භ කළා. අපි පාරවල්, ජලය, විදුලිය, ඇළ වේලි, පුරන් කුඹුරු අස්වද්දන එක, නිවාස ලබා දීම ආදී සියල්ල පසුගිය අය වැය එක්ක ආරම්භ කළා.

ඒ වාගේම, IMF එකත් එක්ක ඒ වන විටත් එකඟ වෙලා තිබුණු ගිවිසුමට අනුව ණය ප්‍රතිව්‍යුහගත කළා. එහෙම තමයි අපි පසුගිය අවුරුද්ද තුළ මේ රටේ ආර්ථිකය ස්ථාවර කර ගත්තේ. දැන් කවුරුත් පිළිගන්නවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආර්ථිකය ස්ථාවර කළා කියලා. දැන් අර පරණ කථා නැහැ, ඒ කාලයේ තිබුණු කථා නැහැ. අවුරුදු ගණනාවක් මාරුවෙන් මාරුවට රට පාලනය කළ විපක්ෂයේ කඳවුරු දෙක දැන් එක්තැන් වෙලා. දැන් ඒ අයගේ ප්‍රතිපත්තිත් අමතක වෙලා. ඔබට මතක ඇති, ජනතා විමුක්ති පෙරමුණේ එක මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේ සිටියදීත්, ඒ මන්ත්‍රීවරු තමන්ගේ අනන්‍යතාව ආරක්ෂා කළ බව, ප්‍රතිපත්තිය ආරක්ෂා කළ බව. නමුත්, අද සී සී කඩ ගිහිල්ලා තිබෙන විපක්ෂයට තම තමන්ගේ ප්‍රතිපත්තිත් අමතක වෙලා තිබෙනවා. පසුගිය මාස හයක කාලය තුළ පාර්ලිමේන්තුව පැවැති හැම දවසකම අපි සන්දර්ශන දැක්කා. ඒ තරමටම අසරණ වෙලා.

අපේ 2026 අය වැය කථාවට පස්සේ, මේ විවාදයේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් මොනවාද කිව්වේ? අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අය වැය විවාදයේදී කථා කරමින් කිව්වා, "සමස්තයක් හැටියට අපි පිළිගන්නවා, මේ ආණ්ඩුව ආර්ථිකය ස්ථාවර කර තිබෙනවා කියලා. හොඳ දේට හොඳයි කියන්න අපි පැකිළෙන්නේ නැහැ. ජනාධිපතිතුමාගේ දූෂණ විරෝධී වැඩ පිළිවෙළ අපි අගය කරනවා. අපි හිතුවේ නැහැ, මෙච්චර ප්‍රමාණයක් වාහන ආනයනය කරයි කියලා. ඩොලර් බිලියන 2කට ආසන්න ප්‍රමාණයක් LCs ඇරලා තිබුණා. අපට වැරදුණා" කියලා. මේ, එතුමාගේ වචන. ඒ වාගේම එතුමා කිව්වා, "කවුරුත් හිතපු නැති විධියට රජයට බදු ආදායමක් ලැබුණා" කියලා. එහෙම තමයි එතුමා කිව්වේ. බදු ආදායමක් ලැබුණා නොවෙයි, නිවැරදි ලෙස අපි මේ කටයුතු කළමනාකරණය කරලා බදු එකතු කළා. බදු පැහැර හරින්නන්ගෙන්, බදු හොරුන්ගෙන් අපි බදු අය කළා. බදු නොගෙවා හිටපු අය බදු දැලට ඇතුළු කළා. භාණ්ඩාගාරය උතුරා ගිහිල්ලා තිබෙනවා කියලා එතුමා කියනවා. "අපි දන්න ඉතිහාසයේ හැම වෙලාවේම OD - overdraft - එකක් තමයි ආණ්ඩුවට තිබුණේ, භාණ්ඩාගාරයට තිබුණේ. හැබැයි, පළමුවැනි වරට මේ වතාවේ රුපියල් ට්‍රිලියනයක් People's Bank එකේ සහ Bank of Ceylon එකේ වැඩිපුර සල්ලි තිබෙනවා" කියලා හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා එතුමාගේ වචනවලින්ම කිව්වා.

ඒ වාගේම ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කිව්වා, "ඇත්තටම අපනයනය වැඩිවීම, ජංගම ගිණුමේ අතිරික්තයක් තිබීම, අය වැය හිඟය අඩුවීම, බදු ආදායම වැඩිවීම ගැන සතුට ප්‍රකාශ කරන්න ප්‍රධාන විපක්ෂය හැටියට සමගි ජන බලවේගයේ අපි ලෝභ

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

වෙන්නේ නැහැ" කියලා. අද මොනවා කිව්වත් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ විවාදය ආරම්භ කරනකොට ඉතාම සද්භාවයෙන් කිව්වා, "ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ ආර්ථිකය කළමනාකරණය කරගෙන, ආර්ථිකය ස්ථාවර බවට පත් කරගෙන අපේ රට නිවැරදි දිශාවකට අරගෙන යනවා" කියලා. ඒ නිසා ඉදිරි දවස්වල විපක්ෂයේ මන්ත්‍රීවරු මොනවා කිව්වත් මේ රටේ ජනතාව දැන් පිළිගෙන ඉවරයි, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආර්ථිකය නිවැරදි මාර්ගයක ගෙන යමින් මේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්න ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.54]

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாவது வாசிப்பு மீதான விவாதத்தில் கலந்து கொள்வதையிட்டு மட்டற்ற மகிழ்ச்சி அடைகின்றேன்.

2025ஆம் ஆண்டில் கடைசி நேரத்தில்தான் அபிவிருத்தி சம்பந்தமான வேலைத்திட்டங்கள் அறிவிக்கப்பட்டன. அவற்றுக்கு ஒதுக்கப்பட்ட நிதியைத் திருப்பி அனுப்பிவிடக் கூடாது என்பதற்காக எங்களுடைய பிரதேசத்திலுள்ள அதிகாரிகள் இரவு பகலாக அயராது உழைத்துக்கொண்டு இருக்கிறார்கள். கடந்த வரவு செலவுத்திட்டத்தை நல்ல வரவு செலவுத்திட்டமென நான் கூறியது பிழை என்பதை உணர்ந்துகொண்டேன். வருடத்தின் கடைசிப் பகுதி மழைக் காலம்! எங்களுடைய வன்னிப் பிரதேசத்தை எடுத்துக்கொண்டாலும் சரி, நாட்டை எடுத்துகொண்டாலும் சரி, அந்தக் காலப்பகுதியில் எந்தவோர் அபிவிருத்தித் திட்டத்தையும் செய்ய முடியாத சூழல் காணப்படுகின்றது. எனவே, இந்த அரசாங்கம் 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தை நடைமுறைப்படுத்த முனையும்போது, பல்வேறு விடயங்களை முதலில் கையாள வேண்டும் என்பது என்னுடைய ஆலோசனையாகும்.

நீங்கள் எவ்வளவு பணத்தை ஒதுக்கினாலும், எங்களுடைய பிரதேசத்தில் அபிவிருத்திகளை மேற்கொள்வதில் பாரிய பிரச்சினைகள் இருக்கின்றன. வன இலாகா, வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் என்பன எங்களுடைய விவசாயிகளின் நிலங்களையும் அபிவிருத்தியை மேற்கொள்ளக் கூடிய அரச காணிகளையும் பிடித்துவைத்து இருக்கின்றன. ஏன், மன்னார் வைத்தியசாலை விடயத்தில்கூட வன இலாகாவின் பிடி இருக்கிறது. கட்டிடம் கட்டுவதாக இருந்தாலும் சரி அல்லது ஏதோவொரு விடயத்தைச் செய்வதாக இருந்தாலும் சரி, அவற்றின் அனுமதியைப் பெற வேண்டும் என்ற நிலை இருக்கின்றது. நீங்கள் அபிவிருத்திக்குக் கூடுதலான பணத்தை ஒதுக்குகின்றபோதும், அது சார்ந்த நடவடிக்கைகள் தடைப்படுகின்றன. அதற்குக் காரணம், வன இலாகாவானது விவசாயக் காணிகளையும் அரசாங்கக் காணிகளையும் பாரியளவில் கையகப்படுத்தி வைத்திருப்பதுதான்.

நாங்கள் இவ்விடயம் தொடர்பில் அபிவிருத்திக் குழுக் கூட்டத்தில் பேசும்பொழுது, அவற்றை விடுவிப்பதாகச் சொல்கிறார்கள். ஆனால், அது நடைபெறுவதில்லை. ஒவ்வோர் அரசாங்கத்திலும் இவ்வாறுதான் நடைபெறு கின்றது. வீட்டுத்திட்டங்கள், விவசாயிகளுக்கான அபிவிருத்தித் திட்டங்கள், கட்டிடங்கள் அமைத்தல் என்பன தடைப்பட்டு நிற்பது இந்தத் திணைக்களங்களின் செயற்பாடுகளினால்தான். ஆகவே, இந்தத் திணைக் களங்களை அரசாங்கம் தன்னுடைய controlஇல் வைத்திருக்க வேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அங்கு இந்தத் திணைக்களங்கள் அரசு போன்று செயற்படுகின்றது. "நாங்கள் யாருக்கும் அடங்க மாட்டோம்" என்று அத்திணைக்களத்தவர்கள் கூறுகிறார்கள். அவர்கள் யாரும் இந்த விடயத்தில் கவனம் செலுத்துவதாக இல்லை. நீங்கள் அபிவிருத்திக்காக எவ்வளவு பணத்தை ஒதுக்கினாலும், இந்தத் திணைக்களங்களின் மோசமான செயற்பாடுகள் இருக்கும் மட்டும் எங்களுடைய தேசத்திலே, இந்த நாட்டிலே அபிவிருத்தி நடைபெறாது.

பலாலியிலாக இருக்கலாம், தலைமன்னாரிலாக இருக்கலாம். அங்கு அபிவிருத்திப் பணிகளை முன்னெடுப் பதற்காக இந்தியா நிதி உதவி செய்வதாகச் சொல்லி இருக்கிறது. இப்பொழுதுதான் எங்களுடைய நாடு அபிவிருத்தி மூலம் வளர்ச்சியை நோக்கி நகருகின்ற ஒரு சூழல் ஏற்பட்டு இருக்கின்றது. அயல் நாடான இந்தியா எங்களுக்கு நிதி உதவி வழங்க முற்படும்போது, ஏன் அதைத் தடுக்கின்றீர்கள்? பலாலி விமான நிலையத்தை சர்வதேச விமான நிலையம் என்று சொல்கின்ற நீங்கள், ஏன் அதனை சர்வதேச தரத்துக்கு உயர்த்த மறுக்கின்றீர்கள்? யாழ்ப்பாணத்திலுள்ள காங்கேசன்துறை துறைமுகத்தை அபிவிருத்தி செய்வதற்கான முயற்சியை இந்தியா மேற்கொள்ள முனையும்போது, ஏன் அதனைத் தடுக்கின்றீர்கள்? தலைமன்னாருக்கும் இராமேஸ் வரத்துக்கும் இடையிலான கப்பல் சேவையை இந்தியா செய்ய முனையும்போது, ஏன் அதைத் தடுக்கின்றீர்கள்?

இன்று எங்களுடைய நாட்டுக்கு வருமானத்தை ஈட்டித் தருகின்ற ஒரு துறையாக சுற்றுலாத் துறை அமைந்துள்ளது. வெளிநாட்டவர்களின் வருகைதான் இன்று எமது நாட்டுக்குக் கைகொடுக்கிறது. Tourism என்ற விடயம்தான் இன்று எங்களுடைய நாட்டின் பொருளாதாரத்தைத் தாங்கிப் பிடிக்கிறது. எங்களுடைய வடக்கில் மேற்குறித்த விடயங்களை மேற்கொள்வதற்கு இந்தியா உதவி செய்ய முன்வரும்பொழுது, 'வடக்கு' என்ற காரணத்தால் அவற்றை நிறுத்தி இருக்கின்றீர்களா? பலாலி சர்வதேச விமான நிலையத்தைத் தரம் உயர்த்தும்போது, தெற்கில் இருக்கின்ற விமான நிலையங்களின் செயற்பாடுகள் தரம் குறைந்துவிடுமென நீங்கள் கருதுகின்றீர்களா? இந்தச் செயற்பாடுகளை அரசாங்கம் இனம் சார்ந்து பார்க்கின்றதா? என்ற கேள்விகள் எழுகின்றன. இந்தியா தனது உதவிக்கரத்தை நீட்டும்போது, அதனைப் பற்றிப்பிடித்து, எமது பொருளாதார நிலையை முன்னேற்றும் செயற்பாட்டைச் செய்வதுதானே சரியாக இருக்கும். ஆகவே, இந்த விடயத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் கரிசனை காட்ட வேண்டுமெனவும் கவனம் செலுத்த வேண்டுமெனவும் நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

நான் ஓர் ஆலோசனையைச் சொல்ல விரும்புகின்றேன். எமது நாடு பொருளாதாரத்தில் மேம்பட வேண்டும் என்றால், பயங்கரவாத தடைச் சட்டம் உடனடியாக நீக்கப்பட வேண்டும். இந்த நாட்டில் எந்த இடத்திலும் அபிவிருத்தியை ஏற்படுத்துவதற்கான வாய்ப்பை உண்டுபண்ண வேண்டுமாக இருந்தால், பயங்கரவாத தடைச் சட்டம் நீக்கப்பட வேண்டும். அப்போது எங்களுடைய நாட்டுக்கு நிச்சயமாக முதலீட்டார்கள் வருவார்கள். அது வெளிநாட்டில் வசிக்கும் தமிழர்களாகவும் இருக்கலாம், யாராகவும் இருக்கலாம். நீங்கள் மின் கட்டணத்தைக் குறைத்தாலும் சரி அல்லது வசதி வாய்ப்புகளை ஏற்படுத்திக் கொடுத்தாலும் சரி, பயங்கரவாத தடைச் சட்டம் அதற்குத் தடையாக இருக்கும் என்பதை நான் இங்கு சொல்லிக்கொள்ள விரும்புகின்றேன். பயங்கரவாத தடைச் சட்டத்தை நீக்கினால், எங்களுடைய நாட்டுக்கு முதலீட்டார்கள் நிச்சயமாக வருவார்கள். ஏனென்றால், அவர்கள் கையைச் சுட்டுக்கொண்டவர்கள்! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவர்கள் முதலீடு செய்யும் வரை பார்த்துக்கொண்டு இருந்துவிட்டு, அவர்கள் முதலீடு செய்த பின்னர், பயங்கரவாத தடைச் சட்டத்தைப் பயன்படுத்தி, அவர்களுக்கு முதலீடு செய்வதற்கான நிதி எப்படி வந்தது? அது தமிழீழ விடுதலைப் புலிகளுடைய பணமா? அல்லது யாருடைய பணம்? என்று விசாரிக்கக்கூடிய நிலைமை இருப்பதால், இங்கு வந்து முதலீடு செய்வதற்குப் பலரும் அச்சத்தில் இருக்கிறார்கள். இந்த நாட்டை பொருளாதார ரீதியாக முன்னேற்றமடையச் செய்ய வேண்டுமாக இருந்தால், பயங்கரவாத தடைச் சட்டத்தை நீக்கப்பட்டே ஆக வேண்டும். அதை இந்த அரசாங்கம் செய்வதாகச் சொல்லுகிறது. ஆனால், இற்றைவரை அது நடைபெறவில்லை. அரசாங்கம் இந்த விடயத்தில் கவனம் செலுத்தவில்லை என்றால், எங்களுடைய நாடு பொருளாதாரத்தில் முன்னேறுவதற்கான வாய்ப்புகளை இழக்க நேரிடும் என்பதை நான் இங்கு பிரதானமான விஷயமாகக் குறிப்பிட விரும்புகின்றேன்.

அடுத்து, வைத்திய துறையை எடுத்துக் கொள்வோம். மன்னார் பொது வைத்தியசாலையானது மிக மோசமாக பின்னடைவைச் சந்தித்து இருக்கின்றது. அங்கு போதியளவு வைத்திய நிபுணர்கள் இல்லை. அங்குள்ள நிலைமைகளை கௌரவ அமைச்சர் அவர்களும் ஆளுநர் அவர்களும் நேரடியாக வந்து பார்வையிட்டிருக்கிறார்கள். அந்த வைத்தியசாலை மாவட்ட வைத்தியசாலையாகத் தரமுயர்த்தப்பட்டு இருந்தாலும், கிராமப் புறத்தில் இருக்கின்ற வைத்தியசாலை போன்றுதான் இருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அரசாங்கம் இந்த வைத்தியசாலைக்கென இடமாற்றங்களைச் செய்கின்றது. அங்கு மயக்கவியல் நிபுணர்கள் தேவையாக இருக்கின்றார்கள். மயக்க நிலைக்கு உட்படுத்தி சத்திரசிகிச்சை செய்வதற்கு மயக்கவியல் நிபுணர்கள் வேண்டும். அது பிள்ளைப் பேற்றுக்காக இருக்கலாம் அல்லது ஏனைய விடயங்களுக்காக இருக்கலாம். அம்பாறையில் இருக்கின்ற வைத்தியர் எம்.டி.டி. சில்வாவுக்கும் எம்பிலிபிட்டியவில் இருக்கின்ற வைத்தியர் டி.கே.ஆர். கனங்கராவுக்கும் மன்னார் பொது வைத்திய சாலைக்கு transfer வழங்கப்பட்டு இருக்கிறது. எனினும், இவர்கள் இருவரும் இற்றைவரை அங்கு வரவில்லை. இதனால் மன்னார் வைத்தியசாலையிலுள்ள நிறைமாதக் கர்ப்பிணிகளும் அவசர சிகிச்சைப் பிரிவில் வைக்கவேண்டியவர்களும் யாழ்ப்பாண வைத்தியசாலைக்கும் வவுனியா வைத்திய சாலைக்கும் transfer பண்ணப்படுகின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மன்னாரில் இருந்து யாழ்ப்பாணத்துக்குச் செல்வதற்கு கிட்டத்தட்ட 2 மணித்தியாலங்கள் தேவை. அங்குள்ள ambulance யாழ்ப்பாணம் சென்று வருகையில், அவசர சிகிச்சை தேவைப்படுகின்ற இன்னோர் நோயாளி இறக்கின்ற நிலை ஏற்படுகிறது. எனவே, இந்த அரசாங்கம் முதலில் கல்வித்துறையிலும் சுகாதாரத்துறையிலும் கவனம் செலுத்த வேண்டும். அவற்றில் கவனம் செலுத்துகின்றபோதுதான் எங்களுடைய மக்களின் எல்லாத் தேவைகளையும் நிறைவுசெய்யக்கூடிய சந்தர்ப்பத்தை நாங்கள் உருவாக்க முடியும். அதிகாலையில் 5 மணிக்கு வைத்தியசாலைக்குச் செல்கின்ற நோயாளிகள், மத்தியான சாப்பாடு இல்லாமல் மாலையில் வீடு திரும்பக்கூடிய நிலையே காணப்படுகின்றது. இதே நிலைதான் எல்லா வைத்தியசாலைகளிலும் இருக்கின்றது. இதனை அரசாங்கம் கவனத்தில் எடுக்க வேண்டும். சாதாரண ஒரு மனிதன் அதிகாலை 5.00 மணிக்கு வந்து காத்திருந்து, பின்னர் நீண்ட நேரம் வெயிலில் வரிசையிலும் நிற்கவேண்டி இருக்கின்றது. பல இடங்களிலும் இவ்வாறுதான் நிலைமை இருக்கின்றது. Passport எடுக்கப் போவதென்றால்கூட, காலை 5.00 மணிக்குச் செல்ல வேண்டும். அதிகாலை 3.00 மணிக்கே அங்கு கூலிக்கு ஆட்களை அமர்த்தி இருப்பார்கள். அதேபோல், சாதாரண கிராம மக்களும் ஒவ்வொரு வைத்தியசாலையிலும் அதிகாலை 4.00 அல்லது 5.00 மணியிலிருந்து queueஇல் நின்று, பின்னேரம்தான் வீடு செல்கின்றார்கள். கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, இந்த துன்பகரமான நிலையைப் போக்க வேண்டுமென்றால், நாங்கள் கல்வி, சுகாதாரம் ஆகிய இரண்டு விடயங்களையும் பிரதானமாகக் கையாள வேண்டும்.

எங்களுடைய பிரதேசத்தில் வருமானத்தை ஈட்டித் தரக்கூடிய இரண்டு முக்கிய துறைகளாக விவசாயமும் மீன்பிடியும் காணப்படுகின்றது. இந்த அரசாங்கம் கடந்த ஒரு வருட காலத்தில் எங்களுடைய மீனவ சமூகத்துக்கென புதிதாக ஏதேனும் விடயத்தை அறிமுகப்படுத்தி இருக்கின்றதா? எனக் கேட்கின்றேன். நாங்கள் கடந்த கால அரசாங்கங்களைக் குறைசொல்கின்றோம். எங்களுடைய மீனவச் சமூகம் இன்றைக்கும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கிறது. அவர்களை எந்தளவுக்குப் பொருளாதார ரீதியாக உயர்த்துவதற்கான திட்டங்கள் உங்களிடம் இருக்கிறது? எனக் கேட்கின்றேன். அத்தகைய திட்டங்கள் தொடர்பில் இந்தச் சபையில் அறிவிக்க வேண்டும். விவசாயிகள் நெல்லை அறுவடை செய்யும்போது, நெல்லுக்கான விலை நிர்ணயத்தை உடனடியாகச் செய்ய வேண்டும். அதைக் காலம் தாழ்த்திச் செய்கின்றபோது, நெல் மாபியாக்கள் மிகக் குறைந்த விலைக்கு எங்களுடைய விவசாயிகளிடமிருந்து நெல்லை வாங்குகின்ற சூழல் ஏற்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இந்த இடத்தில் முக்கியமானதொரு விடயத்தைச் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். கணவன் இறந்த பிறகுதான் மனைவி தன்னுடைய தாலியைக் கழற்றுவது எங்களுடைய மரபு! விவசாயத்தைக் காப்பாற்ற வேண்டும் என்பதற்காக, எங்களுடைய விவசாயிகளின் மனைவிமார் உயிராக நினைக்கின்ற தாலியைக் கழற்றி வங்கிகளில் அடைமானம் வைக்கின்றார்கள். இந்த துயரநிலை எங்களுடைய தேசத்தில்தான் இருக்கின்றது. அதை மீட்க முடியாமல் திண்டாடுகின்ற எங்களுடைய விவசாயிகளுக்கு அரசாங்கம் சலுகைகளை வழங்க வேண்டும் என்பதோடு, நெல்லுக்கான விலை நிர்ணயத்தையும் உறுதிப்படுத்த வேண்டும். இல்லை என்றால், நெல் மாபியாக்களுடைய மிக மோசமான விலைக் குறைப்பால் தாங்கள் பட்ட கடனை அடைக்க முடியாமல் எங்களுடைய விவசாயிகள் திண்டாடுவார்கள். எனவே, அரசாங்கமானது உடனடியாக மேற்சொன்ன விடயங்களைக் கவனத்தில் எடுத்துச்

[ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා]

செயற்பட்டால், நிச்சயமாக பொருளாதாரத்தில் நல்ல முன்னேற்றத்தைக் காண முடியுமெனக் கூறி, விடைபெறுகிறேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරවින්ද සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.07]

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ජන බලවේගය ආණ්ඩුවේ දෙවැනි අය වැය ලේඛනය පසුගිය 07වැනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ, මේ අය වැය පිළිබඳව අපටත්, රටේ පුරවැසියන්ටත් තිබෙන්නේ ඉතාම ධනාත්මක ආකල්පයක් බව. රටේ හැම තැනකම සිටින විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන පුරවැසියන් හමුවෙලා කථා කරද්දී ඔවුන් හැම වෙලාවේදීම කියන්නේ, ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය සෑම ක්ෂේත්‍රයක්ම නියෝජනය වන, ජනතාව ඉලක්ක කරගෙන හදපු අය වැයක් බවයි. හැබැයි, එහෙම තිබියදී විපක්ෂය විවිධ විවේචන ඉදිරිපත් කරමින් ඉන්නවා. ඒක තමයි විපක්ෂයේ සාමාන්‍ය ස්වභාවය. ඊට එහා දෙයක් අපි මේ විපක්ෂයෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ. හැබැයි, මේ විපක්ෂය කණ්ඩායම් දෙකක් විධියට ගත්තොත්, එක කණ්ඩායමක් මේ අය වැය අගය කරනවා වාගේම, ලාංකීය ඉතිහාසය ඇතුළේ ළඟා කර ගත් ඉතා වැදගත් ජයග්‍රහණ පිළිබඳවත් ඔවුන් සඳහන් කරනවා. හැබැයි, ඒ පක්ෂවලම සමහර නායකයන් මේ ආණ්ඩුවේ ආදායම උපයා ගැනීම විවේචනය කරමින්, ආණ්ඩුව මැදිහත් වෙලා ආර්ථික වර්ධනයක් අත්පත් කර ගැනීම පිළිබඳ විවේචන ඉදිරිපත් කරමින් ඉන්නවා. එම නිසා, අපේ දෙවැනි අය වැය ඉදිරිපත් කරලා දින කිහිපයක් ගත වෙද්දී විපක්ෂය බෙදිලා තිබෙනවා.

සමහර මහත්වරු මෙතැන අය වැය පිළිබඳව කථා කරනවා වෙනුවට අපේ මන්ත්‍රීවරුන්ට, අපේ පක්ෂයට මඩ ගහලා, චෝදනා කරලා කාලය ගෙවා දමන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මම ඒ විවේචනවලට අවධානය යොමු කරන්නේ නැහැ. නමුත්, ඒ මහත්වරුන්ට අපි එක කාරණයක් මතක් කරනවා. අපේ දේශපාලන ව්‍යාපාරය හෝ අපේ පක්ෂ මූලස්ථානය හෝ දේශපාලන පෞරුෂය හෝ අපේ ඒ අභිමානය කෙලෙසා ගන්න අපේ ඉතිහාසය තුළ වැඩ කරලා නැහැ. එම නිසා පැලවත්තත් මේ සමාජයේ අභිමානවත් තැනක් කියන පණිවුඩය ඒ විවේචන ඉදිරිපත් කළ මහත්වරුන්ට මම මතක් කරලා දෙනවා. සමහර මහත්වරු හම්බන්තොට දිස්ත්‍රික්කයේ දේශපාලනය කරනවා වාගේම, පොලීසිය හරියට මෙහෙයවුවොත් මාසයකට දවසක් රිමාන්ඩ් බන්ධනාගාරගත කරන්න පුළුවන්. සමහර මහත්වරු පාර්ලිමේන්තුවට එන්නේ බූරු ගහලා. බූරු පිටියේ ඉඳලා තමයි පාර්ලිමේන්තුවට එන්නේ. එහෙම මහත්වරු තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ ආණ්ඩුව විවේචනය කරන්නේ. එම නිසා ඒ මහත්වරුන්ට අපට කියන්න තිබෙන්නේ, තමන්ගේ දේ බලා ගන්න, මේ විවේචන කරද්දී මොනවාද කියන්නේ කියලා කණ්ණාඩිය ඉස්සරහට ගිහිල්ලා බලා ගන්න කියායි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, පටලවාගන්න එපා. ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ වේලාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ස්ථාවර නියෝග 92 (2) යටතේ මම මේක කියන්නේ. මේ පාර්ලිමේන්තුවේ බල්ලා ඉන්නවා නම් බූරුවා ඉන්න එක හරි.

Thank you.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

එතුමාට මහ පෙන්වන්න දේශපාලන ව්‍යාපාරයක් හෝ සහෝදර දේශපාලනඥයෙක් හෝ නැති නිසා ඕනෑ දෙයක් කියන්න පුළුවන්. ඒකේ කිසි ගැටලුවක් නැහැ. හැබැයි, පාර්ලිමේන්තුව බලි මඩුවක් කර ගන්න එපා කියලා අපි ඉල්ලනවා. මේක සෙල්ලමක් නොවෙයි. මේක ව්‍යවස්ථාපිත ආයතනයක්. මේක තමයි රටේ ගෞරවය, රටට නීති හදන තැන. ඒ මහත්වරු හැම කෙනෙක්ම දැනගන්න ඕනෑ, ඡන්ද දායකයාගේ ගෞරවය රකින්න. එම නිසා කියන දේට සවන් දෙන්න. භාෂා ප්‍රශ්න තිබෙන්න පුළුවන්. එහෙම නම් මගේ ප්‍රකාශය සම්බන්ධවත් මම කනගාටුව පළ කරනවා. එහෙම නැතුව හිතා මතා කිව්වා නම්, ඒක වෙනස් කර ගන්න.

මම දැන් මගේ කථාව වෙනස් කරනවා. අපේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු අය වැය පිළිබඳව ගොඩක් දේවල් කථා කරනවා. ඒ සම්බන්ධයෙන් අපට කිසිදු ගැටලුවක් නැහැ. හැබැයි, විපක්ෂයේ ගොඩක් අය අහනවා, මාලිමා ආණ්ඩුව මොනවාද කළේ, 2025 වසරේ මොනවාද කළේ කියලා. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා, විනාඩි 5ක්, 10ක් අරගෙන අපි කරපුවා එකින් එක කියන්න. මොකද, මෙතැන කයිවාරු ගහන විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කයිවාරුව මාධ්‍යවල කපලා කට් එක යනකොට ඒක විශ්වාස කරන ඉතාම සුළු පිරිසක් සමාජයේ ඉන්නවා. ඒ අයට අදහසක් හදාගන්නයි අපි මේ කියන්නේ. අපේ ආණ්ඩුව බලයට එනකොට මුළු ආර්ථිකයේම පදනම දෙදරලා තිබුණේ. හැබැයි, අපට දේශපාලන ව්‍යාපාරයක් හැටියට ඒක ශක්තිමත් කිරීමේ වුවමනාවක් තිබුණා. ඒක ආරම්භයේ ඉඳලාම අපි පියවරෙන් පියවර ශක්තිමත් කරපු ගමනක්. ඒ ලැබෙන ප්‍රතිලාභ හරහා ජනතාවට සහන ගේන්න පුළුවන් ආකාරයට, ඒ වාගේම ඉලක්කගත ජනතාව මේ සමාජ අභිවෘද්ධියේ කොටස්කරුවෝ බවට පත් කර ගන්න අපි වැඩ පිළිවෙළක් හැදුවා.

අපේ ආණ්ඩුව බලයට ඇවිත් මුල්ම අය වැය 2025 පෙබරවාරි මාසයේ ඉදිරිපත් කළා. ඒක සම්මත වෙලා, ඒ මූල්‍ය වර්ෂයේ

ප්‍රතිපාදන එන්න පටන් ගත්තේ මැයි මාසයේ ඉඳලා. එහෙම ගත්තාම මාස 4ක් වාගේ කාලයක් තමයි තවම ගත වෙලා තිබෙන්නේ. මේ ගත වෙච්ච මාස 4 ඇතුළේ අපි "අස්වැසුම" සහනාධාරය මාසිකව රුපියල් 8,500ක් ලබා දුන් කණ්ඩායමට දැන් එය රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, රුපියල් 15,000ක් ලබා ගත් කණ්ඩායමට දැන් එය රුපියල් 17,500ක් දක්වා වැඩි කර තිබෙනවා. ඒ වාගේම, සංක්‍රාන්ති කාලයේ හිටපු අයගේ කාලය මාස කිහිපයකින් දීර්ඝ කර දීලා තිබෙනවා. වකුගඩු රෝගීන්ට මාසිකව දුන්නු රුපියල් 7,500ක දීමනාව අපි රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. වැඩිහිටි දීමනාව ලබා දුන්නේ මාසයකට රුපියල් 3,000යි. ඒ රුපියල් 3,000ක දීමනාව දුන්නේත් මෙහෙමයි. මේ වැඩිහිටි දීමනාව ග්‍රාම නිලධාරි වසමක 10 දෙනාට නම් දුන්නේ, ඒ 10දෙනාගේ කෝටා එක ගමට තිබුණා. තවත් කෙනෙක් අදාළ වයස් සීමාව ඉක්මවූවා නම්, ඔහුට ඒ වැඩිහිටි දීමනාව ගන්න අර 10දෙනාගේ කණ්ඩායමෙන් කෙනෙක් මිය යනකම් ඉන්න ඕනෑ වුණා. හැබැයි, අපි බලයට ඇවිල්ලා වයස අවුරුදු 70ට වැඩි සියලුදෙනාටම මාසිකව රුපියල් 5,000ක් දෙන්න තීන්දු කරලා, ඒක මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

ඒ වාගේම, අපි ගර්භිණී මව්වරුන්ට පෝෂණ ආහාර පැකේජයක් දුන්නා. සමහර අය දේශපාලන වශයෙන් කොච්චර කයිවාරු ගැහුවත්, අවුරුදු 76ක් තිස්සේ දැවැන්ත දේශපාලන චරිත විධියට හිටියත්, මේ සමාජයේ වීථි දරුවන්ගේ, පරිවාස භාරයේ ඉන්න දරුවන්ගේ ප්‍රමාණය දිගින් දිගටම වැඩි වුණා. දරුවන්ට රැකවරණය දෙන්න ආණ්ඩුවක් නැති වුණා. ඔවුන් රැක බලාගන්න කෙනෙක් නැති වුණා. අපි ඇවිල්ලා පළමු පියවර විධියට ඒ දරුවන්ට රුපියල් 5,000ක් දුන්නා. මාසයකට රුපියල් 2,000ක් බැංකුවක තැන්පතු විධියට ඉතුරු කරනවා. ඉතුරු 3,000 භාරකරුට දෙනවා, ඒ දරුවාගේ පෝෂණ අවශ්‍යතා සඳහා. එදිනෙදා අවශ්‍යතා සඳහා.

ළමයින් සිඟමනේ යෙදවීම සහ අන්තරායකර රැකියාවල යොදවන එක අපි නතර කළා. විපක්ෂයේ ඔය මහත්වරුන්ට අපි මේ කාරණය මතක් කරනවා. අවුරුදු 76ක් ගත වුණත් ඔබතුමන්ලාට ඒ දරු පැටවුන්ට සමාජයේ රැකවරණය දෙන්න බැරි වුණා. ඒ දරුවන් සිඟමනේ යොදවනවා. දරුවන් යොදා ගෙන ආදායම් මාර්ග හොයාගෙන ඔවුන්ගෙන් යැපෙන්නන් බවට පත් වුණා. ඒ වාගේම වෙනත් රැකියාවල නිරත කළා. අපේ ආණ්ඩුව ඇවිල්ලා පළමුවැනි තීන්දුව ගත්තා. අපි ගත් තීන්දුවත් එක්ක දරුවන් සිඟමනේ යෙදවීම සහ අන්තරායකර රැකියාවල යෙදවීම සපුරා තහනම් කරලා තිබෙනවා. ඒ තුළින් අපි සමාජයට අලුත් පණිවුඩයක් ලබා දීලා තිබෙනවා. මේවා අපි කරපු දේවල්. ජූලි මාසයේ 01වැනි දා ඉඳලා අපි ඒ සියල්ල තහනම් කර තිබෙනවා.

පෙර පාසල් දරුවන්ගේ ආහාර වේලට දුන්නේ රුපියල් 60යි. අපි එය රුපියල් 100 දක්වා වැඩි කළා. අපි පෙර පාසල් ගුරුවරුන්ගේ දීමනාව වැඩි කළා. අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට ලිපි ද්‍රව්‍ය ගන්න රුපියල් 6,000ක දීමනාවක් දුන්නා. ලංකා ඉතිහාසයේ පළමුවැනි වතාවට පාසල් දරුවන්ට රුපියල් 6,000ක් දුන්නා. මගේ ආසනයේ එක්තරා පවුලක පාසල් අධ්‍යාපනය ලබන දරුවන් හයදෙනෙක් ඉන්නවා. ඒ හයදෙනාට රුපියල් 36,000ක් ලැබුණා. ආණ්ඩුවක් විධියට අපට තිබෙනවා ඒ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කරන්න. අපි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළා; දරුවන්ට ප්‍රතිලාභ ලැබුණා.

ශිෂ්‍යත්වය හඳුන්වා දී ඉතිහාසය පුරාම ශිෂ්‍යත්වය සමත් දරුවෙකුට රුපියල් 750 දක්වා පමණයි වැඩි කළේ. අපි ඇවිල්ලා පළමුවැනි පියවරේදී ඒක සියයට 100කින් රුපියල් 1,500 දක්වා වැඩි කළා. ක්‍රීඩා පාසල්වල ඉන්න දරුවන් අමාරුවෙන් ඒ පාසලට ඇතුළත් වෙන්නේ. අමාරුවෙන් ඒ දරුවෝ ක්‍රීඩා කටයුතුවල යෙදෙන්නේ. ඒ දරුවන් රැක බලාගන්න වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. අපි ඒ දරුවන්ගේ පෝෂණ ආහාර දීමනාව රුපියල් 5,000 සිට රුපියල් 10,000 දක්වා වැඩි කරන්න ආණ්ඩුවක් විධියට කටයුතු කළා.

වෘත්තීය අධ්‍යාපනය ලබන දරුවන්ට රුපියල් 5,000 දක්වා දීමනාව වැඩි කරන්න අපි ආණ්ඩුවක් විධියට කටයුතු කරලා තිබෙනවා. අපි මේ කාරණා එකින් එක කියන්නේ ඇයි? විපක්ෂය අහනවා, මේ අවුරුද්දට මොනවාද කළේ කියලා. අහගන්න. තව ගොඩක් දේවල් තිබෙනවා. ඒවායින් ටිකක් මගේ විනාඩි 10 තුළ මම කියන්නම්. උපකෘත පාසල්වල, පිරිවෙන් හා සිල් මාතාවන්ගේ පාසල්වල, විශේෂයෙන් දරුවන් 250ට අඩුවෙන් ඉන්න පාසල්වල දරුවන්ට සපත්තු ගන්න රුපියල් 3,000ක වවුචරයක් අපි දීලා තිබෙනවා. එන අවුරුද්දේ අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

මහපොළ ශිෂ්‍යාධාරය ගැන විශ්වවිද්‍යාල දරුවෝ හැම දාම පාරේ අරගළ කළා. ලැබෙන මහපොළ ආධාරය ප්‍රමාණවත් නැහැ, ඒ අයගේ පොත්පත් ටික ගන්න. අපි මහපොළ ශිෂ්‍යාධාරය රුපියල් 7,500 දක්වා වැඩි කරලා ගෙව්වා වාගේම, 2026 අය වැයෙන් එය රුපියල් 10,000 දක්වා වැඩි කරන්න යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම විද්‍යාපීඨ අභ්‍යාසලාභීන්ගේ දීමනාව වැඩි කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල සිසුන්ගේ ශිෂ්‍යාධාර රුපියල් 6,500 දක්වා මේ වන විට වැඩි කරලා තිබෙනවා. 2026දීත් තව වැඩි කරන්න යෝජනා කරලා තිබෙනවා. විදේශ සේවයේ නිරත වෙලා ඉන්න වැඩිහිටියන්ගේ දරුවන්ට අපි ශිෂ්‍යාධාර ලබා දීලා තිබෙනවා. අඩු පහසුකම් සහිත පවුල්වලට වීන රජයේ ආධාර යටතේ නිවාස ව්‍යාපෘති 1,996ක්, "සැමට නිවහන" ව්‍යාපෘතිය යටතේ නිවාස 2,854ක්, "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" තේමාව යටතේ පවුල් 4,000කට නිවාස ලබා දෙන්න අපි මේ අවුරුද්ද ඇතුළත සැලසුම් හදලා වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා තිබෙනවා. නිවාස සංවර්ධන අධිකාරිය යටතේ ප්‍රතිලාභීන් 1,000කට ඔප්පු දෙන්න කටයුතු කරනවා. ඔය කථා කරන සමහර පක්ෂ නායකයන්ගේ නිවාස ව්‍යාපෘති තිබෙනවා, හම්බන්තොට දිස්ත්‍රික්කයේ. නිවාස ව්‍යාපෘති හදලා තිබෙන්නේ අලි කළමනාකරණ භූමිය ඇතුළේ. ඒවායේ මිනිසුන්ට පදිංචි වෙන්න බැහැ; ඔප්පුවක් නැහැ. ඒ නිවසේ රැකවරණය සහිතව ඉන්න බැහැ. අපි නිවසත් දෙනවා. ඔප්පු දෙන්නත් වැඩ පිළිවෙළ හදලා තිබෙනවා, මේ ගත වුණු කාලය ඇතුළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩි වේලාවක් දෙන්න.

නිවාස ව්‍යාපෘතිය යටතේ, නිවසක් හදන්න ලක්ෂ 10ක දීමනාවක් අපි ලබා දෙනවා. කලින් ආණ්ඩු ලක්ෂ හයයි දුන්නේ. ඉතිහාසයේ තිබුණු ආණ්ඩු දුන්නේ ලක්ෂ හයයි, ගෙයක් හදා ගන්න. අපි බලයට පත් වෙලා මුල්ම අය වැයෙන් යෝජනා කළා, ලක්ෂ 10ක් දෙන්න. අපි හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම නිවාස 10ක, 20ක ප්‍රමාණයක් සහිතව රට පුරා නිවාස හදලා මේ වනකොට අපි ජනතාවට ඒවා ලබා දෙමින් කටයුතු කරමින් ඉන්නවා. ඉන්දියානු ආධාර යටතේ ක්‍රියාත්මක වෙච්ච නිවාස ව්‍යාපෘති දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

"සුවසැරිය" ගිලන් රථ සේවාවට අපි 150ක් අලුතින් එකතු කරලා තිබෙනවා. සමහර මහත්වරු පැයකට කලින් කිව්වා, ගොවීන්ට මොකුත් කළේ නැහැ කියලා. හෙක්ටෙයාරයට රුපියල් 15,000ක් ලෙස දීපු පොහොර සහනාධාරය අපි රුපියල් 25,000

[ගරු අරවින්ද සෙනරත් මහතා]

දක්වා වැඩි කරලා තිබෙනවා. මේක ගොවියාට ඉතිහාසයේ ලබා දුන් වැඩිම සහනාධාරයයි කියන එකත් අපි මේ වෙලාවේ විපක්ෂයට මතක් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
මට තව පොඩි වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අතුරු භෝග වගාව සඳහා රුපියල් 14,000ක පොහොර සහනාධාරයක් දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. අපි ගොවීන්ට වන්දි ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලාංකීය භූමියේ ගොවිතැන් කරන ගොවීන්ට වන්දි දෙන්නේ නැතුව ඒ වන්දි මුදල් තමන්ගේ ගිණුමේ දමා ගත්ත ඇමතිවරු හිටපු රටක් මේ රට. අපි බලයට ඇවිල්ලා මාස හත අට ගත වෙද්දී මීට වසර දෙකකට පෙර ගෙවන්න තිබුණු වන්දිත් ගොවීන්ට ගෙව්වා. ලංකාවේ වගා වන්දි ගෙවා අවසන් කළ එකම ආණ්ඩුව මාලිමාවේ ආණ්ඩුව බවට පත් වෙලා තිබෙනවා. මේ , 2025 අවුරුද්දේ ගෙනාපු සහන. අතිරේක වගා සහනාධාරය වශයෙන් හෙක්ටයාරයකට රුපියල් 15,000ක සහනාධාරයක්, ධීවරයන්ට ඉන්ධන සහනාධාරයක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. ජනාධිපති අරමුදල ගමට ගෙනිහිල්ලා තිබෙනවා. මතක තියා ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු මුදල් යොදාගෙන වතු කම්කරු ජනතාවට, රටට ඩොලර් ගෙනෙන ජනතාවට රුපියල් 200ක් දෙනවාට විරුද්ධ විපක්ෂය එදා ජනාධිපති අරමුදලේ සල්ලි තමන්ගේ පෞද්ගලික වුවමනා මත ලබා ගත්තා. ඒ වාගේම තමන්ගේ නිවස ගිනි තිබ්බාය කියලා, නිවාස ව්‍යාපෘති හරහා රටේ ධනය රුපියල් මිලියන ගණන් ගත්ත විපක්ෂයේ මන්ත්‍රීවරු කියනවා, වතු කම්කරු ජනතාවට රුපියල් 200 ක දීමනාව දෙන්න එපා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
අවසන් කරනවා.

රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා වැඩි කළා. ඒ වැඩි කිරීමෙන් සියයට 30ක් 2026 ජනවාරි සිට ලබා දෙනවා.

මෙන්න මේ විධියට අපි ආණ්ඩුවක් විධියට මේ රටේ දුක් විඳපු මිනිසුන්ට, බලාපොරොත්තු සහිතව හිටපු මිනිසුන්ට සහන ලබා දෙන්න 2025 වසරේ සිට කටයුතු කරලා තිබෙනවා. 2026 වසරත් ඉතාම සුබයි. 2026 අය වැය ලාංකීය දේශපාලන, ආර්ථික ගමන් මඟ වෙනස් කරනවා. රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඉලක්ක සහගත මෙහෙයවීමක් ඇතුළේ සංවර්ධන වේගය වැඩි කරගෙන අපි මේ රටට අලුත් ආර්ථික නවෝදයක්, අලුත් පුනරුදයක් ගෙනෙන්න කටයුතු කරනවාය කියන විශ්වාසය ලබා දෙමින්, මාගේ කථාව අවසන් කරනවා.

මට මේ වෙලාව ලබා දීම වෙනුවෙන් බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.21]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் இரண்டாவது வாசிப்பு மீதான விவாதத்திலே பல கருத்துகள் முன்வைக்கப்படுகின்றன. அரசாங்கக் கட்சியைச் சார்ந்த உறுப்பினர்கள் இது சிறந்த வரவு செலவுத்திட்டமெனச் சொல்கின்றார்கள். எதிர்க்கட்சியினால் முன்வைக்கப்படுகின்ற சில முன்மொழிவுகளைப் பொருட்படுத்திக்கொண்டு, அது தொடர்பில் அளிக்கப்படும் விளக்கம் தொடர்பான பல விடயங்களை இந்த இடத்திலே கேட்கலாம் என நான் நினைக்கிறேன்.

குறிப்பாக, 2026ஆம் ஆண்டுக்காகச் சமர்ப்பிக்கப் பட்டிருக்கின்ற இந்த வரவு செலவுத்திட்டத்தை வரலாற்றிலே சிறந்ததொரு வரவு செலவுத்திட்டமென இங்கே ஆளும் தரப்பில் இருக்கின்ற அமைச்சர்கள், உறுப்பினர்கள் சொல்கிறார்கள். எந்த அடிப்படையில் இதனை வரலாற்றிலே சிறப்பான வரவு செலவுத்திட்டமெனக் கூறுகின்றீர்கள்? என்பதை நாங்கள் அவர்களிடம் கேட்க விரும்புகின்றோம். நிதி அமைச்சராக இருக்கின்ற மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் நான்கரை மணித்தியாலங்கள் இந்தப் பாராளுமன்றத்திலே இந்த வரவு செலவுத்திட்டத்தை முன்வைத்து உரையாற்றினார். மாண்புமிகு ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் இந்த வரவு செலவுத்திட்டத்தை முன்வைத்ததன் காரணமாகவே பலர் நான்கரை மணித்தியாலங்கள் அந்த உரையைக் கேட்டுக் கொண்டிருந்தார்கள். இதே வரவு செலவுத்திட்டத்தை உங்கள் கட்சியில் இருக்கின்ற வேறோர் உறுப்பினர் முன்வைத்து நான்கரை மணித்தியாலங்கள் பேசியிருப்பாராக இருந்தால், இந்தப் பாராளுமன்றத்திலே எத்தனை பேர் தூங்கியிருப்பார்கள் என்பதைப் பற்றி நீங்கள் சிந்திக்க வேண்டும்.

இன்று எதிர்க்கட்சியினர் இந்த வரவு செலவுத்திட்டம் பற்றி எதிர்மறையாகப் பேசுகின்றபோது அதைத் தாங்கிக்கொள்ள முடியாமல் நீங்கள் துடிக்கின்றீர்கள். மாண்புமிகு ஜனாதிபதி அவர்கள், இங்கிருக்கின்ற கௌரவ பிரதமர் அவர்கள், கௌரவ அமைச்சர்கள் சிலர் அன்று எதிர்க்கட்சியிலே இருந்த நேரத்திலே இப்படியான ஒரு வரவு செலவுத்திட்டம் முன்மொழியப்பட்டிருந்தால், இவர்கள் அதற்குச் சாதகமாகப் பேசியிருப்பார்களா, பாதகமாகப் பேசியிருப்பார்களா? வரலாற்றிலே சிறந்த வரவு செலவுத்திட்டமெனச் சொல்லி யிருப்பார்களா? மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்களுடைய கட்சியில் 3 உறுப்பினர்கள், 6 உறுப்பினர்கள், 12 உறுப்பினர்கள் இருந்த காலங்களில் கொண்டுவரப்பட்ட வரவு செலவுத்திட்டங்களை எவ்வாறு அவர்கள் ஏற்றுக் கொண்டார்கள் என்பதை நாங்கள் கேட்க விரும்புகிறோம். அவ்வாறு 3 - 6 - 12 உறுப்பினர்களைக் கொண்டிருந்த எதிர்க்கட்சியைவிட, இன்று கிட்டத்தட்ட 60 உறுப்பினர்கள் எதிர்க்கட்சியிலே இருந்தாலும், உங்களுக்கான அங்கீகாரத்தை

நாங்கள் தருகின்றோம்; உங்களுக்கான கௌரவத்தை நாங்கள் தருகின்றோம். நாங்கள் வீதிகளிலே மக்களைத் திரட்டவில்லை; வீதிகளிலே நாங்கள் புரட்சியை ஏற்படுத்தவில்லை; சரியான விடயங்களை நாங்கள் ஆதரிக்கின்றோம். ஆனாலும், சில விடயங்களை உள்வாங்குங்கள் என்று நாங்கள் சொல்கின்றபோதுகூட, இன்று அரசாங்கத்திலே இருக்கின்ற உறுப்பினர்கள் அதனைத் தாங்கிக்கொள்ள முடியாமல் தத்தளிக்கின்றார்கள்; வேறு வேறு விடயங்களைப் பேசுகின்றார்கள்.

இன்று பாருங்கள்! இந்த அரசாங்கத் தரப்பிலே இருக்கின்ற அமைச்சர்கள், உறுப்பினர்கள் எத்தனை பேர் இந்த வரவு செலவுத்திட்டம் பற்றி பேசுகின்றார்கள்? எத்தனை பேர் இது சம்பந்தமான விடயங்களை முன்வைக்கின்றார்கள்? என்பதை நாங்கள் கேட்கின்றோம். அவர்கள் பல விடயங்களை மறந்து பேசுகின்றார்கள். வெட்கம்! அரசாங்கத்தில் இருக்கின்ற சில அமைச்சர்கள் இன்னும் 'கோமா'வில் இருக்கின்றார்களா? என்ற சந்தேகம் ஏற்படுகின்றது. ஏனென்றால், சில அமைச்சர்கள் சொல்கின்றார்கள், "நாங்கள் அரசாங்கத்தை எடுக்கின்றபொழுது, පෙට්‍රල් පෝලිම් இருந்தது; ගෑස් පෝලිම් இருந்தது; நாடு பொருளாதார நெருக்கடியில் இருந்த பொழுதுதான் நாங்கள் ஆட்சியைக் கைப்பற்றினோம்" என்று. அவ்வாறு சொல்கின்றவர்கள், 2024ஆம் ஆண்டிலே அரசாங்கத்தைப் பாரமெடுத்ததை மறந்து விட்டார்கள். இன்று ஒரு வருடம் முடிந்து விட்டது; 2026ஆம் ஆண்டுக்கான Budgetஐ அவர்கள் இந்தப் பாராளுமன்றத்தில் சமர்ப்பித்து விட்டார்கள் என்பதை எல்லாம் மறந்துவிட்டு, 2021ஆம், 2022ஆம் ஆண்டுகளில் ஏற்பட்ட பொருளாதார நெருக்கடியின் போது இவர்களிடம் நாட்டைப் பாரப்படுத்தியதைப் போன்றும், அதை அவர்கள் பாரமெடுத்ததைப் போன்றும் இன்று பேசுவது உண்மையிலே கவலையானதொரு விடயமாகக் காணப்படுகின்றது, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

அதேநேரம், நாங்கள் ஓர் எதிர்க்கட்சியாக உங்களுக்கான அந்தச் சந்தர்ப்பத்தை ஒழுங்கான முறையிலே தருகின்றோம்; சரியான முறையிலே தருகின்றோம். இன்று இதிலேகூட சில பிரச்சினைகளை ஏற்படுத்துகின்ற விடயங்கள், உங்களுடைய தரப்பினரால் -அரசாங்கத்தின் அமைச்சர்களால், பாராளுமன்ற உறுப்பினர்களால்- முன்வைக்கப்படுகின்றது. குறிப்பாக, 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்தைப் பார்க்கின்ற போது, இதில் உண்மையிலேயே ஏற்றுக்கொள்ளக்கூடிய பல விடயங்கள் இருக்கின்றன; ஏற்றுக்கொள்ள முடியாத விடயங்களும் இருக்கின்றன. இதுவொரு புத்தகமாக, ஒரு முன்மொழிவாகச் சொல்லப்பட்டிருக்கின்ற வரவு செலவுத் திட்டம். இதன்மீது எங்களுக்கு எப்படி நம்பிக்கையை ஏற்படுத்தப்போகின்றீர்கள்? என்பதை நாங்கள் கேட்கின்றோம். ஏனென்றால், சனாதிபதித் தேர்தலிலே, கடந்த பொதுத் தேர்தலிலே, நீங்கள் 'வளமான நாடு - அழகான வாழ்க்கை' என்ற தொனிப்பொருளில் உங்களுடைய தேர்தல் விஞ்ஞாபனத்தை முன்வைத்தீர்கள்.

அதிலேயுள்ள எத்தனை விடயங்களை நீங்கள் செய்திருக்கிறீர்கள், நாங்கள் இதை நம்புவதற்கு? அதுபோல், 2025க்கு நீங்கள் சமர்ப்பித்த வரவு செலவுத்திட்டத்தில் குறிப்பிட்டவற்றிலே எத்தனை விடயங்களை இதுவரையும் நீங்கள் செய்து காட்டியிருக்கின்றீர்கள்? அதிலே 40-50 சதவீதத்தைக்கூட நீங்கள் நிறைவேற்றவில்லை. அப்படியிருக்கின்றபோது நீங்கள் சமர்ப்பித்த இந்த வரவு செலவுத்திட்டத்தை ஓர் எதிர்க்கட்சி எப்படி நம்பப்போகின்றது என்பதை நீங்களே புரிந்து கொள்ளுங்கள்! இன்று உங்களுக்கான எதிரி எதிர்க்கட்சியல்ல, உங்களால் தயாரிக்கப் பட்டிருக்கின்ற தேர்தல் விஞ்ஞாபனம்தான் என்பதை நீங்கள் மறந்துவிடக் கூடாது. இங்கு பேசுகின்ற நீங்கள் எல்லோரும் இன்று பேசுகின்ற பேச்சையா அன்று ஜனாதிபதித் தேர்தலின்போதும் பாராளுமன்றத் தேர்தலின்போதும் பேசினீர்கள் என்பதை விளங்கிக்கொள்ள வேண்டும். IMFஐப் பற்றி நீங்கள் என்ன கொள்கையுடன் இருந்தீர்கள்? இந்தியாவைப் பற்றி என்ன கொள்கையுடன் இருந்தீர்கள்? ஏன், இப்பொழுது பேசப்படுகின்ற பட்டதாரிகளுடைய விடயங்களிலே அந்த நேரத்தில் நீங்கள் என்ன கொள்கை யுடன் இருந்தீர்கள்? இப்பொழுது என்ன கொள்கையிலே இருக்கின்றீர்கள்? என்பதை நாங்கள் கேட்க விரும்புகின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் சொல்லுகின்ற ஒரு விடயம் என்னவென்றால், நீங்கள் புதிய அரசாங்கம்! புதிய பாராளுமன்ற உறுப்பினர்கள்! புதிய உறுப்பினர்களில் சிலர் அமைச்சர்களாகவும் இருக்கின்றீர்கள். ஆகையால், உங்களுக்கான நேர காலத்தைத் தரவேண்டிய பொறுப்பு எமக்கு இருக்கின்றது. ஆனால், நீங்கள் இன்றும் பழைய விடயங்களையே ஞாபகப்படுத்திக்கொண்டு இருக்கின் றீர்கள். சற்றுச் சிந்தியுங்கள்! இன்று எதிர்க்கட்சியிலே எத்தனை முன்னாள் அமைச்சர்கள் இருக்கிறார்கள் என்பதைப் பாருங்கள்! ஓரிருவர் இருக்கிறார்கள்; சிலர் தேசியப் பட்டியல் மூலமாக வந்திருக்கிறார்கள். மக்கள் அந்த விடயத்திலே தெளிவாக இருந்து, உங்களுக்கு வாக்களித்து, அதன்மூலமாக இன்று உங்களுக்கு ஒரு சந்தர்ப்பத்தை ஏற்படுத்தி யிருக்கிறார்கள் என்றால், உங்கள்மீது ஏதோ ஒரு நம்பிக்கைகொண்டு, நீங்கள் ஏதோ செய்வீர்கள் என்ற அடிப்படையிலேயே அவர்கள் உங்களுக்கு அந்த ஆணையை வழங்கியிருக்கிறார்கள். ஆனால், நீங்கள் அந்த விடயத்தைத் தாண்டி, இன்னும் அரசியல்வாதிகளையும் கடந்த அரசாங்கங்களையும் குற்றம் சொல்லுகின்ற, விமர்சிக்கின்ற அரசியலையே செய்துகொண்டிருக்கிறீர்கள். அதைவிட்டு விட்டு நல்ல விடயங்களை முன்னெடுங்கள்! அப்போது எதிர்க்கட்சியினர் சொல்ல வருகின்ற விடயம் என்னவென்பது உங்களுக்கு விளங்கும். "எதிர்க்கட்சி எப்படியாக இருந்தாலும், சொன்ன விடயத்தை இவர்கள் செய்கிறார்கள்" என்று மக்களாவது ஏற்றுக்கொள்ளுகின்ற வகையிலே நீங்கள் செய்து காட்டுங்கள்! என்று நாங்கள் இந்த அரசாங்கத்திடம் கேட்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்த அரசாங்கத்திலேயுள்ள அமைச்சர்களாக இருந்தாலும் தமிழ், முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களாக இருந்தாலும் அவர்கள் "எங்களுக்குள்ளே இனவாதம் இல்லை, எங்களுக்குள்ளே பிரதேசவாதம் இல்லை, தமிழ், சிங்களம், முஸ்லிம் என்ற வேறுபாடுகள் இல்லை" என்று பாராளு மன்றத்திலே பேசினாலும், இன்னும் அவர்களுடைய செயற் பாடுகள் இனவாதத்தை ஏற்படுத்துகின்ற வகையிலேதான் காணப்படுகின்றன. நாங்கள் சென்ற காலத்திலேயிருந்த அரசாங்கங்களைப் பார்க்கின்றபோது, அவர்கள் பகிரங்கமாக இனவாதத்தைக் கையிலெடுத்ததைக் காண முடிந்தது. ஆனால், இன்று இவர்கள் மேடைகளிலும் பாராளுமன்றத்திலும் இனவாதம் பேசவில்லையென்றாலும், இவர்களுடைய செயற்பாடுகளிலே இனவாதத்தைக் கொண்டுசெல்கிறார்கள். உதாரணமாக இவர்கள் Cabinet அமைக்கின்றபோதுகூட நாங்கள் கேட்டோம், "ஒரு முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர் கூட உங்களுடைய Cabinetஇல் இல்லையா?" என்று. அதற்கு அவர்கள், "இனவாதம் பேசாதீர்கள்! தயவுசெய்து இதை இனவாதம் ஆக்கிவிடாதீர்கள்!" என்றார்கள். சரி! அதுபோல்,

[ගරු ඉම්රාන් මහරූෆ් මහතා]

Clean Sri Lanka என்ற திட்டத்தை நடைமுறைப்படுத்த ஒரு குழுவை நியமித்தீர்கள். அந்த நியமனத்தில்கூட தமிழ் பேசுபவர்கள் புறக்கணிக்கப்பட்டார்கள். அதுதொடர்பாகக் கேட்டபோதுகூட, "தயவுசெய்து இனவாதத்தை ஏற்படுத்தி விடாதீர்கள்! இனவாதம் பேசாதீர்கள்!" என்று சொன்னார்கள். வடக்கு, கிழக்கிற்கு நிதியொதுக்கீடு குறைந்திருக்கின்றது என்று சொன்னாலும்கூட, "பிரதேச அடிப்படையில் பேசாதீர்கள், நாடளாவிய ரீதியிலே நாங்கள் நிதியொதுக்கீடு களைச் செய்திருக்கிறோம்" என்று சொல்கிறார்கள்.

அதுபோல், கடந்த 2025 நவம்பர் 01ஆம் திகதி வெளியிடப் பட்டிருக்கின்ற Gazette மூலமாகத் தொல்பொருளியல் திணைக் களத்திற்கு ஆலோசனைக் குழுவொன்றை அமைத்திருக் கிறார்கள். அந்தக் குழுவிலே சுமார் 19 உறுப்பினர்கள் நியமிக்கப்பட்டிருக்கிறார்கள். அதிலேகூட, தமிழ்மொழி பேசுகின்ற தமிழ் அல்லது முஸ்லிம் ஒருவர்கூட நியமிக்கப்படவில்லை. இது தொடர்பாக இப்போது நாங்கள் கேட்டாலும், "அப்படி இல்லை, இதை இனவாதமாக்கி விடாதீர்கள், அல்லது "நாங்கள் அதைக் காலப்போக்கிலே செய்வோம்" என்ற பதிலை முன்வைப்பார்கள்.

அதேபோன்றுதான் அண்மையிலே தேசிய மக்கள் சக்தி கட்சியின் செயலாளர் அவர்கள் ஒரு பத்திரிகைக்கு அளித்த பேட்டியிலே, "நாங்கள் இன அடிப்படையிலே பதவிகள் வழங்குவது கிடையாது. அதற்கான திறமைகள், அனுபவங்கள் இருந்தால் அவர்களுக்கு அந்தப் பதவிகளை வழங்குவோம்" என்று சொல்லியிருந்தார். அதன்படி பார்த்தால், தேர்தலில் வெற்றி பெற்று இன்று இந்தப் பாராளுமன்றத்திற்கு வந்திருக்கின்ற உங்களுடைய கட்சியைச் சேர்ந்த முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களில் ஒருவர்கூட Cabinet அமைச்சுப் பதவிக்குத் தகுதியானவர்கள் இல்லையா? என்று உங்களை நாங்கள் கேட்கின்றோம்.

ஆகையால் தயவுசெய்து இவ்வாறான பொய்யான விடயங்களைச் சொல்லி மக்களை ஏமாற்றுவதை விடுத்து, எதிர்க்கட்சியினரை ஏசுவதை விடுத்து, உங்களுடைய தவறான விடயங்களிலே கவனஞ்செலுத்தி, சிறந்ததொரு நிலைப் பாட்டை உருவாக்க வேண்டிய பொறுப்பு இன்று உங்களிடம் காணப்படுகின்றது. 159 பாராளுமன்ற உறுப்பினர்களை ஒரு கட்சி கொண்டிருப்பது என்பது வரலாற்றிலே காண முடியாத ஒன்றாகவும், வரலாற்றிலே முதற் தடவையாக உங்களுக்குக் கிடைத்திருக்கின்ற வாய்ப்பாகவும் உள்ளது. இவ்வளவு தொகையான பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டு ஒரு கட்சி ஆட்சியை உருவாக்கி இருக்கின்றது என்பதே ஒரு வரலாறு! ஆகையால், இதன்மூலம் எத்தனையோ நல்ல விடயங்களை நீங்கள் செய்துகொள்ள முடியும். பாராளுமன்றத்திலே கொண்டுவருகின்ற சட்டமூலங்கள் மற்றும் பாராளுமன்றத்தின் ஊடாகச் செய்யப்படவேண்டிய விஷயங்களை, நீங்கள் இந்த இடத்திலே பேசுகின்ற பல விஷயங்களை நீங்கள் நினைத்தால் ஓரிரு நாட்களுக்குள்ளே செய்து முடிக்கக்கூடிய நிலைமை காணப்படுகின்றது. இதைக்கூட நீங்கள் இன்று பொருட்படுத்தாமல், அந்த விடயங்களை இன்னும் இழுத்தடிக்கின்றீர்கள்.

குறிப்பாக, தற்போது மாகாண சபைத் தேர்தல் சம்பந்தமாகப் பேசப்படுகின்றது. "தேர்தலை நடாத்துவதற்கு எங்களிடம் காசு இருக்கின்றது. ஆனால், சரியான தேர்தல் முறை இல்லை" என மாண்புமிகு சனாதிபதி அவர்களே சொல்லுகின்றார். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தத் தேர்தல் முறை மாற்றமென்பது அவ்வளவு பெரியதொரு விடயமா அல்லது அதற்கு அவ்வளவு அதிக கால அவகாசம் தேவையா? இன்று உங்களுடைய தரப்பிலே 159 பாராளுமன்ற உறுப்பினர்களைக் கொண்டிருக்கின்றீர்கள். எனவே, எந்த அடிப்படையில் அந்தத் தேர்தலைச் செய்யப் போகின்றீர்கள் என்பதை முடிவுசெய்தால், நாங்கள் வாக்கெடுப்பின்மூலமாக ஒரு நாளைக்குள்ளே ஒரு தீர்வுக்கு வரமுடியும். ஆகையால், தயவுசெய்து இவ்வாறான விடயங்களை இழுத்தடிக்காமல் சிறந்த முறையிலே முன்னெடுக்கவேண்டிய பொறுப்பு இன்று இந்த அரசாங்கத்திடம் இருக்கின்றது. நான் ஆரம்பத்திலே சொன்னதைப் போன்று, எதிர்க்கட்சி என்றால் விமர்சனங் களைச் செய்வதுதான் எதிர்க்கட்சி! ஆனால், வரவு செலவுத்திட்டத்தை எதிர்க்க வேண்டும் என்பது எங்களுடைய நோக்கம் அல்ல.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அதிலே இருக்கின்ற சில குறைகளை, எங்களுடைய பிரதேசத்திலே காணப்படுகின்ற தேவைகளுக்கான ஒதுக்கீடு சம்பந்தமாக அல்லது எங்களுடைய மாகாணத்திலே காணப்படுகின்ற அபிவிருத்தி சம்பந்தமான விடயங்களை நாங்கள் சொல்லுகின்றபொழுது, அதிலுள்ள விடயங்களை இன்னும் பெரிதுபடுத்தி, அதை வித்தியாசமான முறையிலே புரிந்துகொண்டு, மீண்டும் 70-75 வருட கால அரசியலைப் பேசி, அதனை இல்லாமல் செய்கின்ற ஒரு நிலைப்பாடு காணப்படுகின்றது. உண்மையில் நல்ல விடயங்களுக்கு என்றும் எங்களுடைய ஆதரவு கிடைக்கும். ஆகையால், இந்த விடயங்களைக் கருத்திற்கொண்டு, மக்களுடைய தேவைகளைப் பூர்த்தி செய்கின்ற நல்ல திட்டங்களை நீங்கள் கொண்டுவருகின்றபொழுது, நிச்சயமாக ஒரு சிறந்த எதிர்க்கட்சியாக இருக்கின்ற நாங்கள் அதற்கான ஒத்துழைப்பையும் பங்களிப்பையும் வழங்குவோம் என்பதை இந்த இடத்திலே கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆස්මින් ෂරීෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.35]

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

இந்த நாட்டில் வாழுகின்ற சகல மக்களையும் சந்தோசப் படுத்துகின்ற வரவு செலவுத்திட்டமாக இந்த வரவு செலவுத்திட்டம் அமைந்துள்ளதை நாங்கள் பார்க்கின்றோம். ஏனென்றால், மலையகப் பகுதிகளில் எமது நாட்டின் சனாதிபதி தோழர் அநுர குமார திஸாநாயக்க அவர்களின்

புகைப்படத்தை வைத்துப் பூஜை, வழிபாடுகள் செய்யுமளவுக்கு அவரது வல்லமை உயர்ந்து நிற்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. மேலும், இயற்கை அழகும் பண்பாடும் தொன்மையும் நிறைந்த மலையகத் தமிழர் பிரதேசங்களில் பட்டாசு கொளுத்திப் பெருந்தோட்ட மக்கள் வரலாற்றில் என்றுமே இல்லாதவகையில் இந்த வரவு செலவுத்திட்டத்தை ஆதரித்துக் கொண்டாடிக் கொண்டிருக்கிறார்கள். இதனை யிட்டு மலையகப் பிரதிநிதி என்ற வகையில் நானும் இரட்டிப்பு மகிழ்ச்சியடைகின்றேன்.

எதிர்வரும் ஐந்து வருடங்களுக்குள் மாற்றத்தை நோக்கி மலையக மக்களைப் பொருளாதார ரீதியில் கட்டியெழுப்பு கின்ற, நிலையான, திடமான அபிவிருத்தியின் ஊடாக வழிநடத்துகின்ற ஒரு வரவு செலவுத்திட்டமாக இதைப் பார்க்கலாம். தோட்டத் தொழிலாளர்களுக்கு வரவு செலவுத்திட்டத்தின் ஊடாக அரசாங்கம் 200 ரூபாய் நிதி உதவி வழங்க முன்வந்திருப்பது இதுவே முதற் தடவையாகும். 1,350 ரூபாயாக இருந்த அவர்களுடைய நாட் சம்பளம், கம்பனியின்மூலம் அதிகரிக்கப்படும் 200 ரூபாயுடனும் அரசாங்கத்தின்மூலம் வழங்கப்படும் 200 ரூபாயுடனும் மொத்தமாக 1,750 ரூபாயாக அவர்களுக்கு வழங்கப் படவுள்ளது. அவர்கள் கிட்டத்தட்ட மாதாந்தம் 25 நாட்கள் வேலை செய்தால் மாதாந்தம் 10,000 ரூபாய் சம்பளம் அதிகமாகக் கிடைக்கக்கூடிய வாய்ப்பு உள்ளது. இது ஒரு வியப்பான செய்தியாகும். ஏனென்றால், சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹவின் காலத்தில் "ஐந்து சதமும் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு செய்ய முடியாது" என்று விற்பன்னர் பந்துல குணவர்தன தெரிவித்திருந்தது நமக்கு இப்பொழுது மீண்டும் மீண்டும் நினைவுக்கு வந்துகொண்டிருக்கிறது. எனவே, தேசிய மக்கள் சக்தி போன்ற ஒரு நிலையான அரசாங்கத்தினால் மாத்திரமே இப்படியான சாத்தியமான விடயங்களைச் செய்ய முடியும்.

மலையகத்தில் சுற்றுலாத்துறை வளர்ச்சியை ஊக்குவிக்கும் வகையில் திகன மற்றும் நுவரெலியா நகரங்களை மையப்படுத்தி இலங்கை முதலீட்டுச் சபையின்கீழ் இரண்டு பூங்காக்களைத் தாபிப்பதற்குத் திட்டமிடப்பட்டுள்ளது. இப்பகுதிகள் இயற்கை அழகு, வரலாற்று மரபுகள், பண்பாட்டு அம்சங்கள், சுற்றுலாத் தளங்கள் நிறைந்தாகத் திகழ்கின்றன. சிறப்பான இப்பிரதேசங்களின் சுற்றுலாத் துறை வருமானத்தின்மூலம் இந்த நாட்டின் பொருளாதாரத்தை மேலும் வலுவூட்டுவதற்கு இந்த வரவு செலவுத்திட்டம் பயனுள்ளதாக அமையும் என்பதில் எவ்வித சந்தேகமும் இல்லை. அந்த வகையில், சுற்றுலாத் துறையின் மையப் பகுதியாக அமைந்துள்ள கம்பளையில் அமைந்துள்ள அம்புலுவாவவும் எதிர்வரும் காலங்களில் சிறந்த முறையில் கலாசார ரீதியாக அபிவிருத்தி செய்யப்படவுள்ளது என்பதையும் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

இன்று பாரியதொரு கடன் சுமையை இலங்கைத்தீவு மீளச் செலுத்தவேண்டியிருக்கின்றது. மீளவும் அந்தச் சுமைக்குள்ளா காமல் பணவீக்கத்தை மட்டுப்படுத்தி, நவீன உலகுக்கு சவால் விடுக்கின்ற கல்விக் கொள்கையினூடாக தொழில் நுட்பத்தினை விருத்தி செய்துகொண்டு, உலகத்துக்கு முகம் கொடுக்கக்கூடிய ஒரு சமூதாயத்தை உருவாக்கக்கூடிய வகையில் இந்த வரவு செலவுத்திட்டம் தயாரிக்கப்பட்டுள்ளது.

இந்த நாட்டின் சுகாதார அபிவிருத்திக்காக ஒரு மிகப் பெரிய தொகை - 654 பில்லியன் ரூபாய் - ஒதுக்கீடு செய்யப் பட்டுள்ளது. எதிர்காலத்தில் கம்பளை வைத்தியசாலையும் 400 மில்லியன் ரூபாய் செலவில் அபிவிருத்தி செய்யப்படவுள்ளது. எனவே, ஒட்டுமொத்தமாகப் பார்ப்போமானால், வீழ்ச்சி யடைந்துள்ள நாட்டைக் கட்டியெழுப்புவதற்கான சிறந்ததொரு வரவு செலவுத்திட்டமாக இது காணப்படுகின்றது. அதற்கான தெளிவூட்டல் இதில் வழங்கப்பட்டிருக்கின்றது. குறிப்பாகச் சொல்லப்போனால், சகல தரப்பினரையும் உள்ளீர்த்துக் கொள்ளும் முயற்சியுடன் சமர்ப்பிக்கப்பட்ட வரவு செலவுத் திட்டம் என்று இதனைக் குறிப்பிட முடியும்.

ඒ වාගේම මම තවත් විශේෂ කාරණයක් සඳහන් කරන්න ඕනෑ. යකඩ ගැහැනියක් කියලා විරුදාවලිය ලත් ගම්පොළ ප්‍රදේශයේ ආත්මා දිල්රුක්ෂි ජයරත්න මහත්මිය, පසුගිය කාලයේ දේශපාලනඥයන් විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන හිටපු රුපියල් කෝටි 100ක දේපොළක් රජයට, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට ලබා ගන්න කටයුතු කළා. එතුමියට අපි මේ පාර්ලිමේන්තුවේදී ස්තුති කරන්න ඕනෑ. එතුමියගේ ජීවිතය අනතුරක තිබියදීත් රජයේ හිටපු අගමැතිවරු, ඇමතිවරු එක්ක තරග කරලා ජයග්‍රහණය කරලා, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට අද ඒ දේපොළ යළි පවරා දීලා තිබෙනවා. ඒ ගැන ඇත්තටම අපි සන්තෝෂ වෙන්න ඕනෑ. රජයේ නිලධාරියෙක් විධියට එසේ කටයුතු කිරීම ගැන එම ලේකම්තුමියට අපි ස්තුති කරන්න ඕනෑ.

ඊළඟට, එක මන්ත්‍රීවරයෙක් තවත් කථාවක් කිව්වා, අපි ජාතිවාදී ආණ්ඩුවක්, මුස්ලිම් මන්ත්‍රීවරුන්ට මොනවත් දීලා නැහැ කියලා. ඇත්තටම අපි කවුරුවත් ඇමතිකම් බලාපොරොත්තු වෙන්නේ නැහැ. හිටපු ඇමතිවරු මොනවාද කළේ? මම ගම්පොළ ප්‍රදේශය නියෝජනය කරන්නේ. ඇත්තටම කියනවා නම්, මේ ආණ්ඩුව තුළින් දැනට එම ප්‍රදේශයට රුපියල් මිලියන 2,000ක වැඩ කරලා තිබෙනවා. හිටපු මුස්ලිම් ඇමතිවරු මොනවාද කරලා තිබෙන්නේ? මම දන්නා විධියට ගම්පොළ ප්‍රදේශයේ පොඩි පාරක්, රුපියල් ලක්ෂ 150කින් පාරක් විතරයි මුස්ලිම් නායකයන් කියපු, ජාතික නායකයන් කියපු, අවුරුදු 30ක්, 35ක් පාර්ලිමේන්තුවේ හිටපු අය කරලා තිබෙන්නේ. ඒ නිසා හොඳට මතක තියා ගන්න, අපි ජාතිවාදී ආණ්ඩුවක් නොවෙයි. අපි ඇමතිකම් ඉල්ලුවේත් නැහැ. අතිගරු ජනාධිපතිතුමා අපට ඕනෑ වෙලාවට ඇමතිකමක් දෙන්නත් සූදානමෙන් ඉන්නවා. නමුත් අපට ඕනෑ ඇමතිකම නොවෙයි. මුස්ලිම් ජනතාව ඉන්න ප්‍රදේශවලට ඒ ජනතාව බලාපොරොත්තු වෙන වැඩ ටික කරලා දෙන එක විතරයි අපට අවශ්‍ය වෙන්නේ. ඇමතිකම් ඕනෑ කියලා කියන්නේ මාලිමාවේ ඉන්න කවුරුවත් නොවෙයි. විරුද්ධ පක්ෂයේ ඉන්න කට්ටියට තමයි ඇමතිකම් ඕනෑ, වැඩ කරන්න. අපට ඇමතිකම් අවශ්‍ය නැහැ, වැඩ කරන්න. අඩුම ගණනේ අපට මන්ත්‍රීකමක්වත් අවශ්‍ය වෙන්නේ නැහැ. අපේ ඉන්න cadre එක, අපේ සහෝදරයෝ ඇත්තටම වැඩ කරනවා.

ඒ වාගේම මම තවත් දෙයක් කියන්න කැමැතියි. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා ඊයේ සඳහන් කළා, අපේ මන්ත්‍රීවරු බස් එකේ එනවාය කියලා. ඔව්, අපිට ආඩම්බරයි. අපිට සන්තෝෂයි. හිතලා බලන්න, විරුද්ධ පක්ෂයේ කට්ටිය අවුරුද්දක් මන්ත්‍රී වෙලා හිටියොත් මොනවාද කරන්නේ කියලා. කැබ් එකක් නොවෙයි, සමහර විට V8 එකතුත් අරගෙන ඇති, හොරකම් කරලා; දූෂණ කරලා. සමහර විට හෙලිකොප්ටරයකුත් අරගෙන ඇති. අපේ මිනිස්සු රුපියලක් හොරකම් කරන්නේ නැහැ; කරන්න දෙන්නේත් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**
(மாண்புமிகு பஸ்மின் ஷரீப்)
(The Hon. Fasmin Sharif)

ඒ වාගේම තවත් මන්ත්‍රීවරයෙක් කිව්වා, බී ලූනුවලින්, අලවලින් පැලවත්තට commission ගියා කියලා. අපි කාගෙන්වත් commission ගන්නෙත් නැහැ; ගන්න දෙන්නෙත් නැහැ. ඔබතුමන්ලා හිතන්න එපා අපි හොරකම් කරන ජාතියක් කියලා.

ඊළඟට, තව කාරණයක් මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපි සංවර්ධන කටයුතු කරනවා. අපි මොනවත් කළේ නැහැ කියලා කියනවා. හිටපු අගමැතිතුමාගේ ගෙදරට යන පාරත් රුපියල් ලක්ෂ 1,900කින් අපි තමයි හැදුවේ. ඒ වාගේ තවත් හුඟක් වැඩ අපි ඉදිරියේදීත් කරනවා.

ඒ වාගේම, තවත් කාරණයක් මම කියන්න කැමැතියි. මේ දවස්වල කුරාන් ග්‍රන්ථ සම්බන්ධව ප්‍රචාරයක් යනවා. ඇත්තටම ඒ කුරාන් ග්‍රන්ථ ටික ඉන්දියාවට යවන්න හදනවා කියලා මුස්ලිම් ජනතාව අතර බොරු ප්‍රචාරයක් කරගෙන යනවා. ඉන්දියාවට කුරාන් ග්‍රන්ථ යවන්න අපි රජයක් විධියට කවදාවත් තීන්දු කරලා නැහැ.

ඒ වාගේම මම තව විශේෂ කාරණයක් කියන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය රැකගන්න අවශ්‍යයි. සමහර මන්ත්‍රීවරු කියන වචන ගැන කියන්නත් බැහැ. ඒ වුණාට ඒ කියපු වචන ටික ගැන කියන්න ඕනෑ. "බල්ලෝ" කියනවා, "පිස්සෝ" කියනවා, කාන්තාවන්ට අපහාස වන විධියට කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට විරුද්ධව අනිවාර්යයෙන් ක්‍රියාමාර්ගයක් ගන්න. නැත්නම් ඉදිරි කාලයේදී මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය නැති වෙනවා. මෙතැන කථා කරන දේවල් live විකාශනය වෙනවා. ඒවා ජනතාව අහනවා; පොඩි ළමයි අහනවා; ඉස්කෝල ළමයින් අහනවා. ඇත්තම කියනවා නම්, අපේ ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාගේ කථා, අතිගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ කථා අහලා තමයි මමත් ආසාවෙන් දේශපාලනයට ආවේ. නමුත් මේ වාගේ කථා ඇහුවාම දේශපාලනයට එනවා තියා හිතන්නවත් බැහැ. ඒ වාගේ කථා කරන මන්ත්‍රීවරු ටිකක් ඉන්නවා. මේ ගැන අනිවාර්යයෙන් ක්‍රියාමාර්ගයක් ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ජාතිවාදය පතුරන්නේ නැහැ. ඔබතුමන්ලා හිතලා බලන්න, ලබන 21වැනි දා විරුද්ධ පක්ෂයෙන් කරන meeting එකක් තිබෙනවා. මම විශේෂයෙන්ම සජබයේ මුස්ලිම් මන්ත්‍රීවරුන්ගෙන් අහනවා, ඒ රැස්වීමට ඔබතුමන්ලා යනවාද කියලා. ඒ වාගේම, ඒ කට්ටිය අපේ මුස්ලිම් ජනතාවගේ மையத்து - bodies - ටික පිච්චුවා. ඒක ඔබතුමන්ලා අනුමත කරනවාද? අපේ මුස්ලිම් ජනතාවගේ අබාය ගැලෙව්වා, තොප්පිය ගැලෙව්වා. ඒක අනුමත කරලා විරුද්ධ පක්ෂය ඒකාබද්ධ කරන රැස්වීමට සජබයෙන් යනවාද කියලා මෙතැන ඉන්න කවුරු හෝ අපට උත්තරයක් දෙන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.44]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා විසින් පසුගිය 07වන දා 80වන අය වැය කථාව ඉදිරිපත් කළා. ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතීතය අධ්‍යයනය නොකර වර්තමානය හඳුනාගන්න බැහැ. වර්තමානය නිවැරදිව හඳුනා නොගෙන අනාගතය ගොඩනඟන්න බැහැ. මෙයයි යථාර්ථය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2025 අය වැය දෙස බැලුවාම, ඒ අය වැයේ තිබුණු යෝජනා මොනවාද, ඒ යෝජනාවලින් මේ වෙනකොට යථාර්ථයක් බවට පත්වෙලා තිබෙන්නේ මොනවාද කියන එක අපට අධ්‍යයනය කරන්න වෙනවා. විශේෂයෙන්ම 2025 අය වැය ගත්තොත්, එය ජනාධිපතිතුමාගේ මංගල අය වැය. ඒ මංගල අය වැයේ හඳුනාගත් යෝජනා 57ක් තිබුණා. ඒකට මුදල් වෙන් කර තිබෙනවා, රුපියල් බිලියන 692.9ක්. ඒ වාගේම අමාත්‍යාංශ 24ක් ගැන එතුමා කථා කළා. ඒ අමාත්‍යාංශ 24 ගැන කථා කරනකොට අත්‍යවශ්‍ය අමාත්‍යාංශ 5ක කිසිම යෝජනාවක් ගැන අපේ ජනාධිපතිතුමා කථා කළේ නැහැ. ඒ අමාත්‍යාංශ 5 තමයි කම්කරු අමාත්‍යාංශය, බලශක්ති අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය. මේ අමාත්‍යාංශ 5 සම්බන්ධයෙන් කිසිම සංවර්ධන යෝජනාවක් පිළිබඳව කථා වන්නේ නැහැ. විශේෂයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය ගත්තාම, අද රටේ ජාතික ආරක්ෂාව ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුව පැත්තේ සිටින මැති ඇමතිවරු කියන විධියට ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් නැහැ කිව්වාට, ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් තිබෙනවා. අද කොයි වෙලේ, කොතැන වෙඩි තබයිද කියා දන්නේ නැහැ. ඒක රටේ ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක්. මේ අමාත්‍යාංශ 5ට අදාළව 2025 අය වැයේදී කිසිම නව යෝජනාවක් ගැන කථා කරන්නේ නැහැ. ඒ වාගේම, සංචාරක කර්මාන්තය ගැන කථා කළොත්, සංචාරක කර්මාන්තය සඳහා 2025 අය වැයෙන් රුපියල් මිලියන 500ක් වෙන් වුණා. එහි ප්‍රගතිය ගත්තොත්, එය සියයට බින්දුවයි.

මම දැක්කා ගිය මාසයේ ඇමෙරිකානු රජය ඇමෙරිකාවේ ඉන්න පුරවැසියන්ට නොකියා කියනවා, ලංකාවේ සංචාරය සඳහා යන්න එපා කියලා. මේ සම්බන්ධව අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කවුරු හරි කෙනෙකු හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ කවුරු හරි කෙනෙකු කිසිම නිවේදනයක් නිකුත් කළේ නැහැ. හැබැයි, අපි සංචාරකයන් ගැන කථා කරනවා, ඩොලර් ගැන කථා කරනවා. ලෝකයේ ප්‍රබල රටක් ඒ රටේ ඉන්න සංචාරකයන්ට කියනවා, මේ රටට යන්න එපා, මේ රටේ බිම් බෝම්බ තිබෙනවා කියලා. ඉතින්, මේ ගැන කථා කරන්න වෙනවා. එම නිසා ඒ සම්බන්ධව අවධානය යොමු කරන්නය කියා මම කියනවා.

2026 අය වැය ඉදිරිපත් කරමින් ජනාධිපතිතුමා මේ ගරු සභාවේ පැය 4යි විනාඩි 45ක් විතර කථා කළා. ඒ කථා කරපු අවස්ථාවේත් අමාත්‍යාංශ 4ක් ගැන එතුමා කථා කළේ නැහැ. ඒ අමාත්‍යාංශ හතර ඇතුළේ ආරක්ෂක අමාත්‍යාංශය තිබෙනවා. ආරක්ෂක අමාත්‍යාංශය එතුමාට දැන් අමතක වෙලා තිබෙනවා. රටේ ජාතික ආරක්ෂාව හොඳයි කියලා එතුමා හිතනවා. ආරක්ෂක අමාත්‍යාංශයේ තිබෙන වැදගත්කම එතුමා නොදන්නවා නොවෙයි. එතුමා ඒ සම්බන්ධව දන්නවා. මේ දේවල් අපි පෙන්වා දෙන්නේ අඩුපාඩු තිබෙන නිසායි. ඒ නිසා විශේෂයෙන්ම ඒ සම්බන්ධව අවධානය යොමු කරයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට, 2025දී ගෙනාපු ව්‍යාපෘති, ඒවාට වෙන් කරපු මුදල් සම්බන්ධවත් කියන්න ඕනෑ. කෘෂිකර්මය ගත්තොත්, කෘෂිකර්මය සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. වසර 5ක් ඇතුළත සුළු හා මධ්‍ය පරිමාණ තරුණ ව්‍යවසායකයන් 50,000ක් නිර්මාණය කිරීම සඳහා ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර තිබුණා. එතකොට 2025දී මේ ව්‍යවසායකයන් කීයක් ද

තෝරාගෙන තිබෙන්නේ? 28දෙනායි. ඒකට රුපියල් මිලියන 500ක් වෙන් කර දී තිබෙනවා. ඉතින්, මේ වාගේ දේවල් කරන්න එපා. මේක හොඳ වැඩසටහනක්. නමුත්, මේවාට මුදල් වෙන් කරලා මේවා ක්‍රියාත්මක කරන්නේ නැති වුණාම නැවතත් මේ මුදල් භාණ්ඩාගාරයට යනවා.

ඊළඟ එක, ක්‍රීඩා අමාත්‍යාංශය. ක්‍රීඩා අමාත්‍යාංශයට රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ප්‍රගතිය සියයට 10යි. අනුරාධපුරය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය ඉවත් කරන යන්ත්‍රයක් මිලදී ගන්න රුපියල් මිලියන 750ක් වෙන් කර තිබෙනවා. ප්‍රගතිය සියයට බින්දුවයි. මේවා තමයි අපි පෙන්වා දෙන්නේ. 2025 මංගල අය වැය ලේඛනයේ ඉදිරිපත් කරපු යෝජනාවලින් මොනවාද ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ කියන එක අපට පෙන්වා දෙන්න වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඔබතුමන්ලාගේ මංගල අය වැයෙන් -පළමුවැනි අය වැයෙන්- අඩුපාඩු වෙන්න පුළුවන්. හැබැයි, දෙවැනි අය වැයෙන් මේ වාගේ දේවල් වෙන්න බැහැ. හැබැයි, රජයක් විධියට කිසිම අවස්ථාවක මංගල අය වැයේ වුණත් අඩුපාඩු වෙන්න බැහැ. මේ සම්බන්ධව අවධානය යොමු කරලා ජනතාව තුළ විශ්වාසයක් ඇති වන විධියට කටයුතු කරන්න කියලා අපි කියනවා. විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රී කෙනෙකු විධියට මම මේ දිහා බැලුවේ, 2026 වසර සඳහා ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙනුත් මේ යෝජනාවලටම විශාල මුදලක් වෙන් කරගෙන තිබෙන නිසායි. දැන් මේ යෝජනාවලටත් ඒ විධියටම වෙයිද කියලා අපට සැකයක් තිබෙනවා. එහෙම නොවේවි කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා මේ සම්බන්ධවත් විශේෂ අවධානය යොමු කරන්න.

ඊළඟ කාරණය තමයි, අලි-මිනිස් ගැටුම. නවවැනි පාර්ලිමේන්තුවේදීත් මම අලි-මිනිස් ගැටුම ගැන දිගින් දිගටම කථා කළා. මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයෙත් අලි-මිනිස් ගැටුම තිබෙනවා. මේ අලි-මිනිස් ගැටුම පාලනය කරන්න, පත් වෙච්ච කිසිම රජයකට බැරි වුණා. මම ඔබතුමන්ලාට චෝදනා කරනවා නොවෙයි. හැබැයි, අලි-මිනිස් ගැටුමට පැය 24ක් ඇතුළත විසඳුම් ලබා දෙනවා කියලායි ඔබතුමන්ලා බලයට පත් වුණේ. මට මතකයි, ඔබතුමන්ලාගේ ජයග්‍රහණයත් එක්ක අලි-මිනිස් ගැටුම අවම කරන්න එදා අපේ සියලු රූපවාහිනී නාළිකා පාවිච්චි කරපු විධිය. අලි එහාට එළවනවා, මෙහාට එළවනවා. විදුලි වැටවල් හදනවා, වතුරේ බැහැලා පාසි අයින් කරනවා, අලි වැටවල් එහාට කරනවා, මෙහාට කරනවා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ජනාධිපතිතුමාගේ කථාවේදීම කියනවා, මේ වසරේ අලි ඇතුන් 260ක් මැරිලා තිබෙනවා; මිනිස් ඝාතන 80ක් සිදු වෙලා තිබෙනවා කියලා.

මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අලි වැට කිලෝමීටර 1,172ක් තිබෙනවා. ලංකාවේම අලි වැට තිබෙනවා, කිලෝමීටර 5,620ක්. 2025දී මේ සඳහා රුපියල් මිලියන 400ක් වෙන් වුණා. නමුත්, ප්‍රගතිය සියයට 50යි. ඒ රුපියල් මිලියන 400 වෙන් වුණේ අලි වැට අලුතින් හදන්න නොවෙයි. තිබෙන අලි වැට අලුත්වැඩියා කරන්න, අලුතින් බැටරි ටික ගන්න. නමුත්, මේවා අරගෙන තිබෙනවාද? සියයට 50යි ප්‍රගතිය. එක පැත්තකින් අලින් මැරෙනවා; තව පැත්තකින් මිනිස්සු මැරෙනවා. තව පැත්තකින් දේපළ හානි වෙනවා. 2026 අය වැයෙන් එම ව්‍යාපෘතියටම රුපියල් මිලියන 300ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, විශාල මුදලක්. අලි වැට අලුතින් හදන්න වනවා, අලි වැටක තිබිය යුතු විදුලි ධාරිතාව නියමිත මට්ටමේ තබන්න වනවා, අලුතෙන් බැටරි ටික ගන්න වනවා. අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා මේ කාරණය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරයි කියලා මම විශ්වාස කරනවා.

ඊළඟට, කෘෂිකර්මය ගනිමු. වී මිලදී ගැනීම සඳහා මෙවර අය වැයෙන් රුපියල් බිලියන 10ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පොහොර සහනාධාරය සඳහා රුපියල් බිලියන 36.9ක් වෙන් කරලා තිබෙනවා. ඉතින්, හොඳයි. හැබැයි, පසුගිය යල කන්නයේ පොහොර සහනාධාරය වෙලාවට ලබා දුන්නාද? මම අහගෙන, අපේ නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, හෙක්ටෙයාරයකට රුපියල් 15,000ක් ලෙස දුන් පොහොර සහනාධාරය රුපියල් 25,000ක් කළාය කියලා. ඇත්තටම පොහොර සහනාධාර මුදල රුපියල් 25,000ක් කළේ හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා. එය කළ මනුස්සයාට අපි ඒ ගෞරවය දෙන්න ඕනෑ. ඒක ලබා දුන්නා. හැබැයි, පොහොර සහනාධාරය වෙලාවට ලැබුණාද? යල කන්නයේදී ගොවියාට පොහොර සහනාධාරය වෙලාවට ලැබුණේ නැහැ. නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, දැන් ගොවියාට ප්‍රශ්න නැහැ, ගොවියාගේ ප්‍රශ්න විසඳුණා කියලා.

මම දන්නවා, ගොවීන්ට කොච්චර ප්‍රශ්න තිබෙනවාද කියලා. මොකද, මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කය ගත්තාම අද ලූනු ගොවියා අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නේ. අද ලූනු ගොවියෙක් ළඟ තිබෙනවා, ලූනු කිලෝ 15,000ක්, 20,000ක් අතර ප්‍රමාණයක්. ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 160ක වියදමක් ගිහින් තිබෙනවා. අද ලූනු කිලෝ එකක් කීයද? අද ලූනු කිලෝ එකක් රුපියල් 110යි, රුපියල් 120යි. රුපියල් 110ට ලූනු ටික විකුණන්න දඹුල්ලට යනකොට මොකක්ද කරන්නේ? එකපාරට ලූනු කිලෝ එකක මිල රුපියල් 70, 80 කරනවා. ලූනු කිලෝ එකක් නිෂ්පාදනය කරන්න රුපියල් 160ක් ගොවියාට වියදම් වනවා නම් දැන් මොකක්ද මේකට කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා මේ සම්බන්ධව රජය අවධානය යොමු කළ යුතුයි.

එක කාලයක් වී ගොවියා අන්ත අසරණභාවයට පත් වුණා. එම නිසා යල කන්නයේදී රජය විසින් සහතික මිලක් ලබා දුන්නා, තෙත වීවලට රුපියල් 105කුත්, වේළපු වීවලට රුපියල් 120කුත් වශයෙන්. ඉතිහාසයේ කිසිම රජයක් තෙත වීවලට මිලක් දුන්නේ නැහැ. තෙත වීවලට මිලක් දීම තුළින්ම වී මිල සම්පූර්ණයෙන්ම පහළ වැටුණා. සාමාන්‍යයෙන් අස්වැන්න නෙළනකොටම වී ටික විකුණා ගන්න තමයි ගොවියා බලන්නේ. මොකද, ගොවියාට ශක්තිමත් ආර්ථිකයක් නැහැ. තමන්ගේ වී ටික තියාගෙන, වේළා, ඒ සියයට 14 ප්‍රමිතියට දීලා, රුපියල් 120ක මිලක් ගන්න ගොවියාට හැකියාවක් නැහැ. රජය විසින් තෙත වීවලට රුපියල් 105ක් නියම කිරීම නිසාම තෙත වී විකිණුනේ රුපියල් 70ට, 80ට. මම නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමාටත් කිව්වා, ඒ වාගේම කෘෂිකර්ම ඇමතිතුමාටත් කිව්වා, මේ අය වැයේදී නැවත වාරයක් තෙත වීවලට නියම කරලා තිබෙන මිල අයින් කරන්න කියලා. එතකොට තෙත වීවලට මිලක් හැදේවි. එම නිසා මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මම යෝජනා කරනවා.

ඊළඟට කිරි ගොවියා ගැන කථා කළොත්, දේශීය කිරි ගොවියා ශක්තිමත් කරන්න 2025 අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් වෙන් කළා. රුපියල් මිලියන 2.500ක් වෙන් කළා කියලා කිරි ගොවියා ශක්තිමත් වුණාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කිරි ගොවියෙකුට අයත් හරක් දෙදෙනෙක් ඊයේ වනජීවී කාර්යාලයෙන් අල්ලාගෙන ගිහිල්ලා, උසාවියට ඉදිරිපත් කරලා එක හරකෙකුට රුපියල් 30,000 බැගින් දඩ ගැහුවා. මම ගිය අය වැයේදීත් යෝජනා කළා, රුපියල් මිලියන 2,500ක් වෙන් කරලා තිබෙනවා, එම මුදල වෙන් කළාට මදි, කිරි ගොවීන්ගේ කිරි හරක් ටික නිදහස් කරන්න අවශ්‍ය තණ බිම් ටික ලබා දෙන්න අපට සිද්ධ වනවා කියලා. කිරි ගොවීන්ගේ හරක් ටික තියාගන්න තැනක්

[ගරු කිංස් නෙල්සන් මහතා]

නැහැ. වනජීවී කලාපවලට ගිය ගමන් වනජීවී නිලධාරින් ඒ සතුන්ව අල්ලා ගන්නවා. අල්ලාගෙන උසාවියට ඉදිරිපත් කරලා ඒ ගොවීන්ට දඩ ගහනවා. 2026 අය වැයෙනුත් රුපියල් මිලියන 1,000ක් වෙන් කරලා තිබෙනවා, කිරි ගොවියාව ශක්තිමත් කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොච්චර මුදල් වෙන් කළත් වැඩක් නැහැ, මේ යෝජනා හරි විධියට ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

අද පරිසර අමාත්‍යාංශයටත් අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව රැස් වුණා. ඒකට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් ඇවිල්ලා හිටියා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට 2025 අය වැයෙන් රුපියල් මිලියන 406ක් වෙන් වනවා. ඒ වාගේම වනජීවී fund එකෙනුත් රුපියල් මිලියන 1,194ක් වෙන් වෙලා තිබෙනවා. හැබැයි, ප්‍රගතිය කීයද? සියයට 30යි. අපේ රටේ ජාතික වනෝද්‍යාන 26ක් තිබෙනවා. විවෘත කරලා තිබෙන්නේ කීයද? 19යි. උදාහරණයකට ගත්තොත්, ජාතික වනෝද්‍යාන ඇතුළේ තිබෙන මාර්ගවල යන්න පුළුවන් තත්ත්වයක් අද තිබෙනවාද? ඒ වාගේම සංචාරක බංගලාවලට සංචාරකයන්ට යන්න පුළුවන් තත්ත්වයක් අද තිබෙනවාද? එම මාර්ගවල යන්න බැහැ, එම සංචාරක බංගලාවලට යන්න බැහැ කියන එක අද එම ආංශික අධීක්ෂණ කාරක සභාවට පැමිණි ඒ නිලධාරි මහතාත් පිළිගත්තා. අද ඒ සංචාරක බංගලාවලට යන්න බැහැ. උදාහරණයක් විධියට ගත්තොත්, යාල ජාතික වනෝද්‍යානයෙන් එළියේ තිබෙන පෞද්ගලික බංගලාවක් දවසකට දෙන්නේ රුපියල් 75,000කට, 80,000කට. ජාතික වනෝද්‍යානයක් ඇතුළේ තිබෙන බංගලාවක් රුපියල් 100,000කට දෙන්න කියලා මම කියන්නේ නැහැ. ඒවාට සංචාරකයින්ට යන්න පුළුවන් විධියට පරිසරය හදලා දෙන්න වෙනවා. ඒ දේවල් සඳහා විශාල මුදලක් වෙන් කරලා තිබෙන එක ඇත්ත. මේ සභාවේ කථා කළ මැති ඇමතිවරුන් කිව්වා, "ඔව්, අපි මුදල් වෙන් කරලා තිබෙනවා" කියලා. මම චෝදනාව කරන්නේ අදාළ අමාත්‍යාංශවල ඉන්න නිලධාරින්ට. මේවා හදලා දෙන්න වෙනවා. ඒවා ගැන සොයා බලන්න තමයි ඇමති කෙනෙක් ඉන්නේ. යම් අමාත්‍යාංශයකට මුදලක් වෙන් කළාම ඒ අදාළ ඇමතිවරයා බලන්න ඕනෑ, අපට මේ මුදල මේ අවුරුද්ද තුළ පාවිච්චි කරන්න පුළුවන්ද, බැරිද කියලා. විශේෂයෙන්ම ඔබතුමන්ලා ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න.

ඊළඟට, බන්ධනාගාර ගැන බලමු. 2025දී මේ රටේ බන්ධනාගාරවල අඩු පාඩු සකස් කිරීමට සහ බන්ධනාගාරවල තදබදය අවම කිරීමට රුපියල් මිලියන 845ක් වෙන් කරනවා. රුපියල් මිලියන 845ක් වෙන් වුණාට, දැන් බන්ධනාගාරවල පවතින තදබදය අඩු වෙලා තිබෙනවාද? විශේෂයෙන්ම කොළඹ ආරක්ෂක බන්ධනාගාරයේ ඉන්න පුළුවන් රැඳවියන් සංඛ්‍යාව 1,400යි. නමුත් අද කීදෙනෙක් ඉන්නවාද? 3,579ක් ඉන්නවා. මා නියෝජනය කරන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බන්ධනාගාරයේ ඉන්න පුළුවන් රැඳවියන් සංඛ්‍යාව 149යි. නමුත් අද කීදෙනෙක් ඉන්නවාද? 495දෙනෙක් ඉන්නවා. පොළොන්නරුව බන්ධනාගාරයේ තිබෙන වැසිකිළි පද්ධතිය සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙන්නේ. මේ බන්ධනාගාරයේ තිබෙන වැසිකිළි පද්ධතිය උතුරා ගිහින් අපේ කථානායකතුමාගේ නිවස ඉස්සරහ තිබෙන කුඹුරට තමයි ඒ ඔක්කෝම ටික වැටෙන්නේ. එතුමාත් ඒක දන්නවා. මම මේ සම්බන්ධව ප්‍රශ්නයකුත් මේ පාර්ලිමේන්තුවේදී ඇහුවා. 2025දී රුපියල් මිලියන 845ක් වෙන් වුණා, බන්ධනාගාරවල තිබෙන මේ අඩුපාඩු හදන්න. ඉතින් ඒවා වෙලා තිබෙනවාද? ඒවා වෙලා නැති බව තමයි අපි පෙන්වන්නේ. "මංගල අය වැය", "පළමුවෙනි අය වැය", "අපි දන්නේ නැහැ" කියලා දැන් කියන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2024 ජනාධිපතිවරණයට අපේ පක්ෂයේ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාත්, ඔබතුමන්ලාගේ නායක ගරු අනුර කුමාර දිසානායක මැතිතුමාත් ඉදිරිපත් වුණා. අපේ නායකයා පැරදුනා, ඔබතුමන්ලාගේ නායකයා මේ රටේ ජනාධිපති වුණා. ඒ අභියෝගය ඔබතුමන්ලා භාර ගත්තා. මේ රට වැටිච්ච රටක්, බංකොලොත් වෙච්ච රටක් කියලා අපිත් දන්නවා, ඔබතුමන්ලාත් දන්නවා. හැබැයි ඔබතුමන්ලා ඒ අභියෝගය භාර ගත්තා, රටේ ජනතාව පිළිගත්තා, අනුර කුමාර දිසානායක මහත්තයාට තමයි මේක කරන්න පුළුවන් කියලා. එහෙම නම් දැන් ඔබතුමන්ලා කියලා වැඩක් නැහැ, වැටිච්ච රටක් ගත්තේ, බංකොලොත් වෙච්ච රටක් අපි ගත්තේ කියන ඒ කතන්දර.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ හොඳ දේවල් කරනවා නම් අපි අනිවාර්යයෙන්ම ඒවාට සහයෝගය ලබා දෙනවා. විශේෂයෙන් මම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් විධියට මේ රට වෙනුවෙන් ඔබතුමන්ලා ගන්නා ඕනෑම සුබවාදී කටයුත්තක් වෙනුවෙන් ඕනෑම වෙලාවක අත් දෙකම උස්සලා ඡන්දය දෙනවා. විශේෂයෙන් ජනාධිපතිතුමා මත්ද්‍රව්‍ය තුරන් කිරීම වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ගයට අපටත් දෙන්න පුළුවන් සහයෝගයක් තිබෙනවා නම් එය ලබා දෙන බව කියමින්, අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අශෝක ගුණසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 5.01]

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජන ජීවිත, අපේ රටේ ආර්ථිකය, අපේ රටේ සංස්කෘතිය, අපේ රටේ මුළුමහත් අනාගතයම 2026 වර්ෂය සඳහා තීන්දු කරන 2026 අය වැය වැඩ පිළිවෙළ පිළිබඳව තමයි අපි මේ වෙලාවේදී කථා කරන්නේ. පසුගිය වර්ෂය කියන්නේ, අපේ 2026 වර්ෂයේ අය වැය සම්බන්ධයෙන් පූර්ව ලෙස සිතා බලන්න පුළුවන් අවස්ථාවක්. අපි දන්නවා, අපේ රටේ ජනතාව දශක ගණනාවක් තිස්සේ මේ වාගේ අය වැය හරහා, ඒ අය වැය ඔස්සේ ක්‍රියාත්මක වුණු වැඩ පිළිවෙළවල හරහා බොහෝ සේ පීඩාවට පත් වෙලා සිටි බව. ඒ පීඩාව විසින්ම ඔවුන් තීන්දු කළා, ඒ පීඩාවෙන් මිදෙන්න නම් අප වාගේ දේශපාලන ව්‍යාපාරයක් ජයග්‍රහණය කරවන්න ඕනෑය කියලා.

එම ජයග්‍රහණයේ ප්‍රතිඵලයක් විධියට 2025 වර්ෂයට අදාළ අප රජයේ පළමු අය වැය ලේඛනය 2025 වර්ෂයේදීම ඉදිරිපත් කරනු ලැබුවා. 2025 වර්ෂය ඇතුළත අපේ රට ආර්ථික වශයෙන් කොච්චර දුරකට ආවාද, අපේ රට සමාජමය වශයෙන් කොච්චර දුරකට ආවාද, අපේ රට සංස්කෘතිකමය වශයෙන් කොච්චර දුරකට ආවාද කියලා අපේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා 2026 වර්ෂයට යන්න කලින් 2025 වර්ෂය ගත වුණු ආකාරය ගැන සාධාරණ ලෙස හිතන ඕනෑම කෙනෙකුට තේරුම් යනවා, අපි ගමන් කරමින් සිටින දිශානතිය කුමක්ද කියලා.

අපි දැන් සිටින්නේ 2025 වර්ෂයේ අග භාගයේ. ඉතිහාසය තුළ අපේ රට මෙතෙක් ආපු ගමන් මඟ 2026 වර්ෂයේදී වෙනස් කරන මේ දේශපාලන ව්‍යාපාරය ගැන අපේ රටේ ජනතාව තුළ අදහසක් තිබෙනවා. ඒ අදහස මත ඉඳිමින් තමයි අපේ රටේ ජනතාව මේ අය වැය දිහා බලන්නේ. මේ අය වැය ලේඛනය සැකසීමේදී මුළු රටේම සිටින හැම කෙනෙකුම ඉලක්ක කරගත්තා. ඒ අනුව උපදින්න ඉන්න දරුවා ගැනත්, මේ රටේ ඉපදී සිටින දරුවන් ගැනත්, තරුණ තරුණියන් ගැනත්, වැඩිහිටි ප්‍රජාව ගැනත් මේ අය වැය තුළින් අවධානය යොමු කර තිබෙනවා. හැම ප්‍රජාවක්ම ඉලක්ක කරගත් සුබසාධනයක් සඳහා සහ රටේ අනාගතය දියුණු කිරීම සඳහාත්, රටේ අනාගතය නිෂ්පාදනය ප්‍රමුඛ කරගත් අනාගතයක් බවට පත් කිරීම සඳහාත් සම්බන්ධ කරගත හැකි හැම කෙනෙකුම සම්බන්ධ කර ගනිමින් ගොඩනඟන ලද, සකස් කරන ලද අය වැයක් තමයි මේ අවස්ථාවේ අපි ඉදිරිපත් කර තිබෙන්නේ.

මේ පාර්ලිමේන්තුව තුළ විපක්ෂය නියෝජනය කරන කණ්ඩායම කරන කථාවල අපට දකින්න තිබෙන්නේ, ඔවුන්ගේ කථා තුළින් අපට දැනගන්න ලැබෙන්නේ මොනවාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඒ අය අද කළ කථාවලින් පවා අපට දකින්න ලැබුණේ මොකක්ද? අපේ ගම්වල මිනිස්සු කරන සූදුවක් තිබෙනවා, බුරු ගහනවා කියලා. බුරු පොළවල්වලට එකතු වන මිනිස්සු ඒගොල්ලන් ළඟ තිබෙන මුදල් අතින් අතට, මාරුවෙන් මාරුවට එකිනෙකා අතට හුවමාරු කර ගනිමින් ඒ සූදුවේ යෙදෙනවා. ඒ සූදුවේ යෙදෙනකොට, එක මොහොතකදී එක්කෙනෙක් අතට එකතු වන සල්ලි දිහා බලා ඒ කෙනා කල්පනා කරනවා, මේ වෙලාවේ මම පොහොසතෙක් කියලා. ඒ විධියට තමයි ඒගොල්ලන් ඒ සූදුව ඇතුළේ තෘප්තිමත් වෙන්නේ. එහෙමයි අපි අසා තිබෙන්නේ. අපි දන්නවා, මේ වත්මන් විපක්ෂය ආණ්ඩු කළ කාලයේ ඉදිරිපත් කළ අය වැය ලේඛන තුළ තිබුණේත් ඒ වාගේ සෙල්ලමක් බව. ඒ සෙල්ලම ඇතුළේ තමයි ඒගොල්ලන් තෘප්තිමත් වුණේ. උදාහරණයක් ලෙස ගත්තොත්, පසුගිය කාලයේ පැවති ආණ්ඩු විසින් ඉදිරිපත් කළ අය වැය ලේඛන තුළින් බැංකුවලට කිව්වා, අපේ රටේ විශ්‍රාමිකයන්ගේ තැන්පතු සඳහා සියයට 15ක් පොලිය දෙන්න කියලා. හැබැයි, බැංකුවලට රජය විසින් ගෙවන්න තිබෙන ඒ සියයට 15 ගෙවා නැහැ. ඒ අය ඒ තුළින් උත්සාහ කර තිබෙන්නේ ඒ විශ්‍රාමිකයන් ඒ අයගේ මැතිවරණ ව්‍යාපාරවලට සම්බන්ධ කර ගන්නයි. හැබැයි, ඒ අය දකින්නේ නැහැ, ඒ අය කල්පනා කරන්නේ නැහැ, මේ බැංකු පද්ධතිය කඩා වැටීම නිසා අපේ රටේ ආර්ථිකය කඩා වැටෙනවා, එතකොට රටේ අනාගතයට ඒක විශේෂ බලපෑමක් වෙනවා කියලා. ඒ අය ඒ ගැන කල්පනා කර තිබුණේ නැහැ. ඒ නිසා තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විපක්ෂයේ සිටින අය ඒ අයගේ පාලන කාලවලදී ඉදිරිපත් කළ අය වැය ලේඛන ගැන මම කිව්වේ. මොකද, බුරු පොළක සිද්ධ වෙන ක්‍රියාවලිය වාගේ තමයි ඒගොල්ලන්ගේ කාලයේ අය වැය ලේඛන ඉදිරිපත් කර තිබෙන්නේ.

ඒ වාගේම ඒ අයගේ කාලවලදී ඉදිරිපත් කළ අය වැය ඇතුළේ අපේ රට නිෂ්පාදන ක්‍රියාවලියකට ගෙන ගියා නම්, මේ වාගේ දුක්ඛදායක තත්ත්වයකට අපේ රට අද වැටෙන්නේ නැහැ. ඒක නිසා හරි පැහැදිලියි, ඒගොල්ලන්ගේ ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ මේ රට බිඳ වැට්ටුවා, විනාශ මුඛයට අරගෙන ගියා කියන කාරණය. ඒකෙන් පීඩාවට පත් වූ ජනතාව තමයි දේශපාලන තීන්දුවක් අරගෙන අපට මේ රට භාර දුන්නේ. මේ රටේ ආර්ථිකය වට්ටලා තිබුණේ. එවැනි රටක ඉඳිමින් තමයි අපේ රජයේ දෙවන අය වැය ඉදිරිපත් කරනු ලැබුවේ. කවුරු රට වැට්ටුවත් ආර්ථිකය ගොඩනැඟීමේ වගකීම අප සතුව තිබෙනවා. ඒක නිසා ඒ අභියෝගය භාර ගත් ආණ්ඩුවක් ලෙස තමයි මේ අය වැය ඉදිරිපත් කරන්නේ. ඒ වගකීම ඉෂ්ට කිරීම සඳහා තමයි විවිධ ක්ෂේත්‍ර ගැන කල්පනා කරලා මූලික උපාය මාර්ග ලෙස කාරණා 6ක් මූලික කරගෙන අපේ අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ. රටේ විවිධ ක්ෂේත්‍රවල ඉන්න අයට සුබසාධනය සපයන්න විතරක් නොවෙයි, ඒගොල්ලන් අපේ රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක කරගන්න, නිෂ්පාදන ක්‍රියාවලියට දායක කරගන්න පුළුවන් වන විධියට හදපු අය වැයක් තමයි මෙවර ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ වාගේම මේ රටේ මිනිස්සුන්ගේ ජීවිත ලස්සන කරන්න අවශ්‍ය වන විධියට හැම කෙනෙකුටම හොඳ නිවාසයක් ලබා දෙන්න යෝජනා කරපු අය වැයක් මේක. ඒ අතරේම මම කලින් උදාහරණයක් ලෙස කියපු ආකාරයට මේ රට කරගෙන ගිය පැරණි ආණ්ඩු විශ්‍රාමිකයන්ගේ තැන්පතුවලට ගෙවපු පොලිය ඒ බැංකුවලට ගෙවා නැති නිසා බැංකු කඩාගෙන වැටුණා. ඒ නිසා දැන් අපේ වගකීම වන්නේ ඒ කඩාගෙන වැටුණු බැංකු නැවත ගොඩනඟන එකයි. අපි මේ අය වැය තුළ ඒ බැංකුවලට ආණ්ඩුවෙන් ගෙවන්න තිබුණු පොලී මුදල් ගෙවන එකත් අඩංගු කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරණ ආණ්ඩුවල පව්වලට කර ගහමින් මේ රට ගොඩ දැමීම වෙනුවෙන් සකස් කරපු අය වැයක් තමයි අපි මෙවර ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොන ආණ්ඩුව යටතේ වුණත් වට්ටපු රට නැවත ගොඩනැඟීමේ දිශානතියකට තමයි මේ අය වැය සකස් කරලා තිබෙන්නේ. මේ අය වැය පිළිබඳව සාධාරණ ලෙස දකින ඕනෑම පුරවැසියෙකුට බලා ගන්න පුළුවන්, රට තිබුණු තත්ත්වය සහ දැන් අපි ගමන් කරමින් සිටින තැන. පසුගිය වර්ෂය තුළ අපි ආපු ගමන් මඟ තුළ මේ රට කොයි දිශාවටද ගමන් කරමින් තිබෙන්නේ, සංවර්ධනයේ දිශාවටද නැත්නම් කඩා වැටෙන දිශාවටද කියන එක අපි කල්පනා කර බලන්න ඕනෑ.

අද මම දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මේ සභාවේදී IMF එළදෙන ගැන කථා කරනවා. ඒ වාගේම IMF එකේ කොන්දේසි අනුව, සෞඛ්‍ය උපකරණ සඳහා පනවා තිබෙන VAT එක අඩු කළේ නැහැ කියනවා මම දැක්කා. අපි දන්නවා වුණාට එතුමා

[ගරු අශෝක ගුණසේන මහතා]

දන්නේ නැහැ, කොවිඩ් වසංගතය පැවති කාලයේ පීඩාවට පත් වූ ජනතාව වෙනුවෙන් අපේ රටට ගෙනාපු antigen test kitsවලින් හොරකම් කරපු ක්‍රමය දැන් අහෝසි කරලා තිබෙනවා කියලා. හැබැයි, ඒගොල්ලන් දැන් කියනවා, සෞඛ්‍ය උපකරණ සඳහා පනවා තිබෙන VAT එක අඩු කරන්නේ නැහැ කියලා. නමුත් අපි එතුමන්ලාගේ යුගයේ දැක්කා, අපේ රටේ ජනතාවගේ සෞඛ්‍ය වෙනුවෙන් ගෙනාපු antigen test kitsවලින් හොරකම් කරපු හැටි. හැබැයි, අපේ ආණ්ඩුව ඒවා අවසන් කරලා තිබෙනවා. ඒ නිසා මේ රටේ ජනතාවට සෞඛ්‍ය සම්බන්ධයෙන් භය වෙන්න දෙයක් නැහැ. හොරකම් කරන්නේ නැති ආණ්ඩුවක් දැන් මේ රටේ ගොඩනැඟිලා තිබෙනවා. අපේ රටේ ජනතාව ඒක ගොඩනඟලා තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය අනුග්‍රහය සහිතව හොරකම් කරන්න අවස්ථාව තිබුණු යුගය අවසන් කරලා තිබෙනවා. ඒ නිසා බොහොම පැහැදිලියි, මේ අය වැය හරහා අපේ රට ගමන් කරමින් තිබෙන දිශානතිය මොකක්ද කියලා. ඒක තමයි, අපේ රටේ ජනතාවගේ හෙට දවස ලස්සන ජීවිතයක් බවට පත් කරන එක. එම කාරණයත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.10]

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 වර්ෂය සඳහා වන අපගේ ආණ්ඩුවේ දෙවන අය වැය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම මහත් භාග්‍යයක්කොට සලකනවා. ඇත්තටම 2025දී අපේ මංගල අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේ විපක්ෂයෙන්, "ජාතික ජන බලවේගය ආණ්ඩුව ඉදිරිපත් කරන අවසාන අය වැය. ආණ්ඩුව මාස හයෙන් ඉවරයි. ආධුනික ඇමතිවරු, මන්ත්‍රීවරු ඉන්නේ, ඒ අයට වැඩ කරන්න තේරෙන්නේ නැහැ" වාගේ විවිධ මත ඉදිරිපත් කළා. දැන් ඒකට උත්තරයක් හම්බවෙලා තිබෙනවා. මොකද, 2025 වර්ෂයේ මංගල අය වැයේ අරමුණ වුණේ රටේ පැවති සාර්ව ආර්ථික අස්ථාවරභාවය, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාව, ව්‍යුහාත්මක අකාර්යක්ෂමතාව සහ පාලනයේ දුර්වලතා හේතුවෙන් දැඩි අවදානම් තත්ත්වයකට පත්ව තිබූ ආර්ථිකය යළි නඟා සිටුවීමයි. ඒ අනුව ජනාධිපතිතුමා ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය, ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු ඇතුළුව ආණ්ඩුව සහ රාජ්‍ය නිලධාරින් විසින් කරනු ලැබූ දැඩි කැප කිරීම් සහ පරිශ්‍රමය හමුවේ වසරක කාලයක් තුළ දී සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීමටත්, රාජ්‍ය මූල්‍ය තහවුරු කිරීමටත්, රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීමටත්, දූෂණයට තිත තබමින් විනිවිදභාවය ඉහළ නැංවීමටත්, ජනතාව කෙරෙහි වගවීම තහවුරු කිරීමටත් අවශ්‍ය කටයුතු සාර්ථකව සිදු කිරීම නිසා රාජ්‍ය මූල්‍ය, සාර්ව ආර්ථික හා සමාජ ස්ථාවරත්වය යළි ස්ථාපිත කිරීමේ හැකියාව ලැබී තිබෙනවා. ඇත්තටම එමඟින් විපක්ෂය ගොඩ නැඟූ ඒ බොරු මතවලට නිසි පිළිතුරු ලැබී තිබෙනවා. ආණ්ඩුවේ පාර්ශ්වකරුවෙක් වීම පිළිබඳව ඇත්තටම මම මහත් සේ ආඩම්බර වෙනවා. 2026 අය වැය පිළිබඳව සලකා බලන විට ප්‍රධාන උපාය මාර්ගික අරමුණු ලෙස හඳුනා ගත් කරුණු 6ක් ඔස්සේ කථා කරනවා. ඒවා තමයි, තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික වර්ධනයක්, අපනයන විවිධාංගීකරණය මඟින් ඉහළ ආදායමක්, ණය තිරසරභාවය සහතික කිරීම, නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම, ග්‍රාමීය දිළිඳුබව තුරන් කිරීම, ඩිජිටල්කරණය ප්‍රවර්ධනය යන කරුණු. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාජයේ සියලු කණ්ඩායම් ආවරණය වන පරිදි සකස් කරන ලද වැඩසටහන් රටේම ක්‍රියාත්මක වෙනවා. මෙහිදී කළලයේ සිට වයෝවෘද්ධ තැනැත්තන් දක්වාත්, දිළිඳු ජනතාවගේ සිට ධනපතියන් දක්වාත්, සුළු පරිමාණ කර්මාන්තකරුවන්ගේ සිට මහ පරිමාණ කර්මාන්තකරුවන් දක්වාත්, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව, ජාති ආගම් භේදවලින් තොරව සමාජයේ සියලු ස්ථර මේ අය වැයේ ප්‍රතිලාභ ලැබීමට නියමිතයි. ඒ වාගේම වසර කිහිපයකින් සියයට 7ක් ඉක්මවන ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමත් මෙම අය වැයේ අරමුණක්.

මෙහිදී දේශීය විදේශීය ආයෝජකයන් දිරි ගැන්වීම සඳහා අවශ්‍ය වටපිටාව සකස් කරමින්, නව අණපනත් සම්මත කරමින්, පවතින අණපනත් සංශෝධනය කරමින් දේශීය ආර්ථිකය තුළ ඔවුන්ට ආයෝජනය කිරීමේ වැඩි ඉඩ ප්‍රස්ථා නිර්මාණය කර තිබෙනවා. ඒ සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතට සහ කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව පනතට ඉදිරිපත් කරන ලද සංශෝධන වාගේම, 2026 වර්ෂයේදී සම්මත කිරීමට බලාපොරොත්තු වන රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පනත, ආයෝජන ආරක්ෂණ පනත වාගේ පනත් උපකාර වන බව දක්වන්න පුළුවන්.

ඒ වාගේම සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් මෙම අය වැයෙන් යොමු වෙලා තිබෙනවා. 2030 වර්ෂය වන විට සංචාරක ඉපැයීම් ඇමෙරිකානු ඩොලර් බිලියන 8 දක්වා වැඩි කර ගැනීමට අපේක්ෂා කරනවා.

මෙම අය වැය ජනතාව වෙනුවෙන්ම වූ අය වැයක්. මෙම අය වැය ජනතාවගේ නිරෝගී, සෞඛ්‍ය සම්පන්නභාවය පිළිබඳව වැඩි අවධානයක් යොමු වූ අය වැයක් කිව්වොත් හරි. ශ්‍රී ලංකාවේ සමස්ත මරණවලින් සියයට 40ක් පමණ හෘදය ආශ්‍රිත රෝග නිසා සිදු වන මරණ බවට වාර්තා වෙලා තිබෙනවා. කොළඹ ජාතික රෝහලේ හෘද රෝග ඒකකය ශ්‍රී ලංකාවේ විශාලතම සහ වඩාත්ම දියුණු හෘද රෝග සත්කාර මධ්‍යස්ථානය වුණත්, එහි පවතින සීමිත ඉඩ කඩ සහ පහසුකම් නිසා සත්කාර ගැනීමට දීර්ඝ කාලයක් පොරොත්තු ලේඛනයේ රැඳී සිටීමට සිදු වෙනවා. එහෙම නැත්නම් විශාල මුදලක් වැය කර පෞද්ගලික අංශයෙන් එකී සේවාව ලබා ගැනීමට සිදු වෙනවා. එයට පිළියමක් වශයෙන් වැඩි ඉඩ කඩ පහසුකම් සහ නවීන උපාංගවලින් සමන්විත මහල් 16කින් යුතු ජාතික හෘද ඒකකය පිහිටුවීමට අවශ්‍ය මූලික වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා මම අය වැය මඟින් මුදල් වෙන් කර තිබීමම අපේ හදවත් සුව කිරීමට සමත් පුවතක්.

ඒ වාගේමයි අපේ රටට විශාල ශ්‍රම දායකත්වයක් සපයන වතු කම්කරුවන්ට ලබා දී තිබෙන සහනය. එය ඉතාම අගය කළ යුතුයි. ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,350 සිට රුපියල් 1,550 දක්වා රුපියල් 200කින් වැඩි වීමක් සිදු වන අතර රජය විසින් ගෙවනු ලබන පැමිණීමේ දෛනික දිරි දීමනාවක් ලෙස රුපියල් 200කින් වැටුප් වැඩි වීමක් සිදු වෙනවා. ඒ අනුව දින 25ක් වැඩ කරන අපේ වතු කම්කරුවන්ට රුපියල් 10,000ක වැටුප් වැඩි වීමක් සිදු වෙනවා. සැබැවින්ම එය අගය කළ යුතුම යෝජනාවක්.

ඒ වාගේම කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ඔවුන්ගේ පෝෂණය, ආරක්ෂාව සහ ආර්ථික අවස්ථා ඇති කිරීම සඳහා මෙම අය වැයෙන් අවධානය යොමු වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 52ක් පමණ වන කාන්තාවන්ගෙන් අපේ රටේ ශ්‍රම බලකායට දක්වන දායකත්වය සියයට 32ක් පමණ වෙනවා. කාන්තාවන් වැඩි වශයෙන් ආර්ථික කටයුතු සඳහා සම්බන්ධ කරවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්

දිවයින පුරා වෙසෙන කාන්තා ව්‍යවසායකයන් සවිබල ගැන්වීම සඳහා ඔවුන් විසින් සිදු කරනු ලබන ස්වයං රැකියා, ගෘහස්ථ කර්මාන්ත ආදිය නඟා සිටුවීම සඳහාද මෙම අය වැයෙන් ප්‍රතිපාදන වෙන් වී තිබෙනවා. මේ යටතේ ව්‍යවසායක කාන්තාවන්ට නව ව්‍යාපාර ආරම්භ කිරීමට, ස්වයං රැකියා ශක්තිමත් කර ගැනීමට ආධාර ලබා දීමට කටයුතු සලසා තිබෙනවා. මීට අමතරව කාන්තා අභිවෘද්ධිය ඉලක්ක කර ගත් වැඩසටහන් සඳහාද ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා.

ඒ වාගේම තමයි අපි ගම්වලට යනකොට අපේ වැඩිහිටි ප්‍රජාව, ඒ කියන්නේ අවුරුදු 60 ඉක්මවූ අපේ අම්මලා, තාත්තලා අපෙන් ඉල්ලන්නේ, අපට පිනට කන්න ඕනෑ නැහැ, අපට අනෙක් අයට වාගේම බරක් නොවී ජීවත් වෙන්න පුළුවන් දැනේ කර්මාන්තයකට උදව් කරන්න කියලා. ඉතින්, ඒ හින්දා අවුරුදු 60ට වැඩි අපේ අම්මලා තාත්තලා වෙනුවෙන්, ඒ ජනතාව සමාජයේ සක්‍රිය පාර්ශ්වකරුවන් බවට පත් කරන්න මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් වෙලා තිබෙනවා. අපි ඒකත් මේ වෙලාවේ අගය කරනවා.

ඇත්තටම අපේ ප්‍රධානම විදේශ විනිමය මූලාශ්‍රය වෙන්නේ විදේශගත ශ්‍රී ලාංකිකයන් විසින් එවන ප්‍රේෂණයි. ඇත්තටම අපේ රටේ ආර්ථිකයට ඔවුන් දෙන සහයෝගය අපි අගය කළ යුතුමයි. ඔවුන්ට අත්වැලක් වශයෙන් විදේශගත ශ්‍රමිකයන් සඳහා සහන පොලියට නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමත්, විදේශගත ශ්‍රමිකයන්ට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීමත් අය වැයේ කැපී පෙනෙන යෝජනාවක් විධියට අපි සලකනවා.

ආර්ථික වර්ධනය සඳහා යෝජනා විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීමට මේ අය වැයෙන් යෝජනා වෙලා තිබෙන අතර, දැනටමත් සමහර යෝජනා මේ බිමේ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. ඇත්තටම රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක විධියට මම අපේ මැණික් ව්‍යාපාරික ප්‍රජාවට ආරාධනාවක් කරන්න කැමැතියි. ඇත්තටම රත්නපුර මැණික් ව්‍යාපාරිකයන්ගෙන් බොහෝ පිරිසක් දිනකට මිලියන 10කට වඩා වැඩි ආදායමක් ලබනවා. දිනකට මිලියන 10කඩ වඩා වැඩි ආදායමක්. අපි විශ්වාස කරනවා, මැණික් ලැබෙන්නේ වාසනාවට කියලා. ඉතිහාසය දිහා බලනකොට බිලියනපතියන් වී සිටි මැණික් ව්‍යාපාරිකයන් දිළිඳු තත්ත්වයට පත් වූ අවස්ථාවලට උදාහරණ බොහොමයක් අපි රත්නපුරයේ දැක තිබෙනවා. නමුත් ඔවුන් එම මුදල් ඵලදායී ආයෝජනයක යොදවා තිබුණා නම් ඒ ඉරණම අත් වෙන්නේ නැහැ. දැනටත් මැණික් ව්‍යාපාරිකයන් වෙනත් ව්‍යාපාරවල මුදල් ආයෝජන කරන අවස්ථා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය ඔබතුමියට වෙන් වූ කාලය අවසානයි.

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

නමුත් ඒ බොහෝ පිරිසක් තවමත් ආයෝජනය සඳහා යොමු වී නැහැ. ඒ නිසා මම අපේ මැණික් ව්‍යාපාරික ප්‍රජාවට ආරාධනා කරනවා, ඔබේ මුදල් මේ රටේ ආයෝජනය කරන්න කියලා. එසේ කිරීමෙන් ඔබ ආර්ථික වශයෙන් ශක්තිමත් වනවා සේම රටේ ආර්ථික වර්ධනයටත් එය හේතුවක් වෙනවා. ඒ සඳහා ඔබට ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12 කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.18]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2026 අය වැය ලේඛනය ගැන කථා කරනකොට අපි දෙගොල්ල දෙකට බෙදිලා වාද විවාද කරනවා; සංඛ්‍යාලේඛන ගැන කථා කරනවා. මම හිතන හැටියට ඊට වඩා ප්‍රායෝගිකයි එළියට බැහැලා ගොවීන්ගෙන් ඇහුවා නම්, රජයේ සේවකයන්ගෙන් ඇහුවා නම්, ධීවරයන්ගෙන් ඇහුවා නම්, කම්කරුවන්ගෙන් ඇහුවා නම්, අය වැය කොතරම් සාර්ථකද කියලා. එතකොට උත්තරය ලැබෙනවා. අද අපට පෙනෙන්න තිබෙනවා, ඇමතිවරුන්ට ගමට යන්න බැහැ. ආර්ථික කලාපයට යන්න බැහැ. ජනාධිපතිතුමාට තඹුත්තේගමට යන්න බැහැ. ඇහැට පෙනෙන්න තිබෙන අය වැය ලේඛනය තමයි ඒ විධියට තිබෙන්නේ. ඉතින් මේ වෙලාවේ අශුභවාදීව කථා කරනවා නොවෙයි.

අර ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, -ඔය ගොල්ලෝ කියපු විධියට අපේ අනාගත මුදල් ඇමතිතුමාද කොහේද- භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා ගියා කියලා කියපු කථාව අල්ලා ගෙන, සියලුදෙනා ඒ කථාව කියාගෙන යනවා. ඒ එක්කම මම අහනවා, භාණ්ඩාගාරය පිරුණා නම්, ඇයි ඔය ගොල්ලන් ජනතාවට සහන දෙන්නේ නැත්තේ කියලා? භාණ්ඩාගාරය පුරවාගෙන ඉන්න එකද යුතුකම? භාණ්ඩාගාරය පිරුණා නම්, මිනිස්සුන්ගේ ජීවන බර අඩු වෙන්න ඕනෑ, බඩු මිල අඩු වෙන්න ඕනෑ, වරප්‍රසාද ලැබෙන්න ඕනෑ. දැන් මේ රජයේ ක්‍රියාකලාපය මොකක්ද? ගොයම් කැපෙන කාලයට හාල් ගේනවා. හාල් ඇටයක් ගෙන්නේ නැහැ කියලායි කිව්වේ. ඊට පස්සේ බී ලූනු, රතු ලූනු ගැලවෙන කාලයට ඒවා ගෙනැල්ලා ව්‍යාපාරිකයෝ ගබඩා කරගෙන ඉන්නවා; ස්ටෝරු පුරවා ගෙන ඉන්නවා. පසුගිය කාලයේ ලුණු පරිභෝජනය කරන පමණටය වඩා තුන් හතර ගුණයක් - අසීමිතව - රටට ගෙනැල්ලා, storesවලට දාගෙන අපේම පැත්තේ ව්‍යාපාරිකයෙක් රුපියල් 70, 80ට ගෙනාපු ලුණු කිලෝ එක රුපියල් 275ට market කළා. ඒ කියන්නේ ඔහු පැහැදිලිවම ආණ්ඩුවට උදවු කරපු ව්‍යාපාරිකයෙක්. මම ගිය ගමන කථා කරපු වෙලාවේ ඔහුගේ නම කිව්වා. ඒ කියපු වෙලාවේ මට එතුමා කිව්වා, අනේ! අපේ ගමේ හින්දා මොකක්වත් කියන්න එපා කියලා. ඒ හින්දා මම නම කියන්නේ නැතුව කරුණු කියන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ වෙලාවේ කියනවා, වාහන ප්‍රමාණයක් දැන් ගේන්න යන කාරණය ගැනත්. මේ වාහන ප්‍රමාණය ගේන එක නොවෙයි තිබෙන ප්‍රශ්නය. මේ වාහන ගේනකොට මේ වාහන ටික ඔක්කෝම අපේ account එකට, ජනතාව බැර කරලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරුන්ට, ඔය ගොල්ලනුත්-අපිත් ඔක්කෝමටම. වාහන 225ක් එනවා නම්, ඒ 225න් 20ක් විතර අයින් වෙයි නේ, ඇමතිවරුන්ට තිබෙන ඒවා වෙනුවට. එතකොට වාහන 1,775ක් ගේන්න යනවා. ඒකට බිලියන 42ක් පමණ යනවා. රජය සතුව වාහන 87,000ක් තිබෙනවා. ඒ නිසා මේ වාහන ගේනකොට ජනතාව හිතන්නේ අපි එකතු වෙලා මේ වාහන ටික ගේනවා කියලායි. මම දැක්කා, පසුගිය මැතිවරණ කාලයේ පොරොන්දු දුන්නා; හුඟ දෙනෙක් දුන්නා. නිල නිවාස එපා කිව්වා. වාහන එපා කිව්වා. වරප්‍රසාද එපා කිව්වා. නමුත් දැන් ඒ සියල්ල භුක්ති විඳිනවා. වැටුප් එපා කියලාත්

[ගරු ජගත් විතාන මහතා]

කිව්වා. මමත් කිව්වා. මම කියපු එකට අදාළ ලේඛන මම **සභාගත*** කරනවා, මම මෙතෙක් කල් ගත්ත වැටුප වාගේ හතර ගුණයක් වියදම් කරලා තිබෙනවා, ප්‍රජා සත්කාර සඳහා. ඒ බිල් පත් තිබෙනවා.

මම අද මේ අවස්ථාවේ කියනවා, මට ඔය දෙන ඩබල් කැබ් එක එපා කියලා. හැබැයි, ඩබල් කැබ් එක එපා කියන එකට කොන්දේසියක් තිබෙනවා. ඒ කොන්දේසිය මම ලිඛිතව ගරු කථානායකතුමාට ඉදිරිපත් කරනවා. ඒ කොන්දේසිය මේකයි. ඔය කියන වාහනවලින් 1,774ක් ගේන්න කියලායි මා යෝජනා කරන්නේ. 1,775වැනියා මම. මට ගේන්න එපා ඒ වාහනයක්. මට ඔය පිරුවටයක් වාගේ වාහනයක් ඕනෑ නැහැ. අවුරුදු 4යි තව තිබෙන්නේ. අවුරුදු 4කට ඒ වාහනය අපට දුන්නාට පසුව ඒ කියන නීති රීතිවලට එකඟ වෙන්න, වාහනය ආපහු ගෙනැල්ලා භාර දෙන්න ආදි කොන්දේසි ඕනෑ නැහැ. ඔන්න මම දීපු පොරොන්දුව ඉෂ්ට කළා. මට එපා, ඒ වාහනයක්. මා ඒ සඳහා ගරු කථානායකතුමාට ඉදිරිපත් කළ ලිපියත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

වැටුප් ගන්නේ නැතුව වැඩ කරන බව සනාථ වන ලේඛනත් මම සභාගත කළා.

මේ අය වැය විවාදයේදී හැමදෙනාම වාගේ යම් යම් දේවල් ගැන කථා කරනවා මම දැක්කා. හැබැයි කථා කරන්නේ නැති ටිකකුත් තිබෙනවා. මම ඒවා කියන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී කිව්වා, මේ අවුරුද්ද අගදී අපේ විදේශ සංචිතය ඩොලර් බිලියන 7කට ඉහළ දමනවා කියලා. ආණ්ඩුව බලයට පත් වෙලා මාස ගණනාවකට පස්සේ, පසුගිය සැප්තැම්බර් මාසයේ අපේ ජංගම ගිණුමේ හිඟය සෘණ ඩොලර් මිලියන 183ක් විධියට වාර්තා වුණා. ඒ කියන්නේ අපේ ඩොලර් ආදායමට වඩා ඩොලර් වියදම වැඩි වුණා. මේ දේ සිද්ධ වුණේ මාස ගණනාවකට පසුවයි. දැනට විදේශ සංචිතය තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් බිලියන 6.2යි. මේ ආණ්ඩුව බලය ගන්න කොට විදේශ සංචිතය විධියට ඩොලර් බිලියන 6ක් තිබුණා. ඒක හොඳටම පැහැදිලියි. වාර්තාවල සඳහන්ව තිබෙනවා, මේ ආණ්ඩුව බලය ගන්න කොට විදේශ සංචිතය විධියට ඩොලර් බිලියන 6ක් තිබුණා කියලා. දැන් අවුරුද්දකට ළංවෙන්න ඇවිල්ලාත් එය දශම දෙකයි වැඩි කරන්න පුළුවන් වෙලා තිබුණේ. ජංගම ගිණුම සෘණ වෙලා තියෙද්දීත් මේ මාස එකහමාරට විදේශ සංචිතය ඩොලර් බිලියන 7 දක්වා ගෙන යනවා කියා කරපු ප්‍රකාශය සැබෑ කරලා පෙන්වන්න කියා මම අභියෝගයකුත් කරනවා. මේවා සංඛ්‍යාලේඛන. මේවා බොරු කියලා කාටවත් කියන්න බැහැ. එහෙම නම් අපි සියලුදෙනාම දැනගන්න ඕනෑ, භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා ගියාට අපි ඉන්නේ හරිම අවදානම්සහගත තත්ත්වයක බව. අපි ඒ ගැන සතුටු වෙන්නේ නැහැ.

මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම "හිරු" මාධ්‍ය ජාලයට ස්තුතියක් කරනවා. මොකද, කොළඹ පුරවරය මැද්දේ තිබෙන අර නිවාස සංකීර්ණය කුඩු විකුණන තාලය, කුඩු පුරයක් ඊයේ එම මාධ්‍යයේ පෙන්නුවා. ඒ ප්‍රදේශයේ Police Narcotics Bureau එක ඉන්නවා, CID එක ඉන්නවා, පොලීසිය ඉන්නවා. ඒ ඔක්කෝම සිටිද්දීත් ඒවා සිදු වෙනවා. හදිසියේවත් එය කැමරාගත කරන්න ගිය කට්ටිය අහු වුණා නම් වෙන්නේ මොකක්ද කියලා හිතාගන්නවත් බැහැ. මම ඒක කිව්වේ මට ඒ ප්‍රවෘතිය දැන් මතක් වුණු නිසායි. මම ඒ ප්‍රවෘත්තිය අද උදේත් බැලුවා, ඊයේ හවසත් බැලුවා. ඒ එළිදරව්වේ සම්මානය දෙන්නම ඕනෑ, Hiru CIA කණ්ඩායමට. මොකද, ඒක විශේෂයි.

දැන් බලමු, අපේ රටේ තිබෙන නීති පිළිබඳ කාරණයක්. අවුරුදු දෙකකට කලින් බලාත්මක කරන ලද දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ නිලධාරින්. මුදල් අමාත්‍යාංශයේ ස්ථාවරය වී ඇත්තේ, 2024 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත දූෂණ විරෝධී පනත අභිභවා යන බවයි. දූෂණ විරෝධී පනත ක්‍රියාත්මක වී ඇති කාලයේ සිට මෙම වසර දෙක සඳහා මෙම සභාවේ අරමුදලට කිසිදු මුදලක් දීලා නැහැ. මෙම අරමුදල හරහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පාලනය කර ගන්නට උත්සාහයක් ගන්නා බවත්, එලෙස කටයුතු කිරීමට සැලැස්වුවහොත් තමා ඉහළ අධිකරණයට ගිහින් නියෝගයක් ගන්නා බවත් අල්ලස් කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල් රංග දිසානායක මහත්මයා කියනවා. රංග දිසානායක මහත්මයා පත් කරලා තිබෙන්නේ මේ ආණ්ඩුවෙන්. ඔහුට දූෂණය නවත්වන්න වැඩ කරන්න විධියක් නැහැ. අපි කැමැතියි, දූෂණය නවත්වනවාට. ඒවා කරන අය අල්ලන්න. කෝ? ඒවා අල්ලන කට්ටියට තීන්දු තීරණ ගන්න විධියක් නැහැ. එම කොමිසමේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කියනවා, අවශ්‍ය පහසුකම් ලබා දෙන්නේ නැහැ කියලා උසාවියට යන බව. මේවා මේ විය යුතු දේවල්ද? මේවා තමයි අපි හඬගා කියන්නේ. එහෙම කියන්න විපක්ෂයක් විධියට අපට අයිතියක් තිබෙනවා.

ආණ්ඩු පක්ෂය තුනෙන් දෙකකට එහා ගිය බලයක් ගත්තා. ජනතාව තුනෙන් දෙකකට එයා ගිය බලයක් ආණ්ඩුවට දුන්න නිසා තමයි අත්තනෝමතික විධියට මේ තීන්දු තීරණ ගන්නේ. ඒකට අපට කරන්න දෙයක් නැහැ. ඒක ජනතාවගේ කැමැත්ත. හැබැයි මතක තියාගන්න. මේක අර කියපු පිරුවටයක් වැනි වාහනයක් දුන්නා වාගේ තමයි. ජනතාව අපට මේ බලය දීලා තිබෙන්නේ සීමිත කාලයකට. ඒ සීමිත කාලය අවසන් වෙලා ආයෙත් ජනතාව අතරට ගියාට පස්සේ ජනතා මතය උරගා බලන්න වෙනවා. එවිට ඇති වන තත්ත්වය පිළිබඳවත් මතක තියාගෙන යන්න. සංඛ්‍යා ලේඛන මොනවා වුණත් ජනතාව හරිම බුද්ධිමත්. ජනතාව ඉතා සුපරීක්ෂාවෙන් බලාගෙන ඉන්නවා.

ගරු ජනාධිපතිතුමා උපාධිධාරින්ට තරවටුවක් කරනවා, "මෙච්චර ඇබෑර්තු සංඛ්‍යාවක් තිබෙනවා. විභාගයක් තියලා ඒවාට ගන්නවා. ගෙදර යන්න. පාරේ ඉන්න බැහැ" කියලා. අපි දන්නවා, මේ යන්නේ කොහේටද කියලා. ඒකාධිපතිවාදයක් සඳහා හරිම ලස්සනට සෙමින් සෙමින් ගමන් කරනවා. මම අද අනාවැකියක් කියනවා. මේ කාලය ඇතුළත -මේ අවුරුදු 4 ඉවර වනකොට- අපි සියලුදෙනාට ලොකුම මර්දනයකට මුහුණ දෙන්න වෙනවා. කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන මම ඒකේ ප්‍රතිඵලයක්. මගේ ජීවිත අවදානම තියාගෙනයි මම දේශපාලනයේ රැඳී සිටින්නේ. කිසිම ඉලක්කයක් වී නැති මට ආණ්ඩුවෙන් එවැනි ප්‍රචාරය දෙනවා; බලධාරින් ප්‍රචාරය දෙනවා. ඒ සියල්ල විඳ දරාගෙන තමයි මම මේ වැඩ කටයුතු කරන්නේ. ඒ නිසා මම කියනවා, මේ දේවල් වෙන්න දෙන්න එපා කියලා.

අපි දේශපාලනය සංවර කරමු. අපි හොඳ දේශපාලනයක් කරමු. එහෙම නොකොළොත් අනාගත පරම්පරාව -අපෙන් පසුව එන පරම්පරාව- දේශපාලනය කරන්න එයිද? අපට පුතෙක් ඉන්නවා නම්, ඔහුට දේශපාලනය කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. දැන් දේශපාලකයෝ හුඟ දෙනෙක් තමන්ගේ පවුලේ කෙනෙකුට දේශපාලනය කරන්න දෙන්නේ නැහැ. නමුත්, තරුණ තරුණියන් දේශපානයට එන්න ඕනෑ. ඒ අයට ඇවිල්ලා

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දේශපාලනය කරන්න නම් අපි හොඳ ලස්සන දේශපාලනයක් මේ රටට හුරු කරන්න ඕනෑ. නමුත්, අපි මේ කොහේද යන්නේ? අද ජීවත් වෙන්න කොච්චර අමාරුද?

පොහොරවලට සියයට 18ක VAT එක ගැහුවා; SVAT එක ගැහුවා. දැන් අපනයන දිරිමත් වෙනවාද? ඒ සියයට 18 VAT එක apply කළාට පසු අපනයනකරුවන් අපනයනය කරන්න පෙලඹෙන්නේ නැහැ. මේක තමයි ඇත්ත. අප ජීවත් වන ප්‍රදේශයේ, විශේෂයෙන් කළුතර දිස්ත්‍රික්කයේ තේ ආශ්‍රිත ආදායමයි තිබෙන්නේ. පොහොරවලට සියයට 18ක VAT එක වැදුණාට පසුව අපේ මිනිස්සු මොකද කරන්නේ? දැන් පොහොර දමන්නේ නැහැ. ඒ නිසා දැන් තේ ගහ කහ පාට වෙලා. දැන් තේ ආදායම පහළ ගිහිල්ලා. මිනිස්සු දිරිමත් වෙන්නේ නැහැ.

වතු කම්කරුවන්ගේ දෛනික වැටුප ගැනත් මා කථා කරන්න ඕනෑ. මම අද ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාගෙන් මේ පිළිබඳව ඇහුවා. ඒ අයගේ පඩි වැඩි කිරීම ඉතාම හොඳයි. අපි ඒක නරකයි කියන්නේ නැහැ. හැබැයි, වතු සමාගම්වලට ඒ රුපියල් 200 පහසුකම දෙනකොට, කුඩා තේ වතු හිමියන්, කුඩා රබර් වතු හිමියන්, කුඩා කුරුඳු වතු හිමියන් ඒ රුපියල් 200 ලබා දෙන්නේ කොහොමද කියන එක මට නම් තේරෙන්නේ නැහැ. ඒ පරිපාලන ක්‍රමය හරිගස්සන තාලය හදාරන්න අපට කොච්චර කල් යයිද? ඒ නිසා මෙන්න මේ කියපු ටික කරන්න.

භාණ්ඩාගාරය පිරුණා කියලා ඔය කියන්නේ, ඔක්කොම ප්‍රාග්ධන වියදම් කපා හැරීම නිසායි. ඒවායෙන් සියයට 20යි වියදම් කළේ. සියයට 80ක් කපා හැරියා. මට ලැබිච්ච විමධ්‍යගත අරමුදල් ලක්ෂ 100න් ලක්ෂ 40ක් කැපුවා; ඇස් පනාපිට කැපුවා. මම දිස්ත්‍රික් ලේකම්වරයාට, දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපතිවරයාට ඉල්ලීමක් කළා, චක්‍රලේඛනයට විරුද්ධව මේ කැපිල්ල කරන්න එපා කියලා. මම ඒ ලිපියත් මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒ වුණාට අපේ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපතිතුමා අත්තනෝමතික විධියට ඒ කටයුත්ත කළා. ඒ සල්ලි ටික ගිහිල්ලා භාණ්ඩාගාරය පිරුණා කියලා තමයි මේ ගරු සභාවේ විපක්ෂයේ ඉදිරි පෙළේ අසුන් ගෙන සිටින අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා කියන්නේ. මම එතුමාට ලියලා දෙන්නම් භාණ්ඩාගාරය පුරවපු ආකාරය.

මට ලැබිච්ච කාලය අවසානයි. මම ඔබතුමන්ලාට කියනවා, අප සියලුදෙනාම 2028දී මේ කියන ඉලක්කවලට යන්න නම් කළ යුතු දේවල් කීපයක්ම තිබෙන බව. අපට යන්න තිබෙන ඉලක්ක ටික මා ළඟ තිබෙනවා. කාල වේලාව නැති නිසා මම ඒවා ගැන කියන්නේ නැහැ. ඒ සඳහා මීට වඩා හොඳ මූල්‍ය කළමනාකරණයක් අප සතුව තිබිය යුතුයි කියලා මම අවධාරණය කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුල සුගත් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.30]

**ගරු මංජුල සුගත් රත්නායක මහතා**
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුව ඉදිරිපත් කරපු 2026 අය වැය මඟින් ප්‍රධාන අරමුණු කිහිපයක් මුල් කරගෙන තිබෙනවා. මෙය, සාර්ව ආර්ථිකය ස්ථාවර කරන අය වැයක්, රාජ්‍ය මූල්‍ය විනය තහවුරු කරන අය වැයක්, රාජ්‍ය ආයතන ශක්තිමත් කරන, ජනතාව කෙරෙහි වගවීම තහවුරු කරන අය වැයක්.

අපි දන්නවා, පසුගිය ආණ්ඩු කාලවල දේශපාලනඥයන්ට අනවශ්‍ය වරප්‍රසාද දී තිබුණු බව. අපි ඒ අනවශ්‍ය වරප්‍රසාද ඉතාම ක්‍රමවත් විධියට කපා හැරලා සාධාරණත්වය වාගේම සමානාත්මතාව ඇති කරන යාන්ත්‍රණය හදලා තිබෙනවා. ඒ නිසා ජනතාවට වෙනදාටත් වඩා විශ්වාසය ඇති වෙලා තිබෙනවා, මේ අය වැය අනවශ්‍ය වියදම් නොමැති, ඒ මුදල් ජනතාව වෙනුවෙන් වැය කරන අය වැයක් කියලා. අනෙක් පැත්තෙන් ගත්තොත්, දූෂණය, නාස්තිය වාගේම වංචාව ආදිය නැති කරලා තිබෙනවා. ඒ තුළින් ආයෝජකයන් දිරිමත් වෙලා තිබෙනවා. අපේ ආණ්ඩුව යටතේ ඔවුන්ගේ ආයෝජන වැඩි දියුණු කර ගන්න හැකි වෙලා තිබෙනවා. එය රටේ සංවර්ධනයට බෙහෙවින් වැදගත් වෙනවා. ජාතික ජන බලවේගය ආණ්ඩුව තුළින් ඒ විශ්වාසය ඇති වෙලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තොත්, රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කර තිබෙනවා. පසුගිය අය වැයෙන් වාගේම මේ අය වැයෙනුත් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට යෝජනා කර තිබෙනවා. මෙවර අය වැයෙන් රාජ්‍ය සේවයට 75,000ක පිරිසක් බඳවා ගැනීම සඳහා අවස්ථාව සලසා දී තිබෙනවා.

ඒ තුළින් රාජ්‍ය යාන්ත්‍රණය කාර්යක්ෂම කිරීම සඳහා අවස්ථාව උදා වෙනවා. මෙය ඉතාම වැදගත් වෙනවා, ලංකාවේ තරුණ තරුණියන්ට රාජ්‍ය යාන්ත්‍රණයට හවුල් වීමට, දායකවීමට අවස්ථාව ලැබෙන නිසා. ඒ එක්කම, "ජාතික තනි වෙළඳ කවුළුව" පහසුකම වැඩි දියුණු කිරීම මඟින් අන්තර් ජාතික වෙළෙඳාම තුළ ලංකාවේ තරගකාරිත්වය ඉහළ නැංවීමට කටයුතු සැලසෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 2,500ක් මේ අය වැයෙන් වෙන් කරලා තිබෙනවා. එය ඉතාම වැදගත් අවස්ථාවක්.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ණය පහසුකම් ලබාදීම සඳහා මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා ඒ ව්‍යවසායකයන් දිරි ගැන්වීම සිදු වෙනවා, මේ අය වැය ඇතුළේ. එහෙම ගත්තාම ඉතාම වැදගත් අය වැයක් තමයි 2026 වර්ෂය සඳහා ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම, අභ්‍යන්තර ගුවන් තොටුපළ මෙහෙයුම් වැඩි දියුණු කරලා පුළුල් කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබා දීලා තිබෙනවා. එමඟින් ලංකා භූමිය ඇතුළේ සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කරන්න අවස්ථාව උදා වෙනවා. සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු වීම නිසා ඒ හා බැඳුණු තවත් රැකියා අවස්ථා උදා වෙනවා, ආදායම් උත්පාදනය වැඩි වෙනවා. ඒ වාගේම වෙන දා සංචාරකයන් පැමිණියේ නැති ස්ථානවලට සංචාරකයන්ගේ පැමිණීම වැඩි කරගන්න අවස්ථාවක් උදා වෙනවා, ගුවන් තොටුපළ පහසුකම් වැඩි දියුණු කිරීම තුළින්.

ඊළඟට ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දුම්රිය ස්ථාන, බස් නැවතුම් පොළවල් වැනි පොදු ස්ථානවල පහසුකම් වැඩි කිරීම තුළින් ජනතාවට වෙනදාටත් වඩා පහසුවෙන් තමන්ගේ

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු මංජුල සුගත් රත්නායක මහතා]

කාර්යයන් ඉටු කර ගැනීමට අවස්ථාව උදා වෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ වැඩි දියුණු කිරීම් තුළින් ආකර්ෂණීය බවක් ලැබෙනවා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙන දා පාරට බැහැලා කෑගහලා තමයි ඒ ගොල්ලන්ගේ මහපොළ හා ශිෂ්‍යාධාර වැඩි කරගත්තේ. නමුත් අපි විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ගැන හිතන ආණ්ඩුවක් හැටියට මෙවර මහපොළ හා ශිෂ්‍යාධාර දීමනා රුපියල් 2,500කින් වැඩි කරලා දීලා තිබෙනවා. ඒ අනුව මහපොළ දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි වෙනවා. ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 9,000 දක්ව වැඩි වෙනවා. ඉතා අපහසුවෙන් අධ්‍යාපන කටයුතු කරන ඒ දරුවන්ට මේ වැඩි කිරීම ලොකු ශක්තියක් වෙනවා.

මේ අය වැයෙන් සෞඛ්‍යය පැත්ත ගැනත් හිතලා තිබෙනවා. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ අංශවලට මුදල් වෙන් කර තිබෙන අතර, හෘද රෝගීන්ට දීර්ඝ කාලයක් පොරොත්තු ලේඛනයේ සිටීමට සිදුවීම නිසා ඒ රෝගීන් අපහසුතාවට පත්වීම වැළැක්වීමේ අරමුණින් මහල් 16කින් යුක්ත හෘද රෝග ඒකකයක් පිහිටුවීමට මේ අය වැයෙන් රුපියල් මිලියන 200ක මුදලක් වෙන් කරලා දීලා තිබෙනවා.

ඒ වාගේම කාන්තා ව්‍යවසායකයන් සවිබල ගැන්වීමට මුදල් වෙන් කරලා තිබෙනවා. අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සඳහා විශේෂයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වාහන 294ක් ගෙන්වීමට අවශ්‍ය වෙනවා. අම්පාර වැනි ප්‍රදේශවල අලි-මිනිස් ගැටුම වැඩි වශයෙන් සිදු වෙන බව අපි දන්නවා. ඒ නිසා මේ තීන්දුව ගැනීම අප සිටින එවැනි ප්‍රදේශවලට ඉතාම වැදගත් වෙනවා. ඒවාගේම හඳුනාගත් ප්‍රදේශවල විදුලි වැට ඉදිකිරීම සඳහා, අලි ඇතුන් සඳහා තණබිම් හා ජල මූලාශ්‍ර කළමනාකරණය සඳහා සහ පර්යේෂණ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ සියල්ලට රුපියල් මිලියන 1,755ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම අනියම්, තාවකාලික, ආදේශක හා කොන්ත්‍රාත් පදනමින් සේවය කරන සේවකයන්ට ස්ථිර පත්වීම් ලබා දීමට මේ අය වැයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා. ඒක ඉතා වැදගත් කාරණයක්. ඒ අය අවුරුදු ගණනාවක් තිස්සේ අඩු වැටුපක් ලබමින්, ඉතා පීඩනයට ලක් වෙච්ච කණ්ඩායමක්.

ඒ විතරක් නොවෙයි, කලාකරුවන්ට වාගේම මාධ්‍යවේදීන් සඳහා නිවාස ලබා දීමේ ව්‍යාපෘතියක් මේ අය වැය ඔස්සේ දියත් වෙනවා.

මලයගම් වතු කම්කරු ප්‍රජාවට නිවාස 2,000ක් ලබා දීම සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දුන් කාලය අවසන්.

**ගරු මංජුල සුගත් රත්නායක මහතා**
(மாண்புமிகு மஞ்சுல சுகத் ரத்நாயக்க)
(The Hon. Manjula Sugath Rathnayaka)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එහෙම ගත්තාම, මේ අය වැය විවිධ ක්ෂේත්‍ර සඳහා අතුපතර දාලා විහිදුවා තිබෙනවා. මෙය ඉතා ශක්තිමත් අය වැයක්. මම ඉතා කෙටි කවියකින් කථාව අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

"ජනපති අනුර පහදා දුන් අය වැයකි
සැම ජනහද දිනූ සුපිරිම අය වැයකි
හතර දිගම සංවර්ධන අය වැයකි -

ඊළඟ පදය කියන්නේ කොහොමද කියලා කල්පනා කළේ.

"විපක්ෂයත් හොල්මන් වුණ අය වැයකි"

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.39]

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළපුරුදු, පරිණත, කෘතහස්ත, පාරම්පරික ආර්ථික ඔස්තාර්ලා අය වැය 78ක් ඉදිරිපත් කරමින්, මේ රට අවුරුදු 77ක් පාලනය කළා. ඉන් පසුව අපි ඉදිරිපත් කරන මේ 80වැනි අය වැයේදී 2026 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත සමස්ත රාජ්‍ය වියදම රුපියල් බිලියන 8,980ක් වෙනවා. ඒකෙන් හරි අඩක්, -සියයට 50ක්- ඒ කියන්නේ, සමස්ත රාජ්‍ය වියදමින් රුපියල් බිලියන 4,495ක්ම අපට වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා ණය සේවාකරණය සඳහා; 2026 අවුරුද්දේ ණය ගෙවන්න. ඉතිරි සියයට 50, එහෙම නැත්නම් ඉතිරි රුපියල් බිලියන 4,485ක් තමයි අපට ඉතිරි වන්නේ රජයේ ප්‍රාථමික වියදම් සඳහා. මේ සමස්ත රාජ්‍ය වියදමින් සියයට 22ක් අපට වෙන් කරන්න සිද්ධ වෙලා තිබෙනවා, වැටුප් සහ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා. අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා සියයට 13ක් ගියාම, ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරන්න වෙලා තිබෙන්නේ සමස්ත රාජ්‍ය වියදමින් සියයට 15යි. ඇයි අපට මේ විධියට සමස්ත රාජ්‍ය වියදමින් සියයට 50ක් ණය සේවාකරණය සඳහා ගෙවන්න වුණේ?

ඒකට හේතුව තමයි, අර මම කියපු පළපුරුදු, පරිණත යැයි කියා ගන්නා අය මේ රටත්, මේ රටේ ජනතාවත්, රටේ සම්පත් ප්‍රමාණය, රටේ පිහිටීම වාගේම රටේ තිබෙන විභවයන් කිසිවක් පිළිබඳව හැඟීමක්, දැනීමක් හෝ සැලකිල්ලක් නැතිව, ණය ගැනීමත්, හොරා කෑමත්, ඒ වාගේම වෙනත් ජාවාරම් සහ මත් ද්‍රව්‍ය ජාවාරම යන දේවල් ඒ අයගේ දේශපාලනයේ උප සංස්කෘතියක් බවට පත් කරගෙන සිටීමයි. මේ රටේ ජනතාව ඒ තත්ත්වය පසුගිය අවුරුද්දේ වෙනස් කළා. අපි ගෙනාපු අය වැයෙන් සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරලා තිබෙනවා, සමස්ත රාජ්‍ය වියදමින් සියයට 7.2ක්. ඒ කියන්නේ, රුපියල් බිලියන 654ක්. අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් බිලියන 704ක්. ඒ කියන්නේ සමස්ත රාජ්‍ය වියදමින් සියයට 7.8ක් වෙන් කරලා තිබෙනවා. ඒ කියන්නේ සෞඛ්‍ය සහ අධ්‍යාපනය වෙනුවෙන් අපේ 2026 අය වැයේ සමස්ත රාජ්‍ය වියදමින් සියයට 15ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් වෙනුවෙන් අපි සියයට 4.5ක්, එහෙම නැත්නම් රුපියල් බිලියන 411ක් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සෞඛ්‍යයට වෙන් කරන ලද රුපියල් බිලියන 654න්, රෝහල් සංවර්ධනය සඳහා රුපියල් බිලියන 43.4ක් වැනි දැවන්ත මුදලක් වෙන් කරලා තිබෙනවා. රෝහල් මෙහෙයුම් කටයුතු සඳහා රුපියල් බිලියන 363.3ක් වෙන්

කරලා තිබෙනවා. ඒ වාගේම, අඛණ්ඩ වෛද්‍ය සැපයුම් සඳහා ඖෂධ සහ උපකරණ සැපයීම වෙනුවෙන් රුපියල් බිලියන 187.7ක් වෙන් කරලා තිබෙනවා. ත්‍රිපෝෂ සහ පෝෂණ වැඩසටහන් වෙනුවෙන් රුපියල් බිලියන 12.9ක් හා රෝග වැළැක්වීමේ ක්‍රම වෙනුවෙන් රුපියල් බිලියන 10.4ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, ලෝකය ඉස්සරහට යන්නේ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්වලින්. ඒ නිසා සෞඛ්‍ය පර්යේෂණ හා සංවර්ධනය වෙනුවෙන් රුපියල් බිලියන 1.3ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේමයි, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය. වඩාත් ගුණාත්මක සෞඛ්‍ය සේවයක් වෙනුවෙන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා රුපියල් බිලියන 24.9ක් වෙන් කර තිබෙනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 24,900ක් වෙන් කර තිබෙනවා. "සුවසැරිය" වෙනුවෙන් රුපියල් බිලියන 4.2ක් වෙන් කර තිබෙනවා. ඔය ආදී වශයෙන් මුදල් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, විශේෂ ව්‍යාපෘති අතර රත්නපුර රෝහලේ හෘදය ඒකකයත්, පිළිකා සහ ළමා ඒකකත් වැඩිදියුණු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 870ක්, 2026 අවුරුද්දට වෙන් කර තිබෙනවා. ප්‍රාථමික සෞඛ්‍ය සේවා ප්‍රවර්ධනය වෙනුවෙන්, සංවර්ධන කටයුතු වෙනුවෙන් රුපියල් බිලියන 8ක් -මිලියන 8,000ක්- වෙන් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ණය සේවාකරණය ඇතුළු රටේ සමස්ත රාජ්‍ය වියදමින් සියයට 3ක් වෙන් කර තිබෙන්නේ සෞඛ්‍ය අංශයේ වැටුප් සහ දීමනා වෙනුවෙන්. ඒ මුදල රුපියල් බිලියන 292ක් වෙනවා. අවුරුදු 8කට විතර පස්සේ රාජ්‍ය සේවයට දැනෙන වැටුප් වැඩිවීමක් ගෙනෙන්න අපට පසුගිය අය වැයෙන් පුළුවන් වුණා. එහි දෙවැනි කොටස 2026 ජනවාරියේත්, තුන්වැනි කොටස 2027 ජනවාරියේත් ලැබීමට නියමිතයි. හැබැයි, ඒකෙන් රාජ්‍ය සේවකයාට තිබෙන වැටුප් ප්‍රශ්නය, ආර්ථික ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම විසඳෙන්නේ නැහැ. ඒ නිසා තමයි 2026 අය වැයෙන් ජාතික වැටුප් කොමිසමක් පත් කරන්න අපේ ගරු ජනාධිපතිතුමා යෝජනා කරන්නේ. ඒ ජාතික වැටුප් කොමිසම මඟින් එක් එක් ක්ෂේත්‍රවල තිබෙන විශේෂ තත්ත්ව සියල්ල සැලකිල්ලට අරගෙන වසරක්, දෙකක් ඇතුළත මේ විෂමතා සමනයට පත් කරලා සමස්ත රාජ්‍ය සේවයටම තෘප්තිමත් විය හැකි වැටුප් ව්‍යුහයක් නිර්මාණය කරන්න අපට පුළුවන් වෙයි කියලා හිතනවා.

ඒ වාගේම අපේ රටේ ආදරණීය රාජ්‍ය සේවකයන්ට ස්තුති කරන්න විශේෂයෙන්ම මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මොකද, දශක ගණනාවක් තිස්සේ අපේ රටේ පැවති අන්ත දූෂිත ජරාජීර්ණ දේශපාලකයනි තුළ පැවති දූෂිත තත්ත්වය තමන් තුළට කාන්දු කර ගන්නේ නැතිව රාජ්‍ය සේවය පවත්වා ගැනීම වෙනුවෙන් මම ඔවුන්ට ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම, රාජ්‍ය සේවයේ ඇතැම් ක්ෂේත්‍ර ඉතා අඩු පහසුකම් යටතේ, ඉතාම දුෂ්කරතා යටතේ භෞතික සහ මානව සම්පත් හිඟය මත වුවද රටේ ජනතාවට අඛණ්ඩ සේවය සැපයීම වෙනුවෙන් මම ඔවුන්ට නැවතත් ස්තුතිවන්ත වෙන්න කැමැතියි. එතැනදී, විශේෂයෙන්ම මාත් අවුරුදු 15ක් විතර සේවය කරපු සෞඛ්‍ය සේවය ගැනත් කියන්න ඕනෑ. දවස් 365ම, දවසේ පැය 24ම දීප ව්‍යාප්ත අඛණ්ඩ සේවයක් සපයන සෞඛ්‍ය සේවයේ විශේෂඥ වෛද්‍යවරු, වෛද්‍යවරු, හෙද කාර්ය මණ්ඩලය ඇතුළු සමස්ත සෞඛ්‍ය සේවයේ වෘත්තිකයන්ට, සේවකයන්ට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න ඕනෑ. ඒ වාගේම මම කියන්න ඕනෑ, ඔවුන්ගේ වැටුප් සහ දීමනාවල විෂමතා ටික අපි මේ පිහිටුවන වැටුප් කොමිසමත් එක්ක ඉදිරියේදී නිවැරදි කර ගන්න උපරිම උත්සාහ කරන බව. ඒ පිළිබඳව සැකයක් තියාගන්න එපා කියලාත් කියන්න ඕනෑ.

පසුගිය කාලයේ රාජ්‍ය ආයතනවල තිබුණු ඉදිකිරීම් 2,700ක් විතර අතරමඟ නවත්වා තිබෙනවා, නැත්නම් අතහැර දමා තිබෙනවා. අන්න ඒවාට අපි මේ අය වැයෙන් පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සැලැස්මක් ගෙනෙන්න තීරණය කර තිබෙනවා.

ඒ වාගේම, නිෂ්පාදන ආර්ථිකයක් සඳහා අපි මිල්කෝ සමාගමේ බඩල්ගම නව කිරි කර්මාන්ත ශාලාවේ වැඩ අවසන් කිරීමට රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. ධීවර වරායන් සංවර්ධනයට මොකුත් වෙන් කර නැහැ කියලා කලින් කියැවුණා. නමුත්, මේ අය වැයෙන් ඒ සඳහා රුපියල් මිලියන 1,300ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, විකුණන්න ලැස්ති කරපු ත්‍රිපෝෂ සමාගම වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, ප්‍රතිජීවක ප්‍රතිරෝධයට - antibiotic resistance - එරෙහි නිරීක්ෂණය සඳහා ජාතික විමර්ශන රසායනාගාර ජාලයක් සඳහා රුපියල් මිලියන 150ක් සහ එම වැඩසටහන ශක්තිමත් කිරීම වෙනුවෙන් තවත් රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම, ලස්සන ජීවිතයක් ලබාදීම සඳහා රැඳවුම් නිවාසවල හැදී වැඩුණු තරුණ තරුණියන් වෙනුවෙන් නිවසක් සාදා ගැනීමට රුපියල් මිලියන 2 බැගින් ලබා දෙන්න රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙනවා. මහල් 16කින් යුක්ත ජාතික හෘදය ඒකකයේ ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. අධිවේගී මාර්ග ඇතුළු මාර්ග සඳහා රුපියල් කෝටි 32,400ක දැවැන්ත මුදලක්, -රුපියල් බිලියන 324ක්- වෙන් කර තිබෙනවා. ඒ වාගේම, මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ රුවන්පුර අධිවේගී මාර්ගය වෙනුවෙන් 2026 අවුරුද්දට රුපියල් මිලියන 1,500කුත්, 2027 අවුරුද්දට රුපියල් මිලියන 1,000කුත්, 2028 අවුරුද්දට තවත් රුපියල් මිලියන 1,000කුත් වශයෙන් ඇස්තමේන්තු කර තිබෙනවා. ලබන අවුරුද්ද වන විට රුපියල් මිලියන 1,500ක් ඒ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ගෙවීමට වෙන් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කැලණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ලේ සිට ඉදිකිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනය සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර කළමනාකරණය වෙනුවෙන් වියළි වේලි පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. නව නගරයේ ඉදිකරන රාජ්‍ය සේවකයන්ගේ නිල නිවාස සංකීර්ණයේ මූලික වැඩවලට රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. මේ ආදී වශයෙන් දැනෙන සංවර්ධනයක් වෙනුවෙන්, "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" වෙනුවෙන් සියලු ක්ෂේත්‍ර, සියලු පුරවැසි කණ්ඩායම් ආවරණය වන පරිදිත්, රටේ සමස්ත ප්‍රදේශ ආවරණය වන පරිදිත් ඉතාම සාර්ථක අය වැයක් අප ඉදිරිපත් කර තිබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.47]

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின், இரண்டாவது வாசிப்பின்மீதான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன். இந்த வரவு செலவுத்திட்டமானது, 'வளமான நாடு - அழகான வாழ்க்கை' எனும் தொனிப்பொருளை மையமாகக்கொண்டு தயாரிக்கப்பட்டிருக்கின்றது. இந்த அரசாங்கத்தினால் மேற் கொள்ளப்படுகின்ற போதைப்பொருள் பாவனைக்கு எதிரான செயற்பாடுகள், இலஞ்ச ஒழிப்பு போன்ற விஷயங்களை நாங்கள் பாராட்டுகின்றோம். ஆனால், இந்த வரவு செலவுத்திட்டத்தின் பயன்பாடு எல்லா மக்களையும் சென்றடைய வேண்டும்; இதன் பயன்பாட்டில் ஏழை மக்களின் வாழ்வு உயர வேண்டுமென்பதுதான் எம்மனைவருடைய நோக்கமாக இருக்கின்றது. அதிமேதகு சனாதிபதி அவர்களால் முன்மொழியப்பட்ட 37 தலைப்புகளின் கீழான செயற்பாடு களும் மக்களைச் சென்றடைய வேண்டும். வரவு செலவுத்திட்ட நிதி ஒதுக்கீட்டின்கீழ் அபிவிருத்தித் திட்டங்களை நடைமுறைப்படுத்தும்போது, அரசியலை மையமாக வைத்து அத்திட்டங்களை நடைமுறைப்படுத்தினால், பல்வேறு பிரச்சினைகளுக்கும் சவால்களுக்கும் நாங்கள் முகங்கொடுக்க வேண்டிய நிலையேற்படும்.

மேலும், 1990ஆம் ஆண்டு பாசிச விடுதலைப் புலிகளால் வடக்கு மாகாணத்திலிருந்து இலட்சக்கணக்கான மக்கள் வெளியேற்றப்பட்டு, சென்ற மாதம் 28.10.2025இல் 35 வருடங்கள் பூர்த்தியாகியுள்ளது. காஸா மக்கள் அனுபவித்த துயர வாழ்க்கை போன்றுதான் அன்று இந்த மக்களும் அனுபவித்தார்கள். அதிலும் விசேஷமாக, வட மாகாண முஸ்லிம்கள் அதனை நன்றாக அனுபவித்திருக்கின்றார்கள். தமிழ் பேசும் மக்கள் எல்லோரும் பாதிக்கப்பட்டாலும், விசேடமாக வட மாகாண முஸ்லிம்கள் 120,000 பேர் பொருளாதாரத்திலும் கல்வியிலும் அதேபோன்று பல்வேறு விடயங்களிலும் பாதிக்கப்பட்டுத் துன்பங்களை அனுபவித் தார்கள். அகதிகள் என்ற பெயரிலே 15-20 வருடங்களாக வெளிமாவட்டங்களில் வாழ்ந்திருக்கிறார்கள். அந்தக் கேவலமான வாழ்க்கை முறை வேறெந்த மக்களுக்கும் ஏற்படக் கூடாது என்று நாங்கள் கருதுகின்றோம்.

இந்த இடப்பெயர்வினால் அந்த மக்களின் அன்றாட வாழ்க்கை, பிள்ளைகளின் கல்வி நிலை, சுகாதாரம், பொருளாதாரம், குடும்ப வாழ்க்கை அனைத்தும் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இன்றுடன் சுமார் 35 வருடங்கள் பூர்த்தியாகியுள்ளது. இந்தக் காலப்பகுதியிலே அவர்களுக்குத் தமது சொந்த இடங்களைப் பார்வையிடக்கூட முடியாத ஒரு துர்ப்பாக்கிய நிலை இருந்தது. அந்தப் பிரதேசத்தில் இருந்த 72 பள்ளிவாசல்கள் மூடப்பட்டுப் பாழடைந்த நிலைமையில் காணப்பட்டது. இறுதியிலே இலங்கை அரசுக்கும் விடுதலைப் புலிகளுக்குமான போர் நிறுத்தக் காலத்திலே நடைபெற்ற ஊடகவியலாளர் சந்திப்பின்போது, விடுதலைப் புலிகள் தலைவர் பிரபாகரன் அவர்களும் ஆலோசகர் அன்ரன் பாலசிங்கம் அவர்களும் அதற்காகப் பகிரங்கமாக மன்னிப்புக் கேட்டார்கள். ஆனால், மன்னிப்பு கேட்டுவிட்டால் மட்டும் அந்த மக்களின் துயரங்கள் மாறிவிடுமா? என்று நாங்கள் கேட்கின்றோம்.

மாண்புமிகு சனாதிபதி அவர்களினால் உள்ளூரிலே இடம்பெயர்ந்தவர்களுக்கான வீடுகளை அமைப்பதற்காக 5,000 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளது. அதனை நாங்கள் பெருமையோடு ஏற்றுக் கொள்கின்றோம். ஆனால், பாதிக்கப்பட்ட மக்களுக்கு, 35 வருட காலம் தாழ்த்தி அந்த வீட்டுத் திட்டங்கள் கிடைக்குமா? என்ற சந்தேகம் எங்களுக்கு இருக்கின்றது. காரணம், அண்மையில் சில வீட்டுத் திட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டபோது, இடம்பெயர்ந்து வெளிநாடுகளிலிருந்து அல்லது இந்தியாவிலிருந்து திரும்பி வந்தவர்களுக்கு முன்னுரிமை அளிக்கப்பட்டதுடன், உள்ளூரிலே இடம்பெயர்ந்தவர்களுக்கு அவை நிராகரிக்கப் பட்ட சந்தர்ப்பங்கள் காணப்படுகின்றன.

மேலும், 35வருட கால இடப்பெயர்வினால் மக்களுடைய காணிகள் காடுகளாகக் காட்சியளிக்கின்றன. இவற்றைக் காடுகள் என வன இலாகாவினரும், வனஜீவராசிகள் திணைக்களத்தினரும் விசேட வர்த்தமானிகள் ஊடாகச் சுவீகரித்துள்ளனர். அதனால் பயனாளிகள் தெரிவு செய்யப்படும்போது, அவர்களுக்குக் காணியில்லாத நிலை ஏற்படுகின்றது. எங்களுடைய மாவட்ட ஒருங்கிணைப்புக்குழுக் கூட்டங்களிலும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களிலும் இவ்விடயம் சம்பந்தமாகப் பலமுறை தெரிவித்திருக்கின்றோம். எமது மாவட்ட ஒருங்கிணைப்புக் குழுத் தலைவராக இருக்கின்ற பிரதி அமைச்சர் உபாலி சமரசிங்ஹ அவர்களுக்கும் பிரதேச ஒருங்கிணைப்புக் குழுத் தலைவர்களான கௌரவ பாராளுமன்ற உறுப்பினர் மயில்வாகனம் ஜெகதீஸ்வரன், கௌரவ பாராளுமன்ற உறுப்பினர் டாக்டர் திலகநாதன் அவர்களுக்கும் இந்த விடயங்கள் நன்கு தெரியும். நாங்கள் அவர்களைத்தான் விசேடமாக நம்பியிருக்கின்றோம். அவர்களுக்கு இதில் எங்களைவிட மிகக் கூடுதலான பொறுப்பு இருக்கின்றது. ஆகவே, அரசு இந்த விடயத்திலே கூடுதலான கவனம் எடுக்க வேண்டும்.

எங்களுடைய மாவட்டத்திலே பூர்த்தி செய்யப்படாமல் அரைகுறையாக இருக்கின்ற பல திட்டங்களுக்கு இந்த 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டத்திலே நிதி ஒதுக்கப் படாமல் இருக்கின்றது. கடந்த அரசாங்கத்தால் நிர்மாணிக்கப் பட்ட பாடசாலைக் கட்டிடங்கள், குளங்கள், வீட்டுத் திட்டங்கள் போன்றன இடைநிறுத்தப்பட்டு இருக்கின்றது. அந்தத் திட்டங்களுக்கு நிதி ஒதுக்கீடு செய்து, எங்களுடைய பிரதேசத்தின் அபிவிருத்தியிலே கவனமெடுக்குமாறு அன்பாக வேண்டிக் கொள்கின்றோம்.

மேலும், கடந்த காலத்திலே 'கொவிட்' தொற்று என்ற பேரிலே முஸ்லிம் ஜனாஸாக்களை எரித்தார்கள். 'ஈஸ்ரர்' தாக்குதலை நடாத்திவிட்டு முஸ்லிம் மக்கள்மீது அபாண்டங் களைச் சுமத்தினார்கள். இவ்வாறு காலத்திற்குக் காலம் திட்டமிட்டுச் செயற்படுகின்ற ஒரு பழிவாங்கல் முறை கடந்த காலங்களில் இருந்தது. இந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்தில் அவ்வாறு நடைபெறாது என்று நாங்கள் நம்புகின்றோம்.

அது மாத்திரமல்லாமல், இறக்குமதி செய்யப்பட்ட புனித அல்-குர்ஆன் பிரதிகளைச் சுங்கத் திணைக்களத்திலிருந்து விடுவிக்காமல் தடுத்து வைத்திருக்கின்றார்கள். மஹர

சிறைச்சாலைப் பள்ளிவாசல் மூடப்பட்டிருக்கின்றது. கடந்தகால அரசாங்கத்தின் இவ்வாறான செயற்பாடுகள் காரணமாகக் கணிசமான முஸ்லிம் மக்கள் உங்களுக்கு வாக்களித்தார்கள். அவர்களுடைய நம்பிக்கைக்கு நீங்கள் துரோகம் செய்யாமல் இந்த விஷயங்களில் கவனமெடுத்து உதவுமாறு அன்பாக வேண்டி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අසෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.54]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල් අමාත්‍යවරයා, ඒ වාගේම රටේ ජනාධිපතිවරයා අය වැය කථාව ඉදිරිපත් කරනකොට, අපේ රටේ තිබෙන සංස්කෘතිය අනුව සංවේදී කණ්ඩායම් විසින් ඉතාම හොඳින් අධ්‍යයනිකව ඒ අය වැය කථාවට ඇහුම්කන් දීම කරනවා. විශේෂයෙන්ම පාසල්වල අපොස (උසස් පෙළ) කරන දරුවන්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, කර්මාන්තශාලාවල වැඩ කරන කම්කරුවන්, ඒ වාගේම වෙනත් ව්‍යාපාරික ප්‍රජාව, අධ්‍යක්ෂ මණ්ඩල ඇතුළු ඒ සියලුදෙනාම සාමූහිකව එම කාර්යයෙහි යෙදෙනවා. අතීතයේදී ගුවන් විදුලිය හරහා මේ ඇහුම්කන් දීම කළා. ඊට පස්සේ මෑතකදී රූපවාහිනිය මඟින් සජීව ලෙස සහ සමාජ මාධ්‍ය මඟින් සජීව ලෙස අය වැය නරඹමින් අධ්‍යයනයක යෙදෙනවා.

වසර කිහිපයක් තිස්සේ මේ සම්බන්ධ අත්දැකීම් තිබෙන, අය වැය සම්බන්ධ හොඳ දැනුමක් තිබෙන විපක්ෂ මන්ත්‍රීවරුන් ගණනාවක් මේ ගරු සභාව තුළ ඉන්නවා. එම නිසා අය වැයක් ඉදිරිපත් කළාට පස්සේ කරන අය වැය විවාදය තුළදී බොහෝ වෙලාවට සාකච්ඡා කළ යුතුව තිබෙන්නේ, හරයාත්මක පැත්තෙන් අය වැයේ කුමන පියවරවලින්ද රටක් විධියට ඉදිරියට යන්න උත්සාහ කර තිබෙන්නේ කියන කාරණයයි. හැබැයි, එහෙම සංවාදයක් අපි විපක්ෂය පැත්තෙන් දැක්කේ නැහැ. ඒ අඩුව නිසාම මූලික හරයක් විධියට මේ තත්ත්වය මම පැහැදිලි කරලා දෙන්න ඕනෑ.

එතැනදී 2026 වර්ෂයට ඇස්තමේන්තුගත රජයේ සමස්ත ආදායම විධියට රුපියල් බිලියන 5,355ක ප්‍රමාණයක් තිබෙනවා. මේක බදු ආදායම විධියට, බදු නොවන ආදායම විධියට සහ ප්‍රදාන විධියට අත්පත් කර ගන්න රජය සැලසුම් කරලා තිබෙනවා. රජයක් පවත්වාගෙන යෑමේදී වැටුප් ගෙවීම ඇතුළුව නොයෙකුත් වියදම් දරන්න වනවා. ඒ ප්‍රාථමික වියදම විධියට රුපියල් බිලියන 4,485ක මුදලක් මෙවර ඇස්තමේන්තු කරලා තිබෙනවා. මෙන්න මේ දෙකේ ශේෂය ප්‍රාථමික ශේෂය විධියට හඳුන්වනවා. මේ ශේෂය රුපියල් බිලියන 870ක ධන අගයක් විධියට අපට දකින්න ලැබෙනවා. මෙවර අය වැය අධ්‍යයනය කරන අයට මේක විශේෂ තත්ත්වයක් විධියට දකින්න පුළුවන් වෙලා තිබෙනවා. ප්‍රාථමික ශේෂය මෙවැනි ධන මට්ටමක පවත්වා ගැනීමට අසමත් වන ඕනෑම අවස්ථාවක, රාජ්‍යයක් බරපතළ මූල්‍ය අර්බුදයකට පත් වන්න පුළුවන්.

අපි කුඩා අවධියේ ඉඳන්ම දැකපු දෙයක් තමයි, රටක ආර්ථික ශක්තිමත්භාවයක් තිබෙන ඕනෑම අවස්ථාවක අය වැයක් ඉදිරිපත් කරනකොට රිසි ලෙස එක එක තැන්වලට මුදල් වියදම් කිරීම නිසාත්, ආදායම් උත්පාදනය කරන තැන් වසා දැමීම නිසාත් රට වසරින් වසර ආර්ථික අර්බුදයකට පත් වුණු ආකාරය. එහි උච්චතම අවස්ථාව විධියට අපි දකිනවා, 2022දී අපට භාණ්ඩ ලබා ගැනීමට රුපියල් නැතිවීම. ඒ අවස්ථාවේ රුපියල් මුද්‍රණය කරන්න නොහැකි වීම නිසා දැවැන්ත ආර්ථික අර්බුදයේ කොටස්කරුවන් බවට මේ රටේ ජනතාව පත් වුණා. හැබැයි, අතීතයේ අය වැයට ඇහුම්කන් දෙන සෑම පිරිසක්ම හිතාගෙන හිටියේ ඒ අය වැයෙන් පස්සේ මේ රට සංවර්ධන මට්ටමකට ළඟා වෙයි කියලා. නමුත් එහෙම දෙයක් අපට දකින්න ලැබුණේ නැහැ. ඒ නිසාම මේ සංඛ්‍යාලේඛන අධ්‍යයනය කිරීම ඉතාම වැදගත් වෙනවා. මේ විධියට ප්‍රාථමික ශේෂය ධන රුපියල් බිලියන 870ක්ව පවතිද්දී රජයට තව වියදම් දැරිය යුතුව තිබෙනවා. පොලී ගෙවීම් ඇතුළු ඒ වියදම් සියල්ල රුපියල් බිලියන 2,627ක් විධියට තිබෙනවා. අන්න ඒක අය වැය පරතරය විධියට අපට හඳුනා ගන්න පුළුවන්. මේ අය වැය පරතරයට අමතරව ණය වාරික විධියට තවත් රුපියල් බිලියන 1,878ක්, ගැළපීම් විධියට රුපියල් බිලියන 10ක් තිබෙනවා. ඒ ඔක්කෝම ගත්තාම මුදල් අවශ්‍යතාව රුපියල් බිලියන 3,740ක් වෙලා තිබෙනවා. මේ ගරු සභාවෙන් බලාපොරොත්තු වන්නේ මෙන්න මේ පිළිබඳ සංවාදයක්.

පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වෙනවා, ඊළඟ මුදල් වර්ෂයේදී මේ මුදල් අවශ්‍යතාව සපුරා ගැනීමට. විපක්ෂයේ ඉන්න අත්දැකීම් බහුල ආර්ථික ඔස්තාර්ලාගෙන් අපි බලාපොරොත්තු වුණා, ඒ රුපියල් බිලියන 3,740 මේ රටට අත්පත් කරගෙන මේ අය වැය සම්බන්ධව තිබෙන අර්බුදය බේරාගෙන ඉස්සරහට යන්නේ කොහොමද කියලා ඔවුන් කථා කරාවි කියලා. හැබැයි අපි දැක්කා, මේ අය වැය තුළ ඒ සම්බන්ධ ඉතාම දියුණු වැඩ පිළිවෙළක් තිබෙන බව. විශේෂයෙන්ම දුප්පත්කම ගැන කථා කරද්දී අපේ රටේ සමස්ත දුප්පත් ජනතාවගෙන් සියයට 80කට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙන්නේ ග්‍රාමීය මට්ටමේ. ග්‍රාමීය දුප්පත්කම එහෙම නැත්නම් ග්‍රාමීය දිළිඳුකම නැති කරන්නේ නැතුව ගම් මට්ටමේ ජනතාව මේ තිබෙන ආර්ථිකයට සම්බන්ධ කරගැනීම දුෂ්කර වනවා. මොකද, එදිනෙදා වේල හොයා ගැනීමේ අපහසුතාවෙන් ජීවත්වන අපේම ජනතාවක් ගම්වල ඉන්නේ. ඔවුන්ට තිබෙන්නේ එදිනෙදා කෑම වේල හොයා ගැනීම නම්, ඊට වඩා ආර්ථික මට්ටමක් තිබෙන කෙනෙකුට තිබෙන්නේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීම නම්, තවත් කෙනෙකුට තිබෙන්නේ විදේශ අධ්‍යාපනය සඳහා මුදල් හොයා ගැනීම නම්, මෙන්න මේ අසමතුලිතා අතරින් අඩුම තරමින් ඒ ආහාර අවශ්‍යතාව සහ ජීවත් වීමේ අවශ්‍යතාව තිබෙන ජනතාවගේ අවශ්‍යතා හෝ අපි තහවුරු කරන්න ඕනෑ. ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම එහෙම නැත්නම් ග්‍රාමීය දිළිඳුකම අඩු කිරීම සඳහා 2025දී ගත් ක්‍රියාමාර්ග තවත් ප්‍රබල කරලා 2026දී ඉදිරියට ගමන් කරන්න අවශ්‍ය කටයුතු මේ අයවැයෙන් යොදා තිබෙනවා.

ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම සඳහා ආර්ථික අවස්ථා ගම තුළ බහුල කිරීම කරන්න ඕනෑ. කලින් මන්ත්‍රීවරයෙකු පැහැදිලි කළ ආකාරයටම කිරි කර්මාන්තයේ නියැළෙන ගොවීන්ට අවශ්‍ය dairy hub එක හදලා සියලු ගොවීන් ඒකාබද්ධ වෙලා ඔවුන්ට තිබෙන ගැටලු සමස්තයක් විධියට ගමේ කථා කරන්න පුළුවන් ස්ථානයක් නිර්මාණය කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පශු වෛද්‍ය නිලධාරි මහත්තයාත් එක්ක කථා කරගෙන ඒ ගැටලුවලට උත්තරය හොයා ගන්න පුළුවන් මට්ටමට සංවිධානය කිරීමේ අරමුණින් තමයි 2025දී ක්‍රියාත්මක වුණු Dairy Hub කියන වැඩසටහන තවත් ඉදිරියට ගෙන යෑමට හැකි පරිදි මූල්‍යමය ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් මෙයට එකතු කර තිබෙන්නේ.

ඒ වාගේම තමයි, යටිතල පහසුකම් සංවර්ධනය. විශේෂයෙන්ම ගමක සංවර්ධනයට විශාල බාධාවක්ව පවතින්නේ ඒ ගමේ තිබෙන යටිතල පහසුකම් අවම වීමයි. සමහර වෙලාවට

[ගරු අසෝක සපුමල් රන්වල මහතා]

ඒක ඒ ගම තවත් ගමක් එක්ක බද්ධ වෙන්න තිබෙන පාලමක් වෙන්න පුළුවන්, ඒ ගම් අතර තිබෙන ඒකාබද්ධ පාරක් වෙන්න පුළුවන්. ඒ පිළිබඳව රජයක් විධියට අපි 2025දී අත්හදා බැලීමක් කළා. ඒ අත්හදා බැලීම ඉතාම සාර්ථකයි. ගම් දෙකක් සම්බන්ධ වුණාට පස්සේ ඒ ගම් දෙක අතර තිබෙන සම්බන්ධකම් පුළුල් වෙනවා. ප්‍රවාහනය පමණක් නොවෙයි, සෞඛ්‍ය, අධ්‍යාපනය කියන මේ සියලු ක්ෂේත්‍රයන්ට පහසුවෙන් ළඟා වීම සඳහා එය දායක වෙනවා.

ඒ නිසා ගමේ සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා යටිතල පහසුකම්වලට සුවිශේෂී මූල්‍යමය ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා, ප්‍රවාහනය පැත්තෙන්. මීට පෙර අය වැය ඉදිරිපත් කරද්දී අපි දැක්කේ වෙන වෙනම එක එක අමාත්‍යාංශවලට මුදල් වෙන් කරලා ඒ ඉලක්ක හඹා යැමක්. මේ, ඊට වෙනස් ආකාරයක අය වැයක්. ග්‍රාමීය දිළිඳු බව අඩු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් වෙනවා කියන්නේ, ගමේ සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම් දියුණු වෙනවා, අවට ගම්මානත් එක්ක එකට සම්බන්ධ වෙනවා කියන එකයි. ඒ සියල්ල ඒකාබද්ධ වැඩ පිළිවෙළක් යටතේ මේ අය වැය තුළ ප්‍රදර්ශනය වෙනවා.

ඊළඟ කාරණය, සැලසුම්ගත නවීකරණය. නවීකරණය කියන්නේ, හුදු වචනයක් විතරයි. අලුත් අලුත් භාණ්ඩ ගත්ත පමණින්, කෘෂි කර්මාන්තයට අලුත් උපකරණ ගත්ත පමණින් කෘෂි කර්මාන්තය නවීකරණය වෙන්නේ නැහැ. ඒ සඳහා සැලසුම්ගත නවීකරණයක් ඇති වෙන්න ඕනෑ. ඒ උපකරණ මඟින් ලබා ගත හැකි ආර්ථික සංවර්ධනය කුමක්ද, අන්න ඒ පිළිබඳව ගම් මට්ටමේදී සාකච්ඡා කරන්න සාකච්ඡා මණ්ඩපයක් අවශ්‍යයි. නිකම් ඡන්ද වුවමනාව වෙනුවෙන්, දේශපාලනය කිරීමේ වුවමනාව වෙනුවෙන් එක එක මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කරනවාට වඩා, ගම් මට්ටමින් සියලු නිලධාරින් සහ ගම් මට්ටමේ ඉන්න දේශපාලන අධිකාරියත් එකතු කරගෙන එක මධ්‍යස්ථානයකින්, ප්‍රජා සංවිධානයකින්, ප්‍රජා ශක්ති වැඩ පිළිවෙළක් තුළින් ගමේ ඒ කටයුතු සිදු වෙන්න ඕනෑ. ඒක ඉතා යහපත් දෙයක්. ගමේ වැඩ කෙරෙනවා නම් ප්‍රජා ශක්ති කමිටුවක් හරහා, ප්‍රජා වුවමනා වෙනුවෙන්, ජන ප්‍රජාවගේ සහභාගිත්වයෙන් කෙරෙන වැඩ බවට පත් වෙනවා.

ඊළඟ කාරණය, තිරසර සංවර්ධනයක් අත්පත් කර ගැනීම. මේ සංවර්ධන ව්‍යාපෘති තවත් අවුරුද්දකට දෙකකට පමණක් සීමා වෙනවා නම්, ඒ වෙන් කරන මුදල් ප්‍රමාණය යහපත් ආකාරයෙන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. සමහර විට පාර අයිනේ හදන පැති බැම්මක් පාර පුළුල් කරද්දී කඩන්න වෙනවා නම්, ඒ වෙන් කරපු මුදල් ප්‍රමාණය ගැන අපට ගැටලුවක් පැන නඟිනවා.

ඒ වාගේම මෙතැනදී විපක්ෂය පැත්තෙන් දිගින් දිගටම කියැවුණු කාරණයක් තිබෙනවා. ඒගොල්ලන් අහනවා, "භාණ්ඩාගාරය පිරී ඉතිරී ගිහිල්ලා තිබෙනවා. ට්‍රිලියනයකට වැඩි මුදල් ප්‍රමාණයක් මහජන බැංකුවේ තිබෙනවා. ඒ මුදල් කන්න බොන්න වියදම් කරන්නේ නැත්තේ මොකද" කියලා. මෙන්න මේ ආර්ථික, මූල්‍යමය, ආකල්පමය තත්ත්වය අතීතයේදී අපේ රට ආර්ථික වශයෙන් බංකොලොත් වෙන්න බලපාපු ප්‍රධාන සාධකයක්. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. මේ රටේ ආණ්ඩු කරපු විවිධ දේශපාලන පක්ෂ මැතිවරණයක් ආසන්න වෙනකොට ජනතාව මත මුදා හැරපු මුදල් ප්‍රමාණය අපේ රට සුබිත මුදිත කරන්න හොඳටම ප්‍රමාණවත්. තනි තනියෙන් මිනිස්සු ඒ මුදල් දැම්මේ භාණ්ඩාගාරයෙන් අරගෙන. ගොවීන්ට උදලු තල ලබා දීමට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් පාරවල් හදන ව්‍යාපෘති වෙන්න පුළුවන්. ඒවා වෙනුවෙන් මුදල් ගමට ආවා. ඒක ඇත්තම අය වැයක් විධියට ජනතාව විශ්වාස කළා. හැබැයි, එහෙම තනි තනි මිනිසුන් සල්ලි දමලා මැතිවරණයකදී කරපු වැඩේම අය වැයකදීත් වෙනවා නම්, රටක් සංවර්ධනය වෙන්නේ නැහැ කියලා අපි විශ්වාස කරනවා. එහෙම නම් ඒ සංවර්ධනය වෙනස් ආකාරයකට සිද්ධ වෙනකොට රටේ ආර්ථිකය ශක්තිමත් වෙන අතරතුර රටේ රාජ්‍ය මූල්‍යමය විනය පවත්වා ගන්නත් හැකි වෙනවා. අද වෙනකොට මේ රජය එය කරන්න සමත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධ මූලික වුවමනාව ඉතාම ඉහළින් සමාජගත කරලා තිබෙනවා.

ඒ වාගේම මේ සභාවේදී කියැවුණා, රුපියල් ලක්ෂ 10කින් නිවසක් හදන්නේ කොහොමද කියලා. නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ගම්පහ දිස්ත්‍රික්කය තුළ ආසන මට්ටමින් නිවාස තෝරාගෙන හදාගෙන යනකොට ඒ නිලධාරි මහත්වරු ඒ සඳහා ප්‍රතිලාභීන් තෝරා ගන්න අනුගමනය කළ ක්‍රමය ඉතාම හොඳයි. ඒ සඳහා ඉඩමක් තිබෙන්න ඕනෑ යම් පර්චස් ප්‍රමාණයක. ඒ ඉඩමට අදාළව අවශ්‍ය පහසුකම් ටික තිබෙන්න ඕනෑ. ගැහැනු ළමයි ඉන්න, කඩා වැටෙන්න ළඟ, අනතුරුදායක නිවසක් නම්, ඒ තුළ ආරක්ෂාව නැත්නම් එවැනි අය ප්‍රතිලාභීන් ලෙස තෝරා ගන්නවා. ඒ ප්‍රතිලාභින් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක මුදල් ප්‍රමාණය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ රුපියල් ලක්ෂ 10 කියන්නේ, මිල. නමුත්, එතැනදී ඒ මිලට එහා ගිය වටිනාකමක් එකතු වෙනවා. සමාජ සත්කාරයක් විධියට ගමේ සියලුදෙනාම එකතු වෙනවා, ඒ නිවස හදන්න. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ඉන්න ආර්ථික වශයෙන් ශක්තිමත් අය කණ්ඩායම් වශයෙන් එකතු වෙලා ඒ වෙනුවෙන් සිමෙන්ති කොට්ටයක් වැනි අදාළ දේවල් ලබා දෙනවා. ඒ වාගේම ඒ නිවසේ ඉන්න නිවැසියන් ඒක හදන්න දායක වෙනවා. එතකොට ඒ හැදෙන නිවස මූල්‍යමය වශයෙන් තක්සේරු කළොත්, රුපියල් ලක්ෂ 15කට, 20කට සමාන වෙනවා. ඒ විධියේ නිවාස 220කට වැඩි සංඛ්‍යාවක් මේ වෙනකොට හඳුනාගෙන තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ එවැනි නිවාස 164ක් සාදා නිම කරලා තිබෙනවා. ඒ සියලු කාරණා ගත්තාම මේ අය වැය වෙනම සංවාදයක් කරන්න පුළුවන් අය වැයක් බවට පත් වෙලා තිබෙනවා. ශිෂ්‍යයන්ට, තරුණයන්ට, වැඩ පොළවල වැඩ කරන ජනතාවට, ගොවීන්ට සංවාද මණ්ඩපයක් බවට පත් කර ගන්න ඉතාම හොඳ අය වැයක් බවට මෙවර අය වැය පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය සම්බන්ධව එවැනි සංවාදයකට ප්‍රවිෂ්ට වෙමු, මේ සංඛ්‍යාලේඛනත් එක්ක කථා කරමු කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ආරාධනා කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.06]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අදත් මුදල් අමාත්‍යතුමා හැටියට ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2026 අය වැය ප්‍රකාශය ගැන විවාද කරනවා. එහිදී මම දැකපු අලුත්ම කාරණාවක් තිබෙනවා. මුදල් අමාත්‍යතුමා කරපු කථාව මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාම නැවත වතාවක් කියනවා, අරකට මෙච්චර වෙන් කළා, මේකට මෙච්චර වෙන් කළා කියලා. ඒවා පැය හතරහමාරක් මුදල් ඇමතිතුමා හැටියට ජනාධිපතිතුමා මෙතැනදී කිව්වා. හැබැයි, නැවත නැවතත් ඒකම කියනවා. ඒක නොවෙයි කියන්න ඕනෑ. කියන්න ඕනෑ මේ කරන දේ ගැනයි, මොනවාද මේකෙන් කරන්නේ කියන එක ගැනයි.

විශේෂයෙන්ම මේ කාරණයත් මතක තබා ගන්න. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ දුප්පත්කම ගැන. මතක තබා ගන්න, මේ රටේ තිබෙන්නේ හැංගුණු දුප්පත්කමක් - hidden poverty. දුප්පත්කම තිබෙන්නේ පැල්පත්වල විතරයි කියලා හිතනවා නම් ඒක වැරදියි.

මේ රටේ මධ්‍යම පාන්තිකයාගේ ඉඳලා දුප්පත්කම තිබෙනවා. ඔවුන් ප්‍රශ්න ගොඩක ඉන්නේ. රාජ්‍ය සේවකයා සමහර වෙලාවට රුපියල් ලක්ෂ දෙක, තුනක් වැටුප් ගත්තාට බදු ගෙවලා, බඩු මිලදී ගෙන, අධ්‍යාපනයට වෙන් කරලා, තෙල් ටික ගහලා, විදුලි බිල ඇතුළු සියලු බිල් ටික ගෙව්වාට පස්සේ ඉතාම අසරණ වෙනවා. හැබැයි, ඒ ගැන කියන්න කෙනෙක් නැහැ. ඒ අය මැද නතර වෙනවා. ඒ නිසා මතක තබා ගන්න, විශේෂයෙන්ම මේ දරිද්‍රතාව තිබෙන්නේ ගමේ පැල්පතේ විතරක් නොවෙයි කියන එක. ගමේ පැල්පතේ ඉන්න අයට අස්වැසුම දීලා දුප්පත්කම නැති කරන්න පුළුවන් කියලා හිතනවා නම්, තමුන්නාන්සේලා පළමු තැනම අසමත් කියන එක මතක තබා ගන්න. ඒ සඳහා පටන් ගන්න ඕනෑ ක්‍රමයක්, system එකක්. කොහොමද ඒ system එක හදන්නේ? ඒ system එකේදී මතක තබා ගත යුතු ඊළඟ කාරණාව මෙයයි.

ඊළඟට, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් මේ දුප්පත්කමේ ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා. කොහොමද ඒ අය ඒ ප්‍රශ්නයට මුහුණ දී තිබෙන්නේ? සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන් තමුන්නාන්සේලා මේ අය වැයෙන් කිසිම දෙයක් කරලා නැහැ. මොකක්ද, කරලා තිබෙන්නේ? විශේෂයෙන්ම මේ ප්‍රශ්නයට මුහුණ දෙන්නේ ජනතාව. අපි බලමු, පරාටේ නීතියත් එක්ක තිබුණු ප්‍රශ්න ටික. බැංකුවලින් ණය අරගෙන, ඒ තිබුණු ආර්ථිකයත් එක්ක කඩා වැටුණු අපේ ව්‍යාපාරිකයන් ආරක්ෂා කරන්න තමුන්නාන්සේලා මොනවාද කළේ? තමුන්නාන්සේලා අලුතින් ව්‍යාපාර කරන අයට වෙනම ණය දීමේ වැඩසටහනක් ආරම්භ කළා. හැබැයි, ඒ ණය දීමේ වැඩසටහන පටන් ගන්න ඕනෑ කොතැනින්ද? විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වැටී සිටින තැනින් නැඟිට්ටවන්න අවශ්‍ය ප්‍රතිපාදන, සහන දෙන්න ඕනෑ. අඩු ගණනේ යමෙකුගේ දේපළ බැංකුවට සින්න වෙලා තිබෙනවා නම්, ඒ දේපළ බේරා ගන්න අවශ්‍ය පොලිය කපා හරින වැඩසටහන හෝ තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන් 2026 අය වැයෙන් ඉදිරිපත් කරන්න ඕනෑ. නමුත්, ඒක කරලා නැහැ.

ඊළඟට, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. SVAT එකත් මම මේකට සම්බන්ධ කරනවා. SVAT එක ගත්තාම, විශේෂයෙන්ම මේ රටේ අපනයන ක්ෂේත්‍රයේ යෙදෙන අය බොහෝ වෙලාවට ඒ භාණ්ඩ නිෂ්පාදනය කරන්න අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය කරනවා. මේ අමු ද්‍රව්‍ය ආනයනය කරද්දී, එදා මේ SVAT එක දාලා ලිඛිත ලියවිල්ලක් විතරයි භාර දුන්නේ. Export කරද්දී තමයි ඒක අඩු කරන වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ. හැබැයි, තමුන්නාන්සේලා දැන් අමු ද්‍රව්‍ය ආනයනයේදී මේ බද්ද පනවා තිබෙනවා. ආනයනයේදී ඒක පනවනකොට මතක තබා ගන්න, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවනුත් මෙතැන ඉන්න බව. ඒ තුළින් අපනයන ක්ෂේත්‍රයේ ඉන්න සියලු කණ්ඩායම්වලට විශාල ප්‍රශ්නයක් එනවා. ඔවුන්ට එකවර විශාල මුදලක් අවශ්‍ය වෙනවා. බොහෝ දෙනෙක් එක්කෝ බැංකුවෙන් ණය මුදලක් අරගෙන, එහෙම නැත්නම් OD එකක් අරගෙන තමයි අමු ද්‍රව්‍ය ආනයනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ. එතකොට ඒ අයට විශාල මුදලක් එකවර අවශ්‍යයි. ඒ මුදල නැවත වතාවක් තමුන්නාන්සේලා දින ගණනකින් දෙනවා කියන වැඩසටහන ක්‍රියාත්මක කළත්, පැවැති කිසිම රජයක් තවම ආණ්ඩුවට ගත්ත මුදල් ආපසු දීලා නැහැ. ඒ නිසා මේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන් විපක්ෂය හැටියට අපි යෝජනා කරනවා, ඒ අයට හරි විධියට ගෙවීමේ පැකේජයක් හදන්නේ නැත්නම්, මේ SVAT වැඩසටහන තාවකාලිකව ක්‍රියාත්මක කරන්න එපා කියලා. එහෙම හදන්න බැරි නම් ඒක දැනට කරන්න එපා, නතර කරන්න. එහෙම නොවුණොත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවාත්, අපනයන ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවාත් යන සියලුදෙනාම සම්පූර්ණයෙන්ම විනාශ වනවාය කියන එක මතක තබා ගන්න. එතකොට ඔබතුමා මේ කියන ආර්ථිකය විනාශ වනවා. මෙන්න, මේක තමයි විශේෂයෙන්ම මතක තබා ගන්න ඕනෑ. ලෝකයේ බොහෝ රටවල් තමන්ගේ රටේ දුප්පත්කම නැති කරන්න ක්‍රියාත්මක කරන විශාල වැඩසටහන් - programmes - තිබෙනවා, projects තිබෙනවා. ධීවරයා වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන් වෙනම තිබෙනවා, ගොවියා වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන් වෙනම තිබෙනවා.

තමුන්නාන්සේලා අල, ලූනු, ගොවියා විතරක් අරගෙන කථා කරන්න බලන්න. ඒ අයගේ අස්වැන්න මිලදී ගන්න, රජය පාඩු දරාගෙන. ඒකට තමයි අය වැයෙන් මුදල් වෙන් කරන්න ඕනෑ. මොකද, සුළු පරිමාණයේ ගොවීන් මිස මහා පරිමාණයේ ගොවීන් නොවෙයි ඉන්නේ. මේ ගොවීන් කඩාගෙන වැටුණාට පස්සේ නැවත නැඟිට්ටවන්න බැහැ, අවුරුදු ගණනාවක් ගියත්. ඒ නිසා කඩාගෙන වැටෙද්දී එයා නැඟිට්ටවන්න අවශ්‍ය වැඩ පිළිවෙළ සඳහා රජයේ මුදලක් වෙනම වෙන් කර තිබෙන්න ඕනෑ. ලූනු ටික මිලදී ගෙන, අල ටික මිලදී ගෙන ඒ වෙනස ක්‍රියාත්මක කරද්දී, VAT එක වාගේ, tax එක වාගේ ඒ මිල ගණන් ජනතාවගේ කරපිට දමන්න බැහැ. ඒක අවස්ථානුකූලව රජය විඳ දරා ගන්න ඕනෑ. ඒක තමයි රජයක වගකීම. තමුන්නාන්සේලා ඒක කරන්නේ නැතිව බොහෝ වෙලාවට කරන දේ තමයි,-

මම ඊයේ දැක්කා, අල කිලෝවක් රුපියල් 300ට ගන්න, ලූනු කිලෝවක් රුපියල් 200ට, 250ට ගන්න සූදානම් වෙන්න කියලා කෘෂිකර්ම අමාත්‍යතුමා කියනවා. ඇයි? ගොවියාට නිසි මිලක් ගෙවනකොට ඒක පාරිභෝගිකයාගෙන් -ජනතාවගෙන්- අරගන්න හදනවා. ඒක නොවෙයි කරන්න ඕනෑ. ආපදාවක් සිද්ධ වෙච්ච වෙලාවට එයා රක්ක ගන්නවා කියන්නේ, ඒ අයට මිලක් ගෙවලා ඒක ආණ්ඩුව දරා ගන්න එක. ඒක ජනතාව පිට තියන්න ඕනෑ නැහැ. ජනතාව පිට තියනවා නම් ආණ්ඩුවකින් සත පහකට වැඩක් නැහැ. ඔය කියන කතන්දර එකක්වත් වැඩක් නැහැ.

තමුන්නාන්සේලා මතක තබා ගන්න. මෙතැන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. තමුන්නාන්සේලා බලයට එන්න පෙර JVP එකෙන් මේ රටේ විද්වතුන් විශාල ප්‍රමාණයක් මාලිමාවට ඒක රාශී කර ගත්තා. තමුන්නාන්සේලා බලය ලබාගත් ගමන් ඒ

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

විද්වතුන්ට පයින් ගහලා එළවලා දැම්මා. ඊළඟට, රාජ්‍ය සේවයේ දැනට ඉන්න අය එදා UNP එකේ වෙන්න පුළුවන්, එදා තිබුණු පොහොට්ටුව ආණ්ඩුවේ වෙන්න පුළුවන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආණ්ඩුවේ වෙන්න පුළුවන්, ඒ අයත් එක්ක යම් කිසි රාජකාරියක් අමාත්‍යාංශයක කළා නම්, තමුන්නාන්සේලා ඒ අය වෙන පැත්තකට තල්ලු කරනවා. හැබැයි, ඒ අය රාජ්‍ය සේවයේ ඉන්න දක්ෂ අය. රාජ්‍ය සේවයේ ඉන්න ඒ අය හංවඩු ගහලා, වෙන් කරලා තමුන්නාන්සේලා වෙනම වැඩ කරන්න සූදානම් වෙනවා. ඒ සූදානම් වීම මත අද රාජ්‍ය සේවයේ ක්‍රියාත්මක නොවන රාජකාරි ප්‍රමාණයක් තිබෙනවා. ඒ තත්ත්වය ඇති කර ගත්තේ තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා පාවිච්චි කරපු ක්‍රමය වැරදියි. ඒ නිසා අද මතයක් ඇති වෙලා තිබෙනවා, "දොරටු පාලකයා රජ වෙලා" ද කියලා. මේ කාරණාව කියන්නේ අපි නොවෙයි. මතක තබා ගන්න, අපට ඇඟිල්ල දිගු කරලා බොරුවට කෑ ගහන්න එපා. මේක රාජ්‍ය සේවය ඇතුළේ කථා වන කාරණාවක්. ඒ කථා වන කාරණාව තමුන්නාන්සේලා විසින් නිර්මාණය කරපු එකක්. ඒක නිර්මාණය කර ගත්තේ තමුන්නාන්සේලා. ඒ නිසා මතක් කරනවා, තමුන්නාන්සේලා මේ තීන්දු තීරණ ගනිද්දී නිසි ක්‍රමයක් සකස් කරගන්න කියලා. ඒකට හේතුව මේකයි. COPE එකට හෝ COPA එකට හෝ වෙනත් කමිටුවකට හෝ කැඳවූවත්, අපි සමස්තයක් හැටියට හැම දෙනාම හොරු හැටියට හංවඩු ගහලා තිබෙන්නේ. බොහෝ වෙලාවට වාචාලකමට කථා කරනවා, උද්ධච්චකමට කථා කරනවා, හැම කෙනාටම මඩ ගසමින් කථා කරනවා. ඒ නිසා මේ වැඩසටහන රාජ්‍ය සේවයටත් අදාළයි කියන එක මතක තබා ගන්න.

සුනාමිය ඇති වෙලා මේ රට කඩා වැටුණු වෙලාවේ රාජ්‍ය සේවය තමයි මේ රට ආපහු නැඟිට්ටවලා අරගත්තේ. අද රාජ්‍ය සේවයේ කවුරුත් වගකීම් ටික භාර ගන්නේ නැහැ. කෙළින් ඉඳගෙන වගකීම් ටික භාර ගන්න බැහැ. ඇයි? වගකීම් භාර ගත්තාට පස්සේ ඒ වගකීම් භාරගන්න කරන ක්‍රියාදාමයේ යම් වැරැද්දක් ආවොත් ඒ අය බේරා ගන්න කවුරුත් ඉදිරිපත් වෙන්නේ නැහැ; ඒ අය පිටුපස්සේ කවුරුත් නැහැ. ඒ අය බිල්ලට දීලා තමුන්නාන්සේලා හෙමින් ඈත් වෙනවා. මේක තමයි තමුන්නාන්සේලාගේ රාජ්‍යකරණයේ, රාජ්‍ය සේවයේ ක්‍රමය. මේ ක්‍රමය නිසා මේ වනකොට පැහැදිලි ලෙසම රාජ්‍ය සේවය ඉතාම පිටුපස්සට ගිහිල්ලා තිබෙනවා. ඒ අය තීන්දු තීරණ ගන්න අවස්ථා ගොඩක් අඩු කර තිබෙනවා.

මම තමුන්නාන්සේලාට උදාහරණයක් කියන්නම්. සමහර බලපත්‍ර ගන්න ගියාම, මේ අවුරුද්දේ ජූලි මාසයේ ඉල්ලපු බලපත්‍රයක් තවමත් ලැබිලා නැති ස්ථාන තිබෙනවා. අමාත්‍යාංශ ගැන කථා කරනකොට ඒ බලපත්‍රත් එක්ක මම කරුණු ඉදිරිපත් කරන්නම්. එතකොට කොහොමද මේ රට ඉස්සරහට යන්නේ? රටේ නිසි ක්‍රමයක් නැතිව, යම් කිසි ව්‍යාපාරිකයෙක් තමන්ගේ වැඩ කොටස කරන්නේ කොහොමද, ආයෝජකයෙක් තමන්ගේ වැඩ කොටස කරන්නේ කොහොමද? ඒ ක්‍රමය නැති වෙලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ වැරැද්දෙන්. තමුන්නාන්සේලා ඒ වැරැද්ද කරලා, අනෙක් අය ඒක පෙන්වා දෙද්දී ඒ අයට ඇඟිලි දිගු කරන එක නොවෙයි, වැඩේ. බයිසිකලයක් නොපැදපු කෙනෙක් plane එකක් එළවන්න ගියාම ප්‍රශ්න එනවා. එම නිසා මේ කාරණා පිළිබඳව ඔබතුමන්ලා හොඳ අවධානයෙන් ඉන්න කියලා ඉල්ලීමක් කරනවා.

විශේෂයෙන් ඇමෙරිකාවෙන් ඉදිරිපත් කළ report එක සම්බන්ධව තමුන්නාන්සේලා හොඳට හිතලා බලලා අවශ්‍ය වැඩකටයුතු කරන්න. ඒකේ මොනවාද කියලා තිබෙන්නේ? ඒකේ කියලා තිබෙනවා, අනවශ්‍ය නියාමනය තමුන්නාන්සේලා ළඟ තිබෙන බව. විශේෂයෙන් තමුන්නාන්සේලා anti-American ඒ වාගේම, anti-private sector කියලා හඳුන්වලා තිබෙනවා. එම නිසා ආයෝජකයන්ට ඒ අය උපදෙස් දීලා තිබෙනවා, "ශ්‍රී ලංකාව එක්ක වැඩ කරද්දි පරිස්සමින් වැඩ කරන්න. මොකද, වැඩ කරන්න බැහැ. ඒගොල්ලන්ගේ නියාමන ක්‍රමය වැරදියි" කියලා. එම නිසා මේ සම්බන්ධව තමුන්නාන්සේලා යම් ආකාරයක වැඩ පිළිවෙළක් සකස් නොකළොත් ප්‍රශ්නයක් ඇති වනවා කියන එක මතක තබා ගන්න. මේක සමස්තයක් හැටියට ගත්තාම ලෝකයේ අනෙක් රටවලටත් බලපානවා. අපට ආයෝජකයෝ එන වැඩසටහන්වලදී ඒක බරපතළ ප්‍රශ්නයක් වනවා.

ඊළඟට, අපේ ශ්‍රම බලකාය. අපේ වැඩිහිටි සමාජය වැඩි වෙයගෙන එනවා. තමුන්නාන්සේලා දන්නවා ඊයේ පෙරේදා ගත්ත සංඛ්‍යා ලේඛ අනුව පෙනෙනවා, වැඩිහිටි සමාජය දිගින් දිගටම වැඩි වෙයගෙන යන බව. වැඩිහිටි සමාජය වැඩි වෙද්දී අපේ ශ්‍රම බලකාය අඩු වනවා. අද ගමක් අර ගත්තාම ඒ ගමේ හොඳම තරුණ කණ්ඩායම මේ වනකොට විදේශගත වනවා. එදා තරුණයන් විදේශගත වෙද්දී තමුන්නාන්සේලා මොනවාද කිව්වේ? තමුන්නාන්සේලා කිව්වා, "තරුණයන්ට මේ රටේ ඉන්න බැහැ. මේ රටේ ක්‍රමයක් නැහැ. එම නිසා තරුණයෝ මේ රට දාලා යනවා" කියලා. අද මේ රටේ හැම තරුණයෙක්ගෙන්ම කථා කරලා අහපුවාම මොකක්ද ඒ තරුණයෝ කියන්නේ? ඒ අය කියන්නේ, "අපට රට යන්න ඕනෑ" කියලා. හැම තිස්සේම හොයන්නේ කොයි රටේද හොඳ රැකියාවක් තිබෙන්නේ කියලා, ඒ රටට යන්න. ඇයි? ඇත්තටම ශ්‍රී ලංකාවේ ඉන්න ඒ ගොල්ලන්ගේ කැමැත්තක් නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව හොඳ නම්, තමුන්නාන්සේලා අරගළයත් එක්ක ගෙන ආපු ක්‍රමය හොඳ නම්, මේ රටේ හැම කෙනාම අද කියන්න ඕනෑ, "අපි පිට රට යන්නේ නැහැ. පිට රට යන එක අපි වර්ජනය කරනවා. අපි සියලුදෙනාම ලංකාවේ ඉන්නවා" කියලා. එහෙම කියන්න පුළුවන් නේ. හැබැයි, ඒක කියන්නේ නැහැ. ඇයි ඒ? එතැන අඩු පාඩුවක් තිබෙනවා. මතක තබා ගන්න, එම අඩු පාඩුව නිසා අපේ ශ්‍රම බලකාය අහිමි වීමේ ඉතා බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

ඊළඟට අපේ ඉඩම්. බොහෝ වෙලාවට ආයෝජකයෝ ඉල්ලන ඉඩම් ප්‍රමාණය තිබෙන තැන සහ ඒ අය ඉල්ලන තැන ඉඩම් නැති එකත්, ඒ අය ඉල්ලන්නේ නැති තැන්වල ඉඩම් තිබෙන එකත් කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා land සම්බන්ධ bank එකක් හදන්න digital system එකකට සල්ලි වෙන් කරලා තිබෙනවා. ඒ සල්ලි වෙන් කරලා තිබෙන්නේ ඇයි? තමුන්නාන්සේලා ඒකෙන් බලාපොරොත්තු වන දේ විධියට අපි දකින්නේ, 2027දී තමුන්නාන්සේලා දේපළ බද්දක් ගහන්න යන බවයි. ඒ දේපළ බද්ද ගහන එකට අවශ්‍ය වැඩසටහන හදන්න තමයි තමුන්නාන්සේලා ඒ වැඩේ කරලා තිබෙන්නේ.

ඒ වාගේම තමුන්නාන්සේලාට විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අපි දකිනවා social media හරහා මඩ ගහන ඒවා. තමුන්නාන්සේලාට මම කියන්නේ නැහැ, ඩෝබි බලකාය කියලා. හැබැයි, එවැනි බලකායක් තමුන්නාන්සේලා පඩි දීලා තියාගෙන ඉන්නවා. මතක තබා ගන්න, පඩි දීලා තියාගෙන ඉන්න ඒ බලකාය comments දානකොට Facebook එකේ ඉතා කැත, නින්දිත, පහත්, කාලකණ්ණි වචන තමයි පාවිච්චි කරන්නේ. ඒක ඉතාම වැරදියි. මේ ජන සමාජයම අද විකෘති වෙලා තිබෙනවා. අද දෙමව්පියෝ දරුවෝ අතරත් සමගිය නැහැ. ඇයි, හැම කෙනෙකුටම ඇවිල්ලා තිබෙන්නේ වෛරය. ඒ වෛරය තමුන්නාන්සේලා සමාජය තුළ නිර්මාණය කරලා තිබෙනවා. ඒක Facebook එක හරහාත් නිර්මාණය කරලා තිබෙනවා. මට මතකයි, මගේ මේ වාගේ කථාවක් දාපුවාම

එක්කෙනෙක් මගේ අම්මා ගැන මතක් කරලා දාලා තිබුණා. මගේ අම්මා වයස අවුරුදු 93ක් ජීවත් වෙලායි මිය ගියේ. අපි comments දාන හැම කෙනෙක් ගැනම හොයනවා. හොයලා බලපුවාම මොනවාද තොරතුරු? එයා තමුන්ගේ අම්මා දූෂණය කරන්න ගිහිල්ලා මාස හයක් හිරේට ගිය කෙනෙක්. ඒ අය තමුන්නාන්සේලාගේ photo එක දාගෙන, තමුන්නාන්සේලාගේ symbol එක දාගෙන, තමුන්නාන්සේලාගේ මඩ බලකායේ ඉඳගෙන, අනෙක් අයට මඩ ගහනකොට තමුන්නාන්සේලාගේ තත්ත්වයට මොකද වෙන්නේ කියලා තමුන්නාන්සේලා හිතන්න ඕනෑ. විශේෂයෙන්ම social media හරහා තමුන්නාන්සේලා කරන වැඩේ නවත්වන්න.

ඊළඟට යූටියුබ්කාරයෝ ටිකක් තමුන්නාන්සේලා නිසා ජීවත් වනවා. ඒ අය විකුණනවා. විකුණන්නේ, මඩ. ඉතාම කැත වචන පාවිච්චි කරන්නේ. මීට පෙර සමාජය පාවිච්චි නොකළ වචන පාවිච්චි කරන්නේ. ඒවා පාවිච්චි කරලා තමයි ඒගොල්ලෝ සල්ලි හම්බ කර ගන්නේ. ඒගොල්ලන්ගේ ගෙවල්වල දරුවන් ඇතුළු හැම කෙනෙකුටම කන්න දෙන්නේ ඒ සල්ලිවලින්. හැබැයි, තමුන්නාන්සේලා තමයි ඒ නිර්මාණයට අවශ්‍ය සහයෝගය දීලා තිබෙන්නේ. මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරන්න කියලා තමුන්නාන්සේලාගෙන් ඉල්ලනවා. මොකද, මේ ඇතුළේම අද බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වනවා. විශේෂයෙන්ම කතෝලික පාසල්වලට බරපතළ ප්‍රශ්නයක් තමුන්නාන්සේලා නිර්මාණය කරමින් යනවා. ඒ පාසල්වල විදුහල්පතිවරුන්ට ප්‍රශ්නයක් නිර්මාණය කරගෙන යනවා. ඊළඟට බෞද්ධ පාසල්වලටත් ඒ හා සමාන වැඩකටයුත්තක් ක්‍රියාත්මක කරගෙන යනවා. ආගමික සංහිඳියාව ඇතිව විනයගරුක දරුවෙකු නිර්මාණය කරපු තැන වෙනස් කරලා තමුන්නාන්සේලා අද වෙනස් සමාජයක් නිර්මාණය කරන්න හදනවා. ඒක ඉතාම වැරැදියි කියලා විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාල වේලාව මදි වුණත් විශේෂයෙන් මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. තමුන්නාන්සේලා රිළවු ටිකත් රැවැට්ටුවා වෙනම දූපතකට- island එකකට - දානවා කියලා. අඩුම ගානේ ඒ කාරණයවත් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් කරුණු දෙකක් මතක් කරන්න ඕනෑ. පාස්කු ඉරු දින ප්‍රහාරයට සම්බන්ධ සාරා ජෙස්මින් මැරුණේ නැහැ, එදා බොරුවක් කළේ කියලා අපි කියනවා. ඇය ඉන්දියාවේ ඉන්නවා කියලා තමයි තමුන්නාන්සේලා ඇතුළු හැමකෙනෙක්ම එදා කථා කළේ. අපි කියනවා තමුන්නාන්සේලා රතු නිවේදන යවලා අනෙක් අය අල්ලනවා වාගේ ඇයත් අල්ලන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් එක විනාඩියක් දෙන්න.

රතු නිවේදන යවලා වෙනත් රටවල ඉන්න සමහර අය අල්ලන්න තමුන්නාන්සේලා කටයුතු කරනවා වාගේ සාරා ජෙස්මින් ඇල්ලීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න.

කන්ටේනර් 323 ගැන කථා කරන කොට කිව යුතුයි, මීට ඉස්සෙල්ලා රතු ලේබල් කන්ටේනර් අස්සේ කුඩු තිබුණා කියලා අපි අහලා තිබෙන බව. තමුන්නාන්සේලාත් අපිත් දෙගොල්ලන්ම එකතු වෙලා මේ කුඩු ව්‍යසනය නැති කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* අපි ඔක්කොම එකතු වෙලා මේ උවදුරින් මේ රට බේරා ගන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.22]

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවුරුද්ද ඇතුළත අපි මොකුත්ම කරලා නැහැ වාගේ තමයි විපක්ෂයේ කථා ඇහුවාම හැඟෙන්නේ. හැබැයි අවුරුද්දක් ගත වෙලා ලබන අවුරුද්දට අදාළ අය වැය ඉදිරිපත් කරන්න ඉස්සෙල්ලා ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මාස ගණනක් තිස්සේ මේ රටේ ඉන්න ව්‍යාපාරිකයන්, වෛද්‍යවරුන්, මහාචාර්යවරුන්, ගුරුවරුන්, වෘත්තීය සමිති නායකයන්, වතු හාම්පුතුන් සහ ආර්ථික විශේෂඥයන් ගෙන්නලා මේ අය වැය ගැන විශේෂ වැඩසටහනක් කළා, ඉදිරි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා සාකච්ඡා කරමින්. 2025 අවුරුද්දේ මාස 9කට අය වැය හදද්දීත් ඒ වාගේම වැඩසටහනක් කරලා තමයි ඒ අය වැය ඉදිරිපත් කළේ. ඒ අය වැය ඉදිරිපත් කිරීමත් සමඟ අපි දැන් ඉදිරි ගමනක් ඇවිත් තිබෙනවා. කවුරුත් දන්නවා අපි කොතැනද හිටියේ කියලා. දැන් මේ රට ඉතා ශක්තිමත්භාවයට පත් වෙමින් යනවා. මේක අප සියලුදෙනාගේම සාමූහික ප්‍රයත්නයක්. එහෙම නැතිව, මේක ඉස්සර ඉදිරිපත් කළ අය වැය වාගේ එක පුද්ගලයෙකුගේ හෝ දෙන්නෙකුගේ එකක් නොවෙයි. මේ අය වැය මේ සමාජයේ සියලු මිනිසුන් එකතු කරගෙන කළ වැඩසටහනක්. ඒක තමයි මේ අය වැයේ ජයග්‍රහණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අපේ රටේ 80වෙනි අය වැය. මේ 80වෙනි අය වැයට අදාළ ලබන වර්ෂය අවසන් වෙද්දී මේ රට ඉදිරියට යන්නේ කොහොමද කියලා අපි දන්නවා. ගිය පාර අය වැයත් සමඟ, අපි කළ ඒ වැඩසටහනත් සමඟ මේ රටේ මුදල් ඉතිරි වුණා. ඒ මුදල් ඉතිරි වෙන්න හේතුව තමයි අපි ඒවා නාස්ති නොකිරීම. අපි දන්නවා වෙනත් ආණ්ඩු මුදල් විනාශ කළේ කොහොමද කියලා. අපි මේ ආර්ථිකය ආරක්ෂා කරමින්, ස්ථාවරභාවයට පත් කරමින් තමයි අය වැය යෝජනා ක්‍රියාත්මක කරමින් මේ රට ඉදිරියට ගෙන ගියේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වෙද්දී වෙනත් රටවලින් අපට විශේෂ වරප්‍රසාද ලැබිලා තිබෙනවා. ප්‍රධාන වශයෙන් විදේශ ආයෝජන මේ රටට පැමිණෙමින් පවතිනවා. ඒකට හේතුව තමයි, දැන් මේ රට ස්ථාවර බව ලෝකයට පෙන්වීම. අපි දන්නවා ලබන වසර වෙද්දී මේ ස්ථාවර රට තුළට විශේෂ ව්‍යාපාරිකයන් එන බව. අපි ඉඩම්, යටිතල පහසුකම් ආදිය ඉතාම ඉක්මනින් ඒ ආයෝජකයන් වෙනුවෙන් දෙන්න ලෑස්ති කරලා තිබෙන්නේ. සෑම ආයෝජකයෙකුටම එක හා සමානව සලකන්න අපි වැඩසටහනක් හදලා තිබෙනවා. අපි දන්නවා මීට පෙර ආයෝජකයන්ට සැලකුවේ කොහොමද කියලා. ආයෝජකයෙකු රටට එද්දී එයාගෙන් කීයක්ද ගන්නේ කියලා තමයි බැලුවේ. එදා එහෙම තමයි ආයෝජන සම්බන්ධ කටයුතු සිද්ධ වුණේ. එතකොට ආයෝජකයෝ අපේ රට දාලා ගියා. ඒ නිසා තමයි මේ රට මේ තත්ත්වයට පත් වුණේ. නමුත්, අපි දැන් හරි වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා, සෑම ආයෝජකයෙකුටම මේ රටට ඇවිල්ලා වැඩ කරන්න පුළුවන් විධියට.

[ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා]

විශේෂ නවෝත්පාදන සඳහා අපි විශේෂ අවස්ථා ලබා දීලා තිබෙනවා. ඒ තුළ ජන සහභාගිත්වය ඇතිව ආර්ථිකය ශක්තිමත් කරන රැකියා වෙළෙඳ පොළ හැදෙනවා. ඒවා තමයි අපේ ජයග්‍රහණ.

ඊළඟට, රාජ්‍ය යාන්ත්‍රණය ගැන සඳහන් කළ යුතුයි. අපි දන්නවා, අපේ රටේ තිබුණේ දුර්වල තත්ත්වයක රාජ්‍ය යාන්ත්‍රණයක් බව. නමුත් අපි දැන් මේ රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කරමින් යනවා. අපි දන්නවා, නගර සභාවල, ප්‍රාදේශීය සභාවල, ප්‍රාදේශීය ලේකම් කාර්යාවල නිලධාරි හිඟයක් තිබුණු බව. ඒකට හේතු වුයේ පසුගිය කාලයේ ඒ අදාළ බඳවා ගැනීම් නොකිරීමයි. නමුත් අපි දැන් ඒ අවශ්‍ය නිලධාරින් බඳවා ගැනීම පටන් ගෙන තිබෙනවා. අප මුදල් වෙන් කරපු වැඩසටහන් ඒ ඒ ආසනය තුළ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධාරින් අපි මේ වන විට සූදානම් කරමින් යනවා. අපි ඒ සඳහා වන අඩිතාලම දැන් දමා තිබෙනවා. එහෙම තමයි රටක් ගොඩනගන්නේ.

මීට කලින් කථා කළ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වා, එතුමාට වාහනයක් එපා කියලා. එතුමා වාහනය එපා කියන්නේ, අවුරුදු 4ක් ඒක පාවිච්චි කරලා ආපසු දෙන්න ඕනෑ නිසා වෙන්න ඇති. හැබැයි, ඒ ගැන මුලින්ම අහපු වෙලාවේ කිව්වේ එහෙම නොවෙයි. "අපට වාහන එපා, වාහන පර්මිට් එක දෙන්න" කියලායි. එහෙම කියපු අය තමයි දැන් ඔය වාහන එපා කියන්නේ.

නිෂ්පාදන ආර්ථිකයක් කරා යද්දී අපි නිෂ්පාදකයන්ට විශේෂ අවස්ථා සලසා දෙන්න ඕනෑ. මොකද, අපි දන්නවා මේ වන විට නිෂ්පාදන කටයුතු සඳහා මේ රටට අලුතින් ව්‍යාපාරිකයන් එන බව. ඒ වාගේම මේ රට තුළ සිටින නිෂ්පාදකයනුත් ඒ කටයුත්තට සම්බන්ධ වෙන්න ඕනෑ. රටක සිටින නිෂ්පාදකයන් නිෂ්පාදන කටයුතුවලට සම්බන්ධ වීමෙන් තමයි ඒ රට දියුණු වෙන්නේ. ඔබතුමන්ලා දන්නවා ඇති, අපි මේ වන විට ඒ අයට රාජ්‍ය ණය පහසුකම් ද සලසා තිබෙන බව. ඒ වාගේම අපි ඒ අයට අවශ්‍ය පුහුණු කිරීමේ කටයුතු දැනටත් සිදු කරනවා. මේ රට තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් ආසන මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් රාජ්‍ය අනුග්‍රහය සහිතව කරගෙන යනවා. ඒකත් අපගේ මූලික අභිප්‍රායයක් වෙලා තිබෙනවා. ඒ වාගේම ඒ අයට බැංකු හරහා ණය පහසුකම් ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියලු පාර්ශ්ව නියෝජනය වන විධියට අපි මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙනවා. අපේ මන්ත්‍රීවරු ඒ ගැන කළා. හැම ක්ෂේත්‍රයක්ම නියෝජනය වන විධියට අපි මෙම අය වැය ලේඛනය සකස් කර තිබෙනවා. මා හිතන විධියට මෙහිදී ගොඩක්ම කථා වුණේ වතු කම්කරුවන් ගැනයි. වතු කම්කරු ජනතාව කියන්නේ අපේම කොටසක්. ඒ අය වෙනම කොටසක් නොවෙයි. මේ අය වැයෙන් ලැබෙන වරප්‍රසාද ඒ ජනතාව අතරටත් යන්න ඕනෑ. මෙච්චර කාලයකට කිසිදු වරප්‍රසාදයක් ඒ ජනතාවට ගියේ නැහැ, ඒ ජනතාව ගැන හිතුවේ නැහැ. අපි දන්නවා, ඒ අය මහත් දරිද්‍රතාවෙන් ජීවත් වන ජන කොටසක් බව. ඇත්තටම අපි ඒ අය ගැන සොයා බලන්න ඕනෑ. ඒ වාගේම තමයි මේ සංවර්ධන ක්‍රියාවලිය කරගෙන යද්දී, මේ රට තුළ ඒ හැම කෙනෙකුටම ජීවත් වීමේ අයිතිය අපි ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ දුම්රිය ගේට්ටුකරුවන් ලොකු සේවාවක් කරනවා. අව්ව වැස්ස නොබලා ඒ අය සේවයේ නියැළෙනවා. හැබැයි, මෙච්චර කාලයකට ඒ සේවකයන් ගැන පොඩ්ඩක්වත් සොයා බලා තිබුණේ නැහැ. නමුත් ඒ අයට දැනට ගෙවනු ලබන මාසික වේතනය රුපියල් 7,500 සිට 15,000 දක්වා වැඩි කිරීමට අපේ අය වැය තුළ යෝජනා කර තිබෙනවා. ඒකට හේතුව, ඒ හැම කෙනෙකු ගැනම අප සොයා බැලීමයි.

රාජ්‍ය සේවකයන් බඳවා ගැනීමටත් අපි මේ වෙද්දි මුදල් වෙන් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබුණු කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஸ்டெபனி பர்னாந்து)
(The Hon. Stepni Fernando)
එහෙම නම්, බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විවාදය කල් තැබීම, ගරු අමාත්‍යතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විවාදය දැන් කල්තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව විවාදය කල්තබන ලදී.***
***එතැන් සිට විවාදය 2025 නොවැම්බර් 13වන බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.***

*அதன்படி, விவாதம் ஒத்திவைக்கப்பட்டது.*
*விவாதம், 2025 நவம்பர் 13, வியாழக்கிழமை மீளத் தொடங்கும்.*

*The Debate stood adjourned accordingly.*
*Debate to be resumed on Thursday, 13th November, 2025.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ඔක්තෝබර් 23වන දින සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 13වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி பாராளுமன்றம், அதனது 2025 ஒக்ரோபர் 23ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2025 நவம்பர் 13, வியாழக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 6.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday 13th November, 2025, pursuant to the Resolution of Parliament of 23rd October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts
Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.